322 වන කාණ්ඩය - 03 වන කලාපය
தொகுதி 322 - இல. 03
Volume 322 - No. 03

2025 නොවැම්බර් 10 වන සඳුදා
2025 நவம்பர் 10, திங்கட்கிழமை
Monday, 10th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව** [තීරුව 425]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 427-444]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [දෙවන වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 444-612]

---

# பிரதான உள்ளடக்கம்

**கணக்காய்வாளர் அதிபதியினது ஆண்டறிக்கை** [ப: 425]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 427-444]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 – [ஒதுக்கப்பட்ட இரண்டாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 444-612]

---

# PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S ANNUAL REPORT [Col. 425]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 427-444]

APPROPRIATION BILL, 2026 - [Second Allotted Day]:
Second Reading - Debate Adjourned [Cols. 444-612]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 10වන සඳුදා***
*2025 நவம்பர் 10, திங்கட்கிழமை*
*Monday, 10th November, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது ஆண்டறிக்கை
## AUDITOR-GENERAL'S ANNUAL REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2024 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය) වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) දුනුකේදෙනිය, මඩකුඹුර, මහනිගවත්ත යන ලිපිනයෙහි පදිංචි එම්.ජී.ඩී.එස්. මඩකුඹුර මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) නුවරගල, පිහිටිවැව, අංක 127 යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්. කාංචනා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නන්ද බණ්ඩාර මහතා**
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)

ගරු කථානායකතුමනි, රඹුක්කන, කොටවැල්ල, පහළ වල්පොල යන ලිපිනයෙහි පදිංචි එම්.ආර්. ඉනෝකා චාන්දනී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

ගරු කථානායකතුමනි, මීගම, රිටිකැටිය නව ජනපදය, අංක 92 යන ලිපිනයෙහි පදිංචි ජයමි සංජානා ද සිල්වා මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### උතුරු දුම්රිය මාර්ගයේ වවුනියා-කිලිනොච්චි දක්වා වූ කොටස: අබලන් දුම්රිය හරස් මාර්ග
### வடக்குப் புகையிரத வீதியின் வவுனியா-கிளிநொச்சி வரையான பகுதி: சேதமடைந்துள்ள புகையிரதக் கடவைகள்
### VAVUNIYA-KILINOCHCHI SECTION OF NORTHERN RAILWAY LINE: DILAPIDATED RAILWAY CROSSINGS

1085/2025

**1. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උතුරු දුම්රිය මාර්ගයේ වවුනියාවේ සිට කිලිනොච්චිය දක්වාවූ කොටසේ ඇති දුම්රිය හරස් මාර්ග භාවිත කළ නොහැකි පරිදි බරපතළ ලෙස අබලන්වී ඇති බවත්;

(ii) විශේෂයෙන්ම වවුනියාව, පූලියන්කුලම ප්‍රදේශයේ ඇති දුම්රිය හරස් මාර්ග දැඩි ලෙස අබලන්වී ඇති බවත්;

(iii) බොහෝ දුම්රිය හරස් මාර්ග අනාරක්ෂිත වන අතර ඒ හරහා ගමන් කරන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම අමාත්‍යාංශයේ වගකීම බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) එසේ නම්, මෙම ගැටලුවට ලබා දෙන විසඳුම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடக்குப் புகையிரத வீதியின் வவுனியாவிலிருந்து கிளிநொச்சி வரையான பகுதியிலுள்ள புகையிரதக் கடவைகள் பயன்படுத்த முடியாதவகையில் மிக மோசமாகச் சேதமடைந்துள்ளன என்பதையும்;

(ii) குறிப்பாக வவுனியா, புளியங்குளம் பிரதேசத்திலுள்ள புகையிரதக் கடவைகள் கடுமையாகச் சேதமடைந்துள்ளன என்பதையும்;

(iii) பெரும்பாலான புகையிரதக் கடவைகள் பாதுகாப்பற்றவையாகக் காணப்படுவதுடன் அவற்றினூடாகப் பயணிக்கும் மக்களின் பாதுகாப்பை உறுதி செய்வது அமைச்சின் பொறுப்பு என்பதையும்;

அவர் ஏற்றுக்கொள்ளவாரா?

(ஆ) ஆமெனில், மேற்படி பிரச்சினை தொடர்பில் வழங்கப்படும் தீர்வுகள் யாவை என்பதை அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he admit that -

(i) the railway crossings on the section from Vavuniya to Killinochchi of the Northern Railway Line have become so dilapidated that they have become almost unusable;

(ii) the railway crossings in the Puliyankulam area in Vavuniya in particular are the most severely dilapidated; and

(iii) as many railway crossings have become unsafe, it is the responsibility of the Ministry to ensure the safety of the people who pass through such railway crossings?

(b) If so, will he inform this House of the solutions that will be provided in this regard?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අබලන් තත්ත්වයට පත්ව ඇත්තේ අනවසරයෙන් ඉදිකර ඇති හරස් මාර්ග වන අතර, එම දුම්රිය හරස් මාර්ග සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතු බවට හඳුනාගෙන ඇත.

ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග භාවිතය සඳහා සුදුසු තත්ත්වයේ පවතී.

(ii) වවුනියාවේ සිට පූලියන්කුලම දක්වා ඇති හරස් මාර්ග 14න් 12ක් අනවසරයෙන් ඉදිකර ඇත. දුම්රිය හරස් මාර්ග 2ක් පමණක් ශ්‍රී ලංකා පොලීසිය මඟින් පාලනය කරනු ලබයි.

වවුනියාව හා පූලියන්කුලම අතර ඇති අනවසර දුම්රිය හරස් මාර්ග ඉවත් කළ යුතුව ඇති බැවින් දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු කිරීම සිදු කරනු නොලැබේ. තවද, එම අනවසර දුම්රිය හරස් මාර්ග ප්‍රදේශවාසීන් විසින් ගල්, බොරලු දමා සකසාගෙන ඇති බව නිරීක්ෂණය වේ.

(iii) අනවසර දුම්රිය හරස් මාර්ග සම්බන්ධව දුම්රිය දෙපාර්තමේන්තුවට වගකීමක් දැරිය නොහැක.

(ආ) මහව - ඕමන්ත දුම්රිය ව්‍යාපෘතිය මඟින් දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීමත් සමඟ දුම්රිය පැයට කිලෝමීටර සියයක - 100 Km/h - පමණ වේගයකින් ධාවනය වන අතර, අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග පිහිටා තිබීම හේතුවෙන් අදාළ වේගය පවත්වා ගැනීමට නොහැකි බැවින් එම අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග ඉවත් කළ යුතුව ඇත.

නමුත්, ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම අත්‍යවශ්‍ය වන බැවින් දුම්රිය මාර්ග රක්ෂිතයේ සිට ආසන්නතම ආරක්ෂිත දුම්රිය හරස් මාර්ගය දක්වා සමාන්තර මාර්ග ලබා දීම සඳහා අධ්‍යයනය කර සුදුසු පරිදි ක්‍රියා කළ හැක. ඒ අනුව අදාළ පළාත් පාලන ආයතන විසින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කරන්නේ නම්, බදුකරයකට හා කොන්දේසිවලට යටත්ව දුම්රිය රක්ෂිතයේ සිට දුම්රිය මාර්ගයට සමාන්තරව මාර්ග ලබා දීමේ හැකියාවක් පවතී.

තවද, අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග පිහිටි ස්ථාන සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය හෝ විවිධ පළාත් පාලන ආයතන හා එක්ව ගුවන් පාලම් ඉදිකිරීම වැනි විකල්ප ක්‍රම ක්‍රියාත්මක කිරීමද යෝග්‍ය වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ அமைச்சர் அவர்களே, பதிலளித்தமைக்கு நன்றி!

யுத்தம் முடிவடைந்து வடக்குக்கான புகையிரதப் பாதை அமைக்கின்றபோது, இந்தப் புகையிரதக் கடவைகளில் பெரும்பாலானவை அமைந்துள்ள பிரதேசங்களிலே மக்கள் மீள்குடியேற்றப்பட்டிருக்கவில்லை. ஆனபடியால், நீண்ட காலமாக மக்கள் பாவித்த புகையிரதக் கடவைகள்கூட மூடப்பட்டிருக்கின்றன. அதற்கு ஓர் உதாரணம், ஓமந்தை புகையிரத நிலையத்தின் அருகில் 400 ஆண்டுகளுக்கும் மேற்பட்ட ஒரு பழைய பாதையில் அமைக்கப்பட்டுள்ள புகையிரதக் கடவை. அதனை நீங்களும் அறிந்திருப்பீர்கள். அந்த வகையில், என்னுடைய முதலாவது மேலதிக வினா:

இந்தப் பிரதேசங்களில் நீங்கள் சொன்னதைப்போல, உள்ளூராட்சித் திணைக்களமும் புகையிரதத் திணைக்களமும் பொதுமக்களோடு கலந்துரையாடி, அடையாளப்படுத்துகின்ற வீதிகளை இந்த வருட Budgetஇல் உங்களால் அமைத்துத்தர முடியுமா? அத்துடன், நீங்கள் சொல்லியவாறு இந்தப் புகையிரதப் பாதையுடன் சமாந்தரமாகப் பாதைகள் அமைப்பதற்கும் என்னுடைய விருப்பத்தைத் தெரிவித்துக் கொள்கின்றேன். இப்படியான செயற்பாடுகளைச் செய்து அந்த மக்களுடைய பிரச்சினையைக் காலம் தாழ்த்தாமல் உடனடியாகத் தீர்க்க முடியுமா?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, දුම්රිය හරස් මාර්ග පිළිබඳ මේ ප්‍රශ්නය උතුරු දුම්රිය මාර්ගයට විශේෂිතවත්, දකුණු දුම්රිය මාර්ගය ඇතුළු අනෙක් ප්‍රදේශවලත් තිබෙන ගැටලුවක්. උතුරු දුම්රිය මාර්ගයේ තිබෙන ගැටලුව තමයි, යුද්ධය පැවැති කාලයේදී එම ප්‍රදේශවල දුම්රිය මාර්ග හරියාකාරව ප්‍රතිසංස්කරණය නොවීම. මොකද, ජනතාව හිටියෙත් නැහැ. දුම්රිය ධාවනය නොවුණු නිසා මිනිසුන් ඒ හිටපු හිටපු විදියට ඒගොල්ලන්ගේ පහසුව සඳහා පාරවල් හදා ගත්තා.

අපට දකුණු දුම්රිය මාර්ගයේත් මේ ප්‍රශ්නය ඒ වාගේම තිබෙනවා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා නියෝජනය කරන ගාල්ලේත්, කළුතර වාගේ දිස්ත්‍රික්කවලත් දුම්රිය හරස් මාර්ග කිහිපයක් තිබෙන සමහර ග්‍රාම නිලධාරි වසම් තිබෙනවා, ගරු කථානායකතුමනි. එක ග්‍රාම නිලධාරි වසමක දුම්රිය හරස් මාර්ග කිහිපයක් තිබෙනවා. ඒ කියන්නේ, එකම ගමේ දුම්රිය මාර්ගය cross වනවා හරස් මාර්ග හතකින්, පහකින් හෝ තුනකින් වාගේ.

මේ ප්‍රශ්නය යුද්ධය පැවති ප්‍රදේශවලට විශේෂිතවත්, අනෙක් ප්‍රදේශවලටත් බලපානවා. ජනතාව තමන්ගේ පහසුව සඳහා පාර හදා ගන්න එක වැරැද්දක් නැහැ. ගරු කථානායකතුමනි, දුම්රිය මාර්ගය කියන්නේ අධිවේගී මාර්ගය වාගේ dedicated track එකක්. ඒක මැද්දෙන් නිතර වෙන වෙන හරස් මාර්ග ගියොත් කෝච්චියෙන් කරන වැඩේ කරන්න වෙන්නේ නැහැ. අපි expresswaysවල මැද්දෙන් හැම තැනින්ම හරස් මාර්ග තිබ්බොත් ඒවා expressways වෙන්නේ නැහැ. ඒවා ජනතාවගේ පහසුව සඳහාම තමයි තිබෙන්නේ. ජනතාවටත් අවශ්‍ය වෙනවා සමහරවිට කොළඹ ඉඳලා ඉක්මනින් ඕමන්තයට, වවුනියාවට යන්න. හැබැයි දුම්රිය මාර්ගය මැද්දෙන් ගොඩක් හරස් මාර්ග ආවොත් ඒක කරන්න බැරි වෙනවා. ඒ නිසා මේකේ තෝරා ගැනීමක් තමයි කවදා වුණත් කරන්න වෙන්නේ.

මට කෙටියෙන් කියන්න තිබෙන මූලික අදහස මේකයි. මේකට තිබෙන යම් උත්තරයක් තමයි සමාන්තර මාර්ග හදන එක. ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඒක අදාළ පළාත් පාලන ආයතනය දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලන්න ඕනෑ දෙයක්. දුම්රිය දෙපාර්තමේන්තුව සමාන්තර මාර්ග හදන්න බැඳිලා නැහැ. නමුත් ඒගොල්ලන්ගේ ඉඩම් තිබෙන නිසා ඒගොල්ලන්ට දෙන්න පුළුවන්. සමාන්තර මාර්ග අවශ්‍ය තැන්වලට ඉල්ලන්න, සමාන්තර මාර්ග හදන්න දුම්රිය දෙපාර්තමේන්තුව උනන්දු කරන්න කියලා පළාත් පාලන ආයතනවලින් අපි ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රීතුමනි, මට ප්‍රශ්නය තේරුණා. මම ඕමන්තයේ හරස් පාරවල්වල ගිහිල්ලාත් තිබෙනවා. නමුත් ඒක තමයි කරන්න වෙන්නේ. සමාන්තර මාර්ග තමයි යම් ප්‍රමාණයකට උත්තරය වෙන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! உங்களுடைய பதிலில் கூறப்பட்ட ஒரு விடயத்தைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். நீங்கள் சொல்வதைப்போல் அதிவேகப் புகையிரதங்கள் செல்லுகின்றபோது அடிக்கடி இந்தப் பாதைகளை மூட முடியாது. ஆனால், நான் கேட்பது என்னவென்றால், மக்களுடைய சம்மதம் இல்லாமல் அவர்கள் மீள்குடியேறுவதற்கு முதல் நடந்த பிரச்சினைகளைத் தீர்ப்பதற்கு நீங்கள் சொல்வதைப்போல உள்ளூராட்சிச் சபைகளுடன் சேர்ந்து இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கு வழிசெய்யலாம்.

அதுபோல், இலங்கை முழுவதிலுமாக 7,500 ரூபாய் சம்பளத்திற்கு தற்காலிகமாக வேலைசெய்த 2,064 புகையிரதக் கடவைக் காப்பாளர்களுடைய சம்பளத்தை 100 வீதமாக, அதாவது இரண்டு மடங்காக அதிகரித்து 15,000 ரூபாய் கொடுப்பதற்கு இந்தப் பாதீட்டிலே ஏற்பாடு செய்திருக்கிறீர்கள். அது மிகவும் நல்ல விஷயம்; பாராட்டுகிறேன். குறித்த கடமையில் இருந்த பலர் இப்போது இறந்து விட்டார்கள்; 1,500 பேர் வரையில்தான்

[ගරු පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

இருக்கிறார்கள். ஆனால், அவர்களுக்கு ஒரு குறை இருக்கின்றது. அது என்னவென்றால், பொலிஸ் திணைக்களத்திற்குக்கீழ் இருக்கும்போது சில இடர்பாடுகளைத் தாங்கள் சந்திப்பதாக அவர்கள் பல தடவை சொல்லியிருக்கிறார்கள். கௌரவ பிரதமர் அவர்களுக்கும் அது சம்பந்தமாகக் கடிதம் எழுதியிருக்கிறார்கள். ஆகவே, என்னுடைய இரண்டாவது மேலதிக வினா என்னவென்றால், அவர்களை உங்களுடைய திணைக்களத்திற்குக்கீழ் கொண்டுவருவதற்கான வாய்ப்பு இருக்கிறதா? இந்தப் பாதீட்டிலே தற்காலிக, அமய அடிப்படையில் அல்லது தொண்டர்களாக வேலைசெய்தவர்களுக்கு நிரந்தர நியமனம் வழங்குவதாக ஒரு செய்தி சொல்லியிருக்கிறீர்கள். அதற்குள் இவர்களையும் உள்வாங்க முடியுமா? என்று நான் இந்த சந்தர்ப்பத்தில் கேட்கிறேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, දුම්රිය ගේට්ටු මුර කරන මහත්වරුන්ට මසකට ගෙවනු ලබන රුපියල් 7,500ක මුදල අපි මෙවර අය වැයෙන් රුපියල් 15,000 දක්වා වැඩි කර තිබෙනවා. නමුත් එමඟින් අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල අනාරක්ෂිතභාවය සහමුලින්ම ඉවත් වෙනවා කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා ඒ සම්බන්ධව අපි දිගු කාලීන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා.

පසුගිය කාලයේ රාජ්‍ය සේවයට ස්ථිර නොවන විවිධ පදනම්වලින් පුද්ගලයන් බඳවා ගෙන තිබෙනවා. එයින් 9,800ක් පමණ ස්ථිර කරන්න රජය දැනට තීන්දු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, එසේ සමහර වෘත්තීන්වලට බඳවා ගැනීමේදී blanket cover එකක් හම්බ වෙන්නේ නැහැ.

සමහරු යම් යම් අවම අධ්‍යාපන සුදුසුකම් සමත් වී තිබිය යුතුයි. මම දුම්රිය ගේට්ටු මුරකරුවන් සම්බන්ධයෙන් නැතිව RDA එකේ කම්කරුවන් ගැන කියන්නම්. අපි ඒ හත්සිය ගණනකගේ පත්වීම් ස්ථිර කළා. තව තුන්සිය ගණනක් RDA එකේ ඉන්නවා. ගරු කථානායකතුමනි, ඔවුන් සාමාන්‍ය පෙළ විභාගයට ලියා තිබිය යුතුයි; එයින් සමත් වී නොවෙයි, අඩු ගණනේ sit කරලාවත් තිබිය යුතුයි. ලබන වසරේ පෙබරවාරි මාසයේ තිබෙන O/L විභාගයට ලිව්වාට පස්සේ තමයි සමහර අය ඒ සුදුසුකම ලබන්නේ. ගරු මන්ත්‍රීතුමනි, දුම්රිය ගේට්ටු මුරකරුවන්ටත් ඒ විධියට eligibility එකට අදාළ වන සමහර දේවල් තිබෙන්න පුළුවන්. මට මේ වෙලාවේ අධ්‍යයනයකින් තොරව කියන්න බැහැ, සියලුදෙනාම බඳවා ගන්නවා කියලා. නමුත් රජය පොදුවේ, දෙපාර්තමේන්තුවල සහ සංස්ථාවල රැකියාවේ නිරත ස්ථිර නොවන සහ අනියම් මට්ටමේ ඉන්න 10,000කට ආසන්න පිරිසක් ස්ථිර කරන්න කටයුතු කරනවා.

## සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව: වාර්ෂික ආදායම සහ වියදම
சிவில் பாதுகாப்புத் திணைக்களம்: வருடாந்த வருமானமும் செலவினமும்
CIVIL SECURITY DEPARTMENT: ANNUAL INCOME AND EXPENDITURE

1113/2025

**2.ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මේ වන විට සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා වැය කරනු ලබන මුළු වාර්ෂික වියදම කොපමණද;

(iii) එම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ව්‍යාපෘතිවලින් උපයන ලද වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிவில் பாதுகாப்புத் திணைக்களத்தில் தற்போது கடமையாற்றுகின்ற உத்தியோகத்தர்களின் எண்ணிக்கை மாவட்ட அடிப்படையில் வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) சிவில் பாதுகாப்புத் திணைக்களத்திற்குச் செலவிடப்படுகின்ற ஆண்டுக்கான மொத்தச் செலவினம் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி திணைக்களத்தினால் முன்னெடுக்கப்படுகின்ற விசேட கருத்திட்டங்கள்மூலம் ஈட்டப்படுகின்ற ஆண்டுக்குரிய வருமானம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House the -

(i) number of officers currently serving in the Civil Security Department, separately in each district;

(ii) total annual expenditure incurred by the Civil Security Department; and

(iii) annual income earned from the special projects implemented by the Department concerned?

(b) If not, why ?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| අනු අංකය | දිස්ත්‍රික්කය | පළාත | අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂක සාමාජික/ සාමාජිකාවන් ප්‍රමාණය | | එකතුව |
|---|---|---|---|---|---|
| | | | නිලධාරි | සෙසු නිල | |
| 1 | යාපනය | උතුරු | 0 | 56 | 56 |
| 2 | මන්නාරම | | 0 | 0 | 0 |
| 3 | මුලතිව් | | 2 | 1392 | 1394 |
| 4 | වවුනියාව | | 2 | 995 | 997 |
| 5 | කිලිනොච්චිය | | 1 | 1857 | 1858 |
| 6 | අනුරාධපුරය | උතුරු මැද | 14 | 7086 | 7100 |
| 7 | පොළොන්නරුව | | 2 | 2770 | 2772 |
| 8 | මොනරාගල | ඌව | 5 | 2,807 | 2,812 |
| 9 | බදුල්ල | | 0 | 350 | 350 |
| 10 | හම්බන්තොට | දකුණු | 0 | 473 | 473 |
| 11 | ගාල්ල | | 0 | 87 | 87 |
| 12 | මාතර | | 0 | 116 | 116 |
| 13 | අම්පාර | නැඟෙනහිර | 7 | 5,070 | 5,077 |
| 14 | මඩකලපුව | | 0 | 269 | 269 |
| 15 | ත්‍රිකුණාමලය | | 3 | 4,190 | 4,193 |
| 16 | කොළඹ | බස්නාහිර | 10 | 815 | 825 |
| 17 | ගම්පහ | | 1 | 517 | 518 |
| 18 | කළුතර | | 1 | 422 | 423 |
| 19 | මහනුවර | මධ්‍යම | 1 | 702 | 703 |
| 20 | මාතලේ | | 0 | 114 | 114 |
| 21 | නුවරඑළිය | | 0 | 0 | 0 |
| 22 | කුරුණෑගල | වයඹ | 1 | 244 | 245 |
| 23 | පුත්තලම | | 1 | 637 | 638 |
| 24 | රත්නපුර | සබරගමුව | 2 | 291 | 293 |
| 25 | කෑගල්ල | | 1 | 108 | 109 |
| **එකතුව** | | | **54** | **31,368** | **31,422** |

(ii)

| වියදම | 2024 වර්ෂය | | 2025.01.01 සිට 2025.10.31 දක්වා | |
|---|---|---|---|---|
| | ජාතික අය වැය දෙපාර්තමේන්තුව ලබා දුන් ප්‍රතිපාදන (රුපියල් මිලියන) | සත්‍ය වියදම (රුපියල් මිලියන) | ජාතික අය වැය දෙපාර්තමේන්තුව ලබා දුන් ප්‍රතිපාදන (රුපියල් මිලියන) | සත්‍ය වියදම (රුපියල් මිලියන) |
| පුද්ගල පඩි නඩි සඳහා | 20,734.21 | 20,646.36 | 21,452.00 | 18,976.01 |
| වෙනත් පුනරාවර්තන | 794.00 | 604.93 | 821.00 | 494.34 |
| මූලධන | 252.00 | 115.41 | 157.00 | 38.53 |
| **මුළු වියදම** | **21,780.21** | **21,366.70** | **22,430.00** | **19,508.88** |

(iii)

| ආදායම | 2024 වර්ෂයේ ආදායම (රුපියල් මිලියන) | 2025.01.01 සිට 2025.10.31 දක්වා ආදායම (රුපියල් මිලියන) |
|---|---|---|
| <u>ව්‍යාපෘති ආදායම්</u> කෘෂි, ගඩොල්, සත්ව, වෙනත් | 1363.18 | 324.25 |
| නර්තන හා සංගීත ආදායම් | 1.61 | 7.93 |
| ආරක්ෂණ සේවා ආදායම් | 638.3 | 556.47 |
| නඩත්තු සේවා | 79.87 | 37.51 |
| ඉදිකිරීම් සේවා | 27.09 | 7.40 |
| විවිධ ආදායම් (පුවත් පත්/වෙනත්) | 63.29 | 4.03 |
| ආරක්ෂණ සේවා පුහුණු | 0.39 | 0.06 |
| **එකතුව** | **2,173.73** | **937.65** |

(ආ) පැන නොනඟී.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මේ වන විට මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත් කර තිබෙනවා. ඒ වාගේම ඔබතුමා සඳහන් කළ දත්තවලට අනුවත් සිවිල් ආරක්ෂක

[ගරු රොෂාන් අක්මීමන මහතා]

නිලධාරින්ගෙන් විශාල පිරිසක් උතුරු මැද සහ නැඟෙනහිර පළාත්වල සේවය කරන අය. නමුත්, යුද්ධයෙන් පසුව ගොඩක් නිලධාරින්ව ඒ ප්‍රදේශවලින් පිටතට, විශේෂයෙන් බස්නාහිර පළාතට විශේෂ රාජකාරි සඳහා කියා කැඳවනවා. එතකොට ඔවුන්ට ගොඩක් වෙලාවට කරන්න සිදු වන්නේ බස්නාහිර පළාතේ සිදු කරන සනීපාරක්ෂක කටයුතු සහ එවකට තිබුණු දේශපාලන සම්බන්ධකම් අනුව විවිධ ආගමික ස්ථානවල සේවය කිරීමයි. අපට හම්බ වෙන සමහර නිලධාරින් මධ්‍යම පළාතේ විශේෂ ආගමික ස්ථානවලට අයිති වතුවල පවා වැඩ කරනවා.

ගරු ඇමතිතුමනි, මේ බොහෝ නිලධාරින් තමන් ජීවත් වන ප්‍රදේශවලම සේවය කිරීමේ බලාපොරොත්තුවෙන් ඒ දෙපාර්තමේන්තුවට බැඳුණු අය. මොකද, බොහෝ විට ඔවුන් ගොවියෝ. ඒ වාගේම අමතර රැකියාවක් විධියට ගොවිතැන් කරන අයත් ඉන්නවා. නමුත්, මේ විශේෂ රාජකාරි නිසා කාලයක් තිස්සේ ඔවුන් විශාල පීඩාවකට පත් වෙලා තිබෙනවා. මොකද, ඔවුන්ට කොළඹට ඇවිල්ලා ඉන්න තැනක් නැහැ, අතින් වියදම් කරගෙනයි එන්නේ. එහෙම ආවාම තමන්ගේ ගොවි බිම් පාළු වෙනවා, ඒවා කර ගන්න විධියක් නැහැ. ඉතින් මේ විශේෂ රාජකාරි නිසා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් විශාල පීඩාවකට පත් වෙලා ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ඉදිරියේදී මෙන්න මේ විශේෂ රාජකාරි සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන පියවර මොකක්ද, ඒ සම්බන්ධයෙන් යම් නිදහස් කිරීමක් සිද්ධ වේද කියන එක මා දැනගන්න කැමැතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු මන්ත්‍රීතුමනි, ගිය සතියේ තමයි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත් වුණේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අලි-මිනිස් ගැටුම සමනය කිරීම සඳහා යොදා ගන්න දැනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කරන 5,000ක පමණ පිරිසක් නිදහස් කිරීමට කටයුතු කරමින් ඉන්නවා. ඒ අනුව මේ වෙනකොටත් 3,975ක පිරිසක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට නිදහස් කරලා තිබෙනවා. ඔබතුමා කිව්ව කාරණය ගත්තාම, හුඟක් වෙලාවට මේ අය සේවයේ යොදවා තිබෙන්නේ මම කියපු දිස්ත්‍රික්කවලට ආසන්න රාජකාරි ස්ථානවල. ඔබතුමා කිව්ව කාරණය පිළිබඳව මා නැවත සොයා බලන්නම්. පසුගිය කාලයේ අපි බලයට පත්වීමට පෙරාතුව විවිධ දේවල්වලට මේ පිරිස යොදාගෙන තිබුණත්, අපි දැන් ක්‍රම ක්‍රමයෙන් ඒ පිරිස එම ස්ථානවලින් ඉවත් කරලා, විධිමත් ක්‍රමවේදයක් යටතේ ඔවුන් රාජකාරි සඳහා යොදවනවා. ඒ විතරක් නොවෙයි. ඔබතුමා කිව්ව කාරණය පිළිබඳ අවධානය යොමු කරමින් ළඟම සේවා ස්ථානය ඔවුන්ට ලබා දීමට අපි කටයුතු කරමින් ඉන්නවා. මේ පිළිබඳව තවදුරටත් මා සොයා බැලීමක් කරන්නම්.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂ රාජකාරි එක් එක් දිස්ත්‍රික්කවලත් ක්‍රියාත්මක වෙනවා. හැබැයි, ඒ දිස්ත්‍රික්කවලින් පිටතටත් ඔවුන්ව ගෙන්වනවා.

එතැනදී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ කිසිදු විරුද්ධත්වයක් නැහැ, ඒ දිස්ත්‍රික්කවල කටයුතු කරන්න. නමුත්, දිස්ත්‍රික්කයෙන් පිටතට යන්න සිදු වන අවස්ථාවලදී තමයි ගොඩක් වෙලාවට ඔවුන්ට ඔය අපහසුතාවට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ.

දැන් මේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීමේ ක්‍රියාවලිය අවසන් වුණාට පසුව එතැනිනුත් ඉතුරු වන යම් සිවිල් ආරක්ෂක නිලධාරින් ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන් සම්බන්ධයෙන් ඊළඟට ගන්න පියවර මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

විශේෂයෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 10,000ක පිරිසක් පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා යොදවන්නත්, ඒ සඳහා ඔවුන්ට විශේෂ දීමනාවක් ලබා දෙන්නත්, ඒ වාගේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට 5,000ක පිරිසක් අනුයුක්ත කරලා, ඔවුන් ඒ සේවා සඳහා යොදවන්නත්, ඉතිරි අයට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේම දැනට කරගෙන යන රාජකාරි ඉදිරියට කරගෙන යන්නත් අවස්ථාව සලසනවා. ඒ වාගේම මේක විධිමත් දෙපාර්තමේන්තුවක් හැටියට ස්ථාපිත කරලා, ඔවුන්ට වඩා වැඩි පහසුකම් ලැබෙන පරිදිත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ පොලිස් දෙපාර්තමේන්තුවට නිදහස් කරන පිරිසට අනාගත රැකියා සුරක්ෂිතභාවය ලැබෙන පරිදි සහ ඔවුන්ට වඩා වැඩි පහසුකම් ලැබෙන ක්‍රමවේදයකට ඔවුන්ව අනුයුක්ත කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -1221/2025- (1), ගරු සුරංග රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -1269/2025- (1), ගරු තුරෛරාසා රවිකරන් මහතා.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்தக் கேள்வியைக் கேட்கிறேன்.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -1304/2025- (1), ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## කලාවැව දුම්රිය ස්ථානය: ආසන වෙන් කිරීමේ පහසුකම

கலாவெவ புகையிரத நிலையம்: ஆசனப் பதிவு வசதி

KALAWEWA RAILWAY STATION: SEAT RESERVATION FACILITY

1221/2025

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සුරංග රත්නායක මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சுரங்க ரத்நாயக்க சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Suranga Rathnayaka)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කලාවැව දුම්රිය ස්ථානය, ශ්‍රී ලංකාවේ පැරණිතම දුම්රිය ස්ථානයක් බවත්;

(ii) කලාවැව, අවුකන බුදු පිළිමය, කඩවර දේවාලය, විජිතපුර රජමහා විහාරය, දුටුගැමුණු මහා විහාරය සහ චාමරගල රජමහා විහාරය වැනි ප්‍රසිද්ධ ස්ථානයන් නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන් විශාල ප්‍රමාණයක් එම දුම්රිය ස්ථානය භාවිත කරන බවත්;

(iii) එහෙත්, එහි දුම්රිය ආසන වෙන් කිරීමේ පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එසේ නම්, එම දුම්රිය ස්ථානයට ආසන වෙන් කිරීමේ පහසුකම් ලබා දිය හැකිද;

(ii) එසේ නම්, එම පහසුකම් ලබා දෙන දිනය කවරේද;

(iii) එම දුම්රිය ස්ථානයට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් - ATM - ලබා දිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கலாவெவ புகையிரத நிலையம், இலங்கையின் மிகப் பழைமையானதொரு புகையிரத நிலையம் என்பதையும்;

(ii) கலாவெவ வாவி, அவுக்கண புத்தர் சிலை, கடவர கோவில், விஜித்தபுர ரஜ மஹா விஹாரை, துட்டகைமுனு மஹா விஹாரை மற்றும் சாமரகல ரஜ மஹா விஹாரை போன்ற பிரசித்தி பெற்ற இடங்களைப் பார்வையிடுவதற்கு வருகை தருகின்ற பெருமளவிலான உள்நாட்டு மற்றும் வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகள் மேற்படி புகையிரத நிலையத்தைப் பயன்படுத்துகின்றார்கள் என்பதையும்;

(iii) ஆயினும், அங்கு புகையிரத ஆசனப் பதிவு வசதிகள் காணப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஆமெனில், மேற்படி புகையிரத நிலையத்துக்கு ஆசனப் பதிவு வசதிகளை வழங்க முடியுமா என்பதையும்;

(ii) ஆமெனில், அந்த வசதிகள் வழங்கப்படும் திகதி யாது என்பதையும்;

(iii) மேற்படி புகையிரத நிலையத்துக்குத் தானியங்கி பணம் வழங்கும் இயந்திரமொன்றை -ATM- வழங்க முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Is he aware that -

(i) the Kalawewa Railway Station is one of the oldest railway stations in Sri Lanka;

(ii) a large number of both local and foreign tourists visiting famous destinations such as the Kalawewa Tank, Awukana Buddha Statue, Kadawara Dewala, Vijithapura Rajamaha Vihara, Dutugemunu Maha Vihara, and Chamaragala Rajamaha Vihara use the railway station concerned; and

(iii) nevertheless, train seat reservation facilities are not available there?

(b) Will he inform this House -

(i) if so, whether arrangements could be made to provide seat reservation facilities at that railway station;

(i) if so, the date on which those facilities will be made available; and

(iii) whether arrangements could be made to install an Automated Teller Machine - ATM - at that railway station?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**

(மாண்புமிகு பிமல் ரத்நாயக்க)

(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) කලාවැව දුම්රිය ස්ථානය, ශ්‍රී ලංකාවේ පැරණිතම දුම්රිය ස්ථානයකි.

(ii) දේශීය හා විදේශීය සංචාරකයන් විශාල ප්‍රමාණයක් කලාවැව දුම්රිය ස්ථානය භාවිත කරනු ලැබේ.

(iii) ඔව්.

(ආ) (i) ඉදිරියේදී කලාවැව දුම්රිය ස්ථානයට ආසන වෙන් කිරීමේ පහසුකම් ලබා දිය හැක.

(ii) මේ වනවිට මොබිටෙල් ආයතනය හා එක්ව දුම්රිය ආසන වෙන් කිරීමේ පහසුකම අන්තර්ජාලය මඟින් දුම්රිය ස්ථාන 50කට ලබා දී ඇත. ඒ අනුව මඟීන්ට අදාළ දුම්රිය ස්ථානයට ගොස් හෝ අන්තර්ජාලය හරහා ආසන වෙන් කර ගැනීමට හැක.

දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් සියලු සාමාන්‍ය ප්‍රවේශපත්‍ර හා වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම ආදිය ඇතුළත් නව ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.

ඒ අනුව එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී කලාවැව දුම්රිය ස්ථානයට මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ආසන වෙන් කිරීමේ පහසුකම් ලබා දිය හැක.

(iii) දුම්රිය ස්ථානයන්හි ATM යන්ත්‍ර ස්ථාපිත කිරීම අදාළ බැංකුවල ඉල්ලීම මත සිදු කෙරේ. ඒ අනුව දුම්රිය ස්ථානවල පාලන කටයුතුවලට බාධාවක් නොවන පරිදි අදාළ උප දෙපාර්තමේන්තු නිර්දේශ ද සහිතව භූමි පරිශ්‍රයක් ලබා දීම දුම්රිය දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

එසේ වුවද එම ඉල්ලීම ඉදිරිපත් කිරීමට ප්‍රථම අදාළ බැංකුව විසින් මහ බැංකුවේ සහ අදාළ ATM යන්ත්‍රය ස්ථාපිත කිරීමට යෝජිත ස්ථානයට අයත් පොලිස් ස්ථානවල

[ගරු බිමල් රත්නායක මහතා]

අනුමැතිය ලබා ගැනීම වැනි අවශ්‍යතා කිහිපයක් සම්පූර්ණ කළ යුතු අතර, එම අනුමැතිය ලබා ගැනීමේ වගකීම අදාළ බැංකුව සතු වේ.

ඒ අනුව කලාවැව දුම්රිය ස්ථානයේ ATM යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා යම්කිසි බැංකුවකින්/බැංකුවලින් ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් ඒ අනුව ක්‍රියා කළ හැකිය.

(ඇ) අදාළ නොවේ.

## මාතර දිස්ත්‍රික්කයේ i-Road ව්‍යාපෘතිය: ග්‍රාමීය මාර්ග සංවර්ධනය

### மாத்தறை மாவட்டத்தில் i-Road கருத்திட்டம்: கிராமிய வீதி அபிவிருத்தி

### I-ROAD PROJECT IN MATARA DISTRICT: DEVELOPMENT OF RURAL ROADS

1304/2025

**5. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ - மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. (Prof.) L.M. Abeywickrama)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියේ `i-Road' ව්‍යාපෘතිය යටතේ මාතර දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කිරීම ආරම්භ කරන ලද ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව සහ ඒවායේ දුර කිලෝමීටරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මාර්ග අතරින් මේ වනවිට සංවර්ධන කටයුතු අවසන් කර ඇති මාර්ග සංඛ්‍යාව සහ සංවර්ධන කටයුතු ආරම්භ කර අතරමඟ නතර කර ඇති මාර්ග සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සංවර්ධන කටයුතු අතරමඟ නතර කර දැමීම හේතුවෙන් ගමනාගමනය ඉතා අසීරු වී ඇති මාර්ගවල සංවර්ධන කටයුතු අවසන් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வீதி அபிவிருத்தி அதிகாரசபையின் 'i-Road' கருத்திட்டத்தின்கீழ், மாத்தறை மாவட்டத்தில் அபிவிருத்தி நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்ட கிராமிய வீதிகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் நீளம் கிலோமீற்றரில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) அந்த வீதிகளில், தற்போது அபிவிருத்திப் பணிகள் நிறைவு செய்யப்பட்டுள்ள வீதிகளின் எண்ணிக்கை மற்றும் அபிவிருத்திப் பணிகள் ஆரம்பிக்கப்பட்டு இடைநடுவே நிறுத்தப்பட்டுள்ள வீதிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) அபிவிருத்திப் பணிகள் ஆரம்பிக்கப்பட்டு இடைநடுவே நிறுத்தப்பட்டுள்ள காரணத்தினால் போக்குவரத்து மிகச் சிரமமாகியுள்ள வீதிகளின் அபிவிருத்திப் பணிகளை நிறைவுசெய்ய மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the number of rural roads in the Matara District, of which development has been initiated under the i-Road Project of the Road Development Authority and the distance of the said roads in kilometres, separately;

(ii) out of the said roads, the number of those of which development work has been completed by now and the number of those of which development work has been commenced, but stopped halfway, separately; and

(iii) the steps that will be taken to complete the development work of the roads on which transportation has become very difficult as the development work has been stopped halfway?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

* මාතර දිස්ත්‍රික්කය තුළ M01, M02 හා M03 ලෙස කොන්ත්‍රාත් පැකේජයන් 03ක් යටතේ සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද සමස්ත ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව 66කි.

* එම මාර්ගයන්හි දුර ප්‍රමාණයන් පහත පරිදි වේ.

| පැකේජය | සංවර්ධනය කිරීමට සැලසුම් කළ දිග ප්‍රමාණය (Km) | සංවර්ධනය කිරීම ආරම්භ කරන ලද ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව |
|---|---|---|
| M01 | 98.09 | 22 |
| M02 | 68.17 | 19 |
| M03 | 53.53 | 25 |
| **එකතුව** | **219.79** | **66** |

මෙම මාර්ග 66හි දුර වෙන වෙනම ඇමුණුමෙහි සඳහන් කර ඇත.

ඇමුණුම 01

## Integrated Road Investment Program - Matara District
## Roadwise Progress

| District | RDA/ PRDA/ PS/MC | Road ID | Road Name | Actual Length (km) | Asphalted Length (Km) | Asphalt Progress (%) | Overall Progress 31.12.2024 (%) | Commencement Date | Completion Date | Date of PBM starting | Date of Ending PBM |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Package No. M 01 | | | | | | | | | | | |
| Matara | PS | 2.8 | Alapaladeniya – Thalpekumbura | 2.52 | 2.52 | 100.00 | 100.00 | 18.05.2015 | 06.12.2017 | 07.12.2017 | 06.12.2020 |
| Matara | PS | 2.9 | Dangala – Dellawa | 2.38 | 2.38 | 100.00 | 100.00 | 18.05.2015 | 05.02.2018 | 02.02.2018 | 01.02.2021 |
| Matara | PS | 2.10 | Morawaka – Millawa | 2.90 | 2.90 | 100.00 | 100.00 | 18.05.2015 | 13.10.2017 | 14.10.2017 | 13.10.2020 |
| Matara | PS | 2.10A | Abewela - Thibbatuwawa | 4.90 | 4.90 | 100.00 | 100.00 | 18.05.2015 | 05.02.2018 | 02.02.2018 | 01.02.2021 |
| Matara | PS | 2.11 | Millagaha hena-Kudagala hena | 4.40 | 4.40 | 100.00 | 100.00 | 18.05.2015 | 30.11.2017 | 01.12.2017 | 30.11.2020 |
| Matara | PS | 2.12 | Darangala-Dahaya Kanda Mahena | 3.80 | 3.80 | 100.00 | 100.00 | 18.05.2015 | 04.01.2018 | 05.01.2018 | 04.01.2021 |
| Matara | PS | 2.13 | Batayaya – Kandilpana – Bewraliiya | 13.06 | 13.06 | 100.00 | 100.00 | 18.05.2015 | 31.07.2018 | 01.08.2018 | 31.07.2021 |
| Matara | PS | 2.14 | Morawaka-Paragala Diyadawa | 11.70 | 11.70 | 100.00 | 100.00 | 18.05.2015 | 30.11.2017 | 01.12.2017 | 30.11.2020 |
| Matara | PRDA | 2.15 | Berala Panathara-Thala Palakanda | 6.10 | 6.10 | 100.00 | 100.00 | 18.05.2015 | 22.03.2018 | 23.03.2018 | 22.03.2021 |
| Matara | PS | 2.16 | Kosmodara-Bodeniya | 4.12 | 4.12 | 100.00 | 100.00 | 18.05.2015 | 04.05.2018 | 05.05.2018 | 04.05.2021 |
| Matara | PS | 2.17 | Pathawala-Nadakanda- Keeriwellagama | 2.82 | 2.82 | 100.00 | 100.00 | 18.05.2015 | 22.03.2018 | 23.03.2018 | 22.03.2021 |
| Matara | PS | 2.18 | Kiriwellagama Market to Dewala Road | 1.02 | 1.02 | 100.00 | 100.00 | 18.05.2015 | 01.02.2018 | 02.02.2018 | 01.02.2021 |
| Matara | PS | 2.19 | Kiriwalladola junction to Hingurahena | 2.10 | 2.10 | 100.00 | 100.00 | 18.05.2015 | 30.11.2017 | 01.12.2017 | 30.11.2020 |
| Matara | PS | 2.20 | Keeriwaldola– Keeriwelgama | 2.29 | 2.29 | 100.00 | 100.00 | 18.05.2015 | 01.02.2018 | 02.02.2018 | 01.02.2021 |
| Matara | PS | 2.21 | Porupitiya Annasigalawila | 1.40 | 1.40 | 100.00 | 100.00 | 18.05.2015 | 28.02.2017 | 01.03.2017 | 29.02.2020 |
| Matara | PS | 2.22 | Millalle via Aluwana Sankassa to Madde Ala Rd | 6.95 | 6.95 | 100.00 | 100.00 | 18.05.2015 | 22.03.2018 | 23.03.2018 | 22.03.2021 |
| Matara | PS | 2.23 | Weliwa Pahuruthota - Neel Ella | 4.51 | 4.51 | 100.00 | 100.00 | 18.05.2015 | 22.03.2018 | 23.03.2018 | 22.03.2021 |
| Matara | PS | 2.24 | Bengamuwa-Dabogala Road up to Napath Ella | 3.20 | 3.20 | 100.00 | 100.00 | 18.05.2015 | 28.02.2017 | 01.03.2017 | 29.02.2020 |
| Matara | RDA | 2.24A | Deniyaya - Viharahena | 6.30 | 6.30 | 100.00 | 100.00 | 18.05.2015 | 04.05.2018 | 05.05.2018 | 04.05.2021 |
| Matara | PS | 2.64 | Diyadawa-Olakumbura via Kosmodara | 2.52 | 2.52 | 100.00 | 100.00 | 18.05.2015 | 06.12.2017 | 07.12.2017 | 06.12.2020 |
| Matara | PS | 2.65 | Diyadawa - Bata Adura | 7.50 | 7.50 | 100.00 | 100.00 | 18.05.2015 | 06.12.2017 | 07.12.2017 | 06.12.2020 |
| Matara | PS | 2.66 | Kolawenigama- Uggalpotha | 1.60 | 1.60 | 100.00 | 100.00 | 18.05.2015 | 13.10.2017 | 14.10.2017 | 13.10.2020 |
| | | | | **98.09** | **98.09** | | | | | | |

## Integrated Road Investment Program - Matara District
## Roadwise Progress

| District | RDA/ PRDA/ PS/MC | Road ID | Road Name | Actual Length (km) | Asphalted Length (Km) | Asphalt Progress (%) | Overall Progress 31.12.2024 (%) | Commencement Date | Completion Date | Date of PBM starting | Date of Ending PBM |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Package No. M 02 | | | | | | | | | | | |
| Matara | PS | 2.1 | Kohugoda Road | 5.53 | 5.53 | 100.00 | 100.00 | 18.05.2015 | 29.10.2019 | 21.10.2019 | 20.10.2022 |
| Matara | PS | 2.2 | Poramba School – Diyalape Junction via Hikgoda | 3.68 | 3.68 | 100.00 | 100.00 | 18.05.2015 | 07.01.2019 | 08.01.2019 | 07.01.2022 |
| Matara | PS | 2.3 | Iluppella – Mahingoda- Bopitiya | 5.29 | 5.29 | 100.00 | 100.00 | 18.05.2015 | 25.03.2019 | 26.03.2019 | 25.03.2022 |
| Matara | RDA | 2.4 | Akuressa - Katanavila | 7.20 | 7.20 | 100.00 | 100.00 | 18.05.2015 | 31.07.2019 | 01.08.2019 | 31.07.2022 |
| Matara | PS | 2.5 | Paraduwa-Pahuranwila | 2.38 | 2.38 | 100.00 | 100.00 | 18.05.2015 | 25.10.2018 | 26.10.2018 | 25.10.2021 |
| Matara | PS | 2.6 | Bangama junction-Dola Mawatha | 2.57 | 2.57 | 100.00 | 100.00 | 18.05.2015 | 21.12.2018 | 22.12.2018 | 21.12.2021 |
| Matara | PS | 2.7 | Sri Sudarshi Pirivena Junction to Bibulewela Shramadana Road | 3.78 | 3.78 | 100.00 | 100.00 | 18.05.2015 | 07.01.2019 | 08.01.2019 | 07.01.2022 |
| Matara | PS | 2.40 | Urawa-Pilikannahena Thalgasthenna Rotuba | 2.56 | 2.56 | 100.00 | 100.00 | 18.05.2015 | 26.06.2019 | 27.06.2019 | 26.06.2022 |
| Matara | PS | 2.41 | Lew Pothdeniya | 2.73 | 2.73 | 100.00 | 100.00 | 18.05.2015 | 30.11.2018 | 01.12.2018 | 30.11.2021 |
| Matara | PS | 2.42 | Urubokka - Pothdeniya | 6.50 | 6.50 | 100.00 | 100.00 | 18.05.2015 | 19.01.2018 | 20.01.2018 | 19.01.2021 |
| Matara | PS | 2.49 | Atapattukanda Handiya-Pothuvila | 1.46 | 1.46 | 100.00 | 100.00 | 18.05.2015 | 10.04.2019 | 11.04.2019 | 10.04.2022 |
| Matara | PS | 2.50 | Wilpita-Ukgashena via Ransagoda Galpothta junction Keeriwellagama | 8.75 | 8.75 | 100.00 | 100.00 | 18.05.2015 | 22.02.2019 | 23.02.2019 | 22.02.2022 |
| Matara | PS | 2.51 | Agawaththa Thalgahagoda for Jayawardhana Mawtha(Wellithota Rd) | 1.07 | 1.07 | 100.00 | 100.00 | 18.05.2015 | 25.10.2018 | 26.10.2018 | 25.10.2021 |
| Matara | PS | 2.52 | Ogaspe junction to Maligatheuna Athtuduwa | 0.76 | 0.76 | 100.00 | 100.00 | 18.05.2015 | 25.10.2018 | 26.10.2018 | 25.10.2021 |
| Matara | PS | 2.53 | Pahattu Kade to Nagoda via Welihinda junction | 0.91 | 0.91 | 100.00 | 100.00 | 18.05.2015 | 05.02.2019 | 06.02.2019 | 05.02.2022 |
| Matara | PS | 2.55 | Sulthangoda-Welihinda | 1.30 | 1.30 | 100.00 | 100.00 | 18.05.2015 | 30.11.2018 | 01.12.2018 | 30.11.2021 |
| Matara | PS | 2.56 | Kongala D.C Abeywickrama Rd | 2.44 | 2.44 | 100.00 | 100.00 | 18.05.2015 | 28.06.2018 | 29.06.2018 | 28.06.2021 |
| Matara | PS | 2.57 | Obadakanda Badabadda Rd | 4.56 | 4.56 | 100.00 | 100.00 | 18.05.2015 | 17.10.2019 | 18.10.2019 | 17.10.2022 |
| Matara | PRDA | 2.57A | Thumbe - Kongala | 4.70 | 4.70 | 100.00 | 100.00 | 18.05.2015 | 17.10.2018 | 18.10.2018 | 17.10.2021 |
| | | | | **68.17** | **68.17** | | | | | | |

[ගරු බිමල් රත්නායක මහතා]

## Integrated Road Investment Program - Matara District
## Roadwise Progress

| District | RDA/ PRDA/ PS/MC | Road ID | Road Name | Actual Length (km) | Asphalted Length (Km) | Asphalt Progress (%) | Overall Progress 31.12.2024 (%) | Commencement Date | Completion Date | Date of PBM starting | Date of Ending PBM |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Package No. M 03 | | | | | | | | | | | |
| Matara | PS | 2.25 | Kananke-Polhene- Nagashena- Puhulhene Road | 2.08 | 2.08 | 100.00 | 100.00 | 18.05.2015 | 16.01.2018 | 17.01.2018 | 16.01.2021 |
| Matara | PS | 2.26 | Dehigahahena – Udukawa | 2.51 | 2.51 | 100.00 | 100.00 | 18.05.2015 | 16.08.2018 | 17.01.2018 | 16.01.2021 |
| Matara | PS | 2.27 | Denuwala - Kapuwatta Jaya wijayagama | 2.19 | 2.19 | 100.00 | 100.00 | 18.05.2015 | 06.04.2018 | 07.04.2018 | 06.04.2021 |
| Matara | PS | 2.28 | Yatipila – Udahahena – Henwala | 1.83 | 1.83 | 100.00 | 100.00 | 18.05.2015 | 28.02.2018 | 01.03.2018 | 28.02.2021 |
| Matara | PS | 2.29 | Udupila Junction – Udupila Vihandagoda – Bandaramulla | 1.33 | 1.33 | 100.00 | 100.00 | 18.05.2015 | 31.05.2018 | 01.06.2018 | 31.05.2021 |
| Matara | PS | 2.30 | Ibbawala-Panchaliya-Andugoda | 2.28 | 2.28 | 100.00 | 100.00 | 18.05.2015 | 20.10.2017 | 21.10.2017 | 20.10.2020 |
| Matara | PS | 2.31 | Ibbawala – Ranamaduuragama | 1.31 | 1.31 | 100.00 | 100.00 | 18.05.2015 | 28.02.2018 | 01.03.2018 | 28.02.2021 |
| Matara | PS | 2.32 | Welipitiya Junction – Addarawela | 2.26 | 2.26 | 100.00 | 100.00 | 18.05.2015 | 08.01.2018 | 09.01.2018 | 07.01.2021 |
| Matara | PS | 2.33 | Jaburegoda – Bodhirukkaramaya | 2.31 | 2.31 | 100.00 | 100.00 | 18.05.2015 | 22.01.2018 | 23.01.2018 | 22.01.2021 |
| Matara | PS | 2.34 | Pathegama - Kudalumulla for Kurubawila Pitaduwa Thdukola Gammadda | 2.28 | 2.28 | 100.00 | 100.00 | 18.05.2015 | 08.01.2018 | 09.01.2018 | 08.01.2021 |
| Matara | PS | 2.35 | Jamburagoda Heelelgoda junction-Bodduwa | 1.87 | 1.87 | 100.00 | 100.00 | 18.05.2015 | 08.01.2018 | 21.10.2017 | 20.10.2020 |
| Matara | PS | 2.36 | Kananke police Station Dewelagoda | 1.61 | 1.61 | 100.00 | 100.00 | 18.05.2015 | 22.01.2018 | 23.01.2018 | 22.01.2021 |
| Matara | PS | 2.37 | Kotavila Kudawella Sulthanagoda | 2.01 | 2.01 | 100.00 | 100.00 | 18.05.2015 | 28.02.2018 | 01.03.2018 | 28.02.2021 |
| Matara | PS | 2.38 | Udukawa Baduravila Rd | 1.35 | 1.35 | 100.00 | 100.00 | 18.05.2015 | 27.03.2018 | 28.03.2018 | 27.03.2021 |
| Matara | PS | 2.39 | Welipitiya junction-Munamalpe Udukawa | 2.47 | 2.47 | 100.00 | 100.00 | 18.05.2015 | 08.01.2018 | 09.01.2018 | 08.01.2021 |
| Matara | PS | 2.43 | Baragammulla Moragasmandiya | 1.75 | 1.75 | 100.00 | 100.00 | 18.05.2015 | 31.05.2018 | 01.06.2018 | 31.05.2021 |
| Matara | PS | 2.44 | Narangalgoda - Palliya Gedara | 2.34 | 2.34 | 100.00 | 100.00 | 18.05.2015 | 06.04.2018 | 07.04.2018 | 06.04.2021 |
| Matara | PS | 2.45 | 10th Mile Post-Hakmana Gedara Kade | 3.48 | 3.48 | 100.00 | 100.00 | 18.05.2015 | 31.05.2018 | 01.06.2018 | 31.05.2021 |
| Matara | PS | 2.46 | Karatota School-Gewal Dahaya | 2.48 | 2.48 | 100.00 | 100.00 | 18.05.2015 | 27.03.2018 | 28.03.2018 | 27.03.2021 |
| Matara | PS | 2.47 | Kubalgoda Seelarama Mawatha | 1.70 | 1.70 | 100.00 | 100.00 | 18.05.2015 | 22.01.2018 | 23.01.2018 | 22.01.2021 |
| Matara | PS | 2.48 | Samagimawtta via Siridewapriya mawatha | 2.75 | 2.75 | 100.00 | 100.00 | 18.05.2015 | 27.03.2018 | 28.03.2018 | 27.03.2021 |
| Matara | PS | 2.58 | Sri Piyarathana Mawtha (Kakuluwangoda-Mawatha) | 1.91 | 1.91 | 100.00 | 100.00 | 18.05.2015 | 22.01.2018 | 23.01.2021 | 22.01.2021 |
| Matara | PS | 2.59 | Ashokarama Rd | 1.77 | 1.77 | 100.00 | 100.00 | 18.05.2015 | 22.01.2018 | 23.01.2021 | 22.01.2021 |
| Matara | PS | 2.60 | Degigewatta Hakalamulla | 1.25 | 1.25 | 100.00 | 100.00 | 18.05.2015 | 02.03.2018 | 03.03.2018 | 02.03.2021 |
| Matara | PS | 2.61 | Kaluhena Kolaniya Rd | 4.41 | 4.41 | 100.00 | 100.00 | 18.05.2015 | 31.05.2018 | 01.06.2018 | 31.05.2021 |
| | | | | 53.53 | 53.53 | | | | | | |

(ii) මෙම මාර්ග 66ම සංවර්ධන කටයුතු අවසන් කර ඇත.

(iii) සංවර්ධන කටයුතු අතරමඟ නතර කර නොමැති බැවින් පැන නොනඟී.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026, දෙවන වර කියවීමේ විවාදය. දෙවන වෙන් කළ දිනය.

අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් වී නොමැති බැවින් 2025 සැප්තැම්බර් 11වන දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ තීරණය ප්‍රකාරව අපර භාග 6.00 සිට අපර භාග 6.30 දක්වා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විවාද කිරීමට වෙන් කර ඇති කාලය ද විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය සඳහා සභාවේ අවසරය ඇතිව යොදා ගන්නා බව දැනුම් දීමට කැමැත්තෙමි.

# විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.*

*ඊට අදාළ ප්‍රශ්නය - [නොවැම්බර් 07]*

*"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]*

*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 07]*

*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக" .- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]*

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [ 07th November]*

*"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]*

*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීම, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 9.52]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මේක වැදගත් අය වැය ප්‍රකාශයක්. මොකද, රට බංකොලොත් වෙලා, ජනතාවගේ ජීවන තත්ත්වය ඉතා පහළ තත්ත්වයකට වැටිලා, විශාල බලාපොරොත්තු තිබෙන අවස්ථාවක තමයි මාලිමා රජයට මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න සිදුවෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ජනතාව බලාපොරොත්තු වෙනවා, තමන්ගේ ජීවන තත්ත්වය උසස් කරගන්න; ණය ගෙවන්න තිබෙනවා නම් ඒ ණය ටික ගෙවා ගන්න; දරුවෙක් බන්දලා දෙන්න පුළුවන් නම් ඒක කර දෙන්න; කාර් එකක් ගන්න පුළුවන් නම් ඒක ගන්න; ගෙයක් ගන්න පුළුවන් නම් ඒක ගන්න. ආසියාවේ අනෙකුත් රටවල් -ඉන්දියාව වාගේ රටවල්- එහෙම වරප්‍රසාද ලබනකොට ලංකාවේ ජනතාවත් ඒ වාගේ විශාල බලාපොරොත්තු තබාගෙන ඉන්නවා.

ඇත්තටම මේ ආණ්ඩුවට මේ අවස්ථාව ලැබුණේ මෙන්න මේ නිසායි. මේ රට ඉතාම නරක විධියට බංකොලොත් වෙනකොට, පෙට්‍රල් නැතුව, ඩීසල් නැතුව, විදුලිය නැතුව, වතුර නැතුව ඉන්නකොට, මදුරුවෝ කනකොට ජනතාව විකල්පයක් හෙව්වා. ඒ විකල්පයට උත්තර දෙන්න අනුර කුමාර මහත්තයා ඇතුළු කණ්ඩායමට හැකියාව ලැබුණා. එතුමන්ලා ජනතාවට විශාල බලාපොරොත්තු ලබා දුන්නා. මීට කලින් තනිවම ආණ්ඩුවක් කර නැතත්, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ, චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුවලට එතුමන්ලා සහයෝගය ලබා දුන්නා. නමුත්, ඔවුන්ට බලය ලැබුණේ නැහැ. "අපට බලය ලැබුණොත් කරලා පෙන්වන්නම්" කියලා ඔවුන් පොරොන්දුවක් ලබා දුන්නා. ඒ පොරොන්දුව ජනතාව විශ්වාස කළා. යන යන තැන ජනතාව කිව්වේ, "දීලා බලමු" කියලා. උතුරට ගිහිල්ලා ඇහුවාම දෙමළ ජනතාවත් කිව්වේ, "குடுத்துப் பாப்போம்" කියලා. ඒ කියන්නේ, දීලා බලමු කියන එකයි. ඒක මට හොඳට පාඩම්. මම ජනතාවගෙන් ඇහුවා, දීලා බලලා සෑහීමකට පත් වෙන්න පුළුවන්ද, chance එකක් ගන්න පුළුවන්ද කියලා.

ගරු කථානායකතුමනි, අද ජනතාව ඒක භුක්ති විඳිනවා. මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය වෙතට. මම මේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව හොඳ අධ්‍යයනයක් කළා. NPP ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සහ 2025 අය වැය යෝජනා සම්බන්ධයෙන් මම කරුණු කිහිපයක් කියන්නම්. ගරු කථානායකතුමනි, ජාතික ජන බලවේගය පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කරුණු එකක්, දෙකක් මම කියවන්නම්. එහි 24වැනි පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "සේවයේ යෙදී සිටියදී හදිසි අනතුරකට මුහුණ දෙන සේවකයකුගේ වෛද්‍ය වියදම් සහ රැකියාවට නැවත පැමිණෙන තෙක් සුදුසු දීමනාවක් සේවා යෝජකයා විසින් සැපයීම"

ඒ වාගේම, එහි 31වැනි පිටුවේ මෙන්න මේ කාරණා සඳහන් වනවා:

> "තරුණ විවාහක පිරිස් සඳහා නව නිවසක් මිලදී ගැනීමට හෝ නිවසක් ඉදිකර ගැනීමට මූල්‍ය පහසුකම්"

> "රාජ්‍ය නිලධාරින් සඳහා සේවා ස්ථාන සමීපයේ නිල නිවාස ලබාදීමේ වැඩසටහන්"

> "නිවාස ඉදිකිරීම සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක්"

එම ප්‍රතිපත්ති ප්‍රකාශයේ 39වැනි පිටුවේ මේ කාරණය සඳහන් වනවා:

> "රාජ්‍ය සහ පුද්ගලික අංශයේ අඛණ්ඩ දායකත්වය සහිතව සාහිත්‍යය, සිනමාව හෝ නාට්‍යය ආදී කලා ප්‍රවර්ගවලට අදාළව "ජාතික අරමුදලක්" ගොඩනැගීම"

ඒ වාගේම, එහි 41වැනි පිටුවේ සඳහන් වෙනවා, චිත්‍රපට ශාලා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන්. ගරු කථානායකතුමනි, මේ ආදී වශයෙන් ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ හැම පිටුවක්ම ගත්තොත්, 2025 අය වැයේදී ඒ පොරොන්දුවලින් ඉතා අල්ප, සියයට 5ක වාගේ ප්‍රමාණයක් තමයි දීලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ පොරොන්දු පිළිබඳවත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මෙතුමන්ලා ලොකු පොරොන්දු ටිකක් දුන්නා. ආණ්ඩුව, සැප වාහන විකුණලා ඉස්කෝල හදනවාය කිව්වා. පෙට්‍රල්, ඩීසල්වල බදු, කොමිස් ඉවත් කරලා අඩුවට ඉන්ධන දෙනවා කිව්වා. විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කිව්වා. IMF ගිවිසුම සංශෝධනය කරනවා, නැත්නම් ඉරා දමනවා කිව්වා. "මචං, පුළුවන් නම් ණය ගෙවන්නම්, නැත්නම් පලයන්" කියලා කිව්වා. ඖෂධවල, අධ්‍යාපන උපකරණවල VAT එක ඉවත් කරනවා කිව්වා. එක පැන් පහරින් සහල් මාෆියාව නැති කරනවා කිව්වා. පාස්කු ඉරිදා ප්‍රහාරයේ මහ මොළකරු අල්ලනවා කිව්වා.

මේ, කිහිපයක් විතරයි. තව ගොඩක් දේවල් කිව්වා. හැබැයි, ජනාධිපතිතුමාගේ කථාවේ විශේෂයෙන් සඳහන් වෙන්නේ -මම මෙවර අය වැය කථාවෙන් ගත්තේ- "අපට හැකියාව තිබෙනවා, අපි හිතනවා, අපි අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා, අපි ළඟා කර ගන්න බලනවා, අපි අපේක්ෂා කරනවා" වාගේ දේවල්. ඔක්කෝම තිබෙන්නේ බලාපොරොත්තු. මේ බලාපොරොත්තු ඉටු වන පාටක් පෙනෙන්න නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, සංවර්ධනය සඳහා කාරණා 4ක් අවශ්‍යයි. එකක් තමයි, ආදායම වැඩි කරගැනීම. අනෙක් එක තමයි, සෘජු ආයෝජන. ඊළඟට, රැකියා උත්පාදනය සහ දියුණු තාක්ෂණය. මේ කාරණා හතර ළඟා කර ගන්න මේ අය වැයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනා මොනවාද? මේ හතර අත් පත් කර ගත්තේ නැත්නම්, ඒ වාගේම අපි නිෂ්පාදනය වැඩි කර ගත්තේ නැත්නම් අපට මේ රට ගොඩ දමන්න බැහැ, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි. පොරොන්දු දෙන්න පුළුවන්. ණය ටික එහෙන් මෙහෙන් ගෙවාගෙන, ෂේප් එකේ නහය වතුරෙන් උඩ තියාගෙන යන්න පුළුවන්. ලෝක බැංකුව කියනවා, පොඩි චලනයක් ඇති වුණොත් දුප්පත්කම සියයට 25 ඉඳලා සියයට 32 දක්වා යන්න පුළුවන් කියලා. ඒ කියන්නේ, ගංවතුර ගැලීමක්, කුණාටුවක් වාගේ පොඩි චලනයකින්, ඉතාම සුළු චලනයකින්. ඒ වාගේ අමාරු තත්ත්වයකින් යන්නේ. ඒ නිසා මේක ෂේප් කරලා ගොඩ දමාගන්න බැහැ. අනිවාර්යයෙන්ම නිෂ්පාදන පටන් ගන්න ඕනෑ. නිෂ්පාදන පටන් ගත්තේ නැත්නම් එන්න එන්නම අපි අමාරුවේ වැටෙනවා.

[ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා]

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා පුරෝකථනය පිළිබඳව කථා කළා. ප්‍රතිශතාත්මකව සියයට පොඩ්ඩක් එහාට මෙහාට කරලා පුරෝකථනය කර ගන්න බැහැ කියලා පසුගිය ආණ්ඩුව හෑල්ලුවට ලක් කළා. අපි වර්තමාන ජනාධිපතිතුමාගේ පුරෝකථනයේ හැකියාව බලමු. ගරු කථානායකතුමනි, ගිය සැරේ අය වැයේ තිබුණු "Proposed Legal Reforms for 2025" බලන්න. පළමුවැනි එක, the Act on the Exchange of Information between State Institutions. ඒක කරලා නැහැ. දෙවැනි එක, Investment Protection Act. එක ගෙනැල්ලා නැහැ. මම මේකේ 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, සහ 10න් පස්සේ 11 කියවන්නම්. ඒ තමයි, Amendment of Paddy Marketing Board Act, No. 14 of 1971. මේ එක පනතක්වත් මේ ආණ්ඩුවට තවම ගේන්න බැරිවෙලා තිබෙනවා.

අපි හැකියාව ගැන කථා කළා. Supermarket එකක් දීලා බලන්න කියලා අපි කිව්වේ ඒකයි. මේවා කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ආණ්ඩුවක් අරගෙන මේවා කරන්නේ නැත්නම් ඒක රජයේ දේපළ අවභාවිත වීමක්. විශාල මුදල් කන්දරාවක් වෙන් කරලා තිබෙනවා. මේවා කළේ නැත්නම් රටේ ජනතාව දිළිඳු වෙනවා. මේවා කරන්න ආණ්ඩුව බැඳිලා ඉන්නවා. ගරු කථානායකතුමනි, එකක්වත් කරලා නැහැ. පනත් 11ක් ගැන ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමාත් ඒ සම්බන්ධයෙන් වගකියන්න ඕනෑ. ඔබතුමාත් මේ ආණ්ඩුවේ පාර්ශ්වකරුවෙක්. ඔබතුමා කථානායක වශයෙන් බල කරන්න ඕනෑ, "තමුසෙලා ඉදිරිපත් කළා නම් කරනවා ඕයි. නැත්නම් අපිටයි හූව වදින්නේ" කියලා. ඔබතුමාත් ආණ්ඩුවේ නේ. ඔබතුමා දැන් ඉන්න කථානායක. මේ පනත් ටික පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඉක්මනින් ඒ වැඩ අවසන් කරන්න. නැත්නම් නොකියා ඉන්න ඕනෑ. අපි ඒකයි කියන්නේ. කියන්න පුළුවන්; කයිය ගහන්න පුළුවන්. හැබැයි, කරන්න බැහැ. ගරු කථානායකතුමනි, මම මේ පිළිබඳ දිගින් දිගටම පෙන්වන්නම්.

ගරු කථානායකතුමනි, මම පසුගිය අය වැයේ, අය වැය යෝජනා අංක 36 වෙත අවධානය යොමු කරනවා.

පාසල් අධ්‍යාපනය නවීකරණය සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. වැඩ කරලා තිබෙන ප්‍රතිශතය බැලුවොත් බින්දුවයි, ගරු කථානායකතුමනි. වෙන් කරපු මුදල් වියදම් කරලාත් නැහැ. උසස් ශ්‍රේණිගත විශ්වවිද්‍යාල උපාධි ශිෂ්‍යත්ව සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා. වැඩ කරලා තිබෙන ප්‍රතිශතය බැලුවොත් බින්දුවයි.

වෘත්තීය අධ්‍යාපනය හදාරන සිසු සිසුවියන්ට රුපියල් මිලියන 900ක් වෙන් කරලා තිබෙනවා. වැඩ කරලා තිබෙන ප්‍රතිශතය බැලුවොත් බින්දුවයි. ක්‍රීඩා සංස්කෘතිය බිහි කිරීමට වෙන් කර තිබෙන මුදල රුපියල් මිලියන 500යි. වැඩ කරලා තිබෙන ප්‍රතිශතය බැලුවොත් බින්දුවයි. කෘෂිකර්ම, කර්මාන්තශාලා, තරුණ ව්‍යවසාය වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. මේවා වෙන් කරපු මුදල්. මේ රජයේ මුදල් අවභාවිතාව. මේ, ජනතාවගේ බෙල්ල මිරිකලා ගන්න මුදල්.

ගරු කථානායකතුමනි, වෙලාව නැති නිසා මට එකින් එකට කියන්න බැහැ. වියදම් කළ මුදල සියයට 15ක් තිබෙන ඒවා තිබෙනවා. සංචාරක ප්‍රවර්ධනය සහ නගර සන්නාමකරණයට රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. වියදම් කර තිබෙන්නේ සියයට 15යි. අස්වැසුම ප්‍රතිලාභීන් සවිබලගැන්වීමේ පද්ධතියට රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. වියදම් කරලා තිබෙන්නේ සියයට 6යි. ජනාධිපතිතුමා දැන් පුරෝකථනය කරනවාද? නැහැ නේ. මේ වෙන් කරපු මුදල් ටික වියදම් කරගන්න බැරි නම්, මේ අමාත්‍යවරු අකාර්යක්ෂම නම් මොකක් හරි ක්‍රමයක් හදන්න. මම මේ ඔබතුමන්ලාට බණිනවා නොවෙයි.

කියනවා නම් මේවා කරන්න පුළුවන් වෙන්නත් ඕනෑ. මේවා ජනතාවගේ සල්ලි. මේ විශාල මුදල් ප්‍රමාණය පාවිච්චි කළේ නැත්නම් ජනතාවටයි පාඩු වෙන්නේ. මේක තමයි අවභාවිතය. මේ නිසා 159දෙනාම හිරේ යන්න පුළුවන්. චාමර සම්පත් මන්ත්‍රීතුමාට නඩු දාලා තිබෙන්නේ පඩි ගෙවීමට මුදල් මදි වෙලා වියදම් කරන්න fixed deposit එකක් ගත්තා කියලා. වෙන් කරපු කෝටි ගණනක මුදල් ප්‍රමාණයකින් -බිලියන ගණනක මුදල් ප්‍රමාණයකින්- සියයට 15ක්වත් වියදම් කර ගන්න බැරි නම්, මොකක්ද ජනාධිපතිතුමාගේ පුරෝකථනය? වෙන මිනිසුන්ගේ බින්දුවයි දශම ගණන්වල පුරෝකථනවලටත් බණිනවා. හැබැයි, වියදම් කිරීමට වෙන් කරන මුදල් ටික වියදම් කර ගන්න බැහැ. ඉතින්, කොහේද රටේ සංවර්ධනයක් වෙන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ විනාඩි 18ක කාලයට අමතරව තවත් විනාඩි 8ක කාලයක් ඔබතුමාට ලැබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතකොට ඔබතුමාට විනාඩි 26ක් තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි. මගේ කථාවේ flow එකත් කැඩුණා, කමක් නැහැ.

ගරු කථානායකතුමනි, වියදම් කරපු මුදල් ප්‍රමාණය සියයට බින්දුවක් වෙච්ච ඒවාත් තිබෙනවා. පොදුවේ ගත්තාම, සියයට 15යි. මගෙන් ඒ ඕනෑම තැනකින් අහන්න. අවුරුද්දක කාලයක් තිබුණා. තවම කර ගන්න බැහැ, වෙව්ලනවා.

ගරු කථානායකතුමනි, නිලධාරීන්ගේ ඉල්ලා අස්වීමේ ප්‍රමාණය බලන්නකෝ. ඒකත්, මේ ආණ්ඩුවේ හැකියාව. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමාගේ අමාත්‍යාංශයට අයත් ආයතනවල නම් කවුරුවත් ඉල්ලා අස් වෙලා නැහැ. එහෙම නිලධාරීන් සෑහෙන්න ඉල්ලා අස් වෙච්ච ආයතන භාර අමාත්‍යවරු ඉන්නවා. ඕනෑ නම් මම ඒ අය නහයෙන් පෙන්වන්නම්. එසේ ඉල්ලා අස් වෙච්ච නිලධාරීන් කිහිප දෙනෙකුගේ නම් මම කියන්නම්. මම මේ අවස්ථාවේදී ඒ සම්පූර්ණ නාම ලේඛනය **සභාගත*** කරනවා.

සෙනේෂ් බණ්ඩාර දිසානායක මහත්මයා, සභාපති, රූපවාහිනී සංස්ථාව; රමාල් සිරිවර්ධන මහත්මයා, සභාපති, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය; චින්තක දර්ශන හේවාපතිරණ මහත්මයා, සභාපති, ජාතික තරුණ සේවා සභාව. පින්තූරත් එක්ක 26දෙනෙකුගේ විස්තර තිබෙනවා. 26දෙනෙක් ඉවත් වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. කිසිම ආණ්ඩුවක අවුරුද්දක් ඇතුළත මෙහෙම නිලධාරීන් ඉවත් වෙලා නැහැ. නිලධාරීන්ට වැඩ කරන්න බැහැ. බණිනවා, උඩඟුයි, අහංකාරයි, වැඩ බැහැ. අපි ඒ විදියට නිලධාරීන් අස් කළේ නැහැ. එදා අපේ අමාත්‍යාංශවල බලන්න. අපි ඔවුන්ගෙන් වැඩ ගත්තා. The then Ministry of Science, Technology and Research, Ministry of

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

Development Strategies and International Trade, EDB සහ BoI එකෙන් අහලා බලන්න, අපි කොහොමද නිලධාරින්ගෙන් වැඩ ගත්තේ කියලා. නිලධාරින් දක්ෂයි.

හැබැයි, ඒ අයගෙන් වැඩ ගන්න අවශ්‍යා නිහතමානිකම අප තුළ තිබෙන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක නේ, රට වැටුණේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
රට වැටුණා? රට වැටුණා කියන්නේ කොහොමද? ලක්ෂ 2,500යි, 3,000යි ඔය සමහරුන්ගේ වත්කම් ප්‍රමාණය. වැටුණේ රෙද්දක් තමයි! මේ රටේ ඉඳන් පඩි ගන්නවා රුපියල් ලක්ෂ 12ක්, 15ක්. වත්කම් ප්‍රකාශ එළියට දැම්මාම ඔය සමහරුන්ගේ වත්කම් ලක්ෂ 700යි, 800යි. මොන වැටිල්ලක්ද? වැටිලා තිබෙනවා ලබු ගෙඩි. ගරු කථානායකතුමනි, සූට් ටික බලන්නකෝ ඇමතිවරුන්ගේ. ඉතින් කොහේද වැටිලා තිබෙන්නේ? ඒ අය එන වාහන දිහා බලන්නකෝ. ටයි ටික දිහා බලන්නකෝ. රට වැටිලා නැහැ. ඔය වැටුණාය කියන රටේ බිස්නස් නොකර ලක්ෂ 3,000ක, 4,000ක වත්කම් කාට හෝ තියා ගන්න පුළුවන් නම්, ඒක නියම රටක් නේ. වැඩ කරන්නේත් නැතුව, ව්‍යාපාර කරන්නේත් නැතුව, දේශපාලනය කරන ගමන් කෙනෙකුගේ වත්කම් ප්‍රමාණය ලක්ෂ 3,000ක්, 4,000ක් වෙනවා නම්, නියම රටක් නේ ඒක!

ගරු කථානායකතුමනි, මා කියමින් සිටියේ නිලධාරින්ගේ ඉල්ලා අස්වීම ගැන. මේවාට උත්තර දෙන්නකෝ . ඔබතුමන්ලා හිනා වුණාට මේ රටේ සියයට 20ක්, 25ක් දුප්පත්, මහත්තයෝ. *[බාධා කිරීම්]* රුපියල් 16,000ට අඩුවෙන් පඩි ගන්නේ. *[බාධා කිරීම්]* සියයට 18,- *[බාධා කිරීම්]* මට disturb කරන්න එපා. අහගෙන ඉන්නකෝ. ඔබතුමන්ලා ආවේ ඒගොල්ලන් වෙනුවෙන් නේ; ඒ දුප්පත් මිනිසුන්ගේ කර මතින් නේ. අපි මඩ ගහන්නේ නැහැ නේ කාටවත්. අහගෙන ඉන්න. අපි කථා කරන්නේ දේශපාලනය. අපි කාගේවත් නම් කියන්නේ නැහැ; අරවා මේවා කියන්නේ නැහැ; මඩ ගහන්නේ නැහැ; secretariesලා ගැන කථා කරන්නේ නැහැ; රට රටවල ගිය ඒවා ගැන කියන්නේ නැහැ; පගා ගත්තා කියන්නේ නැහැ; අරවා මේවා ගත්තා කියන්නේ නැහැ. අපි ඒවා කියන්නේ නැහැ. එහෙම සාධාරණව කථා කරනකොට බාධා නොකර ඔබතුමන්ලා මට අවස්ථාව දෙන්න. ඔබතුමන්ලාගේ කථාවලට අපි disturb කරන්නේ නැහැ. වෙලාව දුන්නාම කථා කරන්නකෝ, ඔය පස්සෙන් ඉඳන් "බක්, බක්" ගාන එක්කෙනා. හිට ගන්නේත් නැහැ, දන්නේත් නැහැ; පාපිසි.

ගරු කථානායකතුමනි, අද මෙතැනදී ගරු අධිකරණ ඇමතිතුමා කිව්වා, "2024දී අපි රට භාර ගන්න කොට ගෑස් ටැංකි පුපුරනවා, ලයිට් නැහැ" කියලා. භාර දුන්නේ යුද්ධයක් තිබුණු රටක් කියලා විතරයි කිව්වේ නැත්තේ. ගරු කථානායකතුමනි, මේ තිබෙන්නේ, 2024 වාර්ෂික ආර්ථික විවරණයෙහි සඳහන්ව තිබෙන "ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම" යටතේ සඳහන් දත්ත. රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක අපි එච්චර යාළු නැහැ. හැබැයි එතුමා කරපු වැඩේ හොඳයි කියලා අපි කියන්න ඕනෑ. ඒක නොකියන්න තරම් අපි කුහක වෙන්න හොඳ නැහැ. අර්බුදයේ උච්චතම අවස්ථාව ගැන මෙහි සඳහන් වෙනවා. මෙහි සඳහන් 2024 දත්ත ටික අරගෙන බලන්න. උද්ධමනය ඍණ 1.7යි; දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 5.2යි; ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 4,516යි; පොලී අනුපාතිකය 8.9යි; පෞද්ගලික අංශයේ ණය වර්ධනය සියයට 10.7යි; විනිමය අනුපාතිකය ඇමෙරිකානු ඩොලරයට රුපියල් 293යි. ඒ වෙලාවේ ඩොලරය රුපියල් 293යි. අද රුපියල් 307යි. මේ ඔක්කෝම කරලා, රට යථා තත්ත්වයට පත් කරලායි ඔබතුමන්ලාට භාර දුන්නේ. ගරු කථානායකතුමනි, ලෝක බැංකුව ඒ වෙලාවේ කියනවා, රටවල් 123 අතරින් ආර්ථික ස්ථාවරත්වය ඇති කර ගත්තු හොඳම රට ලංකාව කියලා. එහෙම කියන්න හේතු තමයි, මහ බැංකුව ස්වාධීන කිරීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම, ආර්ථික ප්‍රතිසංස්කරණය ආදිය. අපි කරපු දේවල් තමයි මේවා. ඒ, 2025.04.23. ඊට පස්සේ මොකක්ද කියන්නේ? ලෝක බැංකු වාර්තා දෙකක් කියන කාරණා බලන්න. ආර්ථික ස්ථාවරත්වය නිසි ලෙස සම්පූර්ණ වී නොමැති බව කියනවා. මොනවාද ඒකට හේතු? දුප්පත්කම සියයට 22යි ලු. සියයට 22යි නොවෙයි, සියයට 25යි. ඒ අය මාසයකට රුපියල් 16,000ට වඩා අඩු පඩියක් ගන්නේ, ගරු කථානායකතුමනි. දවසට රුපියල් 500ක්වත් නැහැ. බත් එකක් රුපියල් 350යි. කොහොමද පවුලක් ජීවත් වෙන්නේ? මේවාට උත්තර දෙන්න. අපට හිනා වෙලා හරියන්නේ නැහැ. දුප්පත්කම සියයට 22යි. ජනතාවගෙන් සියයට 10ක් දරිද්‍රතා රේඛාවට මඳක් ඉහළින් ඉන්නවා, ගරු කථානායකතුමනි.

කුඩා ආර්ථික චලනයකින් එය සියයට 32ක් වෙන්න පුළුවන්. මෙහෙම කියන්නේ ලෝක බැංකුව. දරිද්‍රතාව -දුප්පත්කම, හිඟනකම- සියයට 32ක් වෙන්න පුළුවන්. ලජ්ජා නැතුව ඇමති කෙනෙක් කියනවා, අස්වැසුම ඉල්ලන්නේ හිඟන්නෝ කියලා. ඒ, අපේ රටේ පවුල්වලින් සියයට 83ක් ලු.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒක කියන්නේ. කාටද මේ හිඟන්නෝ කියන්නේ? අහිංසක මිනිස්සුන්ට. ඩීල් දාන්නේ නැහැ, හොරකම් කරන්නේ නැහැ, පගා ගහන්නේ නැහැ, ගම්වල ඉන්න අහිංසක මිනිස්සු. මොකක්ද ඒ අයට කියන්නේ? අස්වැසුම ඉල්ලනවා නම්, ඒ අයට "හිඟන්නෝ" කියනවා. අපි කොහොමද ඒ මිනිස්සුන්ට එහෙම කියන්නේ? ඒ මිනිස්සුන්ට අපි අනිවාර්යයෙන්ම ඒ සහයෝගය දෙන්න ඕනෑ. මේකේ තේරුම මොකක්ද? හිඟන්නෝ කියලා කියන්න පුළුවන්ද මේ රටේ මිනිස්සුන්ට? ඒ දුප්පත් ජනතාවගේ කර මතින් බලයට ඇවිල්ලා දැන් ඒ ජනතාව සහන ඉල්ලනකොට කියනවා, හිඟන්නෝ කියලා. මොකක්ද ජනාධිපතිතුමා කිව්වේ? ජනාධිපතිතුමනි, අය වැය කථාව අහගෙන ඉන්නකොටත් මට ලජ්ජා හිතුණා. එතුමා දුප්පත් මිනිස්සු වෙනුවෙන් අපිත් එක්ක ලොකු සටනක් කරපු මහත්තයෙක්. උද්ඝෝෂණ කරන ජනතාවට මොකක්ද කියන්නේ? අපේ ප්‍රතිපත්තිය මේකයි, පාරේ ඉන්න එපා, ගෙදර යන්නලු. මේ හැම දෙයකටම උද්ඝෝෂණය කළා, එදා අනුර කුමාර දිසානායක මහත්තයා. පාරක් හදන්න දුන්නේ නැහැ, airport එකක් හදන්න දුන්නේ නැහැ, පෞද්ගලික විශ්වවිද්‍යාලයක් හදන්න දුන්නේ නැහැ, විදුලි බලාගාරයක් හදන්න දුන්නේ නැහැ. එදා ඒ කිසිම දෙයකට ඉඩ දුන්නේ නැහැ, ඒ හැම එකකටම විරුද්ධව උද්ඝෝෂණ කළා. අද මිනිස්සු පාරට ඇවිල්ලා ඉන්නකොට මොකක්ද කියන්නේ? ඒ අයට ගෙදර යන්න කියනවා. අපේ ප්‍රතිපත්තිය මේකයි, ඒ නිසා දැන් මේක කාපන් කියනවා. අධිවේගී මාර්ගය හදනකොටත් එදා විරුද්ධ වුණා. හැබැයි දැන් හදනවා ලු, මුහුද මැදින් පාරක්. එතකොට මාළු කොහොමද එහාට මෙහේට යන්නේ? මාළු අල්ලන්නත් බැරි වෙනවා. මේ පැත්තේ එක මාළු set එකක්, අනික් පැත්තේ අනික් මාළු set එක. ඉස්සර අධිවේගී මාර්ගය හදනකොට බල්ලන්ට මාරු වෙන්න බැහැ කිව්වා. බල්ලෝ ගැනත් ඒ කාලයේ හිතුවා අපේ ජනාධිපතිතුමා. දැන් බල්ලෝ ගැන හිතන්නේත් නැහැ.

IMF එකේ වචන ටිකමයි අනුර කුමාර ජනාධිපතිතුමාගේ මේ අය වැයේ තිබෙන්නේ. "Budget should be lined with programme’s parameters to continue building fiscal..", මේ ඒ වචන set එකමයි. IMF එකේ කලින් සිටියා, Peter Breuer කියලා

[ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා]

මහත්මයෙක්. දැන් ඉන්නවා, Papageorgiou කියලා මහත්තයෙක්. මට දැනෙන්නේ ඒ මහත්තයා අපේ අය වැය ඉදිරිපත් කළා වාගේයි. ණය ටික ගෙවාගන්න ඕනෑ. පොලිකාරයා IMF එක. අපි ඒක නැහැයි කියන්නේ නැහැ. IMF එක තමයි පොලිකාරයා. World Bank එක තමයි අපේ සංවර්ධනය ගැන හිතන්නේ. IMF එක ඇවිල්ලා කියනවා, මේක ගනින්, අරක ගනින්, බදු ගහපන්, කලිසම ගලවපන් කියලා. ඒ ඔක්කෝම කියනවා. ඒකට අපට බණින්න බැහැ. මොකද, ඔවුන් අපට සල්ලිත් දෙනවා. ඒ සල්ලි ටික අය කරන විධියත් IMF එක අපට කියනවා. ඒවා අපි පිළිගන්නවා. හැබැයි, හැම එකටම අපි IMF එකට ඔළුව නවන්න ඕනෑ නැහැ. ඒගොල්ලන් නිසා තමයි යාන්තම් හරි අපි මෙහෙම හුස්ම අරගෙන ඉන්නේ. එහෙම නැතිව ඔය නීති ටික හදන්න අපේ මිනිස්සුන්ට දුන්නා නම්, මොනවත් හදන්නේ නැහැ. ඒගොල්ලන් බල කරලා කියනවා දැන් මේ ටික කරන්න කියලා. රනිල් වික්‍රමසිංහටත් එහෙමයි, අපි හිටියත් එහෙමයි, බල කරලා කියනවා මේක දාන්න, අරක දාන්න කියලා. Fiscal discipline ඇති කරනවා. ඒක හරි. Fiscal disciplineවලින් පස්සේ අපි බලන්න ඕනෑ, ජනතාව ජීවත් වෙන්නේ කොහොමද කියලා. ඒක ගැනත් අපට වගකීමක් තිබෙනවා ආණ්ඩුවක් වශයෙන්.

එතකොට US Government එක මොකක්ද කියන්නේ? මේ ආණ්ඩුවේ හැකියාවයි මම මේ පෙන්නුම් කරන්නේ. US Department of State මඟින් warning එකක් දෙනවා, ලංකාවට යන්න එපා කියලා. ජූලි චන්ග් ඔයගොල්ලන්ගේ හොඳම යාළුවෙක්. පැලවත්තේමයි සිටියේ, ජූලි චන්ග්.

ජූලි චන්ග් එහේ ඉඳලා කියනවා ලංකාවට යන්න එපා කියලා. මාර කථාවක් මේක. ලංකාවට එන්න එපා කියනවා. ලංකාවේ ඉඳලා කන්න බොන්න හොඳයි, ජූලි චන්ග්ට. එතුමිය ඇවිල්ලා පාටි දාලා, විස්කි ගහලා යනවා. ඊට පස්සේ කියනවා, ලංකාවට යන්න එපා, මාර බඩු ටිකක් ඉන්නේ, සාක්කුවටත් විදිනවා කියලා. ජනාධිපතිතුමා UN එකට ගිහිල්ලා කරන කථාව මොකක්ද? අපේ ලංකාව හොර රටක් කිව්වාම, බල්ලෙක්වත් ලංකාවට එයි ද? ලංකාව හොර රටක්, ලංකාවේ කුඩු තිබෙනවා, මැරයෝ ඉන්නවා කියනවා. UN එකේ ඕවා කථා කරනවාද? ගිහිල්ලා කියන්න එපායැ, අපේ රට මෙහෙමයි, නියම රටක්, ලස්සන රටක්, සංචාරකයෝ එන්න ඕනෑ, අපේ ආර්ථික වර්ධන වේගය මෙහෙමයි, අපේ රට වටේට සුළං මාවතක් තිබෙනවා, ගිගාවොට් 60ක් build up කරන්න පුළුවන්, ලංකාවට එන්න, ආයෝජනය කරන්න කියලා. නමුත් එහෙම නොවෙයි කියන්නේ. මේ ආණ්ඩුවට කරන්න පුළුවන් මොකක්ද? පොලිසියෙන් දඩ ගහනවා, කථා කළොත් හිරේට දමනවා, පළිගන්නවා. එච්චරයි මේ ආණ්ඩුවට කරන්න පුළුවන්.

හැබැයි දැන් කුඩු කථාවක් නැහැ. කලින් වාහන සන්දර්ශනයක් දැම්මා. වාහන ගොඩක් ගෙනැල්ලා Galle Face එකේ දැම්මා. හැබැයි, ඒ වාහනවලට මොනවා වුණාද දන්නේ නැහැ. දැන් ඔයගොල්ලනුත් හොරෙන් පාවිච්චි කරනවා, Secretariesලාත් හොරෙන් පාවිච්චි කරනවා. ඊළඟට, දිගින් දිගට lists ටිකක් දැම්මා. ඒකෙන් ඇද්දා මාස දෙකක්. *[බාධා කිරීමක්]* තව තිබෙනවා, තව තිබෙනවා. ඔබතුමා list captain. ඒ නිසා තව දමයි, තව දමයි. ඊට පස්සේ පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන කථා කළා. Bar permit list එකක් ඉදිරිපත් කළා. ඊට පස්සේ බටලන්ද වාර්තාව ගෙනාවා. බටලන්ද වාර්තාව ගෙනැල්ලා රනිල් වික්‍රමසිංහට බැණලා බැණලා, එතුමා නැති කරලා මාසෙන් ඒක reverse කර ගත්තා. එහෙම නේද නාමල් මල්ලී? ආයේ දැන් බටලන්දක් නැහැ.

ඊළඟට, සත්ව සංගණනය ගෙනාවා. රිළව් ටික ගණන් කළා ඔක්කෝම එකතු වෙලා. රිළව් ටික ගණන් කළා, මොනරු ටික ගණන් කළා. හැබැයි අපරාදේ කියන්න බැහැ හොඳ විනෝදයකුත් සපයනවා. රිළව් තාම ඉන්නවා කියලා මාව පෙන්වනවා, බිමල් රත්නායක මහත්තයා. කණ්ණාඩියෙන් බැලුවොත් කවුද රිළවා කියලා හොයා ගන්න පුළුවන්. ඊට පස්සේ හිරේ දමන එක පටන් ගත්තා. දිගටම හිරේ දමන එක පටන් ගත්තා. රනිල් වික්‍රමසිංහට ගහලා එතැනින් ඇන ගත්තා. එහාට යන්න, මෙහේට යන්න කියලා ඔබතුමන්ලාගේ ආරක්ෂක හටයෝ control කරන්න ඔබතුමන්ලාට පුළුවන්ද? දැන් නම් මමත් ලියුමක් දෙනවා. ආරක්ෂක හටයෝ ඔයගොල්ලන් යොදන්න, එහාට මෙහාට යවන්න. ඒවා මගෙන් නම් අහන්න එපා. රනිල් වික්‍රමසිංහට එහෙම කරලා හිරේ දාලා මොකක්ද කළේ? *[බාධා කිරීමක්]* මේක අහගන්නකෝ. මම ආයෙත් return එකක් දෙනවා. ඊට පස්සේ බලන්න. මොකක්ද ඇමති කළේ? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එංගලන්තයට යන්න ලැබුණු ටිකට් 4කට මොකක්ද කළේ? ඒක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ආවේ. ඒ invitation එක පරීක්ෂා කරන්න ඕනෑ. Economy Class එකේ මුලින් ඉඳලා ලයිට් ඕෆ් කරපුවාම Business Class එකට ගිහිල්ලා ඇමතිවරු 4ක් ඉඳගත්තා. ලයිට් ඕෆ් කරපුවාම හොරෙන් ගිහිල්ලා ඉඳගත්තේ. ගරු කථානායකතුමාටත් හිනා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Upgrade කරලා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Upgrade ද, කොයි grade ද දන්නේ නැහැ, ලයිට් ඕෆ් කළාම ගිහිල්ලා වෙන තැනක ඉඳගෙන. මගේ නොම්මරය තිබෙනවා. අපේ කාලයේ මම ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සභාපතිට කෝල් එකක් දුන්නා කියලා පුළුවන් නම් upgrade කරන්න. අපි ඒ වාගේ තුට්ටු දෙකේ වැඩ කළේ නැහැ.

එය ජනතා මුදල් අවභාවිතයක්. හිරේ යවන්න පුළුවන් ඒ හතරදෙනාම. ගුවන් යානය ගමන් කරන අතර තමයි මාරු වෙලා තිබෙන්නේ. ලයිට් ඕෆ් කළාට පස්සේ හොරෙන් ගිහිල්ලා ඉඳගෙන. Air hostessesලා දන්නේත් නැහැ, භූතයෝ හතරදෙනෙක් ඉඳගෙන ඉන්නවා.

ගරු කථානායකතුමනි, ඊට පස්සේ මම එන්නම් මේ කාරණයට. ජූලි චන්ග් මෙහේ ඉඳලා කාලා බීලා යනවා. ඊට පස්සේ USA එක reasons දෙනවා ලංකාවට යන්න එපා කියලා. බටහිර විරෝධී ආකල්ප නිසා ලංකාවේ ආයෝජන කිරීම අවිනිශ්චිත බවට ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව 2025 සැප්තැම්බර් මාසයේදී වාර්තාවක් නිකුත් කරනවා. ශ්‍රී ලංකාවේ විදෙස් ආයෝජන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී දක්නට ලැබෙන නොගැළපෙන ස්වභාවය, මෙරට ආයෝජන මණ්ඩලය සමඟ විවෘත සංවාදයක් පවත්වාගෙන යෑමේ අභියෝග පැවතීම, අනවශ්‍ය නියාමනය හා නිලධාරින්ගේ ප්‍රතිචාර දැක්වීමේ දුර්වලතා පැවතීම වැනි කාරණාත්, අල්ලස හා දූෂණය ක්‍රියාත්මක නොවන බවට ජනාධිපති පොරොන්දු දුන්නද, වරප්‍රසාද ලත් පිරිසක් ආයතන දූෂණය කිරීම පිළිබඳවත් එම වාර්තාවේ සඳහන් වනවා. මේ නිසා ආයෝජනය කරන්න අපේ රටට එන්න එපා කියලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ එක්කම companies ගොඩක් මේ වන විට ලංකාව අත හැර යමින් තිබෙනවා. HSBC එක ලංකාවෙන් ඉවත් වනවා; Standard Chartered එක ලංකාවෙන් ඉවත් වනවා; Orange එකේ කර්මාන්තශාලාවක් ලංකාවෙන් ඉවත් වනවා. මේ warnings එක්ක මේ විධියට ගොඩක් කර්මාන්ත ලංකාවෙන් ඉවත් වනවා.

ගරු කථානායකතුමනි, මම මේ නිකම් විවේචන ඉදිරිපත් කරනවා නොවෙයි. මා ළඟ තිබෙනවා, newsවලින් ගත්ත කාරණා 200කට වැඩිය. මේවාට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මට මේ එකින් එක කාරණා කියන්න පුළුවන්. ඒ අතර ජනාධිපතිතුමා එදා කියපු කථාවකුත් තිබෙනවා. ඒ තමයි, "මට IMF එක ඕනෑ නැහැ, මම මහ මුහුදෙන් රට ගොඩ දාලා පෙන්වන්නම්" කියන කථාව. මම මේවා එකින් එක කියන්නම්.
Hon. Speaker, how many minutes do I have?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You have five more minutes.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට 10 minutes ලබා දෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
එතුමාට තව ටික වෙලාවක් දෙන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමාගෙන් මට විනාඩි පහක් හම්බ වෙනවා, බොහොම ස්තුතියි!

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
නැහැ, අපෙන් වෙලාව දෙන්නේ නැහැ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එදා IMF එක ගැන කිව්වේ එහෙමයි. ඊට පසුව කියනවා, "රනිල්ගේ වැඩ පිළිවෙළ හැර විකල්පයක් ආණ්ඩුවට නැහැ, ශ්‍රී ලංකාව නව ප්‍රතිසංස්කරණ මාවතේ අඛණ්ඩව රැඳී සිටීම අත්‍යවශ්‍යයි. IMF එක දන්වයි" යනුවෙන්. ආණ්ඩුව මාස දෙකෙන් කඩා වැටෙයි, මාස පහෙන් කඩා වැටෙයි, මාස හයෙන් කඩා වැටෙයි කියලා අපි කියපු බවක් ආණ්ඩුව නියෝජනය කරන අය කියනවා මට ඇහුණා. අපි එහෙම කිව්වා තමයි. ඇයි අපි එහෙම කිව්වේ? ඔබතුමන්ලා එදා කිව්ව දේවල්වලටයි අපි එහෙම උත්තර දුන්නේ. "මචං, IMF එක පන්නනවා" කිව්වා, "ණය ගෙවන කොන්දේසිවලට අපිත් එක්ක agree වෙන්න බැරි නම් උඹලා පලයල්ලා කියනවා" කිව්වා. මම හිතන විධියට, සමන්ත මහත්තයායි ඒක කිව්වේ. ගරු කථානායකතුමනි, ඒ කියපු දේවල්වලටයි අපි උත්තර දුන්නේ.

ගරු කථානායකතුමනි, පාරේ යන බස් එකකට නඟිනවා කියලා කවුරු හෝ කෙනෙක් කියනකොට ඔහුට අපි කියනවා නේ, "වැටේවි" කියලා. හැබැයි ඒ කෙනා ඒ බස් එකට නැග්ගේ නැත්නම් වැටෙන්නේ නැහැ නේ. ගරු කථානායකතුමනි, එතුමන්ලා කිව්වා, IMF එකේ කොන්දේසි අයින් කරනවා, ගිවිසුම ඉරලා විසි කරනවා කියලා. හැබැයි, ගිවිසුම එහෙම ඉරලා විසි කළා නම් මාස දෙකක්, තුනක් යනකොට මේ ආණ්ඩුව වැටෙනවා. ඒ නිසා ඒක කළේ නැහැ. හැබැයි ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම වෙනස් කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මම දැක්කා, සමහර අය කියපු කථා. අපේ ඔස්තාර්ලාත් කිව්වා, "අරක හොඳයි. හොරු අල්ලනවා නම් හොඳයි. වෙනස් කළ එක හොඳයි. අනුර කුමාර ජනාධිපතිතුමා open economy එකට ආපු එක හොඳයි" කියලා. එහෙම බැහැ. ගරු කථානායකතුමනි, අපි ඉස්කෝලේ ගිය කාලයේ උගන්වලා තිබෙන විධියට ප්‍රතිපත්ති වෙනස් කරන මිනිසුන්ට කියන්නේ, fraudsters කියලා. If you are lying, if you are changing your principle, වචන දෙකේ මිනිසුන්ට අපි කියන්නේ, fraudsters කියලා.

ගරු කථානායකතුමනි, මේ එකින් එක කරුණු පෙන්වන්න ගියොත් මට කියන්න තිබෙන කාරණා කියන්න බැහැ. මට කියන්න තිබෙන කාරණා වැඩියි. 2018 වර්ෂය ගැන මම ඔබතුමාට පොඩ්ඩක් කියන්නම්.

නිකමට මම මේ කියන්නේ, විවේචනය කරන නිසා. ඔබතුමන්ලා මොනවාද කළේ කියලා අහන්න පුළුවන් නේ. 2018දී සංචිතය ඩොලර් බිලියන 10යි. ඒ වාගේම foreign direct investmentsවලින් කර්මාන්තවලට සියයට 13යි, මේ සැරේ සියයට 5යි. කර්මාන්තවල නිෂ්පාදනය වැඩි කරන්නේ නැතිව, industrial zones දාන්නේ නැතිව, විදුලි උපකරණ නිෂ්පාදනය කරන්නේ නැතිව ලංකාව ගොඩ දමන්න බැහැ. ලංකාව වටේටම තිබෙනවා wind tunnel එකක්. ඒකෙන් පුළුවන් ගිගාවොට් 60ක් නිෂ්පාදනය කරන්න. ඇයි අදානි එළෙව්වේ? ඔබතුමන්ලා ඒ ගැන සොයලා බලන්න. මෙගාවොට් 500 - 1000 වාගේ කරන ව්‍යාපෘතිවල ඒකකයක් ඩොලර් සත 8.25යි. මම ලෝකයේ හැම තැනම ඒ තොරතුරු සොයලා බැලුවා. Grid එක සඳහා මෙගාවොට් 50ක් කරනවා වාගේ නොවෙයි. මෙගාවොට් 50 ගන්න පුළුවන් ඩොලර් සත 3.5 - 4.00ට වාගේ. ඒ කියන්නේ රුපියල් 23කට ගරු ඇමතිතුමා. අපි විදුලි ඒකකයකට රුපියල් 60ක් ගෙවනවා. ඉතින් කවුද ලංකාවට ආයෝජනයට එන්නේ? කොහොමද ලංකාවේ මිනිස්සු බිල් ගෙවන්නේ? මෙගාවොට් 500ක් හෝ 1,000ක් - ගිගාවොට් 2ක් හදන්න දුන්නා නම් හරි. ගිගාවොට් තුනහමාරයි රටට අවශ්‍ය කරන්නේ. තව භාගයක් ඕනෑ වුණොත් ගිගාවොට් 4යි. ගිගාවොට් 6ක් නිර්මාණය කළොත් අපට මෙගාවොට් 2,000ක් ඉන්දියාවට අපනයනය කරන්න පුළුවන්. එහෙමයි රටවල් ගොඩ දාන්න ඕනෑ. මේ අවුරුද්ද යනකොට ඔබතුමන්ලා කරන්න තිබුණේ ඒකයි. අපට බැණ බැණ අප හිරේ දාන එක නොවෙයි කරන්න තිබුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have two more minutes.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Hon. Chief Opposition Whip, could you please give me five minutes extra?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Two extra minutes දෙන්නම්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Thank you very much. - *[Interruption.]* ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් මට තව විනාඩි 10ක් දෙනවා ලු.

[ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා]

ගරු කථානායකතුමනි, නිෂ්පාදනය නැතිව මේ රට සංවර්ධනය කරන්න බැහැ. මා ළඟ ඒ විස්තර එකින් එක තිබෙනවා. මම ඒවා සභාගත කරන්නම්.

ගරු කථානායකතුමනි, කෘෂිකර්මයට, බීජ අභිජනනයට හා experiments කරන්න සල්ලි විශාල ප්‍රමාණයක් අනිවාර්යයෙන් වෙන් කළ යුතුයි. ඇමෙරිකාව ගොඩ ගත්තේ එහෙමයි. නව බීජ - *[බාධා කිරීමක්]* ගරු බිමල් රත්නායක ඇමතිතුමා, මට disturb කරන්න එපා. මට තව විනාඩි 5යි තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
බැන්නාට ආණ්ඩුව වැටෙන්නේ නැහැ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
නැහැ, නැහැ, ආණ්ඩුව වැටිලා ඉවරයි. සමුපකාරයෙන් බලයට ඇවිල්ලා, සමුපකාරයෙන්ම ගෙදර යන්න වෙයි. දැන් රටේ සමුපකාර ඡන්ද ටික ඔක්කෝම පරාදයි. ඊයේ දකුණේ ප්‍රදේශයක සමුපකාර ඡන්දයෙන් 80න් 15යි මාලිමාවට, අනෙක් ඔක්කෝම 60 ගාණක්, 70ක් විතර විපක්ෂයට. මොකක්ද කිව්වේ? ඇමතිවරුමයි කිව්වේ සමුපකාර ඡන්දය තමයි pulse බලන එක කියලා. දැන් ඔන්න pulse බලලා තිබෙන්නේ! පුළුවන් නම් තියන්නකෝ පළාත් සභා ඡන්දය. ඊයේ මොකක්ද කිව්වේ? පළාත් සභා ඡන්දය තියන්න කියලා ඉන්දියාවෙන් බල කරද්දිත් ඊයේ කිව්වේ මොකක්ද? සීමා නිර්ණය කරන්න තිබෙනවා, අරවා කරන්න තිබෙනවා කියලා ෂේප් වෙලා ගියා. ඒක තියන්නේ නැහැ අනිවාර්යයෙන්ම. මාර්තු මාසයේ ඡන්දයක් තියන්නකෝ ඔබතුමන්ලාගේ වැඩ කොහොමද කියලා බලන්න.

ගරු කථානායකතුමනි, ජනතාව තේරුම් අරගෙන ඉවරයි. අපි කිව්වේ ඒකයි. මට ඒ දවස්වල ඔබතුමන්ලා බැන්නා. මම හිතන විධියට, මාව හිරේ දාන්න try කරන්නෙත් ඒකයි. මම කිව්වා supermarket එකක් භාර දෙන්නම් කියලා. ඒකේ cashier තැනට දානවා කිව්වා හඳුන්නෙත්ති මහත්තයාව.

එතුමාට තරහා ගියා; ඒක කිව්වාම එතුමාට මාර විධියට ඩෝං ගියා. මම ඒක උදාහරණයකට කිව්වේ. මමත් ඇමෙරිකාවේ 7-Eleven supermarket එකක වැඩ කරලා තිබෙනවා. ඒක ලජ්ජා වෙන්න දෙයක් නොවෙයි. දැන් බලන්න මේ ආණ්ඩුව දිහා. Supermarket එකක් භාර දුන්නාම, 100ක බඩු ගන්න ඕනෑ. නමුත් රුපියල් 15ක බඩු අරගෙන තිබෙන්නේ. සීනි අරගෙන නැහැ, පිටි අරගෙන නැහැ. ඉතින් Supermarket එක බංකොලොත් වෙන්නේ නැද්ද? Supermarket එක බංකොලොත්!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have another two minutes.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, රටේ නිෂ්පාදනය නංවන්නේ නැතුව බැහැ. ගයන්ත මහත්මයාගේ උදවු ඇතුව මගේ කාලයේ මිල්ලනියේ අක්කර 400ක වෙළෙඳ කලාපයක් හැදුවා. ඒකට අවුරුදු 7ක් යනවා කිව්වා, ගයන්ත මහත්තයා. මගේ කාලයේ public-private partnership agreement එකක් යටතේ මාස 7ක් යනකොට ඒ වෙළෙඳ කලාපයේ පාරවල් ඇතුළු ඔක්කෝම හැදුවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා සිංගප්පූරුවට කථා කරලා එක දවසින් - *[බාධා කිරීමක්]* මගේ කාලයේ ඒ වෙළෙඳ කලාපයේ ගේට්ටුව ළඟටම හැදුවා. නමුත් ඒකේ credit එක මට එයි කියලා, මලික් සමරවික්‍රම මහත්මයායි, රනිල් වික්‍රමසිංහ මහත්මයායි ඒක නැවැත්තුවා. හැබැයි, මේ ආණ්ඩුව - බිමල් ඇමතිතුමා ඔන්න දැන ගන්න - ධම්මික පෙරේරාට එතැන නැවත release කරන්න යනවා. ධම්මික පෙරේරාගෙන් අපි අමාරුවෙන් ගත්තේ. ධම්මික පෙරේරාගෙන් සහ දම්රෝ එකෙන් අක්කර 200, 200 ගත්තේ. නමුත් ජනාධිපතිතුමාගේ සංවර්ධන වැඩ පිළිවෙළ තුළ මිල්ලනිය ගැන සඳහනක් නැහැ. ඒක expressway එකට එහා පැත්තේ තිබෙන්නේ. හොඳම තැනක්. එතැන අක්කර 400ක් තිබෙනවා. තායිලන්තයේ රෝජනා සමාගම එක්කයි එම කටයුත්ත කරන්න ගියේ. ඔවුන්ගේ වෙළෙඳ කලාප 6ක් තිබෙනවා. ඒගොල්ලන් තමයි ගෙනාවේ. තායිලන්තයේ ආදායමට ඒකෙන් සියයට 10කින් දායක වෙනවා. අපි ඒකත් හඳුන්වා දෙන්නම්. අපි කුහක වෙන්නේ නැහැ.

ඒ වාගේම මම කියන්න කැමැතියි, මගේ export strategy එක ගැනත්. මම එහි නියාමක වශයෙන් වැඩ කළා. අවුරුදු 2 1/2යි, 3යි මම අමාත්‍යාංශ දෙකක හිටියේ. යුරෝ මිලියන 5ක export strategy එකක්. නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, මම දන්නවා ඔබතුමා ටිකක් සාධාරණයි කියලා. අරයා තමයි ටිල්වින්ගේ ලයින් එකේ ඉන්නේ. ඔබතුමා අනුර මහත්තයාගේ ලයින් එකේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අනුරගේ ලයින් එකේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔව්, අනුරගේ ලයින් එකේ. දෙපැත්තක්; දෙකක්. ඔබතුමා විජේවීරගේ - ඒ කාලයේ හිටියේ නැහැ. අපි පොඩ්ඩක් විජේවීර මහත්මයා අගය කරනවා. එතුමා ටිකක් ප්‍රතිපත්තිගරුකයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අපි වාගේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔව්, අපි වාගේ. ඊට පසුව ඔබතුමා සෝමවංශගේ ලයින් එකේ. ටිකක් සාධාරණයි. අරයා පොඩ්ඩක් දරදඬුයි. එයා ඉන්නේ ටිල්වින්, වීරවංශ, බිමල් කියන අයගේ ලයින් එකේ.

නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, මේ නිෂ්පාදන ලබා ගන්න නම්, අනිවාර්යයෙන්ම ඔබතුමන්ලා මේ කලාප දියුණු කරන්න ඕනෑ; අඩුම ගණනේ අක්කර 5,000ක් develop කරන්න ඕනෑ. අක්කර 5,000ක් develop කරලා electronic items නිෂ්පාදනය කරන්න ඕනෑ. ඇත්තටම අපි ඇඟලුම් කර්මාන්තයෙන් පසුව එන්න තිබුණේ electronic itemsවලට. නමුත් අපට එතැනට එන්න බැරි වුණා. අපට 1994 ඉඳලා ආණ්ඩුවක් නැහැ. රනිල් වික්‍රමසිංහ නිසා අපට ආණ්ඩුවක් ගන්න බැරි වුණා. කෝප් එකේ කියනවා ඔබතුමා දකින්න ඇති, ඒ කාලයේ - අසූ ගණන්වල ගාමිණී දිසානායක මැතිතුමන්ලාගේ කාලයේ - ලංකාවේ සියයට 30ක් ට්‍රාන්ස්ෆෝමර්ස් හැදුවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
අපට ඒ අවස්ථාව ලැබුණේ නැහැ. ඩී.එස්, ඩඩ්ලි, ජෝන්, ජේ.ආර්, ප්‍රේමදාස, ගාමිණී දිසානායක, ලලිත් ඇතුළත්මුදලි වැනි නායකයන්ගේ කාලවලදී කරපු දේවල් කරන්න අපට 1994 ඉඳලා අවස්ථාව ලැබුණේ නැහැ. අපට වැඩ කරන්න අවස්ථාව ලැබුණේ නැහැ. හැබැයි, අපි විපක්ෂයේ සිටිමින් උදවු කරන්නම්. Export strategy එක මම දෙන්නම්. මිලියන ගණනක් වියදම් කරලා ඒක හැදුවේ. ඒවා තැගි. ණය නොවෙයි. තැගි වශයෙන් යුරෝ මිලියන 4ක්, 5ක් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Please give me one more minute, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please wrap up now.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ආණ්ඩුවෙන් විනාඩි 10ක් දෙනවා කියනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, I have to stop you now.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ආණ්ඩුවෙන් දෙනවා කිව්වා, විනාඩි 10ක්. They are very generous. - *[Interruption.]* එහෙම නම් half-a-minute දෙන්න, ගරු කථානායකතුමනි. I will wind up. You are a very fair person. At least, give me 30 seconds.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Within 30 seconds you have to finish.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Thank you.

ගරු කථානායකතුමනි, මම කියන්නේ මේකයි. රට තුළ නිෂ්පාදන කරන්නේ නැතුව, රට තුළ කර්මාන්ත ආරම්භ කරන්නේ නැතුව ණය ගෙවන්න බලාපොරොත්තු තියාගෙන නම් මේ රට සංවර්ධනය කරන්න බැහැ. ඊළඟ වතාවේ අනිවාර්යයෙන්ම වැටෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට ඩොලර් බිලියන 6ක් ගෙවනවා. ණය ගෙවන්නම ණය ගන්න වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have to finish now. I have to stop you.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
රට වැටෙනවා, නිෂ්පාදන පටන් ගත්තේ නැත්නම්. එතකොට මේ රට ඉතාම ජරා අගාධයකට ඇදගෙන ගිහිල්ලා රට විනාශ වෙලා, දිළිඳුකම සියයට 50 දක්වා යයි. නමුත් ඇමතිවරු මන්ත්‍රීවරු ටික හම්බ කර ගනියි. හැබැයි, රටේ ජනතාව දුප්පත් වෙලා, සුන්බුන් බවට පත් වෙයි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Wasantha Samarasinghe. You have 20 minutes.

[පූ.භා. 10.21]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු කථානායකතුමනි, අය වැය පිළිබඳ දෙවැනි දවසේ විවාදයට සම්බන්ධ වෙලා අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, if necessary, you can have extra ten minutes.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Thank you, Hon. Speaker.

ගරු කථානායකතුමනි, සුජීව සේනසිංහ ගරු මන්ත්‍රීතුමාට හරියට වෙලාව දුන්නේ නැද්ද දන්නේ නැහැ. එහෙම නැත්නම් එතුමාට දීපු වෙලාවත් එහෙ මෙහෙ ගියාද කොහේද. මේ විවාදය ආරම්භ කරපු දවසේ ආචාර්ය හර්ෂ ද සිල්වා ගරු මන්ත්‍රීතුමාත්, - එතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ - එදා විවාදය අවසන් කරපු

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාත් දෙදෙනාම මේ ආර්ථිකය ස්ථාවර කිරීම පිළිබඳව ආණ්ඩුවේ ප්‍රතිපත්තිය, ආණ්ඩුවේ වැඩ පිළිවෙළ පිළිබඳව කථා කළා. ඒ වැඩ පිළිවෙළ ගැන කථා කරලා, ආණ්ඩුව මේ දෙවන අය වැය ඉදිරිපත් කරන වෙලාවේ දෙවැනි අය වැයත් එක්ක අපි ඉදිරිපත් කරපු සංවර්ධන යෝජනා, සංවර්ධන වැඩ පිළිවෙළ විවේචනය කරන්න උත්සාහ කළා. ගරු කථානායකතුමනි, සමහර විවේචන ආවේ පදනමකුත් නැතිව. සමහර ඒවා පිළිබඳව සමාජයේ තිබෙන ඇත්තත් නොවෙයි කියන්නේ. IMF එක පිළිබඳවත් කිව්වා. මම ඉස්සරහට කියන්නම්, අපි IMF එකත් එක්ක තිබුණු එකඟතා වෙනස් කරලා වැඩ කළේ කොහොමද, වැඩ කරමින් ඉන්නේ කොහොමද කියලා. ඒ වාගේම අපේ රටට එන්න එපා කියලා ඇමෙරිකා එක්සත් ජනපදය statement එකක් දුන්නා කිව්වා. ඒගොල්ලෝ ඒක නිවැරදි කළා මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මේ පිළිබඳව විපක්ෂයේ විලාපය අපට අට වැනිදාත් ඇහුණා. විපක්ෂයේ විලාපය අපට අඛණ්ඩව අහන්න වෙයි කියලා මට හිතෙනවා. ඒකට හේතුව වෙන කියන්න දෙයක් නැති එක.

ගරු ජනාධිපති අනුර දිසානායක මැතිතුමන්, අපේ අනුර සහෝදරයා මුදල් අමාත්‍යවරයා හැටියට මේ පාර්ලිමේන්තුවේදී පැය 4යි විනාඩි 20ක කාලයක් ඉදිරිපත් කළ අය වැය කථාව ඇතුළේ තිබුණු points ටික පිළිබඳව, අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙන ඒ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව විවාදයකට එන්න කියලා මම විපක්ෂයට ආරාධනා කරනවා. අපට සමහර කථා ඇහුණාම හිනාත් යනවා. වාහන විකුණන එක ගැන කථා කරනවා, වාහන ගෙනැල්ලා එකලස් කිරීම නිසා නඩු තිබෙන අය. වාහන විකුණුවේ නැහැ කියලාත් කථා කරනවා. ඒ වාගේම වංචා, දූෂණ පිළිබඳව කටයුතු කරන්නේ නැහැ, ෂෝ එකක් විතරක් දානවා කියනවා, බැඳුම්කර වංචාව පිළිබඳව පොත් ලියලා මාට්ටු වෙලා තිබෙන අය. *[බාධා කිරීමක්]* එම නිසා මේ කථාව මම මේ අය වැයට balance කරන්න, - *[බාධා කිරීමක්]* අහගෙන ඉන්නකෝ. අහගෙන ඉන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඒ නම කියන්නකෝ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නම කියයි. අපේ ඇමතිතුමා හවසට නම කියනවා. *[බාධා කිරීමක්]* කාගෙන්ද? *[බාධා කිරීම්]* ඔය තිබෙන්නේ. ගරු කථානායකතුමනි, - *[බාධා කිරීමක්]* විපක්ෂය මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳගෙන විලාපයක් නඟනවා. *[බාධා කිරීමක්]* විලාප නඟලා දැන් යන එන මං නැතිව දඟලනවා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මඩ ගහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ. වාඩි වෙන්න. ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ. කරුණාකරලා, -

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගැරඩියාට හුමිතෙල් ගැහුවාම වෙන දේ තමයි අද විපක්ෂයට අය වැය කථාව නිසා වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* නම කිව්වා නම් කොහොමද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, disturb කරන්නේ නැතිව වාඩි වෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, නම කියන්න දෙයක් නැහැ. මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ පොත් ලියලා මාට්ටු! පුහුල් හොරා කරෙන් දැනේ කියන්නේ ඕකට තමයි.

ගරු කථානායකතුමනි, මම දැන් නමක් කිව්වාද? මම නමක් කිව්වාද? නැහැ, මම නමක් කිව්වේත් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩි වෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
වාහන එකලස් කරලා නඩු තිබෙනවා කිව්වාම, වැදුණා. මහ බැංකු බැඳුම්කර වංචාව ගැන පොත් ලිව්වා කිව්වාම, වැදුණා. ඇයි, කලබල වෙන්නේ? ගරු කථානායකතුමනි, -

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ නම කිව්වේ නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කිව්වා, කිව්වා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම කාගේවත් නමක් කිව්වේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නම කිව්වේ නැහැ. ඔබතුමා දැන් කරන්නේ බාධා කිරීමක් නේ. ගරු මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. කරුණාකරලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, මේ අය වැය පිළිබඳව - *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නම කිව්වේත් නැහැ. මේ කථාව පටන් ගත්ත වෙලාවේ සිට,- *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම කිසි කෙනෙකුගේ නමක් කිව්වේ නැහැ, ගරු කථානායකතුමනි. කිසිම කෙනෙකුගේ නමක් කිව්වේ නැහැ. ගැරඬියාට භූමිතෙල් ගැහුවා වාගේ. නම් කියන්න ඕනෑ නැහැ, සිද්ධිය කියනකොට කට්ටිය මාට්ටු වෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, වැඩකටයුතුවලට බාධා කරනවා නම් මට ඔබතුමා එළියට යවන්න සිද්ධ වෙනවා. *[බාධා කිරීම්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
සිද්ධිය කියනකොට කට්ටිය මාට්ටු වෙනවා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩි වෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
2026 අය වැය පිළිබඳව, - *[බාධා කිරීම්]* පොතුත් ලිව්වා නේ ඇති වෙන්න *[බාධා කිරීම්]* පොතුත් ලිව්වා නේ. ඇති නේ. තව මොනවාද කථා කරන්නේ? *[බාධා කිරීම්]* තව මොනවාද කථා කරන්නේ? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමනි, බාධා නොකර වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, මම මගේ කථාවට යනවා. *[බාධා කිරීම්]* මේක ඇතුළට වෙලා ඉන්න.

ගරු කථානායකතුමනි, 2026 අය වැය පිළිබඳව - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට සිංහල තේරෙනවාද? *[බාධා කිරීම්]* Hon. Arjuna Sujeewa Senasinghe, would you sit down? [*බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග 92 (2) (අ) යටතේ ඉදිරිපත් කරන්නේ. මේක රීති ප්‍රශ්නයක්. මෙතුමා පටන් ගත්තේ සුජීව කියන නම කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතැන point of Order එකක් නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එතුමා නම කියලා පටන් ගත්තේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
කක්කුස්සි කට අවුස්සා ගන්නවා වාගේ වැඩක්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, ඔබතුමාට මම තව විනාඩි දෙකක් අමතරව ලබා දෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
2026 අය වැයෙහි උපායමාර්ගික අරමුණු, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, වාඩි වෙන්න. ඔබතුමාට point of Order එකක් නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම ආරාධනා කරනවා, මෙන්න මේ උපායමාර්ගික අරමුණු ටික හරියට කියවා ගන්න කියලා. *[බාධා කිරීම්]* මේ උපායමාර්ගික අරමුණු කියෙව්වා නම්, මේ උපායමාර්ගික අරමුණුත් එක්ක අය වැය යෝජනා බැඳෙනවාද, උපායමාර්ගික අරමුණු එක්ක අය වැය යෝජනා යනවාද කියලා බලන්න පුළුවන්. අපි මේකේ කියලා තිබෙනවා, උපායමාර්ගික අරමුණු හයක්. *[බාධා කිරීම්]* තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක්, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක්, - *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට point of Order එකක් නැහැ. ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* මොකක්ද, මේ නටන නාඩගම? නමක් කිව්වේ නැහැ නේ, මෙතුමා. කාගේවත් නමක් කිව්වේ නැහැ. වාඩි වෙන්න, වාඩි වෙන්න. ඔබතුමා වාඩි වෙන්නේ නැත්නම් මෙතැනින් එළියට දානවා. මොකක්ද මේ කරදරේ? ඔබතුමන්ලා discipline එකක් ඇතුව හැසිරෙන්නකෝ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]* ඔබතුමාගේ නම කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, මගේ වෙලාව. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order under Standing Order No. 92(2).

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමාගේ point of Order එක මොකක්ද කියන්න?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Give me the mike. Thank you.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) යටතේ කියනවා, "... පාර්ලිමේන්තුවේ කවර හෝ කටයුත්තක දී නිවැරදි ක්‍රමවේද අනුගමනය කරනු ලැබ තිබේ ද හෝ කරනු ලබමින් තිබේ ද යන්න පිළිබඳව මන්ත්‍රීවරයකු විසින් ප්‍රශ්න කරනු ලැබිය හැකි වන්නේ ය." යනුවෙන්.

ගරු කථානායකතුමනි, අර අපේ මන්ත්‍රීතුමියට කියන්න, ළඟ ඉන්න එපා, මෙතුමා රට අරන් යයි, පොඩ්ඩක් ඈතට ගිහිල්ලා වාඩි වෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතැන point of Order එකක් නැහැ. මොකක්ද මේ කරන්නේ? *[බාධා කිරීමක්]* නාඩගමක් නේ මේ කරන්නේ. *[බාධා කිරීමක්]* ඔය විධියට, අසැබි විධියට ඔබතුමා හැසිරෙන්න එපා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
අසැබි විධියට නොවෙයි, ඔබතුමාට, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමායි අසැබි විධියට හැසිරෙන්නේ. *[බාධා කිරීමක්]* Point of Order එකක් නොවෙයි නේ, ගරු මන්ත්‍රීතුමා. Point of Order එකක් නැතුව නිකම් බොරුවට ඔබතුමායි මේ අසැබි විධියට හැසිරෙන්නේ. *[බාධා කිරීම්]* මන්ත්‍රීතුමියක් එතැන ඉන්නකොට මොකක්ද රට අරගෙන යන කථාවක් කියන්නේ. ඔබතුමා වැරදියි. *[බාධා කිරීමක්]*

ගරු අමාත්‍යතුමා, ඔබතුමා කථා කරන්න. ඔබතුමාට මම තව විනාඩි දෙකක් දෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, මම ගැරඩින්ට භූමිතෙල් ගැහුවේ නැහැ. *[බාධා කිරීම්]* මම කථාව කරන්න, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට තව විනාඩි දෙකක් දෙනවා. ඔබතුමාගේ කථාවට නිතරම බාධා කරනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, කථා, උපහැරණ ගොඩක් කියන්න තිබෙන නිසා දැන් මම කථාව පටන් ගන්නම්. අඩුම ගණනේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මෙන්න මේ මූලික අරමුණු ටිකවත් කියෙව්වා නම් හොඳයි. අපේ ආණ්ඩුවේ අය වැයේ උපායමාර්ගික අරමුණු ටික බලන්න. උපායමාර්ගික අරමුණු ලෙස අපි කියලා තිබෙනවා, තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක්, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක්, ණය තිරසරභාවය සහතික කිරීම, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම, ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීම, ඩිජිටල්කරණය ප්‍රවර්ධනය. මේවා තමයි අපේ උපායමාර්ගික කරුණු හය. ගරු කථානායකතුමනි, මෙන්න මේ කරුණු හය පදනම් කරගෙන තමයි අපි මේ 2026 අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, හැබැයි මේ 2026 අය වැය අපි ඉදිරිපත් කළාට පස්සේ මේ අය වැය පිළිබඳව විපක්ෂය විසින් එකතු කරන කරුණු අතර අමතක කරපු කරුණු ටිකකුත් තිබෙනවා.

මොකද, 2025 වර්ෂය පුරාවට මේ රටේ ජනතාවට 2025 අය වැයෙන් අපි ලබා දීපු ප්‍රතිලාභ තිබෙනවා. ඒ ප්‍රතිලාභ පිළිබඳව කථා කරනවා වාගේම රජයක් හැටියට ආර්ථිකය ශක්තිමත් කරද්දි අපි මුහුණ දීපු අභියෝගත් තිබෙනවා. අපි ඒ අභියෝගවලට මුහුණ දීපු ආකාරය ගැන කථා කරන්නේ නැහැ. විපක්ෂය අද මේ විවාදයට එකතු වෙන්නේ, මොනවා හරි දෙයක් කියන්න උත්සාහ කරන්නේ මේ අය වැය පදනම් කරගෙන නොවෙයි. ඒ නිසා අපි කියන්න ඕනෑ, නැවත මතක් කරලා දෙන්න ඕනෑ, 2025 අවුරුද්ද තුළ අපි කරපු දේවල් ගැන. 2025 අවුරුද්දේ අපි රාජ්‍ය සේවය සම්බන්ධයෙන් බොහෝ වෙනස්කම් කළා. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළා, විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කළා, පෞද්ගලික අංශයේ අවම වැටුප රුපියල් 27,000ක් දක්වා වැඩි කළා. ලබන අවුරුද්දේ එය රුපියල් 30,000ක් වෙනවා. ඒ වාගේම වතු සේවකයන්ගේ වැටුප රුපියල් 1,700ක් දක්වා ගෙන ඒමට අවශ්‍ය පියවර ගන්නවා කියලා අපි 2025 අය වැයේදී පොරොන්දු වුණා. ඒ වාගේම රාජ්‍ය යන්ත්‍රණය ස්ථාවර කිරීමට අවශ්‍ය කටයුතු කරන බව අපි කිව්වා, විදේශ සංචිත ආරක්ෂා කරගන්න ගමන් ආනයන සීමා ලිහිල් කරන බව අපි කිව්වා, රාජ්‍ය සේවයට බඳවා ගැනීම් ආරම්භ කරන බව අපි කිව්වා. ඒ අනුව මේ අවුරුද්ද ඇතුළත රාජ්‍ය සේවයට 75,000ක් බඳවා ගන්න අවශ්‍ය අනුමැතිය මේ වෙනකොටත් අපි ලබා දීලා තිබෙනවා. පාසල් දරුවන්ට පොත්පත් ගන්න අපි රුපියල් 6,000ක් දුන්නා. ඒ වාගේම සපත්තු දෙකක් ගන්න තව රුපියල් 4,000ක් දුන්නා. ඒ විතරක් නොවෙයි. මහපොළ ශිෂ්‍යාධාරය අපි සියයට 50කින් වැඩි කළා. මේ අවුරුද්දේ තවත් සියයට 30කින් -රුපියල් 2,500කින්- අපි එය වැඩි කරනවා.

අධ්‍යාපනය, සෞඛ්‍ය, මහාමාර්ග, වාරිමාර්ග ඇතුළු ක්ෂේත්‍රවල බොහෝ සංවර්ධන කටයුතු ඉලක්ක කරගෙන ඒවායේ ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් බිලියන 1,400ක් අපි වෙන් කළා. ඒ වාගේම නීතියේ ස්වාධීනත්වය අපි ඇති කළා, වංචා, දූෂණවලට තිත තියලා දූෂිතයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. ඒවා ගැන මේ අය කථා කරන්නේ නැහැ. අපි කලින් කරපු කටයුතුවල දිගුවක් ලෙස උපායමාර්ගික කරුණු-කාරණා ගණනාවක් එක්ක තමයි මේ අය වැයටත් අපි ප්‍රවිෂ්ට වෙලා තිබෙන්නේ. ඒ නිසා අද විපක්ෂයට විලාපයක් විතරක් ඉතුරු වෙලා තිබෙනවා, යන එන මං හොයාගන්න බැරි වෙලා තිබෙනවා. එතුමන්ලා කථාව පටන් ගන්න තැනින් නොවෙයි අවසන් කරන්නේ. ඒ නිසා අපි විපක්ෂයට ආරාධනා කරනවා, අඩුම වශයෙන් අය වැය විවාදය බලන්න එන පාසල් දරුවන්ට, මේ විවාදය බලන් ඉන්න අපේ රටේ මිනිස්සුන්ට, මේ සජීව සංවාදය අහගෙන ඉන්න මිනිස්සුන්ට දැනෙන්නවත් මෙය සාර්ථක අය වැය විවාදයක් බවට පත් කර ගන්න එකතු වෙන්න කියලා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඒ සඳහා එතුමන්ලාට උපදෙස් දෙන්න කියලාත් අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, නැත්නම් ජනතාවට මේ අය වැය ඇතුළේ තිබෙන දේවල් හොයාගන්න බැරි වෙනවා. ඒ නිසා තමයි අපට මේ කරුණු කියන්න වුවමනාව තිබුණේ.

අපි මේ අය වැය ඇතුළේ, එනම් 2026දී බොහෝ දේවල් කරන්න අපේක්ෂා කරනවා. ඒ වාගේම අපට විශාල සිහිනයක් තිබෙනවා, මේ රට පොහොසත් රටක් බවට පත් කරන්න. ඒ වෙනුවෙන් තමයි අපි මේ අය වැය යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම මේ කියන්න හදන්නේ ඒ ටික. ඒ ඉලක්ක 6 සම්පූර්ණ කරගෙන යද්දි අපි රාජ්‍ය සේවය වෙනුවෙන් මේ අවුරුද්දේ මොකක්ද කළේ? මම මේ කථාව මීට කලිනුත් කිව්වා. සමගි ජන බලවේගයේ මහ ලේකම්තුමා තමයි එවකට රාජ්‍ය පරිපාලන ඇමති හැටියට හිටියේ. එතුමා අදත් මේ සභාවේ නැහැ. 2016 ඉඳන් රාජ්‍ය සේවයට බඳවා ගත් සේවකයන්ගේ විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් හදපු වැඩ පිළිවෙළක් නැහැ. 2016දී රාජ්‍ය සේවකයන්ට ලබා දුන් පත්වීම් ලිපියේ තිබෙන්නේ කොහොමද? එහි තිබෙන්නේ, "2016 ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය" කියලායි. මේක තමයි 2016දී ලබා දුන් පත්වීම් ලිපියේ තිබෙන්නේ. එම ලිපිය අනුව 2016 වසරේ සිට රාජ්‍ය සේවයට බැඳුණු අයට විශ්‍රාම වැටුප නැහැ, ගරු කථානායකතුමනි. ඒ අය දන්නේ නැහැ ඒ අයට ලැබෙන්නේ දායක විශ්‍රාම වැටුපක් ද කියන එකවත්. දායක විශ්‍රාම වැටුපක් නම් බැඳිච්ච සේවකයන්ගෙන් දායකත්වය අය කර ගන්න ඕනෑ. නැත්නම් රජය පැත්තෙන් විශ්‍රාම වැටුපට අවශ්‍ය දායක මුදල ලබා දෙන්න ඕනෑ. එහෙම වෙන් කිරීමක් කරලාත් නැහැ. ඒ නිසා 2026 අපේ අය වැය තීරණ අනුව 2016 සිට රාජ්‍ය සේවයට එකතු වෙච්ච සියලුදෙනාට විශ්‍රාම වැටුප හිමි කර දීම අපි සිදු කළා, ගරු කථානායකතුමනි. ඒක අපේ රටේ රාජ්‍ය සේවකයා ලද විශාල ජයග්‍රහණයක්.

ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවකයන්ට ලබා දෙන දේපළ ණය සම්බන්ධයෙනුත් මේ අවස්ථාවේදී මා කිව යුතුයි. විපක්ෂයෙන් මේ දේපළ ණය පිළිබඳව කියන කථාව මම අහගෙන හිටියා. මේ සඳහා රුපියල් මිලියන 500යි වෙන් කළේ කිව්වා. ඔව්, අපි රුපියල් මිලියන 500ක් වෙන් කළේ මොකටද? අපි නැවත දේපළ ණය දෙනවා, රුපියල් ලක්ෂ 30ක් දක්වා. රාජ්‍ය සේවකයාට ලබා දෙන දේපළ ණයෙහි පොලියෙන් සියයට 4ක් අපි දෙනවා. රාජ්‍ය සේවකයාට රුපියල් ලක්ෂ 50ක් දක්වා එම ණය මුදල ගන්න පුළුවන්. ඒ රුපියල් ලක්ෂ 50 ණය මුදල දෙන්නේ, පළමු රුපියල් ලක්ෂ 30ට අපෙන් සියයට 4ක පොලියකුත්, දෙවැනි රුපියල් ලක්ෂ 20ට අපෙන් සියයට 2ක පොලියකුත් විධියට. අද වෙනකොට සියයට හතේ පොලියට නිවාස ණය දෙනවා. ඒ නිවාස ණය පොලියෙන් සියයට 4ක් ආණ්ඩුව ගෙවනවා. ඒ ගෙවන මුදල වෙනුවෙන් තමයි මේ රුපියල් මිලියන 500 වෙන් කරලා තිබෙන්නේ. එහෙම නැතිව ණය දෙන්න නොවෙයි. ණය දෙන්නේ බැංකුවලින්.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ගරු කථානායකතුමනි, තාවකාලික පදනම මත බඳවා ගෙන සිටින සේවකයන් ස්ථිර කිරීම ගැනත් මා කිව යුතුයි. පසුගිය රජයන් කළේ විවිධ තැන්වල හිටපු සේවකයන් කොටස්, කොටස් වශයෙන් වෙන් කර ස්ථිර කිරීමයි. හැබැයි, මේ වෙනකොට අපේ ආණ්ඩුව තීරණය කරලා තිබෙනවා, තාවකාලික පදනම මත රාජ්‍ය ආයතනවලට බඳවා ගෙන සිටින සේවකයන් 9,800ක් ස්ථිර කිරීමට. අපි ඒක මේ අවුරුද්දේ කරනවා.

ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම ගැනත් මා කිව යුතුයි. මේ අවුරුද්දේත් රාජ්‍ය සේවක වැටුප් වැඩිවීමේ දෙවැනි කොටස හම්බවෙනවා. කීයක්ද? රුපියල් කෝටිවලින් ගත්තොත්, රුපියල් කෝටි 11,000ක්. රුපියල් බිලියන 110කට ආසන්න මුදලක් අපි මේ අවුරුද්දේත් රාජ්‍ය සේවයේ වැටුප් සඳහා ලබා දෙනවා. ඒ වාගේම රාජ්‍ය සේවකයන්ට ලබා දෙන උත්සව අත්තිකාරම් මුදල අපි රුපියල් 10,000 සිට 15,000 දක්වා ඉහළ දමනවා. 2020ට පෙර තිබුණු විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කිරීමට අවශ්‍ය මුදල වෙනුවෙනුත් අපි තවත් රුපියල් මිලියන 20,000ක් මෙවර වෙන් කර තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් විධිමත් කිරීමටත් අපි කටයුතු කරනවා. ඒ වාගේම රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සම්බන්ධ ගැටලු විසඳීම සඳහා වැටුප් කොමිසමකුත් අපි පත් කරනවා. සියලු රාජ්‍ය සේවකයන්ට මෙතැනින් පස්සේ වැටුප් පිළිබඳ ගැටලුවක් තිබෙනවා නම්, එම ගැටලු විසඳන්න කටයුතු කරනවා.

අපි රජයක් හැටියට ඒ ගත යුතු සියලු තීන්දු තීරණ අරගෙන තමයි මේ කටයුතු සිදු කරමින් යන්නේ. රජයක් හැටියට අපි මේ ගත්ත තීන්දු තීරණත් එක්ක මේ විධියට රාජ්‍ය සේවය සඳහා වැඩ කරද්දී, අර්ධ රාජ්‍ය අංශයට අපි කරලා තිබෙන්නේ මොනවාද කියන එකත් කියන්න ඕනෑ. පසුගිය ආණ්ඩු විසින් අර්ධ රාජ්‍ය අංශයේ ආයතන පාලනය කළා. පැල්වත්ත සීනි සමාගම වැනි විවිධ රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන 10කට ආසන්න ප්‍රමාණයක සේවකයන්ගේ EPF, ETF සහ Gratuity ගෙවලා නැහැ. ඒ සේවකයන් විශ්‍රාම ගිහිල්ලා; Gratuity නැතුව ගෙදර ගිහිල්ලා. ඒ සමහර අය මිය ගිහිල්ලා ගරු කථානායකතුමනි. ඔවුන් පිළිබඳව පසුගිය කාලයේ පැවති ආණ්ඩු නොසලකා හිටියා. නමුත් ඔවුන් වෙනුවෙන් අපි තීරණයක් ගත්තා. අපි රුපියල් මිලියන 11,000ක් වෙන් කර තිබෙනවා, ඔවුන්ගේ EPF, ETF සහ Gratuity ගෙවීම සඳහා. ඒ රාජ්‍ය ආයතනවල සේවකයන්ට තිබුණු ගැටලුව විසඳීම සඳහායි අපි මේ මැදිහත් වෙන්නේ. පසුගිය ආණ්ඩු කථා නොකර, මඟ හැර ගිය දේවල් විසඳන්න ආණ්ඩුවක් හැටියට අපි තීරණය කරලා තිබෙනවා. ඒ මිනිස්සුන්ට තිබුණු ඇත්ත ප්‍රශ්න, ව්‍යවස්ථාපිත හිමිකම, රාජ්‍ය ආයතන නඩත්තු කරද්දී ඒ රාජ්‍ය ආයතනවලට, ඒ සේවකයන්ට ලැබිය යුතු දේවල් දෙන්න අපි කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම රාජ්‍ය සේවයේ ආපදා ණය ලබා දීමේ සීමාව අපි රුපියල් 250,000 සිට රුපියල් 400,000 දක්වා වැඩි කළා. අපි එතැනින් නැවතුණේ නැහැ. ඒ ප්‍රමාණය ගන්න ගියාම අය කර ගැනීම් සහ නැවත ලබා දීම් පිළිබඳව සීමා පැනවුණා. ඒ ණය ලබා දීම් පිළිබඳ සීමා ඉවත් කර ඒ මුදල් ලබා දීම සඳහා අත්තිකාරම් ගිණුමට තවත් රුපියල් මිලියන 10,000ක් වෙන් කර තිබෙනවා, රාජ්‍ය සේවයේ ආපදා ණය ලබා ගැනීමේ අවස්ථා වැඩි කරන්න.

ඒ විතරක් නොවෙයි. දුෂ්කර සේවයේ නිරත ගුරුවරු සඳහා දීමනාවක් ලබා දීමටත් අපි කටයුතු කර තිබෙනවා. ඒ විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට රුපියල් 1,500 ක දීමනාවක් ලබා දෙන්න අපි මෙවර අය වැය තුළින් කටයුතු කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. 700කට, 800කට ආසන්න අනාරක්ෂිත දුම්රිය ගේට්ටුකරුවන් ප්‍රමාණයක් ඉන්නවා. ඒ අය පැය 08ක්, 16ක්, එහෙම නැත්නම් පැය 24ක් වැඩ කළත් ලැබෙන දීමනාව රුපියල් 7,500යි. ඒ නිසා අනාරක්ෂිත දුම්රිය ගේට්ටුකරුවන්ගේ දීමනාව අපි රුපියල් 7,500 සිට රුපියල් 15,000 දක්වා සියයට සියයකින් වැඩි කරලා තිබෙනවා, මේ අය වැය තුළින්. ඒ, සමාජය තුළ නොසලකා හැරපු, අත්හැර දමපු කණ්ඩායම්. හැබැයි, අපි ආණ්ඩුවක් හැටියට ඒ අය පිළිබඳවත් අවධානය යොමු කරලා, දීමනාවක් ලබා දෙමින් ඔවුන්ට ජීවත් වෙන්නත් පුළුවන් වැටුපක් ලබා දෙන්න උත්සාහ කරනවා.

රාජ්‍ය සේවකයන්ගේ අවම වැටුප වැඩි වෙනවා වාගේම, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙනුත් අපි කටයුතු කර තිබෙනවා. අපි 2025 අවුරුද්දේ පෞද්ගලික අංශයේ සේවකයෙකුගේ මාසික අවම වේතනය රුපියල් 27,000ක් කළා. ඒත් එක්කම අපි කිව්වා, 2026 වෙනකොට ඒක රුපියල් 30,000ක් වෙන්න ඕනෑ කියලා. ලබන ජනවාරි 01වැනි දා සිට අපේ රටේ ඕනෑම තැනක පෞද්ගලික අංශයේ වැඩ කරන සේවකයෙකුගේ අවම පඩිය රුපියල් 30,000ක් දක්වා වැඩි කරන්න අවශ්‍ය කටයුතු කරලා ඉවරයි කියන කාරණයත් අපි කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ගරු කථානායකතුමනි, මීට පස්සේ රාජ්‍ය සේවයේ ඕනෑම තැනක, පෞද්ගලික අංශයේ ඕනෑම තැනක - කාර්යාලයක, සාප්පුවක, ආරක්ෂක අංශයේ, cleaning serviceවල, කඩයක - වැඩ කරන සේවකයෙකුගේ අවම මාසික වැටුප රුපියල් 30,000යි. දින 25ක් වැඩ කරන සේවකයෙකුට දිනකට රුපියල් 1,080ක් ලැබිය යුතුයි. අන්න එතැනට අපේ රටේ පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුපත් අපි ගෙනාවා.

අපට වතු සේවකයන්ගේ වැටුප පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. මම අහගෙන හිටියා, අපේ ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමාත් ඊයේ මේ ගැන යම් සැකයක් පළ කරන ගමන් කථා කළා. වතු සේවකයන්ගේ අවම වැටුප ගැනත් ප්‍රශ්නයක් තිබුණා. ගරු කථානායකතුමනි, අපි ගියවර අය වැයෙන් පොරොන්දු වුණා, වතු සේවකයන්ට රුපියල් 1,700ක දෛනික වැටුපක් ලබා දීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගන්න රජය සහතික වෙනවා කියලා. ජනාධිපතිතුමා, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් ඇමතිතුමා, කම්කරු ඇමතිතුමා ඇතුළු සියලුදෙනාම ඒකාබද්ධව වතු හිමියන් ගෙනැල්ලා මේ ගැන සාකච්ඡා කළා. මේ වතුවල වැඩ කරන්න එන කම්කරුවන්ගේ වැටුප ප්‍රමාණවත් නැති නිසා තමයි ඒ අය වත්තේ වැඩ කරන්නේ නැත්තේ. ඒ නිසා රුපියල් 1,350ක් වෙච්ච මේ අයගේ දෛනික වැටුප රුපියල් 1,700ක් කරන්න ඕනෑ. ඒ සඳහා රජය පැත්තෙන් යෝජනාවක් ඉදිරිපත් කළා. දෛනිකව වැඩ කරන්න එන සේවකයෙකුට අපිත් රුපියල් 200ක් දෙනවා, ඔයගොල්ලනුත් තව රුපියල් 200ක් දාන්න කියලා අපි වතු හිමියන්ට කිව්වා. ඒකට හාම්පුතුන් එකඟ වුණා. හාම්පුතුන් එකඟ වුණා, වතු සේවකයන්ගේ රුපියල් 1,350ක දෛනික වැටුපට තවත් රුපියල් 200ක් වැඩි කරලා, මූලික වැටුප 1,550ක් කරන්න වාගේම, වත්තේ වැඩ කරන්න එන දවසකට රුපියල් 200ක පැමිණීමේ දිරි දීමනාවක් ලෙස රජය ලබා දෙන මුදලත් දෙන්න. රුපියල් මිලියන 5,000ක් ආණ්ඩුව මේ වෙනුවෙන් වෙන් කළා. ඒ නිසා සැකහැර දැනගන්න තිබෙන්නේ මෙච්චරයි. මාසයකට වතු සේවකයන්ගේ වැටුපට රුපියල් 10,000ක් වැඩිපුර එකතු කරන්න මේ අය වැය තුළින් අපි කටයුතු කර තිබෙනවා. රුපියල් 10,000ක්, ගරු කථානායකතුමනි. මාසයකට දින 25ක් වැඩට එනකොට ඒ රුපියල් 10,000 ලැබෙනවා. ආයෙත් ඒ ගැන සැකයක් නැහැ. එම නිසා ඒ මුදල ලබා දීමට අවශ්‍ය කරන ඒ ක්‍රියාවලියට එකඟතාව පළ කරලා තමයි වතු සේවක වැටුප අපි ඒ ගණන දක්වා වැඩි කළේ, ගරු කථානායකතුමනි. ඒක සඳහන් කරන්න ඕනෑ කාරණයක්.

වතු සේවකයන් අපේ වතුවල වැඩට ඇවිල්ලා අවුරුදු 200කට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියනවා. හැබැයි, මේ ඉතිහාසය තුළ වතු සේවකයන්ගේ වැටුප වැඩිවීම සම්බන්ධයෙන් ගත්තොත්, අපට හැමදාම වාගේ අහන්න ලැබුණේ රුපියල් 700ක්, 800ක්, 1,000ක් වශයෙන් ඔවුන්ගේ වැටුප් වැඩි වුණු ආකාරයයි. එම නිසා මේ වැටුප් වැඩිවීම ඓතිහාසික අවස්ථාවක් බවට පත් වෙනවා. මොකද, රුපියල් 10,000කින් ඉතිහාසයේ කවදාවත් වැටුප් වැඩිවීමක් වතු සේවකයන්ට ලැබිලා නැහැ. ඒ නිසා මේක වතු සේවකයන් ලැබූ ඓතිහාසික ජයග්‍රහණයක්. *[බාධා කිරීමක්]* මාසයකට රුපියල් 10,000කින් වැටුප වැඩි කළා. *[බාධා කිරීමක්]* මාසයකට, ගරු මන්ත්‍රීතුමනි. ගරු කථානායකතුමනි, මේවා පුදුම දේවල් වුණාට, ආණ්ඩුව ඒ කටයුතු කරලා තිබෙන්නේ. ඒවා ගණිතයෙන් කරලා තිබෙන්නේ. නිකම්ම නොවෙයි. ආණ්ඩුවත් මැදිහත් වෙලා, හාම්පුතුනුත් එකඟ කරගෙන වතු සේවකයන්ට මේ රුපියල් 10,000 වැඩි කරන්න අවශ්‍ය කටයුතු අපි කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ අය වැය තුළින් මූලික උපාය මාර්ගික අරමුණු 6ක් ඉලක්ක කරගෙන අපි බොහෝ දේවල් වෙනස් කරලා තිබෙනවා. ඒ අනුව, බලශක්ති ක්ෂේත්‍රය තුළින් දැවැන්ත පිම්මක් ඉදිරියට යන්න කටයුතු කරනවා. ඒ වෙනුවෙන් data centresවලට වාගේම green hydrogen projectsවලට යන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව අවශ්‍ය පියවර ගන්නත් ඒ ක්ෂේත්‍රය කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය ඩිජිටල්කරණ ක්‍රියාවලිය හරහා digital economy එක ශක්තිමත් කරන්න අවශ්‍ය පියවර මේ අය වැය තුළින් අරගෙන තිබෙනවා.

එමෙන්ම රජයේ සහනාධාර පිළිබඳවත් අපි මතක් කරන්න ඕනෑ. මොකද, විශ්‍රාමිකයාට සහන ලබා දීම, අස්වැසුම ලබා දීම පිළිබඳව විතරක් නොවෙයි, තවත් බොහෝ සහනාධාර ලබා දීම සඳහා අපි මෙවර අය වැයෙන් මුදල් වෙන් කරලා, ඒ ගැනත් කථා කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි පොත් 9ක් print කරලා දීලා තිබෙනවා. අපි ඒ පොත "ජාතික අය වැය, 2026 පුරවැසි අය වැය" හැටියට නම් කරලා තිබෙනවා. මේ පොත කියෙව්වා නම් වෙන් කරපු ගොඩක් දේවල් ගැන දැනගන්න පුළුවන්. අඩුම ගණනේ එතකොට ආණ්ඩුව කරලා තිබෙන්නේ මොනවාද කියලා බලාගන්න පුළුවන්. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මේ පොත්වල ගොඩක් විස්තර තිබෙනවා. මේකේ සටහන් කර තිබෙන දේවල් මම කෙටියෙන් කිව්වේ. "ජාතික අය වැය, 2026 පුරවැසි අය වැය" කියන පොතේ අපි මේ ගැන විස්තර සඳහන් කරලා තිබෙනවා. එම නිසා ආණ්ඩුවක් හැටියට සියලු ක්ෂේත්‍ර ආවරණය කරමින්, ඒ සියලු ක්ෂේත්‍රවල නිරතව සිටින ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා ගැන අවධානය යොමු කරලා තමයි දීමනා සහ සුබසාධන ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ලබා දෙන බැංකු පොලියේ කොටස පිළිබඳවත් සාකච්ඡාවක් ඇති වුණා. ගරු කථානායකතුමනි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ගිණුම් සඳහා ලබා දෙන බැංකු පොලිය ගැන කිව්වොත්, මේ අවුරුද්දේ ඒ පොලිය දෙනවා නම්, මේ අවුරුද්ද සඳහා මුදල් වෙන් කරන්න එපාය, ගරු කථානායකතුමනි. ඒක නේ අය වැයක ප්‍රතිපත්තිය වෙන්න ඕනෑ. එහෙම නේද? ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමන්ලා මේ ගැන දන්නවා. සාමාන්‍යයෙන් මේ අවුරුද්දේ අය වැයෙන් දෙනවා නම්, මේ අවුරුද්දට මුදල් වෙන් කරන්න ඕනෑ. හැබැයි, 2022, 2023 කියන අවුරුදු දෙකට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සියයට 3ක පොලී වැඩි කිරීමක් ලබා දෙන්න එකඟ වුණත් මුදල් වෙන් කළේ නැහැ. අපි 2025දී එම පොලී ගෙවීම සඳහා රුපියල් මිලියන 10,000ක් දුන්නා. තව රුපියල් මිලියන 45,700ක් ගෙවන්න තිබෙනවා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට බැංකු පද්ධතියෙන් ඒ පොලිය ගෙවලා තිබෙනවා. හැබැයි, බැංකුවලට ඒ සල්ලි දීලා නැහැ. ප්‍රතිපත්තිය ගේනවා. නමුත්, ක්‍රියාත්මක කරන්න අවශ්‍ය මුදල් වෙන් කරලා නැහැ. අපේ ජනාධිපතිතුමා එදා කිව්වා, අනුන්ගේ පවුත් අපට කර ගහන්න වෙලා තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, 2022 හා 2023 කියන අවුරුදු දෙක සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම්වලට පොලිය ගෙවීම සඳහා ආණ්ඩුව හැටියට අපි රුපියල් මිලියන 55,700ක් මෙවර අය වැයෙන් වෙන් කරනවා. ඒ විතරක් නොවෙයි. අපි 2025, 2026 ඉඳලා 60,000ක් පමණ වන තැන්පත්කරුවන්ට රුපියල් මිලියනයකට වඩා පොලී ගෙවීමක් කරනවා. මේ පරණ පවු තිබුණේ නැත්නම් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ලබා දෙන පොලිය අපට තවත් සියයට 3කට වැඩි ප්‍රමාණයකින් වැඩි කරන්න තිබුණා. එහෙම බලනකොට මේ අය වැය ඇතුළේ අපි පරණ ආණ්ඩුවල පවුත් කර ගහගෙන යනවා, ගරු කථානායකතුමනි. ඒකට තමයි රටක් ඉදිරියට යනවා කියන්නේ. අපට කියන්න බැහැ, ඒක ගිය ආණ්ඩුවෙන් ඉල්ලා ගන්න කියලා. ඒ ආණ්ඩුවලින් ඒ ප්‍රතිපත්ති ගත්තා. හැබැයි, මුදල් වෙන් කළේ නැහැ. අවසානයේ බැංකු මුදල් ගෙව්වා. දැන් බැංකු හිරවෙලා. ඒ සඳහා මෙතැන රුපියල් බිලියන 55ක් - රුපියල් මිලියන 55,700ක් - තිබෙනවා. මේක පොඩි මුදලක් නොවෙයි, ගරු කථානායකතුමනි. අපි ඒ මුදල් වෙන් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම VAT එක පිළිබඳ සාකච්ඡාවක් එනවා. VAT එක පිළිබඳ සාකච්ඡාව එන්නේ අපි VAT දැල ටිකක් පළල් කළ නිසායි. ඒකට හේතුව මේකයි. මීට කලින්, මාසයකට රුපියල් මිලියන 5කට වැඩිය වෙළෙඳාම් කරන අය තමයි sale එකෙන් හසු වුණේ. දැන් අපි ඒක රුපියල් ලක්ෂ 36ට ගෙනාවා. ඒ කියන්නේ, දවසකට රුපියල් ලක්ෂයකට වඩා වෙළෙඳාමක් කරන කෙනෙක් ඉන්නවා නම් ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, VAT එක ගෙවන්න ඕනෑ. හැබැයි, දැන් ඒ ගැන යමක් කියන්න හැදුවා මම දැක්කා. අපේ කබීර් හෂීම් මන්ත්‍රීතුමාත් එතුමාගේ කථාවේදී කිව්වා, - එතුමා මෙතැන නැති නිසා නොවෙයි මම මේ කියන්නේ - මේ රුපියල් ලක්ෂයටම VAT ගෙවන්න වෙනවා කියලා. එහෙම වෙන්නේ නැහැ. මේක Value Added Tax. සිල්ලර වෙළෙන්දා තමන් එකතු කරන කොටසට VAT ගෙවන්න ඕනෑ.

මම උදාහරණයක් ගන්නම්. පැල්වත්ත සීනි සමාගම දුඹුරු සීනි හදනවා. ලංකාවේ සීනි සමාගම් හතරක් තිබෙනවා. දුඹුරු සීනි වැනි දේශීය නිෂ්පාදනවලට VAT එක තිබෙනවා. සීනි කිලෝවක් රුපියල් 200යි නම්, VAT එකත් එක්ක රුපියල් 236ක් වෙනවා ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඒ ගබඩාවෙන් පිටත් වෙනකොට. ඊට පසුව තොග වෙළෙන්දා රුපියල් 10ක් තියා ගන්නවා නම්, ඔහු VAT ගෙවන්න ඕනෑ ඒ රුපියල් 10ට පමණයි. රුපියල් 236යි, රුපියල් 10යි, රුපියල් 246යි. Transport එකත් එකතු කළාම රුපියල් 250යි. එතකොට තොග වෙළෙන්දා register වෙලා තිබෙනවා නම්, තොග වෙළෙන්දාගේ වෙළෙඳාමේ VAT එක -register නොවුණොත් තමයි ප්‍රශ්නය. ඔහු register වෙන්න ඕනෑ. ඔහුගේ දවසේ වෙළෙඳාම ඊට වඩා වැඩියි. ඔහු VAT ගෙවන්න ඕනෑ ඔහු එකතු කරපු රුපියල් 10ට විතරයි. සිල්ලර වෙළෙන්දාට සීනි කිලෝව රුපියල් 250ට යනවා. සිල්ලර වෙළෙන්දා රුපියල් 260ට කඩේ සීනි විකුණනවා. එතකොට සිල්ලර වෙළෙන්දා කීයක්ද එකතු කරලා තිබෙන්නේ? ඔහු එකතු කරලා තිබෙන්නේත් රුපියල් 10යි. ඔහුගේ ලාභය ලෙස ඔහු එකතු කරන්නේ රුපියල් 10යි, ගරු කථානායකතුමනි. අන්න ඒ රුපියල් 10ට විතරයි සිල්ලර වෙළෙන්දා VAT එක ගෙවන්න ඕනෑ. ඒ ගණන රුපියල් 1.80ක්. එහෙම නැතිව ඔහු අර රුපියල් 260ටම VAT ගෙවන්නේ නැහැ. ඒ රුපියල් 260 පාරිභෝගිකයාට යන්නේ නැහැ. සිල්ලර වෙළෙන්දා රුපියල් 260ට සීනි

[ගරු වසන්ත සමරසිංහ මහතා]

විකුණනකොට ඔහුට VAT වශයෙන් ගෙවන්න තිබෙන්නේ ඔහු එකතු කළ රුපියල් 10ට විතරයි, ගරු කථානායකතුමනි. ඒ ගණන රුපියල් 1.80යි. ඔහු VAT එකට register වුණාම ඔහුගේ VAT එක refund කරගන්නත් අනෙක් පැත්තට පුළුවන්. අපි ඒ විධියටයි කටයුතු කරලා තිබෙන්නේ. මොකද, කොටසක් VAT ගෙවනවා. කොටසක් VAT නොගෙවා යනවා. එතකොට ඇත්තටම ප්‍රශ්නයක් තිබෙනවා. VAT ගෙවන වෙළෙන්දාගේ මිල ගණන් වැඩි වෙන්න පුළුවන්. VAT නොගෙවන කෙනාගේ මිල ගණන් අඩු වෙන්න පුළුවන්. එහෙම දේවල් පසුගිය දවස්වල කරන්න හැදුවා. අපේ මුදල් අමාත්‍යාංශයෙන් ඒක නැවැත්තුවා. නැවැත්වූවේ කොහොමද? VAT එක set off කරන්න හදනවා. සීනිවල VAT එක වෙන එකකින් set off කරන්න හදනවා. එහෙම කරන්න බැහැ. ඒ අදාළ භාණ්ඩයට විතරයි VAT set off කරන්න පුළුවන්. VAT එක පාරිභෝගිකයාට යන එක කොහොමත් යනවා. ඒක නිෂ්පාදනයේදීම එකතු කරලා තිබෙන්නේ. නිෂ්පාදනයේදී එකතු කළාට පස්සේ තොග වෙළෙන්දා වෙන්න පුළුවන්, සිල්ලර වෙළෙන්දා වෙන්න පුළුවන් ඔහු එකතු කරන කොටසට පමණයි VAT එක ගෙවන්න වෙන්නේ. දවසක වෙළඳාමක් කරන කෙනාට, දවසේ වෙළඳාම ඇතුළේ VAT අය කරන භාණ්ඩ තිබෙනවා. VAT අය කරන්නේ නැති භාණ්ඩ තිබෙනවා. VAT එක තිබෙන වෙළඳාම නම් ඔහු කරන්නේ, ඔහු VAT register වුණාට පස්සේ VAT ගෙවිය යුත්තේ ඔහු එකතු කරන කොටසට පමණයි. ඒ නිසා රුපියල් ලක්ෂයක ආදායමට රුපියල් එක්ලක්ෂ දහඅටදාහක් කියලා VAT එක එන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මේක තමයි ඇත්ත කථාව. හැබැයි, ඇත්ත දැනගෙන ඇත්ත වෙනුවට බොරුව කියනවා, විපක්ෂය. මොකද, වෙන කියන්න දෙයක් නැති නිසා.

ජනාධිපතිතුමා පැය හතරයි, විනාඩි විස්සක් අය වැය කථාව ඉදිරිපත් කළා. ඒකේ ඇතුළේ තිබෙන දේවල් කථාබහට එන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අය වැයක හරය ඒක. ජනතාවට බර පටවන්නේ නැතුව, බදු නොගෙවා ඉන්න පිරිස් බදු දැලට ගෙන ඒම තමයි අය වැයක අරමුණ. ඒ නිසා වක්‍ර බදු ප්‍රමාණය අඩු කරමින්, ඍජු බදු ප්‍රමාණය වැඩි කරන්න අපි උත්සාහ කරමින් තිබෙනවා. ඒ ඇතුළේ තමයි අපි VAT දැල පළල් කරන්න ඕනෑ. මම අහගෙන විපක්ෂයේ රවි කරුණානායක මන්ත්‍රීතුමා කියනවා, "ඔක්කෝටම ගහලා දාන්න. එතකොට හරි" කියලා.

ගරු කථානායකතුමනි, මේක VAT Bill එක නිකුත් කරන තැනට ආවා නම්, ඉදිරියේදී මේ බොහෝ ප්‍රශ්න විසඳෙනවා. ඒ නිසා අපි එතැනටයි මේක ගෙනෙන්න හදන්නේ. එතැනට ගෙනෙන්න යන ගමනේදී හැම කෙනාම තමන් ගෙවිය යුතු බදු මුදල ගෙවීම සඳහා පුරුදු කර ගැනීම තමයි ආණ්ඩුවේ උත්සාහය. ලෝකයේ මොන රටකට ගියත් ඒ රටවල් බදු අය කරන ක්‍රම තිබෙනවා. තේ එකක්, කෝපි එකක් බිව්වත් ඒ බිලේ තිබෙනවා තමන් ගෙවන බද්ද කීයද කියලා. ඒවායේ බදු ප්‍රතිශත වෙනස්. ඒ නිසා සමහර බදු වර්ග අපේ රටේ අඩු කරගන්න ඕනෑ. තව අවුරුදු තුන, හතරක් ගිහිල්ලා හරි VAT එකේ ප්‍රමාණයත් අපි අඩු කරගන්න ඕනෑ. ජනතාවට පහසුවක් වෙන්නේ එතකොට තමයි. හැබැයි, අපි හිටපු තැන, ආර්ථිකය වට්ටලා තිබුණු තැන නිසා අපට යන්න පුළුවන් විධියට අපි පාර හදාගෙන තමයි ඉදිරියට යන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ඒ කථාව මම කිව්වේ නිකම් නොවෙයි, VAT ගැන කියන්නයි.

ගරු කථානායකතුමනි, IMF එකත් එක්ක අපිව පටලවනවා නේ. ඔව්, අපි ආණ්ඩුව ගත්තාට පස්සේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපි එක්ක එකඟ වෙලා තිබුණු ගිවිසුමක් තිබුණා. දැන් කියන්න හදනවා, IMF එකේ එකමයි කරන්නේ කියලා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඔබතුමා දන්නවා, රාජ්‍ය සේවයේ පඩි වැඩි කරන්න කිව්වේ කොහොමද කියලා. ඔවුන් පඩි වැඩි කරන්න කිව්වේ, උද්ධමනයට පහළින්. හැබැයි, අපි එහෙම ද වැඩි කළේ? අපි උද්ධමනයට පහළින් නොවෙයි පඩි වැඩි කළේ. අපි ඒ අයට කිව්වා, "අපේ mandate එක, මේක. අපි ඒකට යන්න ඕනෑ" කියලා. අපිත් හිතනවා, ආර්ථිකයක් ශක්තිමත් කරන්න යනකොට, කඩා වැටිච්ච ආර්ථිකයක් ගොඩනඟන්න යනකොට අපට සමහර තීන්දු තීරණ ගන්න වෙනවා කියලා.

Property Tax එකක් තිබුණා කියලා ඔබතුමන්ලා දන්නවා. ඔන්න, රවි කරුණානායක මන්ත්‍රීතුමා දැන් තමයි එන්නේ. මම කියලා ඉවරයි කථාව. Property Tax එකක් තිබුණා රවි කරුණානායක මන්ත්‍රීතුමා, මතකයි නේ. Property Tax එක ගහන්න තිබුණේ කවදාද? 2025 මාර්තු මාසයේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට කිව්වා, ඒක මේ වතාවේ දමන්න කියලා. අපි කිව්වා, අපි එහෙම අදහසක නැහැ, ඒ නිසා අපි ඒක දමන්නේ නැහැ කියලා. ඒක 2025 මාර්තුවලදී දමන්න කිව්වා. හැබැයි, 2026දීත් නැහැ, Property Tax එක. දැන් ඒගොල්ලන් අපෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, 2027දී දාන්න කියලා. අපි බලමු. අපට එහෙම එකක් වුවමනා වෙන්නේ, රටේ බදු ආදායම ප්‍රමාණවත් නැත්නම්. එතකොට නේ විවිධ බදු වර්ග හඳුන්වා දෙන්නේ. ඒ නිසා අපි ඒ Property Tax එකත් ගහන්නේ නැතුව තමයි මේ යන්නේ.

ඒ වාගේම වාහන ආනයනය පිළිබඳව කථාවක් ආවා. කියන්න හැදුවා, වාහන බදු වැඩි කළා කියලා. ගරු කථානායකතුමනි, වාහනයක් ගෙනාවාට පස්සේ වරායෙන් නිදහස් කරද්දී ගෙවන බදු ටිකක් තිබෙනවා. ඊට පස්සේ ඒ වාහනය අරගෙන ගිහිල්ලා කඩවත නම් කඩවත, මහරගම නම් මහරගම සේල් එකක විකුණනකොට එතැනින් එකතු කරන බදු ටිකක් තිබෙනවා. මොකක්ද, මේ සමාජ ආරක්ෂණ බද්ද - SSCL? ඒ බද්ද එකතු වෙනවාද, නැද්ද කියන එක තීරණය වෙන්නේ මෙහෙමයි. වාහනය වරායෙන් ගොඩ බෑවාට සමහර විට වාහනය විකුණන සේල් එකේ තිබෙනවා අවුරුද්දක්. එතකොට SSCL එක එන්නේ නැහැ අපට. වරායෙන් නිදහස් කරනකොට ඇවිල්ලා තිබෙනවා වාහනයට බද්ද. හැබැයි, SSCL එක එන්නේ නැහැ. ඒ නිසා අපි ආණ්ඩුව විධියට තීරණය කළා, සමාජ ආරක්ෂණ බද්දත් එතැනදීම අය කරලා ගනුදෙනුව ඉවර කරමු කියලා. ඉතින් ඒක වැරැද්දක් නොවෙයි. මොකද, වාහනය සේල් එකෙන් ගන්නකොට ගෙව්වත් ඒ බද්ද ගෙවනවා, වරායෙන් නිදහස් කරනකොට ගෙව්වත් ගෙවනවා. වාහනය ගෙනෙන කෙනා නේ ඒක ගෙවන්න ඕනෑ. කොහොමත් ඒක වාහනයේ බිලට එකතු වෙනවා. ඒ නිසා වාහනයේ බද්ද කොහේදීවත් වැඩි වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. වාහනයේ බද්ද වැඩි වෙලා නැහැ. ඒ වෙනුවට අපි කරලා තිබෙන්නේ, නිසි කලට නිසි විධියට බදු ටික එකතු කර ගැනීම තවත් විධියකට ක්‍රමවත් කිරීමයි. ඒ ක්‍රමවත් කිරීම සඳහා අපි ගත්ත තීරණයක් තමයි ඒක. ඒක බදු වැඩි වීමක් නොවෙයි. ඒක බදු යථාවත් කරලා විධිමත් කරලා එකතු කර ගන්න ගත්ත තීරණයක්. ඉතින් ඒකත් බදු වැඩි වීමක් කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු කියන්න උත්සාහ කරනවා. ඉතින් ආපසු මට කියන්න තිබෙන්නේ ඒක වෙන කියන්න දෙයක් නැති නිසා විලාපයට එකතු කර ගන්නා තවත් එක් කරුණක් කියලා පමණයි.

ගරු කථානායකතුමනි, 2028දී ණය ගෙවීම පිළිබඳවත් බිල්ලෙක් මවන්න උත්සාහ කරනවා. 2028 වෙනකොට අපේ රටට ණය ගෙවා ගන්න බැරි වෙයි කියලා කියා ගන්න තමයි ඒ යන්නේ. රටට ණය ගෙවා ගන්න බැරි වෙයි කියලා කියා ගන්නයි යන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have two more minutes.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
එතුමාට තවත් විනාඩි පහක් ලබා දෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, මේ ණය ආපසු ගෙවීම පිළිබඳ කාරණය ගැන හරි පැහැදිලිව අපි කිව්වා. ජනාධිපතිතුමාත් ඒ ගැන කිව්වා. මොකද, අපි දැනුත් ණය සහ පොලී වාරික ගෙවනවා. ඒ සාමාන්‍ය මුදලක් නොවෙයි, ගරු කථානායකතුමනි. අපි දැනුත් ණය සහ පොලී ගෙවනවා. 2024දී අපේ රටේ මුළු පොලිය රුපියල් බිලියනවලින් ගත්තොත් 2,690යි. විදේශීය පොලී කොටස බිලියන 502යි. ඩොලර් මිලියනවලින් ගත්තොත් 1,674යි. එතකොට 2025දී අපේ සමස්ත පොලී ගෙවීම රුපියල් බිලියන 2,650යි. අපේ විදේශීය පොලී ගෙවීම මිලියන 2,435යි. මම ඩොලර් එක රුපියල් 300යි කියලා අරගෙනයි මේ ගණන හදලා තිබෙන්නේ. ඒ අනුව ගත්තොත්, රුපියල් බිලියන 730යි. 2026දී ගරු කථානායකතුමනි, රුපියල් බිලියන 2,617යි අපේ පොලී ගෙවීම. 2026දී පොලී ගෙවීම රුපියල් බිලියන 2,617යි. ඒ අනුව ගත්තත් වැඩිවීමක් තිබෙනවා. අපේ දේශීය පොලී ගෙවීමේ අඩුවීමක් තිබෙනවා. හැබැයි විදේශීය පොලිය අපට එක විධියකට තිබෙන්නේ සමහර ඒවා. ඒ නිසා ඒ පොලිය ගත්තාම ණය එකතු කරන ප්‍රමාණයක් මේකට එකතු වෙනවා. මේ ගෙවීම ගත්තාම ඩොලර් මිලියන 2,500ක විතර පොලියක් තමයි ගෙවන්නේ. ඒක රුපියල් බිලියනවලින් ගත්තොත් 780යි. ඒ කියන්නේ රුපියල් බිලියන 2,617ක් 2026දී පොලිය ගෙවද්දී, ඒකෙන් 780යි විදේශීය ණය සඳහා පොලිය. එතකොට ගරු කථානායකතුමනි, මේ විධියට 2028ට යනකොට අපේ පොලිය ඩොලර් මිලියන 3,259යි. ඒ නිසා 2025ට සාපේක්ෂව ගත්තත්, අපට වැඩි වෙන්නේ ඩොලර් මිලියන 824යි. ආර්ථිකයේ වර්ධනය, රාජ්‍ය ආදායමේ වර්ධනය, ඒ වාගේම විදේශ සංක්‍රාම වැඩිවීම, අපනයන ආදායම වැඩිවීම, සංචාරක ව්‍යාපාරයේ වැඩිවීම, විදේශ සෘජු ආයෝජනවල ඉහළ යෑම, ජාත්‍යන්තර හා ද්විපාර්ශ්වීය සංවිධාන - IMF, World Bank, ADB - ඒ වාගේම- *[බාධා කිරීමක්]* 2028 ඩොලර් මිලියන 3,259යි. *[බාධා කිරීමක්]* මොනවාද? *[බාධා කිරීමක්]* ඒ ඔක්කෝම නේ. මේ ණය සේවාකරණය ගැන කියන්නේ. *[බාධා කිරීමක්]* ඉතින් අපි කොහොමත් දැන් ගෙවමින් යනවා නේ. අපි දැනුත්, මේ අවුරුද්දේත් ගෙවනවා. ණය පොලී ගෙවීම ගැන විතරයි මම මේ කියන්නේ.

ඒ නිසා අපට වැඩි වෙනවා නම් වැඩි වෙන කොටස තමයි මේක. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අහන්නේ ණය වාරිකයයි, පොලී වාරිකයයි දෙකම ගැන. ඔබතුමා දන්නවා, ගිය අවුරුද්ද වෙනකොට අපට තිබුණා ඩොලර් ප්‍රශ්නයක්. හැබැයි, අපි මේ අවුරුද්ද වෙනකොට ඩොලර් මිලියන 2,000ක වාහන ආනයනය කර තිබෙනවා, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි. ඔබතුමා දන්නවා, සාමාන්‍යයෙන් පසුගිය අවුරුදු කිහිපයම ගෙන බැලුවොත් වාහන ආනයනය කරපු මුදල් ප්‍රමාණය ඩොලර් මිලියන 700යි, 800යි, 900යි, 1,200යි කියලා. අවුරුදු කිහිපයක් වාහන ආනයනය නවත්වා තිබුණු නිසා එකවර ඉල්ලුමක් ඇති වුණා වාහන ආනයනය සඳහා. ඒ නිසා තමයි මේ අවුරුද්දේ ඩොලර් මිලියන 2,000කට ආසන්න ප්‍රමාණයක වාහන ආනයනය සඳහා ඩොලර් වෙන් කරන්න අපට සිදු වෙලා තිබෙන්නේ. නමුත් අපි හිතනවා ලබන අවුරුද්දේ මෙච්චර ප්‍රමාණයක් වෙන එකක් නැහැ කියලා. එය ඊට වඩා අඩු ප්‍රමාණයක, එනම් ඩොලර් මිලියන 1,000ක, 1,200ක වාගේ ප්‍රමාණයක තබාගෙන යන්න පුළුවන් වෙයි. වාහන ආනයනයට ඩොලර් වෙන් කිරීම නොවුණා නම් අපේ විදෙස් සංචිත තවත් ඩොලර් බිලියනයකින් වැඩි වෙනවා, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. විදෙස් සංචිත ඩොලර් බිලියන 6.3 වෙනුවට 7.3ක් දක්වා ගෙන යන්න තිබුණා. හැබැයි, අපි මෙය පාලනය කරමින් යන්නේ. ගරු ජනාධිපතිතුමා එදා කිව්වා, භාණ්ඩාගාරය සතුව ට්‍රිලියනයකට වැඩි රුපියල් තිබෙනවා කියලා. 2028දී ණය ගෙවීම පිළිබඳ ප්‍රශ්නයක් නැහැ කියලා අපි කියන්නේ ඇයි? පොලී වැඩි වීම විශාල ලෙස සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා අපේ ණය කොටස සහ පොලී කොටස කියන දෙකම එකට එකතු කරලා ගෙවන්න අපට පුළුවන්. අපි 2026, 2027, 2028 වර්ෂවල ආර්ථිකය ශක්තිමත් කරගෙන ඉදිරියට යන්න ඕනෑ. අපට තිබෙනවා ආර්ථික ඉලක්ක. ඒ ආර්ථික ඉලක්ක වාගේම සංචාරක ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ ඉලක්කයක් ද අපට තිබෙනවා.

ඒ ටික කරන ගමන් අපි ජනතාවගේ පැත්තෙනුත් බඩු මිල අඩු කිරීම ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක වැඩ කරමින් තිබෙනවා. ගොවි ජනතාවගේ පැත්තෙන් ගත්තොත්, මේ දිනවල ගොවි ජනතාව නිශ්චිතව මුහුණ දෙන ගැටලුවක් තිබෙනවා. ඒ තමයි අල, ලූනු ප්‍රශ්නය. අපි අයවැයෙන් තීරණයක් ගෙන තිබෙනවා. සමුපකාර තොග වෙළඳ සංස්ථාව නැවත ස්ථාපිත කර තිබෙනවා. 2026 වසරේ සිට කිසිදු ගොවියෙකුට ආපසු හැරිලා යන්නේ නැති වෙන්න අල සහ ලූනු මිල දී ගැනීම අපි සමුපකාර තොග වෙළඳ සංස්ථාව හරහා කරනවා. ඒ සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා. සාමාන්‍යයෙන් සියයට 20ක් වෙළෙඳ පොළෙන් ගත්තොත් අපට මේක පාලනය කරන්න පුළුවන්, ගරු කථානායකතුමනි. ඒ කියන්නේ, මාස 2ක් ඇතුළත ඒක circulate කරන්න පුළුවන්. ඒ නිසා අල, ලූනු දෙකම මිල දී ගන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ අපි මේ වෙනකොට හදමින් තිබෙනවා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයත්, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයත් ඒකාබද්ධව. ඒ සඳහා අය වැයෙන් අපට රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා. තවත් අවශ්‍ය නම් මුදල් වෙන් කර ගැනීමේ ඉඩ කඩ තිබෙනවා. ගොවි ජනතාවගේ පැත්තෙන් බලලා ඒ වැඩේ කරලා තිබෙනවා. පසුගිය අවුරුද්ද පුරාවට අපි ඒ විධියට කටයුතු කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. 2024 වර්ෂයත් එක්ක අරගෙන බඩු මිල පිළිබඳව කියන්න ඕනෑ. අපි ජනතාව මත බදු පැටෙව්වේ නැහැ; අලුතින් බදු වර්ග ගැහුවේ නැහැ. ගොවියා ආරක්ෂා කිරීම වෙනුවෙන් නම් අපි සමහර බදු ගැහුවා. ආනයනික අල සඳහා වන බද්ද රුපියල් 80ක් කළා, ආනයනික ලූනුවල බද්ද රුපියල් 50ක් කළා. එහෙම කළේ ගොවි ජනතාවගේ ආරක්ෂාවට. ගොවියාගේ ආරක්ෂාවට ඒ වැඩේ කරගෙන යන ගමන් අපි අත්‍යවශ්‍ය භාණ්ඩ වර්ග 40ක මිල අඩු කර තිබෙනවා, පසුගිය කාලය පුරාවට. ඒ පිළිබඳ ලැයිස්තුවක් මා ළඟ තිබෙනවා, ගරු කථානායකතුමනි. මම මේ අවස්ථාවේදී මේ ලැයිස්තුව **සභාගත*** කරනවා.

එහි average එක කොච්චරද කිව්වොත්, සියයට 17.7ක්. මෙම ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ තමයි වෙළෙඳ පොළේ වැඩියෙන්ම අළෙවි වන භාණ්ඩ. තවත් භාණ්ඩ වර්ග 12ක් තිබෙනවා. ඒවායේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු වසන්ත සමරසිංහ මහතා]

වැඩි වීම සියයට 9.6යි. ඒ කියන්නේ, මිල වැඩි වෙච්ච භාණ්ඩ වර්ග 12 තිබෙනවා. භාණ්ඩ වර්ග 40ක් තිබෙනවා මිල අඩු වෙච්ච ඒවා. අපි මේ විධියට බඩු මිල අඩු කරලා, ජනතාවට සහන දෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ නිසා අපි විපක්ෂයට ආරාධනා කරනවා මෙන්න මේ අය වැයේ සමතුලිතය පිළිබඳව බලන්න කියලා. සියලු ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කරලා, සියලු ක්ෂේත්‍රවල ඉන්න පුරවැසියන් පිළිබඳව කථා බහ කරලා අපි මේ අය වැය ඇතුළේ වැඩ කරන්න පටන් ගෙන තිබෙනවා, ජනතාවට අවශ්‍ය සහන ටික දෙන්න අපි වැඩ කටයුතු කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම කථාව අවසන් කරන්නයි හදන්නේ. අපි පසුගිය අවුරුද්දේ වැඩ පටන් ගන්න කොට අපට වැඩ කරන්න තිබුණු කාලය අඩුයි. අපි 2025 අය වැය සම්මත කළේ මාර්තු 21වැනි දා. ඊට පසු election එක ආවා, මැයි මාසයේ. ජූනි මාසයේ සිට මාස 6කට ආසන්න කාලයක් තමයි ඒ අය වැය අනුව අපට මේ අවුරුද්දේ වැඩ කරන්න තිබුණේ. නමුත්, වියදම් කළ යුතු මුදල් ආණ්ඩුව වියදම් කළේ නැහැ කියලා විපක්ෂය දැන් කියනවා. ඒ නිසා මා කියන්නේ, මේ මාස 6 තුළ අපි කර තිබෙන වැඩ දෙස ආපසු හැරිලා බලන්න කියලායි. පළාත් පාලන ඡන්දය නිසාත් අපට සමහර වියදම් කරන්න බැරි වුණා.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, අපිත් ඔබතුමන්ලාට කාරණයක් කියන්න ඕනෑ. ඔබතුමන්ලාගේ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඇවිල්ලා මාව හමු වුණා. විපක්ෂයට තවම බැරි වෙලා තිබෙනවා, අපේ දිස්ත්‍රික්කයේ සභා 3කට තේරී පත් වෙච්ච මන්ත්‍රීවරු ටික පත් කර ගන්න, ගරු කථානායකතුමනි. අනුරාධපුර මහ නගර සභාවේ, නැඟෙනහිර නුවරගම්පළාත ප්‍රාදේශීය සභාවේ සහ මධ්‍යම නුවරගම්පළාත ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු පත් කරලා නැහැ. ඒගොල්ලන් ඇවිත් මා හමු වෙලා කිව්වා, "ගරු ඇමතිතුමා, පුළුවන් නම් අපේ කට්ටියට කියලා අප පත් කරලා දෙන්න" කියලා. මම ඒ කාරණය ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ අවධානයට යොමු කරනවා. ඉක්මනට ඒ අය පත් කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
පත් කරලා ඉවරයි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හැබැයි, පසුගිය සභා වාරයේත් ආවේ නැහැ. එහෙම නම් එයි නේ ඊළඟ සභා රැස්වීමට? එහෙම නම් බොහොම හොඳයි. මේක තමයි තත්ත්වය. ගරු කථානායකතුමනි, ආණ්ඩුව මාස 6ක් ඇතුළත රුපියල් බිලියන 1,400ක ප්‍රාග්ධන වියදම් වෙන් කරමින් කරපු ව්‍යාපෘති තිබෙනවා. ඔව්, ඒ සමහර ඒවා ප්‍රමාදයි.

සමහර ඒවාට tenders දාලා තිබෙනවා; ජාත්‍යන්තර tendersවලටත් ගිහිල්ලා තිබෙනවා. Cabinet-Appointed Negotiating Committeesවලින් ගිහිල්ලා තිබෙනවා. මේවාත් වෙමින් තිබෙන්නේ. තව මාස දෙකක් තිබෙනවා; නොවැම්බර් මාසයත් තිබෙනවා, දෙසැම්බර් මාසයත් තිබෙනවා. පසුගිය අවුරුදුවල සමහර Budgets බැලුවාම සියයට 55යි, 60යි, 65යි වියදම් කරලා තිබෙන්නේ. අපි උත්සාහ කරනවා, මේ මාස දෙකත් ඉවර වනකොට සියයට සියයක්ම වියදම් කරලා මේ වැඩේ උපරිමයෙන් කරගෙන යන්න පුළුවන්ද කියලා බලන්න.

විපක්ෂය බොහෝ දේවල් කියනවා. ඒ විලාපයට අපි ඇහුම්කන් දෙන්න ගියොත් අය වැය ගැන කථා කරන්න වෙන්නේ නැහැ. ඒ නිසා අපි විපක්ෂයට ආරාධනා කරනවා, අය වැය කථාවට එන්න කියලා.

ගරු කථානායකතුමනි, මම මේ කථාව අවසන් කරන්න හිතුවා, ජාතක පාලි අටුවාවේ ඇතුළත්ව තිබෙන, බුදුරජාණන් වහන්සේගේ දේශනාවකින්. "අපිරිසිදු පොළොවක් පිරිසිදු කරගෙන යනවා නම් ඔබේ ගමන යන්න බැරි වෙනවා. ඒ නිසා අපිරිසිදු පොළොවක ගමන් කරන්න මිරිවැඩි සඟලක් හෙවත් සෙරෙප්පු දෙකක් පාවිච්චි කරන්න" කියලා එම දේශනාවේ තිබෙනවා. ඒ වාගේ තමයි දැන් අපටත් කරන්න වෙලා තිබෙන්නේ. මේ සමාජය පිරිසිදු කරගෙන යන්නයි තිබෙන්නේ. විපක්ෂය මේක අපිරිසිදු කරන්න උත්සාහ කළාට වැඩක් වෙන්නේ නැහැ. අපි මේ ගමන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, please wind up.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

හොඳ ආණ්ඩුවකට කොච්චර මඩ ගහන්න හැදුවත් වැඩක් වෙන්නේ නැහැ. අටුවා පාලියෙහි කියනවා, සුදු හඳුන් ගසකට පොරව තලයකින් කෙටුවාම ඒ පොරෝ තලයත් සුවඳයි කියලා. ඒ වාගේ මේ ආණ්ඩුවට කොච්චර ගහන්න හැදුවත්, මේ ආණ්ඩුව විපක්ෂයටත් සේවයක් කරලායි තිබෙන්නේ. මොකද, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, ඒ ජනතාවටත් සේවයක් කරන්න තමයි මේ ආණ්ඩුව මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා සඳුන් ගසකට කොටන පොරව තලය සුවඳ ගහනවා වාගේ විපක්ෂයටත්, මුළු රටටමත් ප්‍රතිලාභ ලබා දෙන අය වැයක් අප ඉදිරිපත් කර තිබෙනවා කියන කාරණය කියමින් මම නවතිනවා. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Chamara Sampath Dasanayake.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Ravi Karunanayake?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ මිත්‍ර ඇමති වසන්ත සමරසිංහ මැතිතුමා අවශ්‍ය වෙලාවට අප පාවිච්චි කරලා, අපේ හොඳ ගුණාංග ආදර්ශයට ගන්න හදන එක ගැනයි මම මේ මතක් කරන්නේ. මම කිව්වේ, VAT එක අපි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Point of Order එකක්. එතුමා මගේ නම කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, එතුමා වරදක් කිව්වේ නැහැ. මම ඒකට එකතු කිරීමක් කරන්නේ.

2016 ඔක්තෝබර් මාසයේ 28වන දා, මේ වාගේම අය වැය ඉදිරිපත් කරපු අවස්ථාවක අපි ගෙනාවා යෝජනාවක්, VAT එකේ threshold එක අඩු කරන්න ඕනෑ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක procedure සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එකමොකක්ද? *[බාධා කිරීමක්]* ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාරණය point of Order එකක් නොවෙයි. *[බාධා කිරීමක්]* ඒක procedure එකේ ප්‍රශ්නයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, බොහොම ගෞරවයෙන් මම ඔබතුමාට Standing Order එකක් පෙන්වන්නයි යන්නේ. මම ඒක කියවන්නම්, මැදින් නවත්වන්න එපා. Standing Order No. 91.(l) states, I quote:

> "(l) Any Member deviating from the rules may be immediately called to order by the Speaker;"

ගරු කථානායකතුමා, deviating from the rules. දැන් වසන්ත සමරසිංහ ඇමතිතුමා කථාව පටන් ගත්තේම "සුජීව සේනසිංහ" කියන නම කියලා. මෙන්න මේ හඬ පටය අහගන්න.

***(මේ අවස්ථාවේදී හඬ පටයක් ඇසෙන්නට සලස්වන ලදී.)***
*( இவ்வேளையில் ஒலிப்பதிவொன்று ஒலிக்கச் செய்யப்பட்டது. )*
*(At this stage, an audio recording was played.)*

ගරු කථානායකතුමා, අපි මේක පෙන්වලා දෙනකොට මා එළියට දානවා කියපු එක,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා මේක අහගන්න. ස්ථාවර නියෝගවල සඳහන්ව තිබෙනවා, "කිසිම මන්ත්‍රීවරයෙකු වෙනත් මන්ත්‍රීවරයකුට අයුතු ආරෝපිත චෝදනාවක් කිරීම..." යනුවෙන්. මෙතැන එවැනි කිසිම චෝදනාවක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ඒ කාරණයේ point of Order එකක් නැත.

The Hon. Chamara Sampath Dasanayake. Hon. Member, you have 18 minutes.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, -

[පූ.භා. 11.05]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු රවී කරුණානායක මැතිතුමා, පොඩ්ඩක් ඉන්නකෝ. මම කථාව පටන් ගත්තා.

ගරු කථානායකතුමනි, අය වැය දෙවන වර කියැවීමේ විවාදයේ දෙවෙනි දවසේ මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ජනාධිපතිතුමා පසුගිය සතියේ "රටම එකට" ජාතික මෙහෙයුම වැඩසටහන ලොකු උත්සවයක් තියලා ආරම්භ කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමා "රටම එකට ජාතික මෙහෙයුම" මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන පටන් අරගෙන දින දෙකක් යන්න කලින් පැලියගොඩ නාගරික මන්ත්‍රීතුමියගේ මහත්තයා එප්පාවලදී කුඩුත් එක්ක අහු වුණා. ඒ වාගේම මීට මාසයකට කලින් දෙහිවල - ගල්කිස්ස නගර සභාවේ කුමාරි

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

කරුණාජීව කියන ජාතික ජන බලවේගයේ මන්ත්‍රීතුමියගේ පුතා කුඩුත් එක්ක අහු වෙලා තිබෙනවා. නමුත්, මේ වනතුරු එතුමිය අයින් වෙලාත් නැහැ. ඒ ගැන ආණ්ඩුව ප්‍රකාශයක් කරලාත් නැහැ. හැබැයි, මේ අතරේ පොලිස්පතිතුමා 2025.11.05වැනි දා ලිපියක් නිකුත් කරනවා, "අත්අඩංගුවට ගන්නා සැකකරුවන්ගේ ඡායාරූප සහ විමර්ශන තොරතුරු සමාජ මාධ්‍ය සහ වෙනත් මාධ්‍ය මඟින් පළ කරන්න එපා" කියලා. මේක නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන්ට වාගේම පොලිස් ස්ථානාධිපතිවරුන්ට අපේ පොලිස්පතිතුමා දැන් යවා තිබෙනවා. පොලිස්පතිතුමා නින්දෙන් නැඟිටලා තිබෙන්නේ පැලියගොඩ නගර සභාවේ මන්ත්‍රීතුමියගේ මහත්තයා කුඩුත් එක්ක අහු වුණාට පසුවයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එතෙක් කළේ මොකක්ද? රට ඉඳන් අල්ලාගෙන ඇවිල්ලා ප්ලේන් එකෙන් බස්සවපු වෙලාවේ සිට සෙව්වන්දිලා පෙන්වමින් රට වටේ - මිද්දෙනියට, තවත් පළාත්වලට - අරගෙන ගිහිල්ලා, කරට අත දමාගෙන ෆොටෝ අරගෙන, ඒවා පෙන්වලා ඉවර වෙලා ඒ ඔක්කෝම මීඩියා සන්දර්ශන දැම්මාට පස්සේ තමයි පොලිස්පතිට මේ ලියුම නිකුත් කරන්න මතක් වෙලා තිබෙන්නේ. පොලිස්පතිතුමා ඒ වාගේ මීඩියා සන්දර්ශන පවත්වලා දැන් මෙවැනි ලිපියක් නිකුත් කිරීම ගැන විපක්ෂය හැටියට අපි කනගාටු වනවා. ඒ විතරක් නොවෙයි. පැලියගොඩ මන්ත්‍රීතුමිය තවම අත්අඩංගුවට අරගෙන නැහැ. එතුමියට විශාල බූදලයක් තිබෙනවා; දේපළ තිබෙනවා. ඒවා ගැන හොයන්න ඕනෑ. ඒ වාගේම දෙහිවල - ගල්කිස්ස නගර සභාවේ කුමාරි කරුණාජීව මන්ත්‍රීතුමිය ගැන හොයන්නේ නැහැ, බලන්නේ නැහැ. එතුමියගේ බැංකු ගිණුම් සහ දේපළ තිබෙනවා. අනෙක් අයගේ දේපළ තහනම් කළා නම්, බැංකු ගිණුම් පිළිබඳව පරීක්ෂා කළා නම්, මේවා ගැනත් බලන්න ඕනෑ කියන එක මා මේ අවස්ථාවේ කියනවා.

අපි 2026 අය වැය ගැන කථා කරන්න ඉස්සෙල්ලා 2025 අය වැය ගැන කථා කරන්න ඕනෑ. මගේ ළඟ මේ තිබෙන්නේ, 2025 අය වැය කථාව. ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මේ 2025 අය වැය කථාව ඇතුළත් පොත ගෙනැල්ලා මේ සභාවේදී කියෙව්වා. ගිය වතාවේ පැය 4ක් නොවෙයි, පැය 3ක් කියෙව්වා. 2025දී අය වැය යෝජනා 57ක් තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ යෝජනා 57න්, 28ක් ඉටු කරලා නැහැ. ප්‍රතිඵලය ශූන්‍ය - බින්දුවයි. කිසිම දෙයක් කෙරිලා නැහැ. යෝජනා 29ක් දැනට ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ප්‍රාග්ධන වියදම්වලින් දැනට සියයට 24යි වියදම් වෙලා තිබෙන්නේ. ජනාධිපතිතුමා අය වැය පරතරය ගැන කිව්වා. 2024ට වැඩිය, 2025ට වැඩිය අය වැය පරතරය අඩු වුණේ, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදනවලින් සියයට 75ක මුදලක් ආණ්ඩුවට ඉතුරු වුණු නිසාත්, ඒ එක්කම වාහන ආනයනයෙන් රුපියල් බිලියන 800කට, 900කට වැඩි මුදලක් එකතු වුණ නිසායි. ඒ නිසා තමයි, මෙවර අය වැය පරතරය සියයට 55 දක්වා අඩු කර ගන්න ආණ්ඩුවට පුළුවන් වුණේ. ඒක මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ.

ඒ එක්කම මම කියන්න ඕනෑ, 2025 අය වැය යෝජනාවක් ගැන. ගල්ඔය, රාජාංගනය, මින්නේරිය යෝජනා ක්‍රමවල සංවර්ධන කටයුතු වෙනුවෙන් 2025දී රුපියල් මිලියන 2,000ක් ලබා දෙන්න යෝජනා කරලා තිබෙනවා. රාජාංගනය තිබෙන්නේ, තඹුත්තේගම. ඒ, ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ ගම. ඒ යෝජනාව වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා, රුපියල් මිලියන 2,000ක්. ඒකේ ප්‍රගතිය සියයට 17යි. ඒ වෙනුවෙන් වෙන් කළ මුදල රුපියල් මිලියන 2,000යි. මම මේ අය වැය යෝජනා ඔක්කෝම ගැන කියන්නේ නැහැ.

ඊළඟට, අනුරාධපුර නගරයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රුපියල් මිලියන 750ක් වෙන් කරලා තිබෙනවා. මම මේ කියන්නේ, අනුරාධපුරය දිස්ත්‍රික්කය වෙනුවෙන් යෝජනා කරලා තිබෙන ටික. මම ලංකාවේ අනෙක් දිස්ත්‍රික්කවලට අදාළ යෝජනා ටික කියන්නේ නැහැ. අනුරාධපුරය කියන්නේ, ජනාධිපතිතුමා, කෘෂිකර්ම ඇමතිතුමා සහ වෙළෙඳ ඇමතිතුමා ඉන්න දිස්ත්‍රික්කය. අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් විෂය භාර ඇමතිවරු තුන්දෙනෙක් පත් වෙලා ඉන්නවා. ඉතිහාසයේ කවදාකවත් විෂය භාර අමාත්‍යවරු තුන්දෙනෙක් එකම දිස්ත්‍රික්කයකින් පත් වෙලා නැහැ. මුදල් විෂය භාර ඇමතිවරයා වන ජනාධිපතිතුමාත් අනුරාධපුරයේ, වෙළෙඳ විෂය භාර ඇමතිවරයාත් අනුරාධපුරයේ, කෘෂිකර්ම විෂය භාර ඇමතිවරයාත් අනුරාධපුරයේ. විෂය භාර අමාත්‍යවරු තුන්දෙනෙක් එකම දිස්ත්‍රික්කයෙන් බිහි වුණු එකම ආණ්ඩුව තමයි, මේ ආණ්ඩුව. එම නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රගතිය බලන්න ඕනෑ ඔක්කෝටම ඉස්සෙල්ලා. රටේ අනෙක් දිස්ත්‍රික්කවල ප්‍රගතිය බලන්න ඉස්සෙල්ලා අනුරාධපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් වෙන් කළ මුදල්වල ප්‍රගතිය බැලුවාම, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙන් කළ මුදල්වලින් වැඩක් වෙලා නැහැ. ප්‍රගතිය ශූන්‍ය.

ඊළඟට, ගිරිබාව - එප්පාවල ජල යෝජනා ක්‍රමය නැවත ආරම්භ කිරීම සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. එප්පාවල තිබෙන්නේ කොහේද? ඒක තඹුත්තේගමට අල්ලපු ගම. ගිරිබාව - එප්පාවල ජල යෝජනා ක්‍රමයේ ප්‍රගතියත් ශූන්‍ය. අපි පාර්ලිමේන්තුවට වාගේම අදාළ ආයතනවලට කථා කරලා පසුගිය අය වැය යෝජනාවල ප්‍රගතිය ගැන හොයා බැලුවා. ලංකාවේ අනෙක් දිස්ත්‍රික්කවල ඒවා මම හොයන්නේ නැහැ.

ඒ වාගේම, අලුත් අවුරුද්දට සහන මල්ලක් දෙනවා කියලා රුපියල් මිලියන 1,000ක් ගිය සැරේ අය වැයෙන් වෙන් කළා, මහා උජාරුවෙන් අත්පුඩි ගහලා. නමුත්, සහන මල්ල තවම නැහැ. අලුත් අවුරුද්ද ඉවර වෙලා දැන් ඊළඟ අවුරුද්දත් එනවා. බෙදපු සහන මල්ලක් නම් තවම මිනිස්සු අතරට ගියේත් නැහැ, හම්බ වුණේත් නැහැ. හිටපු කථානායකතුමාගේ ජපානයේ ලියුම වාගේ තමයි, බඩු මල්ල තවම නැහැ. හිටපු කථානායකතුමාගේ ජපානයේ ලියුම තවම හොයනවා නේ. සුනාමියට ගිහිල්ලා නේ ජපානයේ ලියුම. ඒ වාගේ අලුත් අවුරුද්දට බෙදනවා කියපු සහන මල්ලත් තවම නැහැ. ඒ නිසා පසුගිය අය වැය තුළින් කරපු කිසිම වැඩක් නැහැ.

දැන් මේ සභාවේ වෙළෙඳ ඇමතිතුමා ඉන්නවා. පසුගිය අය වැයේ සියයට සියයක ප්‍රගතියක් ලබා තිබුණේ මොනවාටද කියලා දන්නවාද? ඒ අය වැයේ සියයට සියයක ප්‍රගතියක් ලබා තිබුණේ මොකටද? රුපියල් මිලියන 20,000ක් SriLankan Airlines එකට වෙන් කළා. ඒ වෙලාවේදීම චෙක් එක දුන්නා, SriLankan Airlines එකට. එතකොට ඒකේ ප්‍රගතිය ගන්න පුළුවන් නේ. කෙළින්ම ඒ රුපියල් මිලියන 20,000 SriLankan Airlines එකට යැව්වා. SriLankan Airlines එකේ ගුවන් යානයක ගිහින් නැති අපේ රටේ මිනිස්සු කොච්චර ඉන්නවාද? Airport එක දන්නේ නැති අහිංසක මිනිස්සු කොච්චර මේ රටේ ඉන්නවාද? මේ රටේ අහිංසක මිනිසුන්ගේ බදු මුදල්වලින් රුපියල් මිලියන 20,000ක් SriLankan Airlines එකට ගිය අවුරුද්දේ දුන්නා. අපේ රටේ ග්‍රාම නිලධාරි වසම් 14,500ක් තිබෙනවා. මම නිකම් ඒ ගණනින් මේ මුදල බෙදලා බැලුවා. SriLankan Airlines එකට දීපු රුපියල් මිලියන 20,000 ඒ ග්‍රාම නිලධාරි වසම් 14,500ට බෙදලා දුන්නා නම් එක ග්‍රාම නිලධාරි වසමකට, -වතුර පයිප්පයක් හදා ගන්න, බෝක්කුවක් හදා ගන්න- රුපියල් ලක්ෂ 13ක් වෙන් කරන්න තිබුණා. එහෙම බැලුවාම සියයට සියයක ප්‍රගතියක් ලබා

තිබෙන්නේ වැටුප් වැඩි කිරීමෙනුයි, SriLankan Airlines එකට දීපු එකෙනුයි, රජයට වෙන් කළ අනෙක් මුදල්වලිනුයි විතරයි. ප්‍රාග්ධන වියදම්වල සියයට සියයක ප්‍රගතියක් නැහැ, සියයට 25යි. ඒකත් මේ වෙලාවේ මම කියන්න ඕනෑ.

ඊළඟ කාරණය මේකයි. අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා බොහොම උජාරුවෙන් මාධ්‍ය සාකච්ඡාවකදී කිව්වා, ලූනු වැඩියෙන් හැදුවා කියලා. ඇමතිතුමනි, නෙදර්ලන්තයේ ජනගහනය මිලියන 17යි, අපේ මිලියන 22යි. අද ලෝකයේ කෘෂිකාර්මික නිෂ්පාදන අතින් දෙවන තැන ඉන්නේ නෙදර්ලන්තය. නෙදර්ලන්තය කවදාවත් මිනිස්සුන්ට කියලා නැහැ, වැඩියෙන් හදන්න එපා කියලා. ඔබතුමා කියනවා, මේ සැරේ ලූනු වැඩියෙන් හදලා තිබෙනවා කියලා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ඔබතුමා මගේ කථාවෙන් පස්සේ කථා කරන්න. මගේ කථාවෙන් පසුව කථා කරමු. ඔබතුමා මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා, මේ සැරේ ලූනු වැඩියෙන් හැදුවා කියලා. ඔබතුමා තඹුත්තේගම. ජනාධිපතිතුමා ඉපදුණේ කොහේද? ගලේවෙල ඉස්පිරිතාලේ තමයි ජනාධිපතිතුමා ඉපදුණේ. ගලේවෙල තිබෙන්නේ දඹුල්ලේ. ලූනු හදන ගොවියෝ ඉන්නේ ගලේවෙල. ලාල් කාන්ත මාතලේ හන්දියේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා තඹුත්තේගම. අද මේ රටේ ප්‍රශ්නය කොහේද තිබෙන්නේ? ජනාධිපතිතුමාගේ මුල් ගම ආඬියාගල. ජනාධිපතිතුමා ඉස්කෝලේ ගිය කාලයේත් ආඬියාගල ප්‍රදේශයේ මිරිස් වවලා තිබෙනවා. ජනාධිපතිතුමාගේ මෝටර්බයිසිකලය -තැපැල් නයින්ටිය- තවම ආඬියාගල තිබෙනවා. ජනාධිපතිතුමා දුක් විඳලා ආපු කෙනෙක්. අපි ඒක නැහැ කියන්නේ නැහැ. අද වනකොට ජනාධිපතිතුමාගේ ගමේ මිනිස්සුත් ලූනු වවනවා. කැකිරාව ආසනයට තමයි ආඬියාගල අයිති. ගලේවෙල අයිති වෙන්නේ අල්ලපු වැටේ තිබෙන මාතලේට. අද ලූනු ගොවියෝ ඉන්නේ කොයි කොටසේද? ලූනු ගොවියෝ ඉන්නේ මාතලේ, ගලේවෙල, දඹුල්ල කියන ඔය කොටසේ.

අද මොකද වෙලා තිබෙන්නේ? රට හදන්නත් පුළුවන්. රට වට්ටන්නත් පුළුවන්. ලාල් කාන්ත නම් කොහොමත් ඇමතිකම කරන්නේ නැහැ. ඒක අපි දන්නවා. එතුමා බයිලා ගහමින් ඉන්නවා. ඒ කෘෂිකර්ම ඇමතිකමෙන් මේ රටට වැඩක් නැහැ. ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා තමයි, 1970-1977 සමඟි පෙරමුණ ආණ්ඩුව නැති කළේ. ඒ වාගේම තමයි, එක එක අය ප්‍රේමදාස මහත්තයා නැති කළා. මහින්ද රාජපක්ෂ පවුලේ අය නැති කළා. ගෝඨාභය සහෝදරයෝ නැති කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තුන්කට්ටුවත් ලිප්ගල් තුන වාගේ. ජනාධිපති ආඬියාගල, වෙළෙඳ ඇමති තඹුත්තේගම, කෘෂිකර්ම ඇමති ලාල් කාන්ත මාතලේ හන්දියේ. ලිප්ගල් තුනක් වාගේ නායකයෝ තුන්දෙනෙක්. මේ රටේ ප්‍රධාන නායකයෝ තුන්දෙනෙක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ වුණත්, අද එතුමන්ලාට අනුරාධපුරයේ ඉඳන් දඹුල්ලට යන්න බැහැ. මොකද, ලූනු ගොවියෝ ගහනවා. ලූනු ගොවියෝ එළවනවා. අද ලූනු ගොවියෝ අනාථයි. ලූනු ගොවීන්ගේ ප්‍රශ්නය එහෙමම තිබෙනවා.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මීට මාස 6කට පමණ කලින් මම මේ ගරු සභාවට සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කළා. මම එදා කිව්වා අල ගලවනකොට, ලූනු ගලවනකොට tax එක ගහන්න කියලා. මේ ඇමතිතුමා එදා ඒ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව යටතේ ගෙනාපු විවාදයට සහභාගි වුණේ නැහැ. අර වවුනියාව පැත්තේ මෙලොව හසරක් දන්නේ නැති නියෝජ්‍ය ඇමති කෙනෙක් මට උත්තර දෙන්න ආවා. අපේ පැත්තේ අල ගොවීන්, වැලිමඩ අල ගොවීන් - ඔන්න ඇමතිතුමනි, අද ගහනවා - අද කැප්පෙටිපොල වට කරලා. අද දඹුල්ල වට කරලා. අද ආර්ථික මධ්‍යස්ථාන වට කරනවා. අද ගොවීන් එළියට බැහැලා. ඔබතුමා මේක සුළුවෙන් හිතන්න එපා. අපි ඒ කාලයේ සුළුවෙන් හිතපු නිසා තමයි අපේ ගෙවල් පිච්චුවේ. අපි සුළුවෙන් හිතපු නිසා තමයි නිට්ටඹුවේදී අපේ මන්ත්‍රී කෙනෙක් මරා දැම්මේ. අපි ගණන් ගත්තේ නැති නිසා තමයි මිනිස්සු අපේ ගෙවල් ගිනි තිබ්බේ. ඒ නිසා ඔබතුමන්ලා මේක සුළුවෙන් හිතන්න එපා. දඹුල්ල, මාතලේ, ගල්කිරියාගම, ගල්නෑව, එප්පාවල, කැකිරාව වාගේ පැතිවල ලූනු කොච්චර කුණු වෙලාද? අනුරාධපුර දිස්ත්‍රික්කය ගැන ඔබතුමාට වඩා හොඳට මම කියන්නම්. අද ඒ පැතිවල මිනිස්සු නැති වෙලා. ඒ මිනිස්සු පාරට බැහැලා තිබෙන්නේ. ඒ මිනිස්සු කබලෙන් ළිපට වැටිලා ඉන්නේ.

ගරු ඇමතිතුමනි, ඒ මදිවාට ඔබතුමා කරන්න හදන්නේ මොකක්ද? ඔබතුමා නැති ප්‍රශ්න හදන්න එපා, ඇමතිතුමා. ආණ්ඩුව යන විධියට යන්න දෙන්න. දඹුල්ලේ ජනාධිපතිවරණ රැස්වීම පැවැති වෙලාවේ ඔබතුමන්ලා මොකක්ද කිව්වේ? මම ඒ voice-cut එක මෙතැනදී දමන්නේ නැහැ. දඹුල්ලේ ජනාධිපතිවරණ රැස්වීම පැවැති වෙලාවේ වත්මන් ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ? දඹුල්ල මාර්කට් එකේ අයට ඔප්පු දෙනවා කිව්වා, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය දියුණු කරනවා කිව්වා. අද මොකක්ද කරලා තිබෙන්නේ? අද වනවිට මුදල් අමාත්‍යාංශයේ හිටපු ද්‍රවිඩ ලේකම් ඔබතුමා ළඟ ඉන්නේ. මුදල් අමාත්‍යාංශයේ ඉඳලා ආපු ද්‍රවිඩ ලේකම්තුමා තමයි අද ඔබතුමාගේ Secretary. ඔබතුමා එතුමා කියන විධියට වැඩ කරන්න එපා. ඒ තීන්දු තීරණ ඔබතුමා ගන්න.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, හෙට අනිද්දා වෙනකොට දඹුල්ල මාර්කට් එකේ අය එළියට බහිනවා. හැප්පෙන්න බැහැ. දඹුල්ලේ අය එළියේ තියාගෙන බඩු විකුණයි, මාර්කට් එක පැත්තක තිබියදී. කැප්පෙටිපොළ අයත් එළියේ තියාගෙන බඩු විකුණයි. අද මෙතුමා කරන්න හදන්නේ මොකක්ද? National Agri Market Services Limited කියලා company එකක් හදන්න යනවා. ආර්ථික මධ්‍යස්ථාන පවත්වාගෙන ආවේ දිසාපති, ප්‍රාදේශීය ලේකම් ඇතුළු මණ්ඩලයක් යටතේ. 1999 සිට මේ ආර්ථික මධ්‍යස්ථාන පවත්වාගෙන යනවා. ඒක වෙනස් කරලා මේ ඇමතිතුමා company එකක් හදන්න යනවා. කොම්පැනියක් හැදුවාම මොකක්ද වෙන්නේ? දඹුල්ලේ මුදලාලිලා එක්ක හැප්පෙන්න බැහැ, ඇමතිතුමා. මරණෙට, මඟුලට උදවු කරන්නේ, තෙල් බෙහෙත් ටික ගන්න උදවු කරන්නේ, ඒ ඔක්කෝටම උදවු කරන්නේ ඒ ව්‍යාපාරික ප්‍රජාව. ව්‍යාපාරික ප්‍රජාව තරහ කරගෙන ආණ්ඩුවකට ඉදිරියට යන්න බැහැ. එහෙම නම් ඩඩ්ලි තරහ කරගෙන යන්න කෝ, ඔයගොල්ලන්. නිපුණ තරහ කරගෙන යන්න කෝ. එහෙම යන්න බැහැ. අපි මේ ව්‍යාපාර ගැන හොඳට දන්නවා. අපි ව්‍යාපාර කරලා තිබෙනවා. අපිත් පාරේ ලූනු බිකක් හෝ විකුණපු අය. අපි බණ්ඩාරවෙල මාර්කට් එකේ කරපිංචා මිටියක් හරි විකුණපු අය. අපිට මේවා තේරෙනවා. අපි මේවා ගැන පොඩ්ඩක් හරි දන්නවා. එහෙම දන්න නිසා තමයි අපි ආණ්ඩුවට මේවා කියන්නේ. අද මෙතුමා ඕනෑ නැති දෙයක් කරලා ආර්ථික මධ්‍යස්ථානවල සිටින ඔක්කෝම තරහ කරගන්නයි හදන්නේ.

ඇමතිතුමනි, මෙහෙමයි. හොඳ දෙයක් කරද්දී, කරන්න බැරි දේවල් තිබුණොත් අඩියක් පස්සට ගන්න ඇමතිතුමා. අපි ඒකට

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ලජ්ජා වෙන්න ඕනෑ නැහැ. බැරි අවස්ථාවේදී අපි අඩියක් පස්සට ගනිමු. මොකද, ජනතාව විරුද්ධ නම් මොන ජගතාට වුණත් බැහැ. ගෝඨාභය ඔයිට වඩා චණ්ඩියෙක් කියලා ආවේ. අන්තිමට මොකද වුණේ? පිටුපස ගේට්ටුවෙන් ගිහිල්ලා බෝට්ටුවේ නැඟලා යන්න වුණේ. ඒවාත් මතක තබාගන්න. ඒවා මතක තබාගෙන වැඩ කරමු. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මේ කොම්පැනි එක ගැන තොරතුරු මම දෙන්නම්. මේවා එක එක වාසිවලට, එක එක ලේකම්ලාගේ වාසිවලට කරන්න එපා. මුදල් අමාත්‍යාංශයෙන් ඒකට විරුද්ධ වෙලා තිබෙනවා, ඇමතිතුමා. මුදල් අමාත්‍යාංශයෙන් හරියට අනුමැතිය දීලා නැහැ. අපි ඒවා ගැන හොයනවා.

ඊළඟ කාරණය මේකයි. ඇප නැතුව ණය දෙනවා කියලා ජනාධිපතිතුමා කිව්වා. ඇප නැතුව කාටද ණය දීලා තිබෙන්නේ? ඇප නැතුව ණය දීපු මිනිහෙක් මට නම් කොහේදිවත් හම්බ වෙලා නැහැ. ඇප නැතුව මිලියන 4,000ක් දීලා තිබෙනවා කිව්වා. ඇප නැතුව ණය දෙනවා කියනවා. අපිට නම් එහෙම ණය දීපු කෙනෙක් හම්බවෙලා නැහැ. ඔයගොල්ලන්ට හම්බවෙලා තිබෙනවාද කියන්න දන්නේ නැහැ. ඇප නැතුව ණය දෙනවා කියනවා. ගොඩක් මුදල් වෙන් කරලා තිබෙනවා. මේවා කරන්න. අපි ඒකට කා එක්කවත් තරහා වෙන්නේ නැහැ. අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තාම අද කොහොම උඩින් තියන්න පුළුවන් දිස්ත්‍රික්කයක්ද? ඔය පැත්තේ තුන් දෙනෙක්ම එහේ ඉන්නවා. අපේ පැත්තට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කමක් නැහැ කියමු කෝ.

දැන් බලන්න මෛත්‍රීපාල සිරිසේන. මම ගිය සතියට කලින් සතියේ පොළොන්නරුවේ ගියා. මම පොළොන්නරුව නගරයෙන් බැස්සා. මම ගියේ wedding එකකට. පොළොන්නරුව දැන් කොහොමද? මරු නේ. මොනවා වුණත් මෛත්‍රීපාල පොළොන්නරුව හදලා නේ. මොනවා වුණත් මහින්ද හම්බන්තොට හැදුවා නේ. ඒක නැහැ කියන්න එපා. ගෝඨාභයට කවුරු මොනවා කිව්වත්, - අලියා බීම කොම්පැනිය තිබුණේ "දෙරණට" මෙහා පැත්තෙ නේ. අලියා බීම කොම්පැනිය ළඟ තිබුණු මුඩුක්කු ටික කඩලා හදපු හෝටලය මොකක්ද? ඊයේ පෙරේදා ජනාධිපතිතුමා ගිහිල්ලා කැසිනෝ එකක් විවෘත කළේ. Cinnamon Life එක හදපු තැන තිබුණේ තනිකරම මුඩුක්කු. ඔබතුමා දන්නවාද ඒක? එතැන තිබුණේ අලියා බීම කොම්පැනියයි, මුඩුක්කුයි. ගෝඨා, ඒක කඩලා ඒ ඉඩම අරගෙන තමයි අද ඔයගොල්ලෝ, - එදා මම අල, ලූනු ගොවියෝ ගැන කියනකොට අතන ඉන්න මන්ත්‍රීවරයෙක් -මැදවච්චියේ- චාමර සම්පත්ට පිස්සු කිව්වා. එතකොට මම අතින් මෙහෙම කළා. එතකොට මේක කුණුහරුපයක් කිව්වා. මේක කුණුහරුපයක්ද? මේක කුණුහරුපයක් නොවෙයි. දැන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තිබෙන්නේ. ලූනුකාරයාත් ඉවරයි, අලකාරයාත් ඉවරයි. අපි කිව්වාම කුණුහරුප. අද වෙනතුරු කුණුහරුපය විසඳිලා නැහැ.

ඊළඟට ගරු ඇමතිතුමා කියනවා, මිලියන 1,000ක් අරගෙන ලබන අවුරුද්දේ ප්‍රශ්නය විසඳනවා කියලා. මිලියන 1,000ක් අරගෙන ලබන අවුරුද්දේ ඔය ප්‍රශ්න විසඳන්න බැහැ. ඔබතුමා මෙහෙම කරන්න. කෘෂිකර්ම ඇමතිත් එක්ක සෙට් වෙන්න. අර ඉන්නේ අපේ නියෝජ්‍ය ඇමති අයියා. ලූනු ගලවන්න මාස තුනකට කලින් එතුමා හම්බවෙන්න. ලූනු, අල ගලවන්න කලින් එතුමා හම්බවෙන්න. අපේ රටට කොච්චර අල ඇවිල්ලා තිබෙනවාද, කොච්චර ලූනු ඇවිල්ලා තිබෙනවාද, ගෙන්වන එකට බද්ද ගහනවාද, නවත්වනවාද කියලා තීන්දුවක් ගන්න. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන ඇමතිතුමනි, අපට වැඩිය වෙළෙන්දෝ දන්නවා. අල ගලවන්න කලින් මට කථා කරලා කියනවා, පුළුවන් නම් පාර්ලිමේන්තුවේදී කථා කරලා බද්ද ගස්සන්න කියලා. මොකද, ඒ අය දන්නවා කාලය, වෙලාව. අනෙක් කාරණය තමයි ඒ අය ගොවියෝ. ඒ අය ගානට වෙලාව බලලා තමයි අල, ලූනු හදන්නේ. අපි මේවා කියන්නේ තරහට නොවෙයි. දවසින් දවස ප්‍රශ්න හදා ගන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have exhausted your time.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තව විනාඩි දෙකක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු මන්ත්‍රීතුමාට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
දවසින් දවස ප්‍රශ්න හදා ගන්න එපා. ප්‍රශ්න හදා ගන්නවා කියන්නේ හැමදාම ආණ්ඩුවට ප්‍රශ්නය එනවා කියන එකයි. එතකොට මිනිස්සු එළියට බහිනවා. දඹුල්ලේ මිනිස්සු මාලිමාවට පුරවලා කතිරය ගැහුවා. අනුරාධපුරයත් පුරවලා දුන්නා. ඡන්ද පෙට්ටි උස්සගෙන යන්න බැහැ. මාලිමාවේ ඡන්ද නිසා පෙට්ටි බරයි. මිනිස්සු ඡන්ද පෙට්ටි පිරෙන්න ඡන්ද දුන්නා. ඔබතුමා ජීවිතේට ඡන්ද එක්ලක්ෂ පනස්දාහක්, දෙලක්ෂ ගණනක් ගන්නේ නැහැ. අනුරාධපුරයේ record එක තිබ්බේ ඔබතුමා. ඓතිහාසික record එකක් තිබෙන්නේ. ඒ records කඩා ගන්න එපා. records කඩා ගත්තොත් වෙන්නේ මොකක්ද කියලා දන්නවාද? අපේ දිස්ත්‍රික්කයේ නිමල් සිරිපාල හැමදාම record ගැහුවා. මතකයි නේ? අන්න දැන් ගෙදර ඉන්නවා. හැබැයි, ඡන්ද 19,000ක් අරගෙන චාමර පාර්ලිමේන්තුවේ එල්ලුණා. මේ ඉන්නේත් හොඳ රෙකෝඩ්කාරයෙක්. මේ ඉන්නේ කළුතර රෙකෝඩ්කාරයෙක්. මෙතුමා වරායේ හිටපු ඇමති. මෙතුමා නොකරපු ඇමතිකම මොකක්ද? නමුත් අන්තිමට ඡන්ද 10,000යි ලැබුණේ. ඒකෙන් 100ක් නැති වුණා නම් මෙතුමාත් ඉවරයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙනම් රාජිත එනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔව්. මට ඡන්ද 4,000ක් අඩු වුණා නම් ආයෙත් නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමා මෙතැන ඉස්සරහ වාඩි වෙනවා.

එහෙනම් රවී කරුණානායක පිටුපස්සට යනවා. ඒක තමයි ඇත්ත කථාව. ඇත්ත නේ. අපි වල් පැළ. ඔයගොල්ලෝ බෝ පැළ, ඔයගොල්ලෝ රත්තරන් පැළ. හැබැයි, තව ටික දවසකින් ඔයගොල්ලෝ වල් පැළ වෙලා, අපි රත්තරන් පැළ වෙනවා. මම කියන දේවල්වලට තරහා වෙන්න එපා. අපෙන් පළිගන්න එපා. අපි මේවා කියන්නේ ජනතාවගේ පැත්තේ ඉඳලා.

බලන්න, රජරටින්, වැව් බැඳි රාජ්‍යයෙන් ජනාධිපතිලා දෙන්නයි. පොළොන්නරුවෙන් මෛත්‍රී, තඹුත්තේගමින් අනුර කුමාර. නුවරඑළියෙන් ජනාධිපති කෙනෙක් පත් වුණාද? අපේ පැත්තෙන් ඉන්නවාද? බදුල්ලෙන් ඉන්නවාද? ජීවිතේටවත් අපට හම්බවුණේ නැහැ. අපිත් බලාගෙන හිටියා වි.ජ.මු. ජනාධිපති වෙයි කියලා. ඒත් බැරි වුණා. නිමල් සිරිපාල ජනාධිපති වෙයි කියලා හිතුවා, ඒත් බැරි වුණා. කවුරු මොනවා කිව්වත් ඔයගොල්ලන්ට වැඩිය මේ රටේ බැට කාපු මිනිස්සු ඉන්නේ අපේ පළාතේ;ඌව වෙල්ලස්සේ. මොණරාගල සහමුලින්ම නැති වුණා. ගොවිබිම් නැති කළා. අපේ ඌව පළාතේ, උඩරට මිනිස්සු තවමත් කැළෑවල දුක් විඳිනවා. පාරවල් නැහැ, විදුලිය නැහැ. සුද්දෝ අපට ගහලා එළෙව්වා. අපේ උඩරට මිනිස්සු ඉන්න පස්සර වාගේ ප්‍රදේශවලට ගිහිල්ලා බලන්න. ඒ මිනිස්සු අපා දුකක් විඳිනවා. අපට කවුද සැලකුවේ? අපට කවුරුවත් සැලකුවේ නැහැ. බදුල්ල දිස්ත්‍රික්කයෙන් බිහි වුණු අපේ නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමා අපේ ප්‍රදේශ පොඩ්ඩක් හැදුවා. අපේ ඔය එක එක නායකයෝ අපේ ප්‍රදේශ ටික ටික හැදුවාට, අපටම කියලා කෙනෙක් බිහි වුණේ නැහැ. ඒක හින්දා අපට අපේ පළාත ගැන දුකක් තිබෙනවා.

නමුත්, ඔයගොල්ලන්ගේ පළාතට එහෙම නොවෙයි. මෛත්‍රීපාල සේනානායක මැතිතුමා මැදවච්චියේ හිටපු රජ්ජුරුවෝ. හිටපු කථානායක කේ.බී. රත්නායක මැතිතුමා අනුරාධපුරයට කොච්චර වැඩ කළා ද? හැබැයි, ඔයගොල්ලන් මේ වෙලාවේ යමක් කළේ නැත්නම් ඔයගොල්ලන්ට ආයෙත් යන්න වෙන්නේ නැහැ, අනුරාධපුර පැත්තේ රෙදි ඇඳගෙන. බඩ කපා ගන්න. ඒ පළාතේ තුන්දෙනෙක් ඉන්නවා, තුන්දෙනාම බඩ කපා ගන්න. තුන්දෙනෙක් ඉඳලාත් අනුරාධපුරය ගොඩ දමන්න බැරිද? නලින්ද ජයතිස්ස ඇමතිතුමා කොහොමද කළුතර ගොඩ දමන්නේ? එතුමා විතරයි කළුතරට ඉන්නේ. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා කොහොමද බදුල්ල ගොඩ දමන්නේ? එතුමා විතරයි බදුල්ලට ඉන්නේ. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාත් එක්ක මට ප්‍රශ්න තිබුණා කියලා අපි එහෙම විරුද්ධ නැහැ. අපි හරි දේ හරි විධියට කියනවා. *[බාධා කිරීමක්]* හරි ද? හරි දේ හරි විධියට අපි කියනවා.

බලශක්ති ඇමතිතුමනි, ඔබතුමාත් අපේ පැත්තේ කාලයක් හිටියා නේ; අපිත් එක්ක ගිය මිනිහෙක් නේ. ඒවා ගැන අහන්න එපා. ඔබතුමා දුමින්ද දිසානායක ළඟ හිටියා. එතකොට දුමින්ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. *[බාධා කිරීමක්]* ඇයි, පොහොර සංස්ථාවේ හිටපු කාලයේ. අන්න, මූණ ඇඹුල් කර ගත්තා. මූණ ඇඹුල් කර ගන්න එපා, ඇත්ත කියනකොට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
තුන්දෙනාටම බඩ කපා ගන්න වෙනවා, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන. *[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඔබතුමාට තව කාලය ඕනෑද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තව විනාඩියක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට තව විනාඩියක කාලයක් දෙන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඊයේ පසුපෙළ මන්ත්‍රීතුමෙක් මට කිව්වා, "අයියත් එක්ක අපි කථා කරලා බොහොම සන්තෝසෙන් ඉන්නවා, අයියා හිතේ එකයි, බඩේ එකයි නැති මිනිහෙක්" කියලා. මම කිව්වා, මන්ත්‍රීතුමා මගේ හිතේ එකක්, බඩේ එකක් නැහැ කියලා. මොකද, පසුපෙළේ ඉන්න මන්ත්‍රීතුමන්ලා, අපි ඔක්කෝම එක රටේ ජීවත් වෙන මිනිස්සු නේ. ඇයි, අපි මෙතැන වෛරයෙන් ඉන්නේ? ඇයි, අපි වෛරය - ක්‍රෝධය - ඇති කර ගන්නේ? අර්චුනා මන්ත්‍රීතුමා නම් කමක් නැහැ. අර්චුනා මන්ත්‍රීතුමා ඒ පැත්තට පොඩ්ඩක් ගහලා එතුමාව උස්ස ගන්නයි බලන්නේ. ඒක ඒ පැත්තේ වැඩක් නේ. අපේ පැත්ත ගත්තොත්, අපි මොකටද මිනිස්සුත් එක්ක අමනාප වෙන්නේ? මට කිසි ප්‍රශ්නයක් නැහැ. සමහරු මගෙන් අහනවා, වසන්ත සමරසිංහ ඇමතිතුමාත් එක්ක මට තිබෙන රණ්ඩුව මොකක්ද කියලා. නැහැ, මට එහෙම පෞද්ගලික තරහක් නැහැ. වසන්ත සමරසිංහ මැතිතුමා වෙළඳ ඇමතිකමින් අයින් වුණොත්, ඊළඟ වෙළඳ ඇමතිත් එක්ක තමයි මට fight එක තිබෙන්නේ.

නලින් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා අන්න දැන් හිර ගෙදර. නලින් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා ආර්ථික අර්බුදය තිබියදී අවුරුදු දෙකක් හරියට කටයුතු කළා, කැරම් බෝඩ් නඩුවෙන් හිරේ ගියාට. කැරම් බෝඩ් නඩුවෙන් හිරේ ගිය එක වෙනම එකක්. කැරම් බෝඩ් නඩුවෙන් හිරේ ගියේ එතුමා සතොස සභාපති විධියට හිටපු කාලයේ කරපු දෙයක් නිසා. හැබැයි, එතුමා වෙළඳ ඇමතිකම හොඳට කළා. ඒ කාලයේ විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන් ඔක්කෝම ඒ ගැන දන්නවා. එතකොට ඔබතුමන්ලාත් හිටියේ විපක්ෂයේ. *[බාධා කිරීමක්]*

එතුමා හොඳට කළේ නැතත් වසන්ත සමරසිංහ ඇමතිතුමා හොඳට කරයි කියලා නේ එතුමාට අනුරාධපුරයෙන් ගොඩ ගහලා ඡන්දය දුන්නේ. ඔබතුමන්ලා -මෙතුමාගේ, ජනාධිපතිතුමාගේ- දිස්ත්‍රික්කය හදලා ඉන්න කෝ. අපේ දිස්ත්‍රික්ක පසුව හදමු කෝ. අපි ඒවා පසුව හදා ගනිමු. ඔයගොල්ලන් ඉස්සෙල්ලා ඔයගොල්ලන්ගේ දිස්ත්‍රික්කය ගොඩ දාලා ඉන්න කෝ. ඔබතුමන්ලාගේ දිස්ත්‍රික්කයයේ වැඩවලනේ ප්‍රගතිය නැත්තේ? දැන් මම බැලුවා නේ, ගිරිබාව, එප්පාවල කියන ප්‍රදේශ ගැන. ඇමතිතුමනි, අපට නම් සල්ලි දෙන තුරු අපි ඉන්නේ. මුදල් අමාත්‍යාංශයට දුවලා හරි, මුදල් අමාත්‍යාංශයේ බුදියලා හරි සල්ලි අරගෙන අපි අවුරුද්ද තුළ ඒ වැඩ ඉවර කරනවා. අපි ඒ කාලයේත් එහෙම තමයි කටයුතු කළේ. මම මහ ඇමති කාලයේ හැමදාම වාගේ මුදල් අමාත්‍යාංශයට ඇවිල්ලා හිටගෙන බලාගෙන ඉන්නවා, රුපියල් මිලියන 300ක්වත් දෙන්න කෝ කියලා. අපි කොහොම හරි ගේම ගැහුවා. ඒ හින්දා ඔයගොල්ලන්ටත් මේවා ගැන වගකීමක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩ්ඩක් ඉන්න. මේ මගේ ළඟ තිබෙන්නේ 2025 වසරේ Budget පොත. 2025 Budget එක වැඩක් නැහැ. ඔන්න, ඒ පොත පැත්තකින් තැබුවා. ජනාධිපතිතුමනි, මේවා අහන්න. එතුමා අපි වාගේ දුප්පත් කොල්ලෙක්. එතුමා ගැන අපට සතුටුයි. ජනාධිපතිතුමනි, ඒ වුණාට වැඩේ ෆේල්. 2025 වසරේ ප්‍රාග්ධන වියදම්වල ප්‍රගතිය සියයට 24යි.

ඔන්න, 2026 වසරේ අය වැය කථාව දැන් මම අතට ගත්තා. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා 2026 අය වැය කථාව පැය හතරහමාරක් කියෙව්වා. මේ අමාත්‍යාංශ මන්ත්‍රීවරුන්ට බෙදලා දෙන්න. මේ අයට සල්ලි දෙන්න. නුවර මොනවා හරි කරන්න තිබෙනවා නම් නුවර නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාට කියන්න. මේ වැඩ බෙදලා දෙන්න. බෙදලා දීලා වැඩේ පිටිපස්සෙන් එළවන්න. වැඩේ පිටිපස්සෙන් එළවලා, එළවලා ලබන අවුරුද්දේ අඩුම වශයෙන් ප්‍රාග්ධන වියදම්වලින් සියයට 90කවත් ප්‍රගතියක් මේ රටේ ජනතාවට පෙන්වයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අන්න එදාට අපි කියන්නම්, දැන් නම් චුට්ටක් හරියට යනවා කියලා. දකුණට සිග්නල් දාලා දැන් යන්නේ වමට. තවම හරියට යන්නේ නැහැ. තවම යන්නේ අනික් පැත්තට.

අපේ doctor ලයිට් ඕෆ් කරලා Business Class ගියා කියලා සමහරු කියනවා. කමක් නැහැ, ඒ doctor නේ. Doctor Business Class එකේම අරගෙන යන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please wind up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අපි ඕවාට මොනවාවත් කියන්නේ නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
වසන්ත වාගේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
වසන්ත නම් යනවා. නියමෙට යනවා. වසන්තට මම කැත වැඩක් කළා. ඒක ගැන මම දුක් වෙනවා. *[බාධා කිරීම්]* ඒකට මම දුක් වෙනවා. මම කැත වැඩක් කළා. ඒ ගැන මම හැමදාම හිතේ කනගාටුවෙන් හැම තැනම කියනවා. *[බාධා කිරීම්]* මම මීට වැඩිය කථා කරන්නේ නැහැ.

මේ අය වැය ගැන අපට කියන්න තිබෙන්නේ මොකක්ද? වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමන්ලා මේ අය වැයේ හොඳ කියනකොට අපට අහුවෙන වැරදි අපි කියනවා. ඔබතුමන්ලා කියන්නේ හොඳ. 159දෙනෙක් හොඳ කියපුවාම, මේ අය වැය වැඩක් නැහැ. *[බාධා කිරීම්]* හරිද? ඒකේ ගතියක් නැහැ. අපි 60දෙනෙක් ඉන්න ඕනෑ මේකේ අඩුපාඩු කියන්න. ඒ 60දෙනා තමයි මේ අඩුපාඩු කියාගෙන යන්නේ. *[බාධා කිරීම්]* අපි මේ දේවල් කියනකොට තද වෙලා, නඩු දාන්න, එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහිල්ලා, "චාමරට තව එකක් තිබෙනවා නම් බස්සන්න" කියන්න, CID එකට ගිහිල්ලා තව එකක් තිබෙනවා නම් බස්සන්න කියලා වැඩක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please wind up. I have to call upon the next speaker.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේවා ශානිට කියලා වැඩක් නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Wasantha Samarasinghe, yes, you can raise a point of Order. Your name was mentioned.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චාමර සම්පත් මන්ත්‍රීතුමා මතු කරපු කාරණා අතර එක් කාරණාවක් තිබුණා, අමාත්‍යාංශ ලේකම්තුමා ද්‍රවිඩ ලේකම් කෙනෙක් කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඒ ලේකම්තුමාගේ ජාතිය හෝ ආගම ගන්න එපා. *[බාධා කිරීමක්]* නැහැ, හරි, හරි. *[බාධා කිරීමක්]* මේ, අපේ වෙලාව ගන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
He had referred to him from the very beginning. Hon. Minister, you may make your explanation very brief.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස ආර්ථික මධ්‍යස්ථාන විවිධ හැඩයෙන් ක්‍රියාත්මක වන්නේ. ඒවාට එක ප්‍රතිපත්තියක් නැහැ. එක තැනක ගන්න තීරණ තව තැනකට බලපාන්නේ නැහැ. අනික් තැන ගන්න තීරණ වෙනස් විධියට ගන්නවා. රජයෙන් දීපු රුපියල් මිලියන 1,100ක් පිළිබඳව audit queries තිබෙනවා. ඒවා තවම ආණ්ඩුවට ඇවිල්ලා නැහැ. ඒ නිසා අපි ආර්ථික මධ්‍යස්ථානවල කටයුතු විධිමත් කළා. ඒක තමයි කළේ. ඒකේ එක පියවරක් හැටියට තමයි සමාගමක් හදලා 18ම එක තැනකට ගෙනාවේ. එතුමා කියන්න හැදුවා, ආර්ථික මධ්‍යස්ථාන වට කරලා තිබෙන බව. දඹුල්ල වට කරලා තිබෙනවා, ගොවියෝ එළවලු පලතුරු ගෙනැල්ලා. ඒ හැර වෙන කිසිදු වට

කිරීමක් නැහැ. දඹුල්ලත්, කැප්පෙටිපොලත් හොඳට ක්‍රියාත්මක වනවා. අද ලූනු කිලෝව රුපියල් 160යි; අල කිලෝව රුපියල් 180යි. *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ නම කිව්වා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් නම කිව්වා කියලා දෙපැත්තටම මට කාලය දෙන්න වෙනවා. ගරු මන්ත්‍රීතුමා, මිනිත්තුවක් ගන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම ඒ ලේකම්තුමාගේ නම දන්නේ නැහැ. ඒකයි එහෙම කිව්වේ. එහෙම නැතුව මම ඒ ලේකම්තුමා මුස්ලිම්ද, ද්‍රවිඩද කියලා අගෞරවයක් කළේ නැහැ. ද්‍රවිඩ ලේකම්තුමෙක් කියලා කිව්වේ මම එතුමාගේ නම දන්නේ නැති නිසා.

අනික් කාරණය මේකයි. ඇමතිතුමා කියන ආර්ථික මධ්‍යස්ථාන පිළිබඳව මම සභාව කල්තැබීමේ යෝජනාවක් 19වෙනි දාට යොමු කරලා තිබෙනවා. අපි එදාට ඒ ගැන කථා කරමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Kanchana Welipitiya. You have ten minutes.

[පූ.භා. 11.33]

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 අය වැය පිළිබඳව විවාද කරන මේ මොහොතේ, විපක්ෂය ඒ ගැන විවිධ චෝදනා ඉදිරිපත් කරමින් ඉන්නවා. විශේෂයෙන් මේ ආණ්ඩුව 2025ට අදාළව වෙන් කරපු මුදල් වියදම් කරලා නැහැ කියලා චෝදනා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි අපි කවුරුත් තේරුම් ගන්න ඕනෑ, අපි 2025 අය වැය ඉදිරිපත් කළේ මාර්තු මාසයේ බව. 2025 අය වැය සම්මත වුණේ මාර්තු මාසයේ 21වෙනි දා. මාර්තු 21වෙනි දා අය වැය සම්මත වෙනකොට පළාත් පාලන මැතිවරණය ප්‍රකාශයට පත් කරලා තිබුණේ. මේ අය වැයට අදාළව මුදල් ප්‍රතිපාදන වෙන් කළත්, බිම් මට්ටමින්, ගම් මට්ටමින් වැඩ කරන්න බැරි වුණා, ඒ පළාත් පාලන මැතිවරණය නිසා. ඉන් අනතුරුව අපට මේ මැයි මාසයේ 6වෙනි දායින් පසුව තමයි මේ වැඩකටයුතු ආරම්භ කරන්න හැකි වුණේ. මැයි මාසයේ 6වෙනි දා සිට ගත්තොත්, අද වෙනකොට මාස හයයි ගත වෙලා තිබෙන්නේ. මාස හයක කාල සීමාව ඇතුළත තමයි අපි මේ මුදල් වියදම් කරලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒවාට ඕනෑ කරන මුදල් වෙන් කරලා, වැඩ පිළිවෙළ දැන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. අදාළ ඇස්තමේන්තු සකස් කරලා දැන් තමයි ඒ වැඩ ආරම්භ වෙන්නේ. අපට තව මාස දෙකක කාලයක් තිබෙනවා. මේ මාස දෙක ඇතුළත තව සැලකිය යුතු ප්‍රමාණයක මුදල් වියදම් කරලා අපට මේ වැඩ ටික කරන්න පුළුවන් වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොඩක් අය කථා කරනවා, අපි කිසිම වැඩක් කරලා නැහැ කියලා. හැබැයි, මේ වන විටත් අපේ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රාදේශීය ලේකම්වරු ප්‍රකාශ කරනවා, ඉතිහාසයේ වැඩිම මුදල් ප්‍රමාණයක් වියදම් කරලා වැඩ කළේ මේ වසරේ කියලා. මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ විතරක් මේ වන විට රුපියල් කෝටි තුනකට වඩා මුදල් වියදම් කරලා අමුණු හා ඇළ වේලි ටික හදලා තිබෙනවා.

දැන් අපි කෘෂි කර්මාන්තය ගොඩනඟා ගැනීම වෙනුවෙන් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළට අනුව පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩ පිළිවෙළට සමානව, ජනතාවට ඕනෑ කරන ඇළ වේලි ටික, අමුණු ටික සාදා දීම වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. රාජ්‍ය නිලධාරින් කියන්නේ, "ඉතිහාසයේ කවදාවත් මෙහෙම මුදලක් වෙන් වෙලා නැහැ. ඒ මුදල වෙන් වුණේ 2025 අවුරුද්දේ" කියායි. එහෙමයි ජනතාව වෙනුවෙන් අපේ ආණ්ඩුව වැඩ කරමින් ඉන්නේ. හැබැයි, විපක්ෂයට ඒවා පෙනෙන්නේ නැහැ.

අපේ ගරු ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරනකොට ප්‍රකාශ කළා, "අපි භාණ්ඩාගාරයට රුපියල් ට්‍රිලියනයක මුදලක් ඉතුරු කළා" කියලා. හැබැයි, විපක්ෂයේ කිසි කෙනෙක් ඒ ගැන කථා කරන්නේ නැහැ. රුපියල් ට්‍රිලියනයක් ඉතුරු කළේ කොහොමද කියලා ඒගොල්ලන් කථා කරන්නේ නැහැ. හැබැයි, ජනාධිපතිවරයා සහ ආණ්ඩුව පත් වෙලා අවුරුද්දක් ඇතුළත භාණ්ඩාගාරය රුපියල් ට්‍රිලියනයකින් පුරවන්න අපට හැකි වුණා. නමුත්, ඔය කථා කරන, මීට පෙර ආණ්ඩු කරපු අය ඒ දවස්වල කළේ දින 50න් මහ බැංකුව හොරා කාපු එක. ඒගොල්ලන් දින 50න් මහ බැංකුව හොරා කනකොට, අවුරුද්දක් ඇතුළත මහා භාණ්ඩාගාරය රුපියල් ට්‍රිලියනයකින් පුරවන්න අපට පුළුවන් වුණා. ඒ, මේ ආණ්ඩුව හොරකම් කරන්නේ නැතුව, වැඩ පිළිවෙළක් ඇතුව වැඩ කරපු නිසායි. දැන් ඒක කිසිම කෙනෙක් අගය කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ දවස්වල රනිල් වික්‍රමසිංහ මහත්මයා කිව්වේ මේ රට නැවත වතාවක් 2019 තිබුණු තැනට ගන්න පුළුවන් වෙන්නේ 2048 අවුරුද්දේ කියායි. හැබැයි, ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ ආණ්ඩුව කරපු වැඩ පිළිවෙළත් එක්ක අපට පුළුවන් වෙලා තිබෙනවා, මේ අවුරුද්ද අවසන් වනකොට 2019 තිබුණු ආර්ථික තත්ත්වයට නැවත වතාවක් මේ රට අරගෙන එන්න. ඇයි මේ ගැන කථා කරන්නේ නැත්තේ? මේ අවුරුද්ද ඇතුළත රට නැවත වතාවක් යථා තත්ත්වයට පත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා, මේ ජාතික ජන බලවේගය ආණ්ඩුවට.

ඒ වාගේම දැන් ගොඩක් අය කථා කරනවා අලුත් අවුරුද්ද වෙනුවෙන් වෙන් කරපු බඩු මල්ල බෙදුවේ නැහැ කියලා. ඒකත් එහෙම තමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ඒකට අදාළ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් සකස් කරලා තිබුණා. හැබැයි, විපක්ෂයෙන් මැතිවරණ කොමිසමට ගිහිල්ලා පැමිණිලි කළා, "මේ මැතිවරණ කාලයේ බඩු බෙදන්න දෙන්න එපා" කියලා. ඒ හින්දා ඒ වැඩ පිළිවෙළ කඩාකප්පල් කළේ විපක්ෂයෙන්. හැබැයි, දැන් කියනවා, "අවුරුද්දට බඩු මල්ලක් බෙදනවා කියලා ආණ්ඩුව පොරොන්දු වුණා. හැබැයි බෙදුවේ නැහැ" කියලා. අවුරුද්දට බෙදන්න හදපු බඩු මල්ල බෙදන්න දෙන්නේ නැතුව නතර කළේ විපක්ෂය මැදිහත් වෙලා, මැතිවරණ කොමිසමට පැමිණිලි කරලා. ඒක නිසා ඒකට වගකිව යුත්තේ විපක්ෂය. හැබැයි දැන් චෝදනා කරනවා, ආණ්ඩු පක්ෂය තමයි එහෙම කළේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ අය හැමදාමත් බොරුව සමාජගත කරමින් තමයි ජීවත් වෙන්නේ.

2025 අය වැය ඉදිරිපත් කරන වෙලාවේදී වාගේම, ඒ අය වැය ගැන විවාදය කරන වෙලාවේ එතුමන්ලා කිව්වේ, "ජාතික ජන

[ගරු කංචන විජේසේකර මහතා]

බලවේගය ආණ්ඩුව රාජ්‍ය සේවකයන්ගේ වැටුප රුපියල් 15,750කින් වැඩි කළා. ඒක දෙන්න බැහැ" කියායි. ඒක ප්‍රායෝගික නැහැ කියායි ඒගොල්ලන් කිව්වේ. ඒ අය වැය විවාදය පැවති දවස් 26 ඇතුළතම ප්‍රධාන මාතෘකාව වුණේ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක දෙන්න බැහැ කියලා එදා එතුමන්ලා කිව්වා. හැබැයි, අද එතුමන්ලාට පිළිගන්න වෙලා තිබෙනවා, රාජ්‍ය සේවකයන්ගේ වැටුප වැඩි කළාය කියන එක. මේ අය වැය ගැනත් එහෙම කරුණු තමයි කිව්වේ.

මේ අය වැය ඉදිරිපත් කළාම එතුමන්ලා කිව්වා, "ගෙයක් හදන්න රුපියල් මිලියනයක් වෙන් කරලා තිබෙනවා. රුපියල් මිලියනයකින් ගෙයක් හදන්න බැහැ. ඒක නිසා ඒක ප්‍රායෝගික නැහැ. වර්ග අඩි 100ක ගෙයක් තමයි හදන්න වෙන්නේ" කියලා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනවිටත් අපි කෑගල්ල දිස්ත්‍රික්කයේ ගෙවල් 157ක් හදලා තිබෙනවා. වර්ග අඩි 575ක ගෙවල් තමයි අපි හදලා තිබෙන්නේ. මම ළඟ තිබෙනවා, ඒවායේ photos. මේ, අපි හදපු ගෙවල්. ඒවා ඕනෑ කෙනෙකුට බලා ගන්න පුළුවන්. අපි කෑගල්ල දිස්ත්‍රික්කයේ හදලා තිබෙනවා, වර්ග අඩි 575ක ගෙවල් 157ක්. අපි මේ එක ගෙයක් වෙනුවෙන් රුපියල් මිලියනයක් වෙන් කළාට, තව ප්‍රජා දායකත්වයත් අරගෙන තමයි මේ වැඩ කරලා තිබෙන්නේ. මොකද, අපි ස්වේච්ඡාවෙන් වැඩ කරලා ආදර්ශයක් පෙන්වන්න පුළුවන් දේශපාලන ව්‍යාපාරයක්. අපි හොරකම, වංචාව නතර කරපු දේශපාලන ව්‍යාපාරයක්. අපේ ආදර්ශය නිසා දැන් රාජ්‍ය නිලධාරි මහත්ම, මහත්මීන් වැඩ කරන්න පටන් ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සන්තෝෂයෙන් කියන්න ඕනෑ, කෑගල්ල දිස්ත්‍රික්කයේ සමහර ග්‍රාම නිලධාරි මහත්මීන් මේ ගෙවල් සෑදීම වෙනුවෙන් දැවැන්ත වැඩ කොටසක් කළ බව. ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නියෝජනය කරන ග්‍රාම නිලධාරිතුමියක් උදේ පාන්දර ගෙදරින් බත් පාර්සල් ටික බැඳගෙන ඇවිත් කොන්ක්‍රීට් අනනවා. එහෙම තමයි ආදර්ශය ලබා දීලා මේ ගෙවල් හැදුවේ. රුපියල් මිලියනයක් එක ගෙයක් වෙනුවෙන් වෙන් කළාට, රුපියල් ලක්ෂ 18, රුපියල් ලක්ෂ 20 වටිනාකම ඇති ගෙවල් දැන් හදලා තිබෙනවා. ඒගොල්ලන් එකතු වෙලා ප්‍රජා දායකත්වය ලබාගෙන තමයි මේ වැඩ කටයුතු කළේ. ඒ වාගේම මේ දිනවල තව ගෙයක් හදනවා. ඒ ගෙදරට ප්‍රධාන පාරේ ඉඳන් පඩි පෙළ 230ක් පහළට බහින්න ඕනෑ. ඒ ගෙදර වැඩ ආරම්භ කරන වෙලාවේ මටත් සහභාගි වෙන්න අවස්ථාව ලැබුණා. මම ඒ වෙලාවේ රාජ්‍ය නිලධාරින්ගෙන් ඇහුවා, "මේ ගෙදරට බඩු ටික අරගෙන යන්නේ කොහොමද" කියලා. රාජ්‍ය නිලධාරින් කිව්වා, "මන්ත්‍රීතුමා, අපට ඒක කරන්න පුළුවන්. අපි ඒක කරනවා" කියලා. දැන් ලස්සනට ඒ වැඩ ටික කරගෙන යනවා. දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපේ පක්ෂයේ අපි කවුරුත් ඒ දේශපාලන ආදර්ශය ලබා දුන්නා. ස්වේච්ඡාවෙන් වැඩ කරන දේශපාලන ආදර්ශය අපි පෙන්වා තිබෙනවා. කැප කිරීම් කරන දේශපාලන ආදර්ශය අපි පෙන්වා තිබෙනවා. හොරකම් නොකරන දේශපාලන ආදර්ශය අපි පෙන්වා තිබෙනවා. අන්න ඒ නිසා දැන් ඒ රාජ්‍ය නිලධාරි මහත්ම මහත්මීන් ඒ වැඩ ටික හරියට කරනවා. ප්‍රජා දායකත්වයත් ඒකට ලැබෙනවා. පසුගිය කාලයේ හැදුවා වාගේ පෙට්ටි ගෙවල් නොවෙයි, ජනතාවට ජීවත් වෙන්න පුළුවන් හොඳ ගෙවල් අපි ගොඩනඟනවා.

වාහන ගෙන්වීම සම්බන්ධ කාරණයත් මේ වෙලාවේ ගොඩක් සංවාදයට ලක් වෙනවා. සමහර අය මේක ලසු කරනවා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට වාහන 159ක් ගෙනෙන්න තමයි මේ රුපියල් මිලියන 12,500ක් වෙන් කරලා තිබෙන්නේ කියලා. පට්ටපල් බොරු සමාජගත කරනවා. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රුපියල් මිලියන 12,500 වෙන් කරලා තිබෙන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට වාහන ගෙනෙන්න නොවෙයි. මේ ආණ්ඩුවේ සැලසුමක් තිබෙනවා, වාහන 2,700ක් ගෙන්වන්න. වාහන 1,775ක් ගෙන්වන්නේ රාජ්‍ය ආයතනවල සේවාව සක්‍රිය කරලා, වේගයෙන් වැඩ කිරීම වෙනුවෙන් සහ ඔවුන්ට අවශ්‍ය කරන පහසුකම් සැපයීම වෙනුවෙන්. ඒ වාගේම මන්ත්‍රීවරු වෙනුවෙන් වාහන 225කුත් ගෙනෙනවා. මැතිවරණ කාලයේ අපේ වැඩ පිළිවෙළ විධියට අනුර දිසානායක සහෝදරයාත්, අපි කවුරුත් වේදිකාවල කිව්වේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට වාහන පර්මිට් එකක් දෙන්නේ නැහැ කියායි. හැබැයි, අපි ඒ වෙලාවේ කිව්වා, ආණ්ඩුවේ මන්ත්‍රීවරු ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාට අවුරුදු 5ක කාලය තුළ වැඩ කරන්න වාහනයක් දෙනවා කියලා. ඒගොල්ලන් වැඩ කරන්න ඕනෑ, ඒ වෙනුවෙන් වාහන දෙනවා කියලා අපි කිව්වා. ආණ්ඩුවෙන් වාහනයක් දෙනවා, අවුරුදු 5 ඉවර වුණාට පස්සේ නැවත ඒ වාහනය ආණ්ඩුවට භාර දෙන්න ඕනෑ කියලා තමයි අපි කිව්වේ. ඒක මැතිවරණ කාලයේදීත් කිව්වා. අද ඒක තමයි මේ ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනා වෙනුවෙන් වාහන 225ක් ගෙනෙනවා. ඒ එක්කම පළාත් පාලන ආයතනවල වැඩ ටික වේගවත් කිරීම වෙනුවෙන් ඒ අවශ්‍ය කරන උපකරණ ටික ගෙනෙනවා. අපි ඒ විධියට තමයි වාහන 2,700ක් ගෙනෙන්නේ. ඒ වෙනුවෙන් තමයි රුපියල් මිලියන 12,500ක් වෙන් කරලා තිබෙන්නේ. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරු මේක ලසු කරනවා, ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනාට වාහන ගෙන්වනවා කියලා.

ඒ වාගේම අපි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය යටතේ සඳහන් කරලා තිබෙනවා, අපේ රටේ ජනගහනය 5,000 සිට 10,000 දක්වා ආවරණය වන පරිදි වෛද්‍යවරයෙක් සහ රෝහල් කාර්ය මණ්ඩලයක් ඇති කළ යුතුයි කියලා. අපි ඒ වෙලාවේ ඒ ගැන කථා කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ අපි දැන් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මෙවර අය වැයෙන් ඒ සඳහා ඕනෑ කරන මුදල් ටික වෙන් කරලා තිබෙනවා. එහි නියමු ව්‍යාපෘතිය හැටියට මේ වසරේ අපි ඉලක්ක කරපු ප්‍රාදේශීය රෝහල් ගොඩනඟා ගැනීම වෙනුවෙන් මුදල් වෙන් කරලා, අපි ඒ වැඩ පිළිවෙළත් ඉදිරියට අරගෙන ගිහිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනාගතය ගැන හිතලා, අනාගත දිශානතිය සහතික කිරීම වෙනුවෙන් වැඩ පිළිවෙළක් එක්ක මේ රට කොතැනටද අරගෙන යන්නේ කියන දැක්මක් ඇතුව තමයි මෙවර අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ වැඩ පිළිවෙළ මේ විධියට ඉදිරියට ගෙනිහිල්ලා, අපි කවුරුත් බලාපොරොත්තු වන පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් ජනතාවට උදා කර දීම වෙනුවෙන් එකතු වෙන්න කියලා විපක්ෂයටත් ආරාධනා කරමින් මම කථාව අවසන් කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Dammika Patabendi. You have 16 minutes.

[පූ.භා. 11.44]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 අය වැය විවාදය අවස්ථාවේදී කථා කිරීම සඳහා මට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. කොහොමද අය වැය විවාදයට සම්බන්ධ වෙන්න ඕනෑ, කොහොමද අය වැය විවාදයකදී කරුණු දක්වන්න ඕනෑ කියන කාරණය ගැන මේ ගැලරියේ ඉන්න අපේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වැරදි අදහසක් ගන්න ඉඩ තිබෙනවා, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු මේ අය වැය විවාදයට මැදිහත් වෙන විධිය බැලුවාම. ඒ නිසා ගැලරියේ ඉන්න පාසල් දරු දැරියන්ගෙන් අපි ඉල්ලා සිටිනවා, අය වැය විවාදය මේ විපක්ෂයේ කථා අනුවම තේරුම් ගන්න උත්සාහ කරන්න එපා කියලා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට මේ අය වැය විවාදයේදීත් තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, මනාප ප්‍රශ්නය. ඒගොල්ලන් මනාප ප්‍රශ්නය මූලික කරගෙන තමයි අය වැය විවාදයටත් සම්බන්ධ වෙන්නේ. හැබැයි, අය වැය විවාදය කියන්නේ මනාප සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. 2026 අවුරුද්දේ ආර්ථික ගමන් මග සැකසෙන්න ඕනෑ කොහොමද, ඒ සඳහා මේ අය වැය ඇතුළේ හදලා තිබෙන උපාය මාර්ග ගැළපෙනවාද, නැද්ද වැනි සාකච්ඡාවක් තමයි අය වැය තුළදී වෙන්න ඕනෑ. නමුත්, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු අය වැය තුළ පවා සාකච්ඡා කරන්නේ, තමන්ට ලැබෙන මනාප ගැන, තමන්ට මනාප කීයක් අඩු වුණා නම්ද අනෙක් එක්කෙනාට එන්න පුළුවන් වෙන්නේ ආදි වශයෙන් ලැබිච්ච මනාප ගැන. අපි විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, මේ අය වැය විවාදය හැල්ලුවට ලක් නොකර රටේ ජනතාවට ආදර්ශයක් ලබා දෙන්න කියලා. වසර 76කට පසුව පත් වෙච්ච අලුත් ආණ්ඩුවක් අලුත් ගමනක් ආරම්භ කර තිබෙනවා. අපි ඉතිහාසයේ කවදාවත් නැති විධියේ ආර්ථික ප්‍රතිඵල මේ සමාජයට, මේ රටට ගෙන එමින් තිබෙනවා. අන්න ඒ පිළිබඳව සාකච්ඡා කරන්න. එහි තිබෙන වැරදි අඩු පාඩු පිළිබඳව සාකච්ඡා කරන්න. ඒ මිස, මේක මනාප ප්‍රශ්නයකට ලඝු කරන්න උත්සාහ කරන්න එපා.

ඒ වාගේම මේ සාකච්ඡා තුළ අපට තේරෙන දේ තමයි, මීට කලින් -අවුරුදු 76ක් තිස්සේ- අය වැය හැදෙන්න ඇත්තේ කොහොමද කියන කාරණය. ඒ අය වැය හැදිලා තිබෙන්නේත් මනාප මුල් කරගෙන. ඒක නිසා තමයි සමහර මන්ත්‍රීවරුන්ට මුදල් අමාත්‍යාංශයේ නිදාගෙන ඉඳලා හරි තමන්ගේ දිස්ත්‍රික්කයට සල්ලි ගන්න සිදු වුණේ. මෙතෙක් පැවැති රජයන් තමන්ගේ අය වැය ප්‍රතිපත්ති පටු, පෞද්ගලික අරමුණු මතට ලඝු කිරීම නිසා තමයි මේ රට බේදවාචකයට පත් වුණේ; අපේ දූ දරුවන්ට, තරුණ තරුණියන්ට, මේ රටට අනාගතයක් නැති වුණේ. නමුත්, ජාතික ජන බලවේගයේ පාලනය දැන් දෙවැනි අය වැය ඉදිරිපත් කර තිබෙනවා. රට ඉස්සරහට අරගෙන ගිහිල්ලා තිබෙනවා. ඉතාම සාර්ථක අයුරින් වසරක ගමනක් පසු කරලා තිබෙනවා. 2026 අවුරුද්දට අදාළව උපාය මාර්ගික කරුණු 6ක් මුල් කරගෙන වැඩ පිළිවෙළ ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට අපි කියනවා, කරුණාකර මෙන්න මේ පදනම මත ඉඳගෙන මේ අය වැය ගැන කථා කරනවා මිසක්, පටු පෞද්ගලික චේතනාවලට මේ අය වැය ලඝු කරන්න එපා කියලා.

මේ අය වැයේදී ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා ප්‍රධාන උපාය මාර්ග 6ක් ගැන. තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනය, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක් ලබා ගැනීම, ණය තිරසරභාවය සහතික කිරීම, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සහ ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කියන උපාය මාර්ගික කරුණු 6 පදනම් කරගෙන සැකසුණු අය වැයක්, මේක. මේ අය වැය ගැන කථා කරද්දී විපක්ෂයේ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා, "මුහුද මැදින් පාරක් යනවා ලු, මාළු කොහොමද එහාට මෙහාට යන්නේ?" කියලා. රටක ආර්ථිකය මොන දිශාවටද අරගෙන යන්නේ, ඒ සම්බන්ධයෙන් වූ මූලධර්ම, ප්‍රතිපත්තිමය කාරණා ගැන තමයි අපි සාකච්ඡා කරන්නේ. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, මාළුන්ට එහාට මෙහාට යන්න බැරි වෙන්න අපි මුහුද මැද පාරක් හදනවා ලු. මෙච්චර කාලයක් වෙච්ච දේ තමයි ඒ තුළින් ප්‍රකාශයට පත් වෙන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තිබෙනවා විශාල කාර්යභාරයක්. විපක්ෂයේ බාධා කිරීම් මැද්දේත් මේ රට ඉස්සරහට අරගෙන යෑමේ වගකීම, ආර්ථිකය ඉස්සරහට අරගෙන යෑමේ වගකීම අපට පැවරී තිබෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

තාප්පයක් ගැහුවොත් මාළුන්ට යන්න බැහැ. තාප්පයක් නොවෙයි, පාරක් හදන්නේ.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ඔව්, ඒක තමයි. ඒ පාරවල් හදන්නේ තාප්ප ගහලා නොවේ කියලායි අපේ ගරු ඇමතිතුමා ප්‍රකාශ කරන්නේ. ඒ නිසා ඔබතුමන්ලාට ඡන්දය දීපු ජනතාව මේ තරම් හැල්ලුවට පත් කරන්න එපා කියලා අපි විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට තිබුණු ප්‍රධාන ගැටලුවක් තමයි රුපියල් ලක්ෂ 10කින් කොහොමද ජීවත් වෙන්න පුළුවන් මට්ටමේ ගෙයක් හදා ගන්නේ කියන එක. අපේ ගරු කංචන වැලිපිටිය මන්ත්‍රීතුමා පැහැදිලි කළා, අපි මිලියන 157ක් වියදම් කරලා, කෑගල්ල දිස්ත්‍රික්කයේ නිවාස 157ක් හදලා ඒ කටයුතු අවසන් කරමින් ඉන්න බව. ලක්ෂ 10ක නිවාසයක් ඔබතුමන්ලා හිතනවාට වඩා වේගයෙන් හදන්නේ කොහොමද දන්නවාද? ඒවා තුළ වංචාව, දූෂණය සිදු වෙන්නේ නැහැ. මේ රජය විසින් දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ ප්‍රතිලාභය මේ රටේ ජනතාවට ලැබෙන අවස්ථාවක් තමයි, ලක්ෂ 18ක, 20ක වටිනාකමක් සහිත නිවසක් ලක්ෂ 10කින් අපි ගොඩනැඟීම. ඒ ක්‍රියාවලිය තුළ ඔබතුමන්ලාගේ පාලන කාලයේ වාගේ වංචා, දූෂණ සිද්ධ වුණේ නැහැ. ඒ වාගේම, අපේ කංචන වැලිපිටිය මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි සමත් වෙලා තිබෙනවා මේ සඳහා රාජ්‍ය සේවකයන්ගේ සහාය ලබා ගන්න. ඒ විතරක් නොවෙයි, ග්‍රාමීය ප්‍රජාවගේ, විශේෂයෙන් ස්වේච්ඡා සංවිධානවල, කොට්ඨාස සභාවල සහාය අරගෙන ඒ වෙන් කළ මුදලට වඩා වැඩි වටිනාකමක් සහිත නිවාසයක් ප්‍රතිලාභීන්ට ලබා දෙන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. එම නිසා අපි මේ වසර තුළ සාර්ථක ගමනක් ඇවිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය අවුරුද්ද තුළ අපි ආපු ගමන, පසුගිය වතාවේ අපි ඉදිරිපත් කරපු මුල්ම අය වැය අසාර්ථකයි කියලා කරුණු දක්වන්න විපක්ෂය උත්සාහ කරනවා. නමුත්, අපේ දිස්ත්‍රික්කවල, අපේ ප්‍රදේශවල දශක ගණනාවක් තිස්සේ කර ගන්න බැරි වෙච්ච ඉතාම අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු ඉතිහාසයේ පළමුවැනි වතාවට පසුගිය වසරේ සිට ක්‍රියාත්මක වෙන්න පටන් අරගෙන තිබෙනවා. මම උදාහරණ කිහිපයක්

[ගරු දම්මික පටබැඳි මහතා]

කියන්නම්. දැරණියගල ආසනයේ පිහිටා තිබෙන මාලිබොඩ පාර කියන්නේ ශ්‍රීපාද ස්ථානයට පහසුවෙන් ළඟා වෙන්න පුළුවන්, ඒ වාගේම සංචාරක කලාපයක පිහිටා තිබෙන මාර්ගයක්. ඒ වාගේම, දෙමළ ජනතාව, වතු ජනතාව විශාල වශයෙන් ජීවත් වන ගම්මානවලට යන මාර්ගයක්. මේ මාර්ගයේ සංවර්ධනය වෙනුවෙන් අපි රුපියල් මිලියන 45ක වාගේ මුදලක් යොදවා තිබෙනවා. දශක ගණනාවක් තිස්සේ කිසිදු රජයකට මේ සඳහා මුදල් යොදවන්න බැරි වුණා. හැබැයි, අපේ රජයේ පළමුවැනි වසරේදීම මුදල් යොදලා මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු දැන් අවසන් කරමින් තිබෙනවා. ඒ වාගේම තමයි, රත්නපුරයේ කුරුවිටට එකතු වන, දිස්ත්‍රික්ක දෙකක් යා කරන දැරණියගල ආසනයේ කාලංචිවත්ත පාර. මේ සඳහා අපි රුපියල් මිලියන 45 ක් වැය කර තිබෙනවා. මේ මාර්ගය හරහා දිස්ත්‍රික්ක දෙකක් සම්බන්ධ කරලා, ඒ ප්‍රදේශවල ජනතාවට පහසු ගමනාගමනයක් ළඟා කර ගැනීම සඳහා අපි මැදිහත් වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි හෙට්ටිමුල්ල, ගැවිලිපිටිය මාර්ගය. අපි ඒ සඳහා රුපියල් මිලියන 81ක් වෙන් කර තිබෙනවා. ඒ මාර්ගයේ කැඩිච්ච පාලම ප්‍රතිසංස්කරණය කරලා නාවලපිටිය, ගම්පොල, කෑගල්ල දිස්ත්‍රික්කයට සම්බන්ධ වෙන ඒ මාර්ගය වැඩිදියුණු කරන්න අවශ්‍ය කටයුතු සිදු කර තිබෙනවා. දශක ගණනාවක් තිස්සේ හිටපු පාලකයන්ට බැරි වෙච්ච දේවල් අපි මේ ගෙවුණු වසර තුළ සිදු කර තිබෙනවා. එම නිසා ගෙවුණු වසරේ සිදු කළ ආර්ථික සංවර්ධනය ඒ විධියට හෑල්ලුවට ලක් කරන්න විපක්ෂයට බැහැ.

අපි අභියෝග කරනවා, ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු මෙන්න මේ කරුණු ටික පුළුවන් නම් බොරු බව ඔප්පු කරන්න කියලා. 2024 වසරේ පළමු භාගය තුළ පැවති සියයට 4.6ක ආර්ථික වර්ධන වේගය, 2025 වසරේ ඒ හා සමාන කාල පරිච්ඡේදය තුළදී සියයට 4.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, පළමු කාර්තුවේ සියයට 4.5ට තිබුණු විරැකියාව සියයට 3.8 දක්වා අඩු කර තිබෙනවා. භාණ්ඩ අපනයනය ඇමෙරිකානු ඩොලර් බිලියන 8.5 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 9.1 දක්වා වැඩි කර තිබෙනවා. සේවක ප්‍රේෂණ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 4.8 සිට ඇමෙරිකානු ඩොලර් 5.8 දක්වා වැඩි කර තිබෙනවා. සංචාරක ඉපැයීම් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5 දක්වා වැඩි කර තිබෙනවා. ආදායම් සහ ප්‍රදාන, රුපියල් ට්‍රිලියන 2.9 සිට රුපියල් ට්‍රිලියන 3.8 දක්වා වැඩි කර තිබෙනවා. එම ප්‍රමාණය අපේ ඉලක්කත් ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම, ප්‍රාථමික ශේෂය රුපියල් ට්‍රිලියන 0.8 සිට රුපියල් ට්‍රිලියන 1.5 දක්වා වැඩි කර තිබෙනවා. ඒ ප්‍රමාණය අප බලාපොරොත්තු වූ ඉලක්කයත් අභිභවා ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මේ ආර්ථිකය පසුගිය වසරේදී ඉතාම ස්ථාවර ගමනක් ඇවිල්ලා තිබෙනවා. අපි මේ ආර්ථිකය ස්ථාවර කර තිබෙනවා. අපේ රටේ ජනතාවගේ සිත්වලට ඇතුළු කරලා තිබුණු මතය මොකක්ද? අපේ රටේ ආර්ථිකය කියන්නේ එහෙම ගොඩ ගන්න බැරි ආර්ථිකයක්, අය වැය පරතරය වැඩි වෙනවා හැර අඩු වෙන්නේ නැති ආර්ථිකයක්, ණය අරගෙන මිසක් ගොඩ දාන්න බැරි ආර්ථිකයක් කියලා තමයි මතය හදලා තිබුණේ. හැබැයි ඉතිහාසයේ පළමුවැනි වතාවට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පෙන්වා දී තිබෙනවා, වංචා, දූෂණවලින් තොරව නිවැරදි ආර්ථික කළමනාකරණයක් යටතේ ආර්ථිකයක් හරි මඟට ගන්නේ කොහොමද කියලා. අපි ඒ ආදර්ශය මේ රටට පළමුවැනි වතාවට ලබාදීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයේ විශේෂ ලක්ෂණ කිහිපයක් සාකච්ඡා කරන්න මම කැමැතියි. ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළා, අපි ආර්ථික වශයෙන් ලෝකය ජය ගනිද්දී, අනිවාර්යය විශේෂම කාරණය තමයි ලෝකයේ තාක්ෂණයත් සමඟ අපි එකට ගමන් කළ යුතුයි කියන කාරණය. ලෝකයේ දියුණු තාක්ෂණය, වර්ධනය වන තාක්ෂණය කොතැනද තිබෙන්නේ, අන්න ඒවා හඹාගෙන ගිහිල්ලා අත් පත් කර ගන්න සූදානම් රටකට, ජාතියකට විතරයි සංවර්ධනය ළඟා කර ගන්න පුළුවන්, ආර්ථික සංවර්ධනය කර ගන්න පුළුවන්, ජන ජීවිතය සංවර්ධනය කර ගන්න පුළුවන්. එම නිසා ලෝකයේ නව තාක්ෂණය අත් පත් කර ගැනීම වෙනුවෙන් වෙච්ච වැඩ පිළිවෙළක් මේ අය වැය තුළ තිබෙනවා. ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීම අපගේ උපායමාර්ගික වැඩ පිළිවෙළේ මූලික කරුණු හයෙන් එකක්. ඒ සඳහා මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. මේ ආණ්ඩුව පළමු වසරේදීම ඒ සඳහා අවශ්‍ය ආරම්භය ලබා ගත්තා. ඒ ආරම්භයත් එක්කම අපි ඩිජිටල්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කළා. 2025 වසරේ පළමු කාර්තුව තුළ රජයේ ගෙවීම්වලදී LankaPay මාර්ගගත ක්‍රමය හරහා පමණක් රුපියල් බිලියන 2,000කට වැඩි ගනුදෙනු සිදු කරන්න අපි සමත් වෙලා තිබෙනවා. එම නිසා ඒකට අවශ්‍ය කරන හැරවුම, ආරම්භය අපි අරගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්දේ අය වැයෙන් ඒ සඳහා අවශ්‍ය නව ක්‍රියාමාර්ගවලට යන්න; මෙය අඛණ්ඩ ගමනක් හැටියට ඉදිරියට රැගෙන යන්න. ඒ අනුව ආයතනවලට ගෙවීම් කිරීමේදී සේවා ගාස්තු අය නොකිරීමට යෝජනා කර තිබෙනවා. 2026 වසරේ ජනවාරි මාසයේ 01වැනි දා ඉඳලා රජයේ ආයතන වෙත ඉලෙක්ට්‍රොනික ගෙවීම් සඳහා වන සියලු සේවා ගාස්තු ඉවත් කිරීමට මේ රජය යෝජනා කර තිබෙනවා.

ඒ වාගේම, දත්ත මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා කලාප මධ්‍යස්ථානයක් ලෙස විකාශනය වීමට ශ්‍රී ලංකාවට ඉහළ විභවතාවක් තිබෙනවා. එම දත්ත මධ්‍යස්ථානවලට ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. එහි ආරම්භයක් විධියට 2026 වර්ෂය සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා.

කෘත්‍රිම බුද්ධිය කියන්නේ, ලෝකයේ මේ මොහොතේ ඉහළින්ම තිබෙන තාක්ෂණයක් බව අපි දන්නවා. එය අත් පත් කර ගැනීම වෙනුවෙන් වන වැඩ පිළිවෙළක මේ රජය නිරතව සිටිනවා. ඒ අනුව කෘත්‍රිම බුද්ධිය සහ Cloud පහසුකම් ලබා දීම සඳහා රුපියල් මිලියන 750ක් වෙන් කිරීමට මේ අය වැයෙන් කටයුතු කර තිබෙනවා.

අපි පසුගිය කාලයේ දැක්කා, ඒ මොහොතේ තිබුණු තාක්ෂණික මෙවලම් අපේ පාලකයන් පාවිච්චියට ගත්තේ ඡන්ද ලබා ගැනීම සඳහා හුදු ඡන්ද පොරොන්දු වෙනුවෙන් විතරයි කියන එක. නොමිලයේ Wi-Fi දෙනවා, නොමිලයේ ටැබ් දෙනවා වාගේ බොරු අය වැය පොරොන්දු, බොරු මැතිවරණ පොරොන්දු දෙමින් තමයි ජනතාවගේ ඡන්ද කඩා වඩා ගත්තේ. ඒ තාක්ෂණය බිමට ගෙනාවේ නැහැ. සාමාන්‍ය ජනතාවට ඒ තාක්ෂණය වෙත ළඟා වෙන්න අවස්ථාව ලබා දුන්නේ නැහැ. නමුත්, සියලු පුරවැසියන්ට ඩිජිටල් තාක්ෂණය සඳහා ප්‍රවේශය පුළුල් කිරීම පිණිස අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රවේශ සඳහා අස්වැසුමලාභීන් සහ අනෙකුත් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට broadband vouchers ලබා දෙන්න අපි මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා.

තාක්ෂණය ගැන කථා කරනවා විතරක් නොවෙයි, අපි තාක්ෂණය මේ ආර්ථිකයේ සංවර්ධනය වෙනුවෙන් ගෙන එන්න අවශ්‍ය කරන පියවර අරගෙන තිබෙනවා. අපි ඒ ගමනත් ඇවිත් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, තාක්ෂණය, ඒ නව දැනුම, ඒ නවීනත්වය මේ රටේ සාමාන්‍ය ජනතාවටත් ලබා දීම සඳහා මේ අය වැය තුළින් අවශ්‍ය මැදිහත්වීම කරන්නත් යෝජනා කර තිබෙනවා.

ඊළඟට, අපි ඩිජිටල් තාක්ෂණයේ ව්‍යාප්තිය වේගවත් කිරීම සඳහා, සන්නිවේදන කුලුනු ඉදිකිරීම වැනි ඩිජිටල් යටිතල පහසුකම් ඉදිකිරීම සඳහා වඩාත් සරල වූ සහ කඩිනම් අනන්‍ය අනුමත කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කරන්නත් කටයුතු කරනවා. මෙම ඩිජිටල් තාක්ෂණ ව්‍යාප්ති වැඩසටහන යටතේ ඉදිකරන ලද නව කුලුනු සඳහා අදාළ වන බද්ද වසර 5ක කාලයක් සඳහා අත්හිටුවීමටද මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා.

ඒ වාගේම ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා startup ecosystem වර්ධනය වේගවත් කිරීමට "අග්නි" නමින් අරමුදලක් පිහිටුවන්න 2026 වසරේදී කටයුතු කරනවා. ඒ සඳහා මූලික රාජ්‍ය අනුග්‍රහය ලෙස රුපියල් මිලියන 1,500ක් -ඇමෙරිකානු ඩොලර් මිලියන 5ක්- වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය "අතථ්‍ය විශේෂ ආර්ථික කලාපයක්" - Virtual Special Economic Zone එකක් - සෑදීම සඳහා අවශ්‍ය මැදිහත්වීම මේ අය වැයෙන් කර තිබෙනවා. ඒ නිසා මේ අය වැය ආර්ථික කරුණු මත විතරක් පදනම් වූවක් නොවෙයි. නිසි ආර්ථික වර්ධනයක් ලබා ගන්න, ලෝකයේ අනෙකුත් ආර්ථිකයන් සමඟ තරග කිරීමේ මට්ටමට රට ගෙන යන්න ඉතාම තීරණාත්මක සාධකය වන නවීන තාක්ෂණය මේ ආර්ථිකයට ගෙන එන්නත් මේ අය වැය මඟින් යෝජනා කර තිබෙනවා; ඒකට මුදල් වෙන් කර තිබෙනවා; ඒ සඳහා වැඩ පිළිවෙළ හදලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාල වේලාව මදි වුණත් සඳහන් කරන්න ඕනෑ විශේෂ කාරණයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Dammika Patabendi, would you please wind up?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න.

විශේෂයෙන් බලශක්ති ක්ෂේත්‍රයේ තිබෙන අර්බුදය සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම වෙනුවෙන් පියවර ගන්න මේ ආණ්ඩුව අදහස් කරනවා. ඒ අනුව data centres, transport electrification, green hydrogen සහ green ammonia වැනි සංකල්ප කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා. එම නිසා මේ අය වැය, එක පැත්තකින් ආර්ථික දත්ත අනුව වැදගත් අය වැයක් විතරක් නොව, මේ රට හරි මඟට ගන්න පුළුවන් විධියේ දැක්මක්, වැඩ පිළිවෙළක් සහ උපාය මාර්ගයක් ද සහිත අය වැයක් ද වන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Gnanamuththu Srineshan. You have 14 minutes.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Member?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Hon. Deputy Speaker, I raise it under Standing Order No. 91. This is just to make a clarification in order to improve the Parliamentary practice.

Actually, this morning, I raised a point of Order when my name was mentioned. Subsequently, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we have gone past that now. I think the Hon. Speaker was in the Chair at that time and he made an explanation on that.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
I know. This is just a clarification for you, Sir. I am raising this so that we can improve the Parliamentary practice, not because I want to speak.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, if it is a personal clarification to me, you can do it outside.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
It is not a personal clarification. I want to clarify it under the Standing Orders.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
It was gone into.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
It is not that I want to speak, but I only refer to Standing Order No. 91(h).

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Shall we move on to the next speaker?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, Standing Order No. 91.(h) states, I quote:

"No Member shall make any imputation of improper motives against another Member, or make reference to personal affairs of another Member;"

[ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා]

So, Sir, no one can decide what innuendo was made. Once an Hon. Member's name has been mentioned, that Hon. Member has the right to raise a point of Order, and that is Parliamentary democracy, Sir. No one - the Secretary-General or the Secretariat - can decide what innuendo the other Member made. So, once an Hon. Member's name has been mentioned, that Hon. Member has the right to raise a point of Order under the Standing Orders. That is all.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Gnanamuththu Srineshan, you have 14 minutes and your time starts now.

[பி.ப. 12.03]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய வரவு செலவுத்திட்ட விவாதத்தை இரண்டு வகையில் நோக்க முடியும். முதலாவது, அறிவியல் பூர்வமாகப் புள்ளிவிபரத்தை அடிப்படையாகக் கொண்ட ஓர் அணுகுமுறை; இரண்டாவது, வடக்கு, கிழக்கில் பாதிக்கப்பட்ட மக்களின் குரலாகப் பார்க்கின்ற அணுகுமுறை. முதலில், இந்த வரவு செலவுத்திட்டத்தில் காணப்படுகின்ற விடயங்களை அறிவியல் பூர்வமாகப் புள்ளிவிபர ரீதியாகப் பார்க்கின்றபோது, 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் துண்டுவிழும் தொகை மொத்தத் தேசிய உற்பத்தியில் 6.5 சதவீதமாகக் காணப்பட்டிருக்கிறது. இம்முறை அந்தத் துண்டுவிழும் தொகையானது, மொத்தத் தேசிய உற்பத்தியில் 6.2 சதவீதமாக 0.3 சதவீதத்தால் குறைந்திருக்கின்றது. யுத்தம் நடைபெற்ற காலத்தில், "நாட்டில் குண்டுவிழும் தொகை அதிகரிக்க அதிகரிக்க துண்டுவிழும் தொகையும் அதிகரித்துக்கொண்டு செல்கின்றது" என்று சொல்வார்கள். இப்போது யுத்தம் முடிவடைந்த நிலையில் 0.3 சதவீதத்தால் இந்தத் தொகை குறைந்திருப்பதென்பது ஒரு சாதகமான விடயமாகப் பார்க்கப்படுகின்றது.

இதைவிட, நாட்டின் பொருளாதார வளர்ச்சி 4.8 சதவீதத்தால் உயர்ந்திருக்கின்றது என்ற ஒரு சாதகமான விடயமும் காணப்படுகின்றது. அதைவிட, நிதித்துறை உறுதிப்பாட்டை நிர்ணயிக்கக்கூடிய விதத்தில் வட்டி வீதம் 9.3 சதவீதமாகக் குறைந்திருக்கின்றது என்ற விடயமும், 2022ஆம் ஆண்டில் சுமார் 114 சதவீதமாக இருந்த அரசின் கடன் அளவு 96 சதவீதமாகக் குறைந்திருக்கின்றது என்ற கருத்தும் சொல்லப்பட்டிருக்கின்றது. அத்துடன், தோட்டத் தொழிலாளர்களின் நாட் சம்பளம் 400 ரூபாயால் உயர்த்தப்பட்டு, அது 1,750 ரூபாயாகியிருக்கின்றது. அதுபோல, 'பிரஜா சக்தி' வேலைத்திட்டம், தொழிற்படைக்கு மகளிரின் பங்களிப்பு போன்றவை புள்ளிவிபர ரீதியாகச் சாத்தியமாக, அனுகூலமாகக் காணப்படுகின்ற விடயங்களாகக் காணப்படுகின்றன.

அடுத்ததாக, வடக்கு, கிழக்குப் பகுதியில் இருக்கின்ற மக்கள் என்ன நினைக்கின்றார்கள், என்ன சொல்கின்றார்கள், அவர்களுடைய குரல் எப்படி இருக்கின்றது என்பதைப் பற்றி நான் சுட்டிக்காட்ட வேண்டும். ஏனென்றால், அந்தப் பிரதேசத்தின் பாராளுமன்ற உறுப்பினர் என்ற அடிப்படையில் இந்தக் கருத்தினையும் சொல்ல வேண்டிய கடப்பாடு எனக்கு இருக்கின்றது. அந்த வகையில், இந்த அரசாங்கம் கட்டுப்படுத்திக்கொண்டு வரும் ஊழல், மோசடி, இலஞ்சம் போதைவஸ்து பிரயோகச் செயற்பாடு மற்றும் பாதாள உலகக் குழுவின் செயற்பாடு போன்ற விடயங்களை நாங்கள் சாதகமாகப் பார்க்கின்றோம். அதேவேளை, இந்த நாட்டின் சட்டவாட்சியைப் பலப்படுத்துவது, மக்களை மையமாகக் கொண்ட ஆட்சியைத் தோற்றுவிப்பது, பொருளாதார வெற்றிகளை அடிமட்டத்தில் வாழும் மக்கள்வரை கொண்டுசெல்வது போன்ற விடயங்கள் இந்த வரவு செலவுத்திட்ட அறிக்கையின் முன்னுரையாகக் காணப்பட்டன. ஊழல், மோசடி, இலஞ்சம், பாதாள உலக குழுச் செயற்பாடு மற்றும் போதைவஸ்துப் பிரயோகம் என்பன ஒழிக்கப்பட வேண்டுமெனச் சொல்வது போன்று, அடுத்த விடயமாக நோக்கப்பட வேண்டியது இந்த நாட்டில் புரையோடிப்போயிருக்கின்ற தேசிய இனப் பிரச்சினை தீர்க்கப்பட வேண்டும் என்ற விடயமாகும். இந்தப் பிரச்சினை தீர்க்கப்படுவதும் வரவு செலவுத்திட்டத்துக்குச் சாதகமான அம்சமாக அமையும். அதாவது, இந்தப் பிரச்சினை தீர்க்கப்படுமாக இருந்தால், எமது புத்திஜீவிகள், பொருளாதார விற்பன்னர்கள், நாடு கடந்து வாழுகின்றவர்கள் இந்த நாட்டுக்குள் வந்து தமது பங்களிப்பைச் செய்கின்றபோது, வடக்கு, கிழக்கில் மாத்திரமல்லாமல் நாடு பூராவும் பொருளாதார வளர்ச்சியை உயர்த்தக்கூடிய சந்தர்ப்பம் இருக்கின்றது. எனவேதான் நாங்கள் தேசிய இனப் பிரச்சினையைத் தீர்ப்பது பற்றி கூறுகின்றோம்.

2009ஆம் ஆண்டு இறுதி யுத்தம் முடிவடைந்து இப்போது 16 ஆண்டுகள் கழிந்திருக்கின்றது. இந்தக் காலகட்டத்தில் என்ன நடந்திருக்கின்றது என்பதைப் பற்றி நாங்கள் சற்றுச் சிந்தித்துப் பார்க்க வேண்டும். ஐக்கிய நாடுகள் சபையின் மனித உரிமைகள் பேரவையில், 2012ஆம் ஆண்டு காலப்பகுதியில், இறுதி யுத்தத்தின்போது நடைபெற்ற சம்பவங்கள் தொடர்பாகப் பொறுப்புகூறல் என்ற விடயத்தை அரசாங்கம் கையில் எடுக்க வேண்டுமெனச் சொல்லப்பட்டது. அந்த அடிப்படையில் பார்க்கும்போது, இறுதி யுத்தத்தின்போது இடம்பெற்ற பாரிய மனிதப் பேரவலத்திற்கும் மனித உரிமை மீறல்களுக்கும் அதற்கு அரசு பொறுப்புக்கூற வேண்டும்; உண்மைகளைக் கண்டறிய வேண்டும்; பரிகார நீதி வழங்கப்பட வேண்டும்; மீண்டும் இவ்வாறான அவலங்கள் ஏற்படாமல் தடுக்க வேண்டும் என்ற கருத்துகள் சொல்லப்பட்டன. ஆனால், இன்னும் அந்த விடயங்கள் நிறைவேற்றப்படாமல் இருப்பது வேதனைக்குரியதாக இருக்கின்றது. ஏனென்றால், நாட்டின் பொருளாதாரத்தோடு இந்தப் பிரச்சினைகளுக்கு மிகவும் நெருக்கமான தொடர்பு இருக்கின்றது.

எங்களைப் பொறுத்தமட்டில், வடக்கு, கிழக்கில் யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்கள், காணாமல் ஆக்கப்பட்ட மக்கள், அரசியல் கைதிகளாக இருக்கின்றவர்கள் சார்பாகவும் எமது மண்ணில் நிகழ்ந்துள்ள சில நில அபகரிப்புகள் தொடர்பாகவும் பேசவேண்டியிருக்கின்றது. இந்த இடத்தில் நான் குறிப்பாகக் கடந்த காலத்தில் ஏற்பட்ட சில நிர்க்கதியான விடயங்கள் பற்றி சொல்ல விழைகின்றேன். கடந்த யுத்த காலத்தில் படையினரால் பாலியல் பலாத்காரங்கள் - பாலியல் வன்கொடுமைகள் நடைபெற்றிருந்தது உங்களுக்குத் தெரியும். மத்திய முகாம் என்ற இடத்தில் கோணேஸ்வரி என்கின்ற ஒரு தாய் பாலியல் பலாத்காரம் செய்யப்பட்டுக் கொலை செய்யப்பட்டிருந்தார். புங்குடுதீவில் சாரதாம்பாள் கொலை செய்யப்பட்டிருந்தார். அதேபோன்று சுண்டிக்குளி பாடசாலை

மாணவி கிருசாந்தி செம்மணியில் கொலை செய்யப்பட்டிருந்தார். விடுதலைப் புலிகளின் ஊடகவியலாளர் இசைப்பிரியா என்பவரும் பாலியல் பலாத்காரம் செய்யப்பட்டுக் கொலை செய்யப்பட்டிருந்தார். இது தொடர்பில் பீல்ட் மார்ஷல் சரத் பொன்சேகா ஒரு முக்கிய தகவலைச் சொல்லியிருக்கின்றார். அவர் தானாக முன்வந்து, சுயாதீனமாகச் சில வாக்குமூலங்களை ஊடகங்களுக்குச் சொல்லி வருகின்றார். அந்த வாக்குமூலத்தின் அடிப்படையில் இசைப்பிரியா என்ற அந்தப் பெண் படுமோசமாகப் பாலியல் பலாத்காரம் செய்யப்பட்டு படுகொலை செய்யப்பட்டிருந் தமைக்குக் காரணமாக இருந்தவர் புலனாய்வுப் பணிப்பாளர் கபில ஹெந்தவிதாரண என்ற விடயத்தை அவர் சொல்லியுள்ளார். அத்தோடு, ஜகத் ஜயசூரிய என்பவரைப் பற்றியும் வெள்ளைக்கொடியுடன் வந்தவர்கள்கூட படுகொலை செய்யப்பட்டுள்ளார்கள் என்றும் அதற்குப் பொறுப்பானவர் சவேந்திர சில்வா என்றும் சொல்லியிருக்கிறார்.

இந்த இடத்தில் நாங்கள் சொல்ல வேண்டிய ஒரு விடயம் என்னவென்றால், யுத்தத்துக்குத் தலைமைதாங்கிய சரத் பொன்சேகா அவர்களே இந்த விடயங்களை ஒரு சாட்சியமாக ஒப்புக்கொண்டுள்ளார் என்பதாகும். இந்த அரசாங்கம் உள்நாட்டுப் பொறிமுறை பற்றி அடிக்கடி வலியுறுத்திக் கொண்டிருக்கின்றது. அவ்வாறு உள்நாட்டுப் பொறிமுறையை வலியுறுத்துகின்ற அரசாங்கம், யுத்தத்துக்குத் தலைமைதாங்கிய தளபதி சரத்பொன்சேகா அவர்கள் கொடுத்திருக்கின்ற வாக்குமூலம் தொடர்பாக ஆராய வேண்டும். உங்களுடைய NPP அரசாங்கத்துக்குச் சாட்சியங்கள் தானாகவே கிடைத்துள்ளன. எனவே, இந்த விடயங்களை அரசு கையாள வேண்டுமென்பதைக் குறிப்பிட விரும்புகின்றேன்.

அடுத்த கட்டமாகச் சொல்ல வேண்டிய ஒரு விடயம் என்னவென்றால், நீங்கள் நாட்டை அபிவிருத்தி செய்யவேண்டும், ஊழல் மோசடிகளைத் தடுக்க வேண்டும், பாதாள உலக நடவடிக்கைகளைக் கட்டுப்படுத்த வேண்டும், போதைப்பொருளைக் கட்டுப்படுத்த வேண்டுமென்று செயற்படுவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. நாங்கள் அதனை வரவேற்கின்ற அதேவேளை, தேசிய இனப் பிரச்சினை சம்பந்தமாகவும் உங்களுடைய செயற்பாடுகள் மிகவும் துரிதமாகக் கையாளப்பட வேண்டுமென்பதைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். கிட்டத்தட்ட 16 ஆண்டுகள் 'உள்நாட்டுப் பொறிமுறை' என்ற செயற்பாட்டின் ஊடாக எந்தவொரு சாதகமான தன்மையும் சாதகமான சமிக்ஞையும் எங்களுக்குக் காட்டப்படவில்லை. எனவேதான் நான் இதனைச் சொல்லுகின்றேன்.

அடுத்ததாக, இந்த வரவு செலவுத்திட்டத்தை எடுத்துப் பார்க்கின்றபோது, எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தில் கிரான் பாலம், பொண்டுகள்சேனை பாலம் என்பவற்றின் அபிவிருத்தி மற்றும் முந்தனையாறு ஆற்றுப்படுக்கை நீர்த்தேக்கத் திட்டம் ஆகியவற்றைத் தொடங்குவதற்கான நிதிகள் இதில் ஒதுக்கப்பட்டிருக்கின்றது. நான் இந்த விடயத்தைச் சாதகமாகப் பார்க்கின்றேன்; அதனை வரவேற்கின்றேன்.

அதுபோல், இன்னுமொரு விடயத்தைச் சுட்டிக்காட்ட வேண்டும். மக்களின் குரலாக அவர்கள் எங்களுக்குக் கடிதங்கள் அல்லது WhatsAppமூலம் அனுப்புகின்ற செய்திகளை எடுத்துக்கொண்டால், அதில் மக்களின் அடிப்படைத் தேவைகளில் ஒன்றாக இருக்கும் குடிநீர் பற்றிய விடயம் முக்கியமானதாகக் காணப்படுகின்றது. இந்தக் குடிநீர் ஏறத்தாழ 65 சதவீதமான மக்களுக்குத்தான் கிடைத்திருக் கின்றது என்று சொல்கின்றார்கள். அப்படியென்றால் வடக்கு, கிழக்கில் 35 சதவீதமான மக்கள் குடிநீர் இல்லாமல் இருக்கின்றார்கள். ஆகவே, சுத்தமான குடிநீரை வழங்குகின்ற விடயத்தில் காலத்தைத் தாமதிக்கக் கூடாது. அநேகமான மக்கள் அசுத்தமான குடிநீரை அருந்துவதன் காரணமாகச் சிறுநீரக நோயாளிகளாக வாழ்ந்து கொண்டிருக்கின்றார்கள் அல்லது அதனால் பாதிக்கப்பட்டுக் கொண்டிருக்கின்றார்கள். குறிப்பாக வடக்கு, கிழக்கில் பல கஷ்டப் பிரதேசங்கள், அநேகமான குக்கிராமங்கள் காணப்படுகின்றபடியால் அங்குள்ள மக்களுக்குச் சுத்தமான குடிநீரை வழங்குவதற்கான வசதிகளைச் செய்வதற்குரிய நிதி வழங்கப்பட வேண்டும். இந்தக் கிராமங்களைச் சுட்டிக்காட்டுவதற்கு நேரம் போதாமையால் அதனை நான் தவிர்த்துக் கொள்கின்றேன்.

இன்னுமொரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். மட்டக்களப்புப் பிரதேசத்தில் கூடுதலான காட்டு யானைகள் காட்டிலிருந்து வயல்களுக்குள் வந்து, ஊர்களுக்குள் நுழைந்து, இப்போது நகரங்களுக்குள் நுழைகின்ற நிலைமை காணப்படுகின்றது. அதேவேளை, மட்டக்களப்பில் இருக்கின்ற 8 Range Officesக்கு - அதனை Beat Office என்றும் சொல்வார்கள் - பணியாட்கள் கிட்டத்தட்ட 75 பேர் வரை தேவைப்படுகின்றார்கள். இருந்தாலும், இதுவரை 35 பணியாளர்களே அங்கு இருக்கின்றார்கள். இந்தப் பணியாளர்களின் பற்றாக்குறை காரணமாகக் காட்டு யானைகள் இரவு பகலாகக் கிராமங்களை நாசம் செய்வதோடு மட்டுமல்லாது, மக்களையும் கொலை செய்து வருகின்றன என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

கடந்த 2020-2025க்கு இடைப்பட்ட காலத்தில் யானைத் தாக்குதல் காரணமாக மட்டக்களப்பில் 63 பேர் கொல்லப்பட்டிருக்கின்றார்கள். முதலைத் தாக்குதல் மூலமாக 9 பேர் கொல்லப்பட்டிருக்கின்றார்கள். அதேநேரம், 89 யானைகள் கொல்லப்பட்டிருக்கின்றன. இந்த விடயங்களை ஒட்டுமொத்தமாகப் பார்க்கின்றபோது, யானைகள் இப்போது நிலத்தின் செல்லப் பிராணிகளாகப் பார்க்கப்படுவதாகவும் முதலைகள் என்பது நீர் நிலைகளின் செல்லப் பிராணிகளாகப் பார்க்கப்படுவதாகவுமே தோன்றுகிறது. அவற்றைக் கட்டுப்படுத்துவதற்கான செயற்பாடுகள் இல்லாதபடியால், மக்கள் பயத்துடனும் தங்களுடைய அன்றாட வேலைகளைச் செய்யமுடியாத நிலையிலும் காணப்படுகின்றார்கள். நான் இது சம்பந்தமாக ஒத்திவைப்புப் பிரேரணை ஒன்றைக் கொண்டுவந்தபோது, வெகு விரைவில் அந்தப் பிரதேசங்களில் இந்தப் பிரச்சினையைத் தீர்க்க நடவடிக்கை எடுப்பதாக அதற்குப் பொறுப்பாக இருந்த அமைச்சரால் சொல்லப்பட்டது. எனவே, வாகரை, ஏறாவூர்ப்பற்று, பட்டிப்பளை, வவுணதீவு, ஓட்டமாவடி ஆகிய பிரதேசங்களில் யானை-மனித மோதலைத் தடுப்பதற்கான அலுவலகங்களும் பணியாட்களும் நியமிக்கப்பட வேண்டும் என்கின்ற விடயத்தை இங்க சொல்லிக்கொள்ள விரும்புகிறேன்.

அதுபோல், இன்னுமொரு விடயமான மேய்ச்சல் தரைப் பிரச்சினை பற்றியும் சொல்ல வேண்டும். அதாவது, மயிலத்தமடு-மாதவனையாக இருக்கலாம், கறுவாச் சோலையாக இருக்காலம், மேசைக்கல் பிரதேசமாக இருக்கலாம், இந்தப் பிரதேசங்களில் விவசாயிகள் தாங்கள் வைத்திருக்கின்ற கால்நடைகளைப் பராமரிக்க முடியாத நிலையில் அங்கு கெடுபிடிகள் அதிகரித்து வருகின்றன. அங்கேயுள்ள பல நிலங்கள் Forest Departmentஇற்கு உரிய நிலம் என்றும், வன சீவராசிகள் திணைக்களத்திற்குரிய நிலம் என்றும், தொல்லியல் திணைக்களத்திற்கு உரிய நிலம் என்றும் பலவிதமாகக் கல் போட்டு அடையாளம் இடப்படுகின்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

றபடியால், அங்கு கால்நடைகளை வளர்க்க முடியாது மக்கள் மிகவும் கஷ்டத்துக்கு உள்ளாகின்றார்கள். இந்த விடயமும் பாராளுமன்றத்துக்குக் கொண்டுசெல்லப்பட வேண்டும் என்பது மக்களின் முறையீடாக இருந்தது.

அண்மையில் கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் ஒரு நல்ல விடயத்தைச் சொல்லியிருந்தார். அதாவது, மாவீரர் துயிலும் இல்லங்களில் உள்ள இராணுவத்தை வெளியேற்றி, அதனை மக்களின் சுதந்திரமான செயற்பாட்டுக்கு விடுவிப்பது பற்றி சொல்லியிருந்தார். ஆகவே, அந்த விடயமும் நடைபெறவேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

இதைவிட, The Finance Company PLC என்ற நிறுவனம் கடந்த காலத்தில் பல வாடிக்கையாளர்களின் நம்பிக்கைக்குரியதாக இருந்தது. அந்த நிறுவனம் இப்போது மூடப்பட்டதனால் அதில் முதலீடு செய்த வாடிக்கையாளர்கள் பலர் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள்; அவர்கள் மிகவும் வேதனையோடு இருக்கின்றார்கள். நீண்ட காலமாக அது பற்றிய சாத்தியமான பதில் கிடைக்க வேண்டும் என்று காத்திருக்கிறார்கள். எனினும் இதுவரை எந்தச் சாத்தியமான பதிலும் கிடைக்கவில்லை.

இதையும்விட இன்னுமொரு விடயம், ஓய்வூதியம் பெறுகின்றவர்களுடைய பிரச்சினை! அண்மையில்கூட, பாராளுமன்றத்தின் முன்பாக அவர்கள் ஆர்ப்பாட்டம் செய்தார்கள். அவர்கள் தங்களுடைய ஓய்வுப் படி முரண்பாட்டினைத் தவிர்க்கச் சொல்லிக் கேட்கிறார்கள். 2021ஆம் ஆண்டு மார்கழி மாதம் 31ஆம் திகதி ஓய்வு பெற்றவர்களுக்கு 67,500 ரூபாய் சம்பளம் கொடுக்கப் படுகின்றது. அடுத்த நாள் - 2022ஆம் ஆண்டு முதலாம் மாதம் முதலாம் திகதி ஓய்வு பெற்றவர்களுக்கு 97,500 வேதனம் கொடுக்கப்படுகின்றது. கிட்டத்தட்ட ஒரு நாள் பிந்தி ஓய்வுபெற்றவர்களுக்கு 30,000 ரூபாய் வித்தியாசத்தில் வேதனம் குறைத்து வழங்கப்படுகின்றது. இது பாரிய ஒரு முரண்பாட்டைக் காட்டுகின்றது. அவர்கள் பட்டதாரிகளாக இருக்கின்றார்கள்; நீண்ட காலம் பணியாற்றியவர்களாக இருக்கின்றார்கள். ஒரு நாள் வித்தியாசத்தில் அவர்கள் 30,000 ரூபாயை இழக்கின்றார்கள். எனவே, சமத்துவ சிந்தனை உள்ள இந்த அரசாங்கத்திற்கு இந்த முரண்பாட்டைத் தீர்க்க வேண்டிய ஒரு கடப்பாடு இருக்கின்றது.

இதையும்விட, மட்டக்களப்புப் பிரதேசத்தில் நெடியகல்மலை என்ற ஓர் இடம் வடமுனையில் காணப்படுகின்றது. அந்த இடத்தில் உண்மையில் பௌத்த குடிமகன் எவரும் வாழவில்லை. அவர்கள் வாழும் இடத்திலிருந்து கிட்டத்தட்ட 15 கிலோமீற்றர் கடந்து வந்து அந்த நெடியகல்மலையில் ஒரு பௌத்த வழிபாட்டுத் தலம் அமைக்கப்பட்டிருக்கின்றது. அந்த இடத்தில் அந்த வழிபாட்டுக்கு உரிய எந்தக் குடிமக்களும் இல்லை. இதுபோன்ற பிரச்சினைகள் கடந்த காலத்திலும் ஏற்பட்டன. வெடுக்குநாறி மலை விவகாரமாக இருந்தால் என்ன, தீகவாபி விவகாரமாக இருந்தால் என்ன, நெடியகல்மலையில் அமைக்கப்படுகின்ற பௌத்த வழிபாட்டுத் தலமாக இருந்தால் என்ன, அவையெல்லாம் உங்களுடைய காலத்தில் ஏற்படுத்தப்பட்ட பிரச்சினைகள் அல்ல!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Srineshan, your time is up now.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

Hon. Deputy Speaker, please give me only one more minute.

மட்டக்களப்பு மாவட்டத்தின் வடமுனை, நெடியகல் மலையில் பொலன்னறுவையில் இருந்து வருகின்ற மதகுருமார் வழிபாட்டுத் தலங்களை அமைத்துத் தேசிய நல்லிணக்கத்திற்கு முரண்பாடான செயலைச் செய்துகொண்டு இருக்கின்றார்கள். இந்த விடயங்கள் கட்டுப்படுத்தப்பட வேண்டும். அன்று பௌத்த மதகுரு மிஹிந்தலை விகாராதிபதி உண்மையை அழகாகச் சொன்னார். அதாவது, குருந்தூர்மலையில் பௌத்த இடிபாட்டுச் சின்னங்களைக் கொண்டுசென்று கொட்டிவிட்டு, அந்த இடத்தில் அவை இருந்தன என்று சொல்லிக்கொண்டு அவர்கள் அங்கு விகாரையை அமைக்கின்ற செயற்பாட்டைச் செய்கின்றார்கள் என்பதாக அவர் ஒத்துக்கொண்டிருக்கின்றார். இந்த விடயத்தையும் இங்கே நான் உங்களுடைய கவனத்திற்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்னும் பல விடயங்களைக் கூறவேண்டியிருந்தாலும் அதற்கு நேரம் போதாமல் இருக்கின்றது. குறிப்பாக, மட்டக்களப்பு போதனா வைத்தியசாலை முழுமையான ஒரு வைத்தியசாலையாக அமைக்கப்பட வேண்டும். ஏனென்றால், அங்குள்ள நோயாளிகளைக் கொழும்புக்கும் யாழ்ப் பாணத்திற்கும் கொண்டுசெல்ல வேண்டிய ஒரு நிலைமை காணப்படுகின்றது. மேலும், கரடியனாறு, மல்வத்தை விவசாயப் பண்ணைகள் ஆரம்பிக்கப்பட வேண்டும். மட்டக்களப்பில் மூடப்பட்ட நிலையில் இருக்கின்ற மீன்பிடிக் கூட்டுத்தாபனத்தை இயங்குநிலைக்குக் கொண்டுவர நடவடிக்கை எடுக்க வேண்டும். அன்னமலைப் பகுதியில் பாலம் அமைக்கப்பட வேண்டும் என்ற மக்களின் வேண்டுகோள்களை உங்கள் முன்னிலையில் வைக் கவேண்டிய பொறுப்பு எங்களுக்கு இருக்கின்றது.

வடக்கு, கிழக்கு என்பது யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்களாகும். அந்தப் பிரதேசங்களைப் பத்தோடு பதினொன்றாகக் கருதாமல், அவற்றையும் எல்லாவற்றுடனும் சமமாகக் கருதாமல், பாதிக்கப்பட்டிருக்கின்ற அந்தப் பிரதேசங்கள் தொடர்பில் கூடுதல் கவனம் செலுத் தவேண்டுமென்று கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. P. Ruwan Senarath. You have 12 minutes.

[අ.භා. 12.20]

**ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රජයේ දෙවන අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේ ඒ පිළිබඳව කථා කරන්නට

අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. මේ අය වැය පිළිබඳව කථා කරද්දී විශේෂයෙන්ම සඳහන් කරනවා, මෙය මේ රටේ ආණ්ඩුවක් ඉදිරිපත් කරපු 80වැනි අය වැය බව. අපේ ආණ්ඩුව පත් වෙලා දෙවන අය වැය තමයි ගරු ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ඉදිරිපත් කළේ. මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ 17වැනි දා පළමුවැනි අය වැය ඉදිරිපත් කළා. ඒ කියන්නේ රටේ 79වැනි අය වැය. මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ 80වැනි අය වැය. මීට කලින් මේ පාර්ලිමේන්තුවේ මුදල් ඇමතිවරුන් අය වැය 78ක් ඉදිරිපත් කරලා තිබෙනවා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මුදල් ඇමතිවරයා විධියට වාර 11ක් - වැඩිම වාර ගණනක් - අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා, මේ ඉස්සරහා පේළියේ ඉඳගෙන.

අද විපක්ෂයේ වාඩි වෙලා ඉන්න අය මීට අවුරුද්දකට පෙර මේ පැත්තේ වාඩි වෙලා ඉඳගෙන අය වැය ගණනාවක් ඉදිරිපත් කරලා, අපි දෙවැනි අය වැය ඉදිරිපත් කළාට පස්සේ අපට කියනවා, කිසිම ඉලක්කයක් නැති, සැලැස්මක් නැති අය වැයක් ඉදිරිපත් කළා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අය මේ අය වැය පිළිබඳව අධ්‍යයනයක් කරලාද, එහෙම නැත්නම් කල්පනාව නැතුව ඔහේ කියවනවාද කියලා මම දන්නේ නැහැ. එක්කෝ, මේක අහගෙන ඉඳලා stress වැඩි වෙලා නැඟිටලා යනකොට බිත්තියේ ඔළුව වැදිලා, මාධ්‍ය වටකර ගත්තාට පස්සේ ඔහේ මොනවා හරි කියවලා යනවාද කියලා අපට තේරෙන්නේ නැහැ. විපක්ෂ නායකතුමා කියපු දෙයක් මාධ්‍යවල ප්‍රචාරය වෙනවා මම දැක්කා. "මහ පොළොවේ ඉඳගෙන නොවෙයි මේ අය වැය හදලා තිබෙන්නේ" කියලා එතුමා කිව්වා. එතුමාත් මේක ඇත්තටම අධ්‍යයනය කරලාද ඒ වාගේ දේවල් කියන්නේ කියලා අපි දන්නේ නැහැ. මොකක් හරි පීඩනයක් නිසාද, එහෙම නැත්නම් තිබෙන මොකක් හරි ප්‍රශ්නත් එක්කද එහෙම කියන්නේ කියලා අපි දන්නේ නැහැ. ඒ පැත්තේම ඉන්න සමහර මන්ත්‍රීවරුන් - ආර්ථිකය පිළිබඳව විශේෂ දැක්මක් තිබෙනවා කියන මන්ත්‍රීවරුන් - අය වැය පිළිබඳව විවාද කරද්දී, "අපි කවදාවත් බලාපොරොත්තු නොවුණු විධියට ආර්ථිකයේ වර්ධනයක් තිබෙනවා, භාණ්ඩාගාරය පිරිලා උතුරලා යනවා, අපි එදා ඉදිරිපත් කරපු දේවල් වැරදුණා" වැනි කතන්දර ටිකක් කිව්වා. ඒවා කියන්නේ නායකතුමාට ෂොට් එකක් දෙන්නද, තමන්ට පහළ මන්ත්‍රීවරයෙක් ඉන්දියාවට එක්ක ගෙන ගිය නිසාද කියන්න මම දන්නේ නැහැ. ඒ කෙසේ වෙතත්, මේ වනවිට අය වැය පිළිබඳව විවිධ කාරණා මතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 අවසන් වෙනකොට අපේ රටේ තිබුණු තත්ත්වය පිළිබඳ වාර්තා කිහිපයක් මා ළඟ තිබෙනවා. විශේෂයෙන් ගත්තොත් වාර 78ක් අය වැය ඉදිරිපත් කරපු අය මේවා ගැන අපෙන් ප්‍රශ්න කරනකොට, අපට පොඩ්ඩක් හිනාත් යනවා.

තවම පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කරගන්න බැරිව මගේ දිස්ත්‍රික්කයේ විතරක් - හම්බන්තොට දිස්ත්‍රික්කයේ විතරක්- 73,000ක් ඉන්නවා. ඒ වාගේම වැසිකිළි පහසුකම් නැතුව අපේ දිස්ත්‍රික්කයේ විතරක් 3,500කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඒවා තමයි ඇත්ත සංඛ්‍යාලේඛන. 2024 වසරේ අවසාන සංඛ්‍යාලේඛන තමයි මම ගත්තේ. මෙහෙම තත්ත්වයක් ඇතුළේ අය වැය 78ක් ඉදිරිපත් කරපු අය අපට කියනවා, "කෝ, තවමත් මේකේ ඉලක්කයක් නැහැ, සැලැස්මක් නැහැ, ඉස්සරහට යන්නේ නැහැ, වැඩේ යන්නේ නැහැ" කියලා. ගෙවුණු අවුරුද්ද ඇතුළේ ඉතාම සාර්ථක අය වැයක් ඉදිරිපත් කර ගන්න අපට හැකියාව ලැබුණේ ගිය අවුරුද්දේ පළමු අය වැය ඇතුළේ අපි දාපු අඩිතාලම නිසා. අපි පළමුවන අය වැය ඉදිරිපත් කරනකොට රටට සිදු වෙලා තිබුණු තත්ත්වය ගැන අපි දිගින් දිගටම කථා කළා. ආර්ථිකයේ පදනම දෙදරා ගිහිල්ලා තිබුණු තත්ත්වයක් තමයි රටේ තිබුණේ. එවැනි තත්ත්වයක් තුළ තමයි අපි පළමුවැනි අය වැය ඉදිරිපත් කළේ. ඒ අය වැය ඉදිරිපත් කරනකොට සමහර මන්ත්‍රීවරුන් ඇහුවා, ඕවා කිව්වාට කරන්න පුළුවන්ද කියලා. ඕවා සුරංගනා කථා, වාහන ගෙන්වන එක පිස්සු වැඩක්, එහෙම වුණොත් රට ඉවරෙටම ඉවරයි කියලාත් තවත් සමහරු කිව්වා. හැබැයි ඒගොල්ලන් අද පිළිගන්නවා, "නැහැ, එහෙම නැහැ, අපට වැරදුණා, ආර්ථිකය දැන් ඉස්සරහට යමින් තිබෙනවා" කියලා. ඒක තමයි ඇත්ත තත්ත්වය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඉදිරිපත් කළ මේ අය වැය ප්‍රධාන වශයෙන් උපායමාර්ගික අරමුණු හයක් ඔස්සේ විග්‍රහ කරලා තිබෙනවා. හැබැයි දැන් සමහරු කෙඳිරිගානවා, මේ අය වැයේ අනාගත සැලැස්මක් නැහැ, ඉලක්කයක් නැහැ කියලා. ඒ විධියට ඔවුන් මාධ්‍ය ඉස්සරහ කෙඳිරිගාමින් සිටිනවා. ඒක තමයි දවසේ කෙඳිරිල්ල.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 අය වැයේ තිබෙන ඉදිරි ඉලක්ක මොනවාද, ඉදිරි උපායමාර්ගික අරමුණු මොනවාද? මීට පෙරත් මේ කාරණාව මතු වුණා. තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක් පිළිබඳව මේ අය වැය තුළ කරුණු මතු කරලා තිබෙනවා. මොකක්ද මේ කියන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපගේ ප්‍රධාන උපායමාර්ගික අරමුණ වන්නේ, වසර කිහිපයකින් සියයට 7 ඉක්මවන ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමයි. ඒ අනුව එහි ප්‍රතිලාභ රටේ සෑම ප්‍රදේශ, ප්‍රජාව සහ සමාජ කණ්ඩායම් අතර සාධාරණව බෙදී යන බව සහතික කිරීම, ජන සහභාගිත්වයක් සහිත ආර්ථිකයක් ගොඩනැඟීම තමයි අපේ මූලික අරමුණුවල සඳහන් පළමුවැනි ඉලක්කය.

අපගේ ඊළඟ උපායමාර්ගික අරමුණ වන්නේ, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක් ලබා ගැනීමයි. මේ කාරණාව ඔස්සේ අපි බලාපොරොත්තු වන්නේ, 2025-2029ට අදාළ ජාතික අපනයන සංවර්ධන සැලැස්ම යටතේ නව අපනයන වෙළෙඳ පොළවල් අත්පත් කර ගැනීම, පවතින වෙළෙඳ පොළ පුළුල් කිරීම, දැනට අත්සන් කර ඇති වෙළෙඳ ගිවිසුම් සමාලෝචනය කිරීම, නව නිදහස් වෙළෙඳ ගිවිසුම්වලට එළඹීම යන කාරණායි. නමුත් අපට කියනවා, ඉලක්කයක් නැහැ, සැලැස්මක් නැහැ, දැක්මක් නැහැ, මේවා නිකම් කථා විතරයි කියලා.

විපක්ෂයේ සමහරුන්ට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, ජනාධිපතිතුමා පැය හතරහමාරක් කථා කළ එක. අපි දන්නවා, මීට කලින් හිටපු සමහර මුදල් ඇමතිවරු මේ පාර්ලිමේන්තුවේදී අය වැය ඉදිරිපත් කළ ආකාරය. ඉතිහාසය අරගෙන බැලුවොත්, මේ රටේ හිටපු ජනාධිපතිවරයෙක් මුදල් ඇමතිවරයා වශයෙන් පැයකට අඩු කාලයකදීත් අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ, ඩී.බී. විජේතුංග මහත්මයා. ඒ වාගේම වැඩි කාලයක් ගත්ත රොනී ද මැල් මහත්මයා ඉදිරිපත් කළ අය වැය ගැනත් අපට අවබෝධයක් තිබෙනවා. ඉස්සර හිටපු තවත් සමහර මුදල් ඇමතිවරු අය වැය කියවපු ආකාරයත් අපට මතක් වනවා. අය වැය ටිකක් කියවනවා, ටිකක් වාඩි වෙනවා. සභාව කල් තබනවා; ආයෙත් නැඟිටිනවා; ආයෙත් කියවනවා. එහෙම කියවපු අය වැයත් අපි දැකලා තිබෙනවා. හැබැයි එතකොට ඔය කවුරුවත් ඒ ගැන කථා කළේ නැහැ. නමුත් ජනාධිපති අනුර දිසානායක සහෝදරයා පැය හතරහමාරක් අය වැය ඉදිරිපත් කිරීම සමහර අයට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. හැබැයි ඒ, කාලය සම්බන්ධව නොවෙයි.

අය වැයේ අන්තර්ගතය මොකක්ද, ඉලක්ක මොනවාද, ණය තිරසර ලෙස කළමනාකරණය කරන්නේ කොහොමද, මොකක්ද තිබෙන සැලැස්ම යනාදිය පිළිබඳ සාධනීය අදහස් ඉදිරිපත් කිරීමයි විපක්ෂය කරන්න ඕනෑකම තිබෙන්නේ. විපක්ෂයේ එවැනි සාධනීය විවේචන හෝ අදහස් භාර ගන්න අපි ලැස්තියි. සමහර

[ගරු පී. රුවන් සෙනරත් මහතා]

මන්ත්‍රීවරු ඒ විධියට අපට සැහෙන උදව් කරනවා, මේ රට හොඳ තැනකට ගෙන යන්න. සමහර මන්ත්‍රීවරු අපෙන් ප්‍රශ්න කරනවා, ඇපයක් නැතුව ණයක් දෙනවා කිව්වා, එය තවම ප්‍රමාදයි නේද කියලා. ඒවා අහන අයට අපි කියන්න ඕනෑ, සමහරු ඇප නැතුව ඉන්නේ, සමහරු ඇප පිට ඉන්නේ, ඒ අයට ඇප දෙන්න අපට බැහැ, ඒ අයට ඇප ගන්න වෙන්නේ උසාවිවලින් කියලා. නමුත් අපි ජනතාවට, ව්‍යාපාර කරන අයට ණය දෙනවා, ඇප රහිතව. ඒක ඉදිරි කාල සීමාව ඇතුළත ක්‍රියාත්මක වනවා. නමුත් ඒ කිසිවක් පිළිබඳව සොයා බලන්නේ නැතුව මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඔහේ මොනවා හරි කියාගෙන යන තත්ත්වයකට මේ අය අද පත් වෙලා තිබෙනවා.

අපේ ඊළඟ උපායමාර්ගික අරමුණ වන්නේ, ණය තිරසරභාවය සහතික කිරීමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ ලංකාව ණය ගත්තා. මොනවාටද ගත්තේ? වගකීම් විරහිත, ප්‍රමුඛතාවක් නොමැති ව්‍යාපෘති සඳහා එදා ණය ගත්තා. එලෙස ණය ගත් සමහර ව්‍යාපෘතිවල වත්කම් තවමත් ජනිත කරගන්න බැරිවෙලා තිබෙනවා. මොකද, අදාළ ව්‍යාපෘති අදාළ කාලයේදී අවසන් කර නැහැ. එවැනි කාරණා ගණනාවක් පසුගිය කාලයේ මතුවෙලා තිබුණා. ඒ නිසා ණය තිරසරභාවය පිළිබඳව ගැටලු රැසක් පසුගිය කාල සීමාව තුළ නිර්මාණය වෙලා තිබුණා. කෙසේ වෙතත්, අප විසින් ණය තිරසරභාවය තහවුරු කිරීම සඳහා පැහැදිලි සැලැස්මක් සකස් කරමින් තිබෙන බව මේ සභාවට කියන්න ඕනෑ. ඒ නිසා තමයි අද ණය දෙන ආයතනත්, මූල්‍ය ආයතනත් අප සමඟ එකතු වෙලා මේ ණය තිරසරකරණය පිළිබඳ සැලකිල්ලක් දක්වමින් අපේ රට නැවත ගොඩනැඟීම සඳහා සහයෝගය ලබා දෙමින් සිටින්නේ.

විශේෂයෙන්ම නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම පිළිබඳව ගත්තොත්, අපේ ආර්ථිකය රැඳී තිබෙන්නේ ආනයනය මත පදනම් වෙලා බව අපි කවුරුත් දන්නවා. ගෝලීය වශයෙන් අර්බුදයක් ඇති වුණොත්, ඒක අතිශය භයානක තත්ත්වයක්. ඒ නිසා අපේ රට ඇතුළේ නිෂ්පාදන ආර්ථිකයක් පටන්ගන්න ඕනෑ. ඒ නිසා නව නිෂ්පාදන ආර්ථිකයක් පටන් ගැනීම මේ අය වැයේ පළමු අදියරේම ආරම්භ කර තිබෙනවා. මේ අය වැයේ දෙවැනි අදියරේදී එහි ඊළඟ පියවරට යනවා. නමුත් ඕනෑම කෙනෙකුට ඔහේ මොනවා හෝ කියන්න පුළුවන්, මේකේ ඉලක්කයක් නැහැ, මොකක්වත් නැහැ, සැලැස්මක් නැහැ කියලා.

විශේෂයෙන්ම ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීම සඳහා මෙවර අපි විශේෂ මැදිහත් වීමක් කරමින් තිබෙනවා. රටේ කුඩාම පරිපාලන ඒකකය ග්‍රාම නිලධාරි වසමයි. ඒ ග්‍රාම නිලධාරි වසම් 14,022ම ආවරණය කරන සංවර්ධන සැලැස්මක් අපි ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීමට ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඒවා තමයි අපේ ඉලක්ක. මේවා කිසිවක් හොයන්නේ බලන්නේ නැතිව, එහෙම නැත්නම් හොයලා බලලා ඒක තමන්ට වැදගත් නැහැ කියලා දැනෙන නිසා, තමන්ගේ අඥානාව පාර්ලිමේන්තුව ඉස්සරහ හෝ මාධ්‍ය ඉස්සරහ ඉදිරිපත් කරලා වැඩක් නැහැ. මේකේ සත්‍ය තේරුම් ගන්න.

ඒ වාගේම තමයි ඩිජිටල්කරණය ප්‍රවර්ධනය. අපේ රටේ ඒ සඳහා හොඳ විභවතාවක් තිබෙනවා. අපි ඒ වෙනුවෙන් විශාල මැදිහත්වීමක් කරමින් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, your time is up.

**ගරු පී. රුවන් සෙනරත් මහතා**
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසන් වශයෙන් මා මෙම කරුණ කියනවා. 2026 අය වැය කියන්නේ, රටේ ආර්ථිකය නැවත ගොඩනැඟීමේ පියවරක්. එය සම්පූර්ණ අභියෝගයට පිළිතුරක් කියා අපි විශ්වාස කරනවා. විපක්ෂය කරන සාධනීය විවේචන ගෞරවයෙන් භාරගන්න, අහන්න අපි කැමැතියි. නමුත්, එම විවේචනවලට ප්‍රතිපත්තිමය සහ සංඛ්‍යාත්මක පිළිතුරු අපේ අය වැය තුළම තිබෙනවා. අපි කියන්නේ මෙච්චරයි. මේ ඉදිරිපත් කළේ රජයේ අය වැයක් පමණක් නොවෙයි, ජනතාවගේ අය වැයක්. ඒ නිසා අප සියලුදෙනාම එකතු වෙලා මේ අය වැය ක්‍රියාත්මක කරමු. ඒ සඳහා සියලුදෙනාම මේ පිළිබඳව හොඳ අවබෝධයක් ලබාගන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ruwanthilaka Jayakody. You have ten minutes.

[අ.භා. 1.00]

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුද්දක සාර්ථක පාලන කාලයකින් අනතුරුව අපේ රජයේ දෙවන අය වැය විධියට සාර්ථක අය වැයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාටත්, මුදල් අමාත්‍යාංශයටත් මා ස්තුතිවන්ත වෙනවා. මේ අය වැය තුළ තිබෙන සුවිශේෂී කාරණය තමයි, රටේ ආර්ථිකය ස්ථාවර තත්ත්වයකට ගෙන ඒමට අපේ ආණ්ඩුවට පුළුවන් වූ බවට වන සාක්ෂිය. බිමටම ඇද දමා, නැත්තටම නැති කර තිබූ ආර්ථිකයක් මේ තරම් කෙටි කාලයක් තුළ සාර්ථකව නඟාසිටුවීමට අපගේ ආණ්ඩුවට පුළුවන් වුණා. ඒ නිසා ස්ථාවර ආර්ථිකයක් පිළිබඳව අපට කථා කරන්න පුළුවන්. ගරු ජනාධිපතිතුමා අය වැය කථාව ඉදිරිපත් කරමින් පැය 4 විනාඩි 20ක් පුරා පැහැදිලිව අපට කිව්වා, ඉදිරි කාලය තුළ ආර්ථිකය ගෙනියන්නේ කොහොමද, මේ රටේ සංවර්ධන ක්‍රියාදාමය සිදු වන්නේ කොහොමද, ස්ථාවර ආර්ථිකයක් හදන්නේ කොහොමද, 2028දී අපි ණය ගෙවන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව.

හැබැයි, මෙහිදී විපක්ෂය අල්ලා ගත්ත කාරණා දෙකක් තිබුණා. ඒ සම්බන්ධව විවාද කර ගන්න මට්ටමට කථා කරපු අවස්ථා දෙකක් තිබුණා. එක කාරණයක් තමයි, පර්මිට් එක. දෙවන කාරණය තමයි, විමධ්‍යගත ප්‍රතිපාදන වෙනුවෙන් වෙන් කරන රුපියල් මිලියන 10 ගැන. ඒ සම්බන්ධව දිගට කිව්වා.

පර්මිට් එක සම්බන්ධයෙන් ගත්තොත්, විපක්ෂයෙන් පැහැදිලිව ඉල්ලුවේ පර්මිට් එක ලබා දෙන්න කියලායි. පර්මිට් එක දෙන්න කිව්වා. ඒක යම් සාකච්ඡා මට්ටමකට ගියා. එතුමන්ලා කිව්වා, "රජයෙන් වාහන දෙනවාට වඩා පර්මිට් එක දෙන එක ලාභයි. ඒ නිසා ඒක දෙන්න" කියලා. නමුත්, ඇත්ත කථාව මොකක්ද? ඇත්ත කථාව, පර්මිට් එක ලැබුණාම විපක්ෂයේ අය මේක විකුණා ගන්නවා. විශාල මුදලක් ගන්නවා. එතුමන්ලා ජනතාවගේ බදු මුදල් විශාල වශයෙන් වෙනස් විධියට පාවිච්චි කරනවා. හැබැයි, අපි පැහැදිලිවම ආණ්ඩුව ගන්නකොට කිව්වා වාගේම ජනතාවට පොරොන්දු ලබා දුන්නා, මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරනවා කියලා. ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේදී අපි දේශපාලනඥයාට තිබෙන සියලු වරප්‍රසාද කපා හරිමින් ගියා. විශේෂයෙන් ජනාධිපතිවරුන්ගේ තිබෙන සියලු වරප්‍රසාද කපා හරිමින් ගියා. ඒ, එක් අවස්ථාවක අපි පැහැදිලිව කිව්වා, "මන්ත්‍රීවරුන්ට පර්මිට් එක දෙන්නේ නැහැ" කියලා. අපි ඒක කිව්වේ පැහැදිලි හේතුවක් මත. මහජන බදු මුදල් පැහැදිලිවම සාධාරණ විධියට වියදම් කරන්න ඕනෑ කියන කාරණය නිසා තමයි අපි ඒක ඒගොල්ලන්ට කිව්වේ. මන්ත්‍රීවරුන්ට වාහනයක් ලැබිය යුතුයි. අපි ඒක ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඒ නිසා තමයි අපි කිව්වේ, මෙවර වාහනයක් ලබා දෙන්න ක්‍රියාමාර්ග ගන්නවා, කැබ් රථයක් ලබා දෙනවා කියලා. හැබැයි, පර්මිට් එක ගැන ඉතිහාසයේ අපට තිබෙන්නේ අමිහිරි අත්දැකීමක්; ඒ සම්බන්ධයෙන් මේ රටේ ජනතාවට තිබෙන්නේ අමිහිරි අත්දැකීමක්. ඒක විපක්ෂයේ අය විකුණා ගත්තා. අවසානයේදී සති දෙකකට මන්ත්‍රී ධුරය ගත්ත අයත් ඒ පර්මිට් එක අරගෙන විකුණා ගත්තා. අපි ස්ථිර වශයෙන්ම පර්මිට් එක ලබා දෙන්නේ නැහැ.

හැබැයි, අපි වාහනය දුන්නාම කොහොමද ඒක ලාභ වෙන්නේ? ජනාධිපතිතුමා කිව්වා, "අපි සම්පූර්ණ - full - රක්ෂණයක් දාලා වාහනය ලබා දෙනවා" කියලා. ඒ රක්ෂණය ලබා දුන්නාට පස්සේ ඒ වාහනය මන්ත්‍රීවරයාට ලැබෙනවා. ඒ අවුරුදු පහ ඒ මන්ත්‍රීවරයා නඩත්තු කරගෙන එතුමා විසින් ඒ වාහනය භාවිත කළ යුතුයි. එහෙම භාවිත කරලා අවුරුදු 5 ඉවර වුණාම ඒ වාහනය නැවත ලබා දෙන්න ඕනෑ. ජනාධිපතිතුමා සහ මේ ආණ්ඩුව අද අරගෙන තිබෙන ක්‍රියාදාමය ඔස්සේ ගියාම ඉදිරි අවුරුදු 5ත් මේ ආණ්ඩුවේම මේ වාහනය තියා ගන්න පුළුවන්. හැබැයි, තවදුරටත් මේගොල්ලන් හිතන්න පුළුවන්, පර්මිට් එක විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට දුන්නත් අපි විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට ඒ පර්මිට් එක අරගෙන ඕනෑ නම් ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට කැබ් එක අරන් දෙන්නම් කියලා. එහෙම එකඟතාවකටත් ඒගොල්ලන් එන්න පුළුවන්. මොකද, ඒක එච්චර ලාභයි ඒගොල්ලන්ට. එහෙම කියන්නත් පුළුවන්. පැහැදිලිවම අපි ජනතාවට පොරොන්දු වෙච්ච විධියට නිවැරදි ක්‍රියාමාර්ග ගන්නවා. අපි මේ පර්මිට් එක දෙන්නේ නැහැ. වාහන ලබා දීලා අවුරුදු 5 ඉවර වුණාට පස්සේ නැවත ඒක රජයට භාර දිය යුතුයි. අපි හිතනවා, ආණ්ඩුවේ මන්ත්‍රීවරු තමන්ගේ ගෙදර පාවිච්චි කරන වාහනයක් විධියට භාවිත කරලා, නැවත ඒක රජයට ලබා දෙයි කියලා. ඒක එහෙම වෙනවා.

දෙවන කාරණය තමයි, විමධ්‍යගත ප්‍රතිපාදන. රුපියල් මිලියන 10ක ප්‍රතිපාදන තමන්ට ඉක්මනට ලබා දෙන්න කියලා විපක්ෂයේ අය හඬක් නැඟුවා. පැය 4යි විනාඩි 20ක කාලයක් තුළ මේ රට හදන ක්‍රියාදාමය සම්බන්ධයෙන්, මේ රටේ ආර්ථිකය ස්ථාවර කරන්නේ කොහොමද, අපි 2028දී ණය ගෙවන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අය වැය කථාව පිළිබඳ විවේචනයක් නොවෙයි තිබුණේ. සාකච්ඡාව තිබුණේ මෙන්න මේ කාරණා දෙක ඉටු කර ගන්නේ කොහොමද කියන එක ගැනයි.

ඉතිහාසයේ රුපියල් ලක්ෂ 10ක විමධ්‍යගත ප්‍රතිපාදන මන්ත්‍රීවරුන්ට ලබා දුන්නාම එතුමන්ලා ඒක භාවිත කළේ කොහොමද කියලා අපි දන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ මුදල් අපහරණය කළා. ඒ මුදලින් තමන්ගේ හිතවතුන්ට අවශ්‍ය දේවල් බෙදා දීමට සමහර වැඩසටහන් ක්‍රියාත්මක කළා. අපි බලයට එනකොටත් ඒ මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදනවලින් තමතමන්ගේ හිතවතුන්ට බෙදා දෙන්න ඕනෑ බඩු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩගහලා තිබුණු ආකාරය අපි දැක්කා. අපි බලයට ආවාට පසුව අපට කිව්වා, "මේවා ඒ මන්ත්‍රීවරයා දුන්නු දේවල්. ඒ මන්ත්‍රීවරයාට ලැබුණු දේවල්. ඒවා ඒගොල්ලන් කියන අයට තමයි බෙදා දෙන්න ඕනෑ" කියලා. ඊට පසුව අපි ඇහුවා, "ඒ මන්ත්‍රීවරයා තමන්ගේ ගෙදර තිබුණු මුදල්වලින්ද දුන්නේ?" කියලා. අපේ පැත්තෙන් අපි කිව්වා, "නිශ්චිතව නිවැරදි ක්‍රමවේදයකට, සාධාරණව මේ බඩු බෙදන්න" කියලා. මේගොල්ලන්ගේ පැත්තෙන් දිගටම කථා කළේ ඒ ගැනයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි, අපේ මහජනතාවට පොරොන්දු වෙච්ච විධියට ඉතාම සාධාරණව ඒ මුදල් බෙදා දීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනවා. පසුගිය අවුරුද්දේ දිස්ත්‍රික්කවලට ලැබුණු මුදල් ඒ සියලු දිස්ත්‍රික්කවල අය සමඟ සාකච්ඡා කරලා, නිවැරදිව බෙදා දීලා වැඩ කටයුතු කළා; නිවැරදිව ඒ මුදල් භාවිත කළා. ඒ මුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් ගත්තොත්, අපි ගම්පහ දිස්ත්‍රික්කයේ දැනට ඒ මුදල්වලින් සියයට 85ක් විතර වියදම් කරලා තිබෙනවා. ඉලක්කම් විධියට ගත්තොත්, මේ දවස්වල ඒ මුදල් වියදම් කරලා නැති වෙන්න පුළුවන්. හැබැයි, අපට තවත් කාලය තිබෙනවා. දෙසැම්බර් 15වන දා විතර වෙනකොට බලන්න පුළුවන් වෙයි, අපි විශාල මුදලක් වියදම් කරලා ඒ ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න අවශ්‍ය ක්‍රියාමාර්ග නිවැරදිව අරගෙන තිබෙන බව.

අපේ චාමර සම්පත් හිටපු රාජ්‍ය ඇමතිතුමා ජනාධිපතිතුමාගේ අය වැය කථාව අවසන් වෙලා යන ගමන් මාධ්‍යයට අදහසක් ප්‍රකාශ කළා, "මෙච්චර දේවල් කිව්වාට ඒවා කරන්නේ නැහැ" කියලා. ඉන්පසුව මට එතුමාව ලොබියේදී හමු වුණාම මම එතුමාගෙන් ඇහුවා, "ඔබතුමාට ආයේ කවදාවත් බලයට එන්න වෙන්නේ නැහැ නේද, මෙවැනි අය වැයක් ඉදිරිපත් කළාම?" කියලා. එතුමා කිව්වා, "නැහැ. ඔය කිව්වාට කිසි දෙයක් වෙන්නේ නැහැ" කියලා. ඒ, එතුමාගේ අත්දැකීම. ඒක සාධාරණයි. එතුමන්ලාගේ අත්දැකීම එහෙම තමයි. එතුමන්ලා තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍රයක් එක්ක තමයි ආණ්ඩුවල හිටියේ. ඒ පෞද්ගලික න්‍යාය පත්‍ර එක්ක වැඩ කටයුතු කරද්දී ඒ විධියේ අදහස් එන එක සාධාරණයි. ඒගොල්ලන්ගේ ඉතිහාසය තුළම තිබුණේ එවැනි වැඩ පිළිවෙළක්. එතුමා දැන් කියපු විධියට ඒගොල්ලන් නිවැරැදිව ඒ වැඩ කටයුතු නොකරපු නිසා තමයි මේ රටේ මිනිස්සු අපිව බලයට ගෙනාවේ. පැහැදිලිව අපි වැඩ කටයුතු කරන්නේ team එකක් විධියට. අපි වැඩ කටයුතු කරන්නේ පෞද්ගලික න්‍යාය පත්‍ර එක්ක නොවෙයි. අපි මේ රටේ මහ ජනතාව බලාපොරොත්තු වෙන සංවර්ධන යෝජනා ක්‍රම, ඒ ක්‍රියාදාමයන් team එකක් විධියට ක්‍රියාත්මක කරනවා. ඒ සම්බන්ධව මේ රටේ ජනතාව පැහැදිලිව දන්නවා. ඒ නිසා විපක්ෂයේ අය කලබල වෙන්න ඕනෑ නැහැ. අර මන්ත්‍රීතුමාත් කලබල වුණේ, අලුත්ම ක්‍රමවේදයක් හදන්න එතුමා උත්සාහ කරනවා, අලුත් දෙයක් නිර්මාණය කරන්න හදනවා. එතුමා මාර හොඳයි, එතුමාත් ඉන්නේ අපිත් එක්ක කියලා අපට ලොකු කතන්දරයක් කියන්න හදනවා. එහෙම කියන ගමන් එතුමා කියනවා, කුඩු අල්ලන එක සංදර්ශනයක් කියලා. කුඩු අල්ලන සිද්ධි දාමයේදී "පසු ගිය දවස්වලදී ජාතික ජන බලවේගයේ කෙනෙකුත් අහු වුණා. අන්න දැන් තමයි තේරෙන්නේ වැඩේ, මේකට සියලුදෙනා සම්බන්ධයි, ඒගොල්ලන් ඒවා වහනවා" වාගේ අදහසක් තමයි එතුමා ඒ වෙලාවේ සමාජයට දෙන්න හැදුවේ. හැබැයි අතිගරු ජනාධිපතිතුමා විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ "රටම එකට" වැඩසටහන ආරම්භ කරද්දී පැහැදිලිව කිව්වා, "මේක අපි

[ගරු රුවන්තිලක ජයකොඩි මහතා]

හිතනවාට වඩා විශාල වශයෙන් පැතිරුණු එකක්. රජයේ නිලධාරින්, දේශපාලනඥයන්, සියලු ක්ෂේත්‍රවල අය මේකට පැටලිලා, බද්ධ වෙලා ඉන්නවා. මේක නැති කිරීම විශාල කාර්යයක්. ඒ සඳහා පක්ෂ භේදයකින් තොරව සහයෝගය දෙන්න, ඒ සඳහා වැඩ කටයුතු කරන්න" කියලා. පොලිස්පතිතුමා ඇතුළු පොලිස් නිලධාරින් විශාල ප්‍රමාණයක් එකතුවෙලා ඒ වැඩසටහන ඉතා සාර්ථක කර ගන්න කටයුතු කරගෙන යනවා. ඒ නිසා ඒ මන්ත්‍රීතුමා කලබල වෙන්න ඕනෑ නැහැ, ඒක හරි විධියටම කරගෙන යනවා. ඒ කටයුත්තේදී මොන පක්ෂයේද, මොන පාටද කියලා අදාළ නැහැ. කවුරුන් හෝ විෂ මත්ද්‍රව්‍ය ජාලය තුළ බිස්නස් එකක් කරනවා නම් ඒ ගොල්ලන්ව අත්අඩංගුවට ගන්නවා. ඒ සම්බන්ධව කිසිම ගැටලුවක් නැහැ, අපි නීතිය ක්‍රියාත්මක කරනවා.

ඒ මන්ත්‍රීතුමා තව ලොකු කථාවක් කිව්වා. ඒ මොකක්ද? අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති ප්‍රශ්න ගැන එතුමා හැඟීම්බරව කථා කළා. ලුනු සම්බන්ධ ප්‍රශ්නයක් ලොකුවට කිව්වා. ඇත්තටම ගත්තොත් මේක ඉතිහාසයේ ඉඳලා තිබෙන ප්‍රශ්නයක්, ඒකට දේශපාලනය සම්බන්ධයි, ඒකේ මාෆියාවක් තිබෙනවා. ඒ සියලුදෙනා එකතු වෙලා තමයි ඒ බිස්නස් එක අරගෙන යන්නේ. ඒ ගොල්ලන්ගේ ඒ ක්‍රියාදාමයට විරුද්ධව අපි සැලැස්මක් ඇතිව වැඩ කටයුතු කරගෙන යනවා. නිලධාරින් එකතු කරගෙන, සියලු දත්ත එකතු කරගෙන අපි සැලැස්මක් ඇතිව වැඩ කටයුතු කරගෙන යනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ruwanthilaka Jayakody, your time is up.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
මට තව තත්පර 30ක් දෙන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒවා සම්බන්ධයෙන් අපි වැඩසටහනක් හදලා, ලබන අවුරුද්දට අදාළව අය වැයෙන් මුදල් වෙන් කරලා ඒ ප්‍රශ්න විසඳීමට හරි ක්‍රමවේදයකට අනුව වැඩ කටයුතු කරගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඉතා සාර්ථක අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති මාලාව තුළ ඉඳගෙන මේ රටේ සමස්ත ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න වැඩ කටයුතු කරන බව කියමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chanaka Madugoda. You have 14 minutes.

[අ.භා. 1.11]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 අය වැය ලේඛනය පිළිබඳව විවාද කරන මේ වෙලාවේ මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා මන්ත්‍රී ප්‍රතිපාදන ගැන සිහිපත් කළා. ඇත්තටම එතුමන්ලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන දීලා නැත්තේ විපක්ෂයේ මන්ත්‍රීවරු ඒ මන්ත්‍රී ප්‍රතිපාදන නිවැරදිව වියදම් නොකරන නිසායි කියලා තමයි එතුමාගේ කථාවේදී හැඟුණේ. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන කප්පාදු කිරීම ඔබතුමන්ලාගේ ආණ්ඩුව කළ දැඩි මුග්ධ ක්‍රියාවක් කියන එක මම මේ මොහොතේ කියන්න කැමැතියි. මොකද, අපිත් මහජන ඡන්දයෙන්, මහජන මනාපයෙන් පාර්ලිමේන්තුවට ආව මිනිස්සු. අපට අපේ ගමේ ජනතාවට, අපේ ප්‍රදේශයේ ජනතාවට විමධ්‍යගත ප්‍රතිපාදනවලින් යම් වැඩ කටයුත්තක් කරන්න නොහැකිවීම ගැන තිබෙන්නේ දැඩි කනගාටුවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 අය වැය ලේඛනය බැලුවත්, පසුගිය වසරේ අය වැය ලේඛනය බැලුවත්, අපට ඔබතුමන්ලාගේ අය වැය ලේඛනවලින් දකින්නට ලැබෙන්නේත් පසුගිය කාලවල ඉදිරිපත් කළ අය වැය ලේඛනවල දිගුවක්ම තමයි කියන කාරණයත් මම මේ වෙලාවේ සිහිපත් කරන්න ඕනෑ. අපට මතකයි, වත්මන් ජනාධිපතිතුමා එදා විපක්ෂයේ ඉන්නකොට රජයේ සේවක මහත්ම මහත්මීන්ගේ ගැටලු, ප්‍රශ්න වෙනුවෙන් කථා කළ ආකාරය, ඔවුන්ගේ අයිතිවාසිකම් ඉල්ලමින් උද්ඝෝෂණය කළ ආකාරය. එහෙම පාරට බැහැපු ජනාධිපතිවරයා අද රජයේ සේවක මහත්ම මහත්මීන්ට ඉවසන්න කියන එක කොතරම් සාධාරණද කියලා අපි අහන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ආණ්ඩුවෙන් ජනතාව බලාපොරොත්තු වුණු විප්ලවීය වෙනස්කම්, එහෙම නැත්නම් සුසමාදර්ශී වෙනස්කම් සිදු කරන්න ආණ්ඩුව සමත් වෙලා නැහැ කියන එක අපට අද දකින්න ලැබෙනවා. පැහැදිලිව සැබෑ වෙනසක් අපේක්ෂාවෙන් හිටපු ජනතාව එදා 2025 අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ඒ දිහා බලලා සතුටු වුණා. නමුත්, 2025 වසර අවසන් වනකොට ජනතාව තමන්ගේ අභිලාෂ ඉටු වුණේ නැහැ කියලා දැඩි කනස්සල්ලෙන් ඉන්න බව සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා, විනිවිදභාවයෙන් වැඩ කරන ආණ්ඩුවක්. මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා විනිවිදභාවයෙන් වැඩ කරන රාජ්‍ය යන්ත්‍රණයක්. නමුත්, ඒ බලාපොරොත්තුව අද ඉටු වෙලා තිබෙනවාද කියන කාරණය පිළිබඳව දැඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඉන්දියාව සමඟ ගිවිසුම් ගැහුවා. ඉන්දියාව සමඟ හොර ගිවිසුම් හතක් ගැහුවාය කියලා අද මේ රටේ කථා වෙනවා. අපි ආණ්ඩුවෙන් ඇහුවා, ඒ ගිවිසුම් මොනවාද කියලා. අද පාර්ලිමේන්තුවේ ඉන්න අපවත්, මේ රටේ ජනතාවවත් දන්නේ නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගහපු ගිවිසුම් මොනවාද කියලා.

ඒ වාගේම ඇමෙරිකාවෙන් බදු සහන ගන්න වෙලාවේ ඒ සහනවලට හිලව් කළේ මොනවාද කියන කාරණය, මේ රටත් සමඟ එකඟ වුණේ මොන කරුණු පිළිබඳව ද කියන කාරණය පිළිබඳවත් මේ ආණ්ඩුව වසන් කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි. විපක්ෂයේ ඉන්න අප සියලුදෙනාම කන්ටේනර් පෙට්ටි 323ක අක්‍රමිකතාව සම්බන්ධයෙන් විමසුවා. ඒ ගැන සොයා බලන්න ජනාධිපතිතුමා පත් කළ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු හැම දාම හඬ නැඟුවා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වන කල් එම වාර්තාව සභාගත කරන්න ආණ්ඩුව සමත් වෙලා නැහැ. ඒ සම්බන්ධව කළ එකම දෙය තමයි, වගකීම් දැරූ ඇමතිවරයා ඉවත් කිරීම. එපමණයි මෙම ආණ්ඩුවෙන් සිදු කළ කාර්යභාරයක් විධියට අපි දැක්කේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විනිවිදභාවය පෙන්වන්න බැරි වුණු ආණ්ඩුවක් විධියට මේ ආණ්ඩුව අපට සලකන්න වෙනවාය කියන කාරණය මා මේ මොහොතේ සිහිපත් කරනවා.

ඒ විතරක් නොවෙයි. මුදල් වැය නොවන ආයතනික මට්ටමෙන් සිදු කළ හැකි බොහෝ දේවල් මේ ආණ්ඩුව අද මඟ හරිමින් ඉන්නවා. පසුගිය අය වැය ලේඛනයේ ප්‍රගතිය පිළිබඳව විශේෂයෙන්ම අපි ආංශික කාරක සභාවලදී විමසුවාම සමහර යෝජනාවල ප්‍රගතිය වුණේ, සියයට 12යි, එහෙම නැත්නම් සියයට 15යි. 2025 වර්ෂයේ අය වැය ලේඛනයේ ප්‍රගතිය පිළිබඳව කිසිදු පැහැදිලිතාවක් නැති වෙලාවක තමයි 2026 අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන්නේ කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

2025 වර්ෂයේ අය වැයේදී ආයෝජකයන් වෙනුවෙන් ආයෝජන ආරක්ෂණ පනතක් ගෙනෙනවාය කිව්වා. නමුත්, ඒ දේ තවම ඉටු කර ගන්න බැරි වෙලා තිබෙනවා. අමාත්‍යාංශ මට්ටමෙන් නීති සම්පාදන ක්‍රියාවලියේ තිබෙන දෝෂ සහ අකාර්යක්ෂමතාව තමයි අපට මේ කාරණයේදී පිළිබිඹු වෙන්නේ. මේ අවුරුද්දේ අය වැය ලේඛනය තුළත් ඒ කාරණයම සඳහන් වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපනයනකරුවන්ට තත්ත්ව පරීක්ෂණය සහ සහතිකකරණය ලබා ගැනීම සඳහා අවශ්‍ය ජාතික තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා 2025 අය වැය ලේඛනයෙන් රුපියල් මිලියන 750ක් වෙන් කරලා තිබුණා. නමුත්, තවමත් ඒ කටයුතුවල ප්‍රගතියක් දකින්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ රටේ ප්‍රධාන ආදායම් මාර්ගය, සංචාරක ව්‍යාපාරයයි. අද මේ ආණ්ඩුව සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් මොනවාද කරලා තිබෙන්නේ? පසුගිය කාලයේ ජනාධිපතිවරයා කිව්වා, 2030 වර්ෂයේදී සංචාරක ව්‍යාපාරයෙන් ඩොලර් බිලියන 8ක් මේ රටේ ආදායම විධියට උත්පාදනය කරන්න බලාපොරොත්තු වනවා කියලා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගුවන් තොටුපළ පර්යන්තයේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ඒ පටන් ගත්ත සංවර්ධන ව්‍යාපෘතියේ මූලික ප්‍රසම්පාදන කටයුතුවත් අවසන් නොකර තමයි මේ රටට ඩොලර් බිලියන 8ක් ගෙනෙන්න කථා කරමින් ඉන්නේ.

ඒ වාගේම ඩිජිටල්කරණය පිළිබඳව කථා කළා. පසුගිය ආණ්ඩු ඩිජිටල්කරණය පිළිබඳව මූලික සැකැස්ම, මූලික කාර්යභාරය ඉටු කර තිබුණේ. මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා මේ වන විට වසරක් ගත වෙලා තිබෙනවා. නමුත්, ඩිජිටල්කරණය පිළිබඳව මෙම ආණ්ඩුව ඉදිරිපත් කළ වැඩ පිළිවෙළේ සාධනීය ප්‍රගතියක් අපට දකින්න ලැබෙන්නේ නැහැ කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

රටක් අලුත් චින්තනයකට යොමු කරන්න නම් උපදින දරුවන්ගේ ඉඳලා වෙනස්කම් ඇති කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒත්, ආණ්ඩුවට තවමත් බැරි වෙලා තිබෙනවා නීරෝගී සම්පන්න, සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහි කිරීම වෙනුවෙන් කටයුතු කරන්න. පසුගිය අය වැයෙන් රුපියල් මිලියන 7,500ක් ගැබිනි මාතාවන්ට පෝෂ්‍යදායී ආහාර ලබා දීම වෙනුවෙන් වෙන් කරලා තිබුණා. නමුත්, තවමත් සියයට 46යි එහි ප්‍රගතිය. එයින් තවම වැය කරලා තිබෙන්නේ මිලියන 917.79ක් පමණයි. මෙම ආණ්ඩුවේ ප්‍රගතිය ඒ සියලු නිර්ණායක තුළින් අපට මනින්න පුළුවන්. ඒ නිර්ණායක අනුව, ඔවුන් අසමත් බව සිහිපත් කරන්න ඕනෑ. ත්‍රිපෝෂ වැඩසටහන වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදනවල ප්‍රගතිය තිබෙන්නේ සියයට 35ක් පමණයි. අර කථාවක් තිබෙනවා නේ, "කන්දක් විළි ලා මී පැටියෙක් වැදුවා වාගෙයි" කියලා. 2025 අය වැය ලේඛනයත් අපට පෙනෙන්නේ ඒ විධියේ අය වැය ලේඛනයක් ලෙසටයි. 2026 අය වැය ලේඛනය එහෙම නොවෙන්න කියලා, විපක්ෂයක් විධියට අපි ප්‍රාර්ථනා කරනවා.

මේ අය වැය ලේඛනය දිහා බැලුවාම පෙනෙන්න තිබෙන කරුණක් තමයි, මේ අය වැය තුළින් ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබිඹු වෙන්නේ නැති එක. ඔබතුමන්ලා කියපු දේවල්, ඔබතුමන්ලා විපක්ෂයේ සිටියදී හඬ නැඟූ දේවල්, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය මේ තුළ පෙනෙන්නේ නැහැ. එදා ඔබතුමන්ලා 76 වසරක සාපයක් පිළිබඳව කථා කළා; ඒ ක්‍රමවේදය වැරැදියි කිව්වා. නමුත් අද අපට ඔබතුමන්ලා වෙතින් වෙනස් ක්‍රමවේදයක් දකින්න ලැබෙන්නේ නැහැ කියන කාරණයත් මේ මොහොතේ සඳහන් කරන්න ඕනෑ.

ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ දෙවැනි අය වැය ලේඛනය තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ ආණ්ඩුවේ කාල සීමාවට අයත් අය වැය ලේඛන 5න්, 2ක් දැනටමත් ඉදිරිපත් කරලා ඉවරයි. මේ ආණ්ඩුව බලයට ආවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් පෙන්වලායි. දේශපාලන බලය ලබා ගැනීම පිණිස ඔබතුමන්ලා ඉදිරිපත් කළ එම ලියවිල්ල තුළ සඳහන් කරුණු පිළිබඳවත් අපි මේ මොහොතේ සිහිපත් කරවන්න ඕනෑ. ආදරණීය පෙර පාසල් ගුරුවරියන් -ඒ ගුරු මහත්මීන්, ගුරු මෙනෙවියන්- සඳහා වන දීමනාව රුපියල් 6,000ක් දක්වා වැඩි කර ඔබතුමන්ලා ලබා දුන්නා. නමුත් අද සියයට 57ක ප්‍රගතියක් පමණයි එහි දකින්නට තිබෙන්නේ. අද අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් ගැන කථා කරනවා. එහිදී විශේෂයෙන්ම මුල් ළමාවිය සංවර්ධනය ඉතා වැදගත් කාරණයක් බව ඔබ අපි සියලු දෙනාම පිළිගන්නවා. නමුත්, ඒ කටයුත්ත සිදු කරන පෙර පාසල් ගුරුතුමියලාගේ ගරුත්වය වෙනුවෙන්, ඒ අය නූතනත්වයට ගැළපෙන පෙර පාසල් ගුරුවරියන් බවට පත් කිරීම වෙනුවෙන් රජය ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද? මෙහිදී අපි යෝජනාවක් කරනවා. රුපියල් 6,000ක් වැනි දීමනාවකට පෙර පාසල් ගුරුතුමිය ලඝු කරන්න එපා. ඇයට ගරුත්වයක් ලබා දිය හැකි ආකාරයට කටයුතු කරන්න. ඒ අනුව අවම වශයෙන් රුපියල් 20,000ක පමණවත් දීමනාවක් ලබා දීම කෙරෙහි ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියන කාරණයත් මම මේ මොහොතේ සඳහන් කරනවා.

ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ කියා තිබෙනවා, විවාහක තරුණ පිරිසට ඉඩම් ලබා ගැනීම සඳහා, නිවාස සාදා ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සපයනවා කියලා. තරුණ තරුණියෝ ඒවා විශ්වාස කළා. නමුත් 2025 සහ 2026 අය වැය ලේඛන දෙකේම එම කාරණා ගැන සඳහන් වී තිබෙන බවක් අපි දැක්කේ නැහැ. විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ සඳහන් කර තිබෙනවා, තරුණ තරුණියන් විවාහයට පත් වුණාට පසුව නිවසක් මිල දී ගැනීම සඳහා මූල්‍ය පහසුකම් ලබා දෙනවා කියා. විවාහක තරුණ තරුණියන්ට ගෙවල් හදා දෙන්න ඕනෑ නම් ඔබතුමන්ලා කළ යුත්තේ අඩු ගණනේ ගෙයක් හදා ගැනීමට අවශ්‍ය පහසුකම් හෝ සලසා දීමයි. නමුත් අද වන විට සිමෙන්ති මිල කීයද? සිමෙන්තිවලට සියයට 49ක බද්දක් ගසා තිබෙනවා; ටයිල්වලට සියයට 60ක බද්දක් ගසා තිබෙනවා; නාන කාමර කට්ටලවලට සියයට 60ක බද්දක් ගසා තිබෙනවා; ඇස්බැස්ටෝස්වලට සියයට 93ක බද්දක් ගසා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තරුණ තරුණියන්ගේ ඒ කියපු සිහිනය සැබෑ කරන්න අවශ්‍ය නම්, ඔවුන්ට ගෙයක් හදා ගැනීමට අවශ්‍ය පහසුකම් මේ අය වැය ලේඛනය තුළ ඉදිරිපත් කරන්න ඕනෑ කියන කාරණය මම සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල් උපකරණවලට පනවා තිබෙන VAT එක අයින් කරනවා කිව්වා අපට මතකයි. හැබැයි, ඒ පිළිබඳව අද කථා බහක් නැහැ. විපක්ෂය විවිධ අවස්ථාවලදී ඒ පිළිබඳව හඬ නැඟුවා. දරුවන් ලබන වසරේ මුල නව පාසල් වාරය ආරම්භ කිරීමට නියමිතයි. ඒ නිසා පාසල් ළමුන්ට රුපියල් 6,000ක දීමනාවක් ලබා දෙනවාට වඩා පාසල් උපකරණවලට පනවා තිබෙන VAT එක ඉවත් කරලා එම

[ගරු චානක මාදුගොඩ මහතා]

උපකරණ අඩු මිලට ලබා ගැනීමේ පහසුකම ලබා දෙනවා නම් වටිනවා කියන කාරණයත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම උසස් පෙළ හදාරන දරුවන්, විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වන දරුවන් අද වන විට පරිගණකයක් ගන්න, "ටැබ්" එකක් ගන්න බැරුව හූල්ලමින් ඉන්නවා. ඒ නිසා එවැනි උපකරණ මිල දී ගැනීම සඳහා යම් සහනයක් මේ අය වැය ලේඛනය තුළින් ලබා දෙන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් මම මේ මොහොතේ සඳහන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙහිදී විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ, මේ සමාජය තුළ ඔබතුමන්ලා ඇති කර තිබෙන වෛරය ගැන. ඔබතුමන්ලා කිව්වා හැම නගරයකම කලා, සංස්කෘතික කටයුතු සඳහා කලාප ගොඩනඟනවා කියලා. නමුත් ඒ කියපු කලාප තවමත් ඇති කරලා නැහැ. පසුගිය දවසක රත්න ශ්‍රී විජේසිංහ මැතිතුමා සහභාගි වුණු සාහිත්‍ය උත්සවයකදී එතුමාගේ වතුර වීදුරුවට කෙළ ගහපු ප්‍රවෘත්තියක් අපි දැක්කා. ඒ තරමටම අද මේ සමාජය පිරිහිලා. ඔබතුමන්ලා මේ සමාජය තුළ ඇති කරපු වෛරය තමයි, ඒ. එම වෛරී සමාජ ආමන්ත්‍රණයේ ප්‍රතිදානය තමයි අද දකින්නට ලැබෙමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසය පිළිබඳව, සංස්කෘතිය පිළිබඳව, උරුමයේ වටිනාකම පිළිබඳව දැනුවත් කිරීම අවශ්‍ය මට්ටමින් සිදු කරනවා කිව්වත්, අද වන විට ඉතිහාසය විෂයයට පාසල් විෂය මාලාව තුළ වටිනාකමක් ලබා නොදෙන තත්ත්වයක් ඇති වෙමින් තිබෙනවා. අපි විපක්ෂයක් විධියට ඒ පිළිබඳව හඬ නැඟුවා.

ඒ වාගේම ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ සඳහන් කර තිබුණා, මාධ්‍යවේදීන්ට කැමරා ඇතුළු උපකරණ මිල දී ගැනීම සඳහා යම් සහනදායී වැඩ පිළිවෙළක් ආරම්භ කරනවා, අඩු පොලී ණය පහසුකමක් ලබා දීමට කටයුතු කරනවා කියලා. අද වන විට ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැඩි අපහසුතාවකට පත්ව තිබෙනවා, මාධ්‍යකරණයේ නියැළීමට පහසුකම් නොමැති වීම නිසා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ සිටියදී මාධ්‍යවේදීන් ගැන කථා කළ ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් අපි විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, අඩුම ගණනේ මාධ්‍යවේදීන්ට අවශ්‍ය උපකරණ මිල දී ගැනීමට ණය මුදලක් හෝ වෙනත් ප්‍රතිපාදනයක් ලබා දෙන්න කියලා.

ඊළඟට ක්‍රීඩාව ගැන කියන්න ඕනෑ. අපේ රටට ලෝකය වෙත ඉගිළෙන්න තිබෙන අත්තටු හැටියට තමයි අප ක්‍රීඩාව දකින්නේ. අපි පසුගිය කාලයේ පාර්ලිමේන්තුවේදී හඬ නැඟුවා, ක්‍රීඩා උපකරණවලට පනවා තිබෙන VAT එක නිදහස් කරන්න කියලා. ගමේ තරුණයෙකුට, ගමේ ක්‍රීඩා සමාජයට, පාසලේ ක්‍රීඩා කරන දරුවෙකුට ක්‍රීඩා උපකරණ ගන්න අද හැකියාවක් නැහැ. මොකද, VAT එක නිසා ක්‍රීඩා උපකරණවල මිල විශාල ලෙස ඉහළ ගොස් තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව ඒ ගැනත් හිතලා කටයුතු කරන්න ඕනෑ. පසුගිය මාසයේදී තරුණ ක්‍රිකට් ක්‍රීඩිකාවන් අපේ රටට විශාල කීර්තියක් ලබා දුන්නා. අපි ඒ ක්‍රිකට් ක්‍රීඩිකාවන්ට සමස්ත පාර්ලිමේන්තුවේ උත්තමාචාරය පුද කර සිටිනවා. ක්‍රීඩාව ඉහළ නැංවීම උදෙසා, ක්‍රීඩා උපකරණවලට පනවන ලද VAT එක ඉවත් කරන්න කියලාත් මම මේ මොහොතේ විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට මම බලාපොරොත්තු වුණා, මේ අය වැය ලේඛනයෙන් ගාල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් යම්කිසි මුදලක් වෙන් කරයි කියලා. අපි මේ පාර්ලිමේන්තුවට ගාල්ලේ ජල ගැටලුව පිළිබඳව ප්‍රශ්නයකුත් ඉදිරිපත් කළා. ඒ වෙලාවේ ගරු ඇමතිතුමා පැහැදිලිවම ප්‍රකාශ කළා, ගාල්ලේ ජල ගැටලුව විසඳන්න 2026 වසරේදී මුදල් ප්‍රතිපාදන සිදු කරනවා කියලා. හැබැයි, අපි දැක්කේ නැහැ, ගාල්ලේ ජල ගැටලුව විසඳන්න මේ අය වැය ලේඛනය තුළ මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙන බවක්. ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාව අද දැඩි ජල අර්බුදයකින් පෙළෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශ්වාස කරනවා, ගාල්ලේ ජල ගැටලුව පිළිබඳව මේ ආණ්ඩුව අවධානය යොමු කරයි කියලා. ඒ වෙනුවෙන් ඔබතුමන්ලා කටයුතු කරයි කියා ගාල්ලේ ජනතාව විධියට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය ලේඛනය තුළ ගාලු වරායේ සංවර්ධනය ගැන සඳහන් කරලා නැහැ. මීට අය වැය ලේඛන දෙකකට පෙර කරාපිටිය බස් නැවතුම් පොළ තුළ සංවර්ධන කටයුතු වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබුණා. නමුත් මේ ආණ්ඩුවේ අය වැය ලේඛනවලින් ඒ පිළිබඳව අවධානය යොමු කරලා නැහැ. ඒ වාගේම, ගාල්ලේ ජල ගැටලුව විසඳීම සඳහා මුදල් ප්‍රතිපාදන මේ අය වැය ලේඛනය තුළින් ලබා දීලාත් නැහැ.

ඔබතුමන්ලා පසුගිය අය වැය ලේඛනය තුළින් ප්‍රධාන වශයෙන්ම කිව්වා, උපාධිධාරීන් 30,000කට රැකියා ලබා දෙනවා කියලා. හැබැයි, උපාධිධාරීන් 30,000කට රැකියා ලැබිච්ච බවක් නම් අපට තවම දකින්නට නැහැ. ඔබතුමන්ලා උපාධිධාරීන් 2,265කට පමණයි රැකියා ලබා දීලා තිබෙන්නේ. පසුගිය අය වැයෙන් උපාධිධාරීන් 30,000කට රැකියා ලබා දෙනවා කියලා පොරොන්දු වුණු ආණ්ඩුව උපාධිධාරීන් 2,265කට පමණයි රැකියා ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා උපාධිධාරී මහත්ම මහත්මීන් අද පාරේ උද්ඝෝෂණය කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ආණ්ඩුව මේ අය වැය ලේඛනයෙනුත් කියනවා, 75,000කට රැකියා ලබා දෙනවා කියලා. උපාධිධාරීන් 30,000කට රැකියා ලබා දෙන්න බැරි වුණු ආණ්ඩුව ලබන වසරේ 75,000කට රැකියා ලබා දෙයි කියලා අපි විශ්වාස කරන්නේ කොහොමද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඔබතුමන්ලා තිබෙන රැකියාත් නැති කරනවා අපි දැක්කා. උප පොලිස් පරීක්ෂකවරු සිය දෙනෙක් බඳවා ගෙන ඒ අයට පසුගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේදී පත්වීම් ලිපි ලබා දෙන්න තිබියදීත් ඔබතුමන්ලා ඒක නතර කළා. උප පොලිස් පරීක්ෂකවරුන් සිය දෙනෙකු බඳවා ගත් ඒ නිර්ණායක පසෙක දමා අද ඔවුන් ගෙවල්වල ඉන්න තැනට පත් කර තිබෙනවා. ඒ නිසා දෙන්න තිබෙන රැකියාත් නැති කරපු ආණ්ඩුවක් විධියට තමයි අප ඔබතුමන්ලාගේ ආණ්ඩුව දකින්නේ. විපක්ෂයක් විධියට අපි, ඔබතුමන්ලා විපක්ෂයේ සිටියදී කරපු කාර්යභාරය කරන්නේ නැහැ. ඔබතුමන්ලා 2025 වර්ෂයේ ඉදිරිපත් කරපු අය වැය ලේඛනය යථාර්ථයක් බවට පත් කර ගන්න ඔබතුමන්ලාට බැරි වුණා. ඒ වාගේම ඔබතුමන්ලා බලාපොරොත්තු වුණු ප්‍රගතිය කරා යන්න බැරි වුණා. 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කරපු අය වැය ලේඛනය තුළින් ඔබතුමන්ලාට අඩුම ගණනේ සියයට 70ක, 80ක ප්‍රගතියක් කරා යන්න පුළුවන් වෙන්න කියා විපක්ෂයේ මන්ත්‍රීවරුන් විධියට ප්‍රාර්ථනා කරමින්, මට වෙලාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ruwan Wijeweera. You have 10 minutes.

[අ.භා. 1.27]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතියක් විධියට අපට අහිමි කරන ලද අභිමානය සහ සමෘද්ධිමත්භාවය යළි අත්පත් කර ගැනීම සඳහා පදනමක්, වටපිටාවක්, පරිසරයක් නිර්මාණය කරන 2026 පුරවැසි අය වැය පිළිබඳ විවාදයට එකතු වන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා.

අද උදෑසන සිට මේ විවාදය ඉදිරියට යනකොට විපක්ෂය පැත්තෙන් මතු කරන ලද තර්ක විතර්ක කිහිපයක් තිබුණා. ඒ තර්ක විතර්ක ඒ ආකාරයෙන්ම 2025 අය වැය ඉදිරිපත් කරපු වෙලාවේදීත් මතු වුණා. මේ ආර්ථිකය කළමනාකරණය කර ගන්න, සාර්ව ආර්ථික ඉලක්ක ජයග්‍රහණය කර ගන්න, සාර්ව ආර්ථික කළමනාකරණයක් ඇති කරන්න, අය වැය මඟින් අපේක්ෂා කරන ලද ඉලක්ක ජයග්‍රහණය කරන්න හෝ ඒ සඳහා ළඟා වෙන්න පුළුවන්කමක් මේ ආණ්ඩුවට හෝ මේ කණ්ඩායමට නැහැ කියන එක තමයි ඔවුන් පුන පුනා කිව්වේ.

නමුත්, 2025 වසරේ අවසානයට එළැඹෙන කොට ඒ සංඛ්‍යා දත්ත මේ ආකාරයෙන් තමයි සටහන් වෙන්නේ. අය වැයේ තිබෙන මූලික කාරණාවක් තමයි රාජ්‍ය ආදායම. රාජ්‍ය ආදායම ගත්තොත්, මෑත ඉතිහාසයේ වසර ගණනාවකට පසුව අය වැයේ අපේක්ෂිත පුරෝකථන ඉක්මවා යන තැනට රාජ්‍ය ආදායම පත් කර තිබෙනවා; ආදායම් ඉලක්ක ඉහළට ගිහින් තිබෙනවා. එක පැත්තකින්, ඒක ආණ්ඩුව ලබපු විශිෂ්ට ජයග්‍රහණයක්. අනෙක් පැත්තෙන්, 2024 වසරේ පළමුවැනි මාස නවයට සාපේක්ෂව ගත් විට අය වැය පරතරය මේ වනකොට සියයට 50කින් පමණ අඩු කර ගන්න පුළුවන්කම ලැබී තිබෙනවා.

අපට සාර්ව ආර්ථික කළමනාකරණයක් කර ගන්න බැහැ, ආර්ථික කළමනාකරණය කර ගන්න බැහැ කියලා විපක්ෂය කිව්වාට ආර්ථිකය ඇතුළේ අය වැය පරතරය සියයට 50කින් පමණ අඩු වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, අපනයන ආර්ථිකයේ ඉපයීම්, විදේශ ප්‍රේෂණ, සංචාරක ඉපැයීම් හරහා අපට ලැබෙන ඩොලර් ප්‍රමාණය වැඩි වීම මත රටේ ඩොලර් බිලියන ප්‍රමාණය ඉහළ ගිහින් සංචිත යම් ප්‍රමාණයකට ස්ථාවර වීමත් මේ වනකොට දක්නට ලැබෙනවා. එම නිසා අපට කියන්න තිබෙන්නේ 2024 වසරට සාපේක්ෂව මේ වනකොට රටේ සාර්ව ආර්ථික කළමනාකරණයක් සිද්ධ වෙලා තිබෙනවා, ඒ ඇති වෙලා තිබෙන සාර්ව ආර්ථික කළමනාකරණයේ ස්වභාවය දේශීය සහ විදේශීය වශයෙන් පිළිගෙන තිබෙනවා කියන එකයි. ඒ බවට උදාහරණ කීපයක් මම ඔබතුමන්ලාට දෙන්නම්.

"Colombo Telegraph" කියන වෙබ් අඩවියේ මෙසේ සඳහන් කරනවා:

> "The balance is evident in the allocations: major investments in digital infrastructure, healthcare, and education lay the groundwork for a knowledge economy, while significant financial packages for housing, rural roads, and public servant benefits directly inject relief and opportunity into the grassroots economy. "

මේ කියන කාරණාව ඉතා පැහැදිලියි. විශේෂයෙන්ම ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය, සෞඛ්‍ය පහසුකම් ඉහළ නැංවීම, අධ්‍යාපනය සඳහා කරන ලද මුදල් වෙන් කිරීම ඇතුළේ මේ වනකොට දැනුම් ආර්ථිකයක් කරා මේ රට ගෙන යන්න අවශ්‍ය කරන පදනම සපයා තිබෙනවා කියන කාරණාව එහි පිළිගන්නවා. ඒත් එක්කම, එහි මෙසේද කියනවා, I quote:

> "By linking fiscal discipline with radical reforms - such as anti-corruption measures and digital governance - the budget attempts to build a moral and financial environment conducive to sustained, equitable prosperity."

සැමට සාධාරණ වෙච්ච, සැමට ප්‍රතිලාභ සැලසෙන්නා වූ අපේ අය වැයේ තිබෙන්නා වූ පළමුවැනි උපාය මාර්ගික පරමාර්ථය වන්නේ සැමට ප්‍රතිලාභ සැලසෙන්නා වූ තිරසර ආර්ථික සංවර්ධන ප්‍රවේශයක් අත්පත් කර ගැනීමයි. එය සාක්ෂාත් කර ගැනීමට හැකි වෙලා තිබෙනවා කියන එක locally accepted; විදේශීය වශයෙන් ගත්තත් ඒක ඒ ආකාරයම තමයි. ලෝක බැංකුව පවා එය පිළිගන්නවා. නමුත්, විපක්ෂයට එය පිළිගන්න බැහැ. එය පිළිගන්න විපක්ෂයට මැළිකමක් තිබෙනවා, අමාරුවක් තිබෙනවා, අසීරුතාවක් තිබෙනවා. ඒකට සාධාරණ හේතු තිබෙනවා. ඒ සාධාරණ හේතු හැදෙන්නේ ඒගොල්ලන්ගේ දේශපාලන අනාගතය පිළිබඳව ඇති වන තහවුරුභාවයේ තිබෙන අස්ථිරත්වයත් එක්ක. ලෝක බැංකුවේ වාර්තාවක් මා ළඟ තිබෙනවා. මේක ඉදිරිපත් කරන්නේ 2025 සැප්තැම්බර් 09වැනි දා. මොකක්ද, World Bank එක කියන්නේ? World Bank Group එක අපේ රටේ ආර්ථිකය පිළිබඳව මෙසේ සඳහන් කරනවා:

> " "Now that Sri Lanka has largely stabilized its economy, the challenge is to get better results from every rupee collected and spent," said David Sislen, World Bank Division Director for Maldives, Nepal and Sri Lanka."

In Sri Lanka, macroeconomic stabilization has been achieved, and it has been accepted by the officials of the World Bank. Unfortunately, though some of the Opposition Members cannot accept that truth on the ground, it has been accepted by the World Bank. ලෝක බැංකුවත් පිළිගෙන තිබෙනවා, අපි සාර්ව ආර්ථික කළමනාකරණයක් සිදු කර තිබෙනවා, ආර්ථික වශයෙන් ළඟා කර ගත යුතු ඉලක්ක අත්පත් කරගෙන තිබෙනවා කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය කරපු විවේචන අතරේ තවත් එකක් තමයි, අපි හිඟන මිනිසුන්ගේ කර මතින් බලයට ඇවිල්ලා ඒගොල්ලන් නොසලකා ඉන්නවා කියන එක. මම මේ අවස්ථාවේදී ඒ ගැනත් කියන්න ඕනෑ. මේ රටේ මිනිසුන් අතර "හිඟන මිනිස්සු" කියලා කොට්ඨාසයක් නැහැ. මේ රටේ මිනිසුන් අතර ඉන්න හැම දෙනාම මිනිස්සු. හැබැයි, අද විපක්ෂයේ ඉන්න අය හිඟන මිනිස්සු කියලා කොටසක් ඒ කාලයේ නඩත්තු කළා. එහෙම නඩත්තු කළේ ඒ අයට බලයට එන්නයි. ඒගොල්ලෝ 76 වසරක් එවැනි කොටසක් නඩත්තු කළා. ඒගොල්ලෝ දුප්පත්කම maintain කළා. ඒක ඒගොල්ලන්ගේ අවශ්‍යතාවක් වෙලා තිබුණා. ඒ නිසා ඒගොල්ලෝ අපට කියනවා, අපි ඒ මිනිසුන්ගේ කර මතින් බලයට ඇවිල්ලා දැන් ඒ මිනිසුන් නොසලකා හරිනවා කියලා. අපි නොසලකා හරින්නේ නැහැ, ඒ සහෝදර ජනතාව. ඒ, අපිත් එක්ක ඉන්න ආදරණීය ජනතාව. අපි විශ්වාස කරන්නේ නැහැ, මේ සමාජයේ එහෙම දුප්පත්, පොහොසත් භේදයක් තිබිය යුතුයි කියලා. එම නිසා ඒ ආදරණීය මිනිසුන් වෙනුවෙන් අපි යම් යම් දේවල් අය වැය තුළ වෙන් කර තිබෙනවා.

උදාහරණයක් විධියට ගත්තොත්, ලබන අවුරුද්දේ ඉඳලා ඉදිරියට නිවාස 70,000ක් හදන්න අවශ්‍ය කරන මැදිහත්වීම් කරලා තිබෙනවා. ඒවායෙන් 10,000ක් ලබන අවුරුද්දේ හදනවා.

[ගරු රුවන් විජේවීර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගියා බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන, මෙතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ හදලා තිබුණු නිවාස ව්‍යාපෘතියක් බලන්න. නිවාස 52ක් හදලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නිවාස 28කම අඩක් නොවෙයි, කාලක්වත් හදලා නැහැ. එක කාමරයයි හදලා තිබෙන්නේ. ලක්ෂ හතරක්ද, පහක්ද දෙන්නත් තිබෙනවා. මේ, ගෝණගංආර, කෝන්කැටිය කියන වසම් දෙකේයි. නිවාස 28ක් සම්පූර්ණයෙන්ම වල් බිහි වෙලා. ඒවාට අවශ්‍ය ගඩොල් කපලා තිබෙන්නේ ඒ ව්‍යාපෘතිය කරපු පක්ෂයට අදාළ ප්‍රධාන සංවිධායකවරයායි. බුත්තල කොට්ඨාසයේ ඒ කියන නිවාස සඳහා ගඩොල් ටික කපලා දීලා තිබෙන්නේ ඔහුයි. ගඩොල් 1,800කට සල්ලි දුන්නත් 800ක් තවම හම්බ වුණේ නැහැ කියනවා. එහෙම තමයි මෙතුමන්ලා නිවාස ව්‍යාපෘති කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මෙතුමන්ලාට හිතෙනවා, 'ලක්ෂ 10කින් නිවාසයක් හදන එක මාර magical වැඩක් නේ' කියලා. ඒ වුණාට අපට කියන්න තිබෙන්නේ මේකයි. මිනිස්සු එකතු වෙලා ගංගාවලට බැහැලා වැලි ගොඩ දමලා, තමන්ගේ කරෙන් ගඩොල් ටික අරගෙන ගිහින්, අර දීපු ලක්ෂ 10ත් යොදාගෙන නිවාස ව්‍යාපෘති කරනවා. මේ වනකොට අපේ දිස්ත්‍රික්කයේ විතරක් එසේ නිවාස 30ක් සම්පූර්ණයෙන් වැඩ නිම කරලා භාර දීලා තිබෙනවා. නිවාස එකසිය ගණනින් ඉතිරි ටිකත් අපි මේ අවුරුද්ද ඉවර වෙන්න කලින් හදලා භාර දෙනවා. ඒ නිසා අපි දුප්පත්කම maintain කරන්නේ නැහැ. අනෙක් පැත්තෙන්, ඒගොල්ලන්ට අවශ්‍ය කරන අස්වැසුම ප්‍රතිලාභ, ඒ විතරක් නොවෙයි, ශිෂ්‍යයන්ට අවශ්‍ය කරන පහසුකම් ඇතුළු සියල්ල අපි ලබා දීලා තිබෙනවා. අපේ අවශ්‍යතාව තමයි තිරසර ආර්ථිකයෙන් ලැබෙන්නා වූ, මේ රටේ මිනිසුන්ට අවශ්‍ය කරන ප්‍රවේශයන් ටික සැමට සාධාරණව ලබා දීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මේ අය වැය ඇතුළේ මා දැකපු විශේෂ ලක්ෂණයක් කියන්නම්. මොනරාගල ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක් තිබෙනවා, වන අලි ගැටලුව නිසා දැඩි පීඩනයට ලක් වෙච්ච. අපේ ප්‍රදේශයේ වන අලි ගැටලුවට මුහුණ දීපු එක තැනක් තිබෙනවා. ඒ තමයි, වන්දම දෙමළිය රක්ෂිතය. ඒ රක්ෂිතයේ තිබෙන ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් අනවසරකරුවන් අල්ලාගෙන තිබෙනවා, පසුගිය රජයයන් සමයේ. එයාලාට තිබුණු දේශපාලන බලය, එයාලාගේ බල පුළුවන්කාරකම ඇතුළේ ඒ ඉඩම් අක්කර සිය ගණන් අත්පත් කරගෙන ඒවායේ විදුලි වැටවල් ගහලා අහිංසක අලින්ටත්, හේන් ගොවිතැන් කරපු මිනිසුන්ටත් උන් හිටි තැන් අහිමි කරලා තිබෙනවා. එහෙම කරලා තිබෙන්නේ දේශපාලන බලය පාවිච්චි කරලායි. බදු ඔප්පු ගන්න අවසන් අදියරේ තිබෙන ඉඩම් සම්බන්ධයෙන් අපි මේ වනකොට කථා කරමින් සිටිනවා. "එහෙම කරන්න එපා, නැවත පරිසර ඇගයුමක් -EIA එකක්- කරලා, වන අලින් වෙනුවෙන් අලි ප්‍රේරණ කලාපයක්, අලි කොරිඩෝවක් හදලා ඒ ඉඩම් හරියට manage කරන්නේ කොහොමද කියන එක සම්බන්ධව අදහසකට එන්න" කියලා කියා තිබෙනවා. අපි ඒ ගැන සාකච්ඡා කරමින් යනවා. ඒත් එක්කම, අය වැය ගත්තොත්, ආසන්න වශයෙන් රුපියල් මිලියන 1,800ත්, 2,000ත් අතර ප්‍රමාණයක් වෙන් කරමින් research and experiment කියන තැන ඉඳලා අලි වැට කළමනාකරණය ඇතුළු සමස්ත ගැටලුව විසඳන්න අවශ්‍ය කරන මැදිහත්වීම් ටික කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොනරාගල දිස්ත්‍රික්කය ගත්තාම අපි දන්නවා, එය විශාලත්වයෙන් දෙවැනි දිස්ත්‍රික්කය වුණත් ඉතාම දුප්පත් ජනතාවක් ජීවත් වන දිස්ත්‍රික්කයක් බව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
Please give me one more minute, Sir.

සංස්කෘතික මිනිසෙකු සැදීමේ අපේක්ෂාව ඇතිව සංස්කෘතික සහ විනෝදාස්වාදය සඳහා space එකක් සකස් කිරීම උදෙසා මෙවර අය වැය මඟින් රුපියල් මිලියන 200ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ, මොනරාගල සහ අම්පාර දිස්ත්‍රික්කවල නගර ශාලා ඉදි කරන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම ගරු ජනාධිපතිතුමාගේ ප්‍රකාශයක් සිහිපත් කරවමින් මගේ කථාව අවසන් කරනවා. මේක තමයි අපේ අය වැයේ සහ ආණ්ඩුවේ තිබෙන strategies හැම එකකම ඇති අවසාන අපේක්ෂාව. ගරු ජනාධිපතිතුමාගේ එම ප්‍රකාශය මෙසේයි:

> "මේ අපි යන ගමනේ දී සතුරන්ගේ වියරු කෑගැසීම් අපට නෑසෙන බවත්, රටේ පුරවැසියන්ගේ අධිෂ්ඨානශීලී බලාපොරොත්තු සහගත දෑස් පමණක් අපට පෙනෙන බවත් සිහිපත් කරනවා."

එහෙම නම්, මේ ගමන බරපතළ ගමනක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශ්වාසයෙන් යුතුව කියනවා, විපක්ෂය කොයි තරම් කෑගැහුවත් මිනිසුන්ගේ ඒ අධිෂ්ඨානශීලී දෑස් දිහා බලාගෙන මේ රට සමෘද්ධිමත් දේශයක් කරා ගෙන යන්න අවශ්‍ය කරන මැදිහත්වීම අපි කරන බව.

ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Nishantha Samaraweera. You have 12 minutes.

[අ.භා. 1.37]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ 2026 අය වැය හා සම්බන්ධ මේ විවාදයට එක්වීමට අවස්ථාවක් ලැබීම ගැන මා සතුටු වෙනවා. අපට පෙර අදහස් දක්වපු, විපක්ෂය නියෝජනය කරන, විශේෂයෙන් මගේ ගාල්ල දිස්ත්‍රික්කයේම සහෝදර මන්ත්‍රීවරයෙක් තමයි, ගරු වානක මාදුගොඩ මැතිතුමා. එතුමා පොඩි ආදර්ශයක් දුන්නා මේ පාර්ලිමේන්තුවට, විනය ගරුකව කථා කරන්නේ කොහොමද කියලා. ඒ පැත්තෙන් එතුමාට ගරු කරන ගමන් - ඒ ගරුත්වයත් සහිතව - එතුමා කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් මා යම් අදහසක් කියන්න ඕනෑ. එතුමා කරපු ඒ කථාව ඇතුළේ ගැටලු කීපයක් තිබෙනවා. විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයට වාගේම ලංකාවට, ජාතියට සම්පතක් ලෙස සලකන රත්න ශ්‍රී විජේසිංහ මැතිතුමා වාගේ කෙනෙක් සම්බන්ධව මාලිමාවේ ආණ්ඩුව ජන සමාජය තුළ වෛරයක් වපුරලා තිබෙනවා වාගේ අදහසක් ප්‍රකාශයට පත් කළා. ගාල්ල, මාතර, හම්බන්තොට කියන දිස්ත්‍රික්ක තුනම එකතු වෙලා මෙතෙක් කල් මේ දක්ෂිණ ලංකාවේ තිබුණු විශාලතම සංස්කෘතික සහ කලා

මංගල්‍යය කළා කියන එක අපි කියන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රත්න ශ්‍රී විජේසිංහයන් ඒ මුළු ක්‍රියාවලිය ඇතුළේම ප්‍රධානම චරිතයක් වෙලා තිබුණා. එතුමාට අදාළ ගෞරවය ඇතුළු සියල්ල ඒක ඇතුළේ තිබුණා. එතැන කිසිදු ගැටලුවක් වුණේ නැහැ. යම් සිදුවීමක් වෙලා තිබෙනවා නම් අපි ඒ පිළිබඳව කනගාටුව පළ කරන ගමන් එවැනි මතයක් generalize කරන්න දරපු උත්සාහය පිළිබඳව මගේ අප්‍රසාදය පළ කරනවා.

මේ අය වැය සම්බන්ධව මම සතුටු වෙනවා. රනිල් වික්‍රමසිංහ, මහින්ද රාජපක්ෂ යුගයේ කර්මාන්ත උද්‍යානයක් වශයෙන් පටන් ගත්ත Techno Park කියලා භූමියක් ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙනවා. රුපියල් කෝටි ගණනක් වැය කරලා ඒකට අඩිතාලම් කීපයක් දාලා තිබෙනවා. එතැන එච්චරයි තිබෙන්නේ. ඒ කොන්ත්‍රාත්කරුවන්ට බැංකුවලින් ලබා දීපු ණය ගෙවන්නත්, ණය ගෙවලා එම භූමිය නැවත කර්මාන්ත සඳහා නිදහස් කරන්නත් අපිට තමයි දැන් සිද්ධ වෙලා තිබෙන්නේ. මොකද, කර්මාන්ත සඳහා භූමියක් සොයාගන්න ප්‍රශ්නයක් වෙලා තිබෙන දිස්ත්‍රික්කයක් විධියට තමයි ගාල්ල දිස්ත්‍රික්කය තිබෙන්නේ. මේ අය වැය ගැන අපි සතුටු වෙනවා. මොකද, මේ ණය ගෙවන්න රුපියල් මිලියන 1,500ක් අපි දැනටත් වෙන් කර තිබෙනවා. එය රුපියල් කෝටි 150ක විතර ණය ප්‍රමාණයක්. නව කර්මාන්ත උද්‍යානයන් බිහි කිරීම සඳහා ගාල්ල, කුරුණෑගල ඇතුළු ප්‍රදේශවල කරපු Techno Park කියන මේ සුදු අලියාව අපිට නැවත හදලා ගන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම, ගාල්ල දිස්ත්‍රික්කයේ ජල සැපයුම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා කියලා අපි නිශ්චිතවම කියන්න ඕනෑ. ඔව්, හැබැයි ජලසම්පාදන මණ්ඩලයත් එක්ක කථා කළාම ගාල්ල දිස්ත්‍රික්කයේ 2016 ජල සැපයුම තිබුණු තැනම තමයි අදත් තිබෙන්නේ කියලා දැනගන්න ලැබුණා. 2016 ඉඳන් 2024 වෙනකම් ගාල්ල දිස්ත්‍රික්කය පාලනය කළේත් අපි නොවෙයි. 2024 වසරේ අන්තිම කාලයේ තමයි මාලිමාව බලයට එන්නේ. ඒ බලයට ආපු දවසේ ඉඳලා මේ ජල ගැටලුවට උත්තරයක් හොයන්න අපි දැවැන්ත වෙහෙසක් දරමින් ඉන්නවා. ඒ වාගේම, ඒ ජල ගැටලුවට හොයන උත්තරය ඇතුළේ තිබෙන්නේ පොඩි වියදමක් නොවෙයි. ඒකට බිලියන ගණනක මුදලක් ඕනෑ. ඒ කියන්නේ ජලය ඝනමීටර් 60,000ක් ඕනෑ එකට තවමත් නිෂ්පාදනය කරන්නේ ජලය ඝනමීටර් 40,000යි. එවැනි පරතරයක් සහිතව තමයි මේ ජල අවශ්‍යතාව තිබෙන්නේ. ඒක නිසා ඒ සඳහා දැවැන්ත මුදලක් ඕනෑ. අපි ආණ්ඩුව විධියට මේ ගැන; මේ මුදල සපයාගන්න සාකච්ඡා කරමින් ඉන්නවා. මුළු ලංකාවේම ජල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ හැම තැනටම මුදල් වෙන් කිරීමේ හැකියාවක් නැතිකම තිබෙනවා. නමුත් ඉදිරි වසර තුළ සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් මේ වෙනුවෙන් වෙන් කරගන්න; මුදල් සපයාගන්න අපි උත්සාහ කරනවා.

අපි මේ 2026 අය වැය ගැන කථා කරද්දී මේ අය වැයෙහි උපායමාර්ගික අරමුණු සහ ප්‍රවේශය ගැනත් කථා කරන්න ඕනෑ. සියයට 7ක ආර්ථික වර්ධන වේගයක්, නව තීරුබදු ප්‍රතිපත්තියක් සහිතව අපනයන විවිධාංගීකරණය මත ඉහළ ආදායමක් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ජාතික නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීම, ග්‍රාමීය දිළිඳු බව පිටුදැකීම, ඩිජිටල්කරණය වාගේ ආර්ථික උපායමාර්ග සහ අරමුණුවල අපි ඉන්නවා. එහි වැදගත් දෙයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ තමයි, මේ ණය තිරසරභාවය අත්පත් කර ගැනීම කියන කාරණය. මුළු රට පත් වෙලා තිබිච්ච දැවැන්ත ආර්ථික ඉරණම හමුවේ අපේ රජයට, අපේ ආණ්ඩුවට පැවරිලා තිබෙන ප්‍රධානම වගකීම තමයි මෙන්න මේ ණය තිරසරභාවය හදන එක. මේ debt sustainability එක සම්බන්ධව ගත්තොත්, IMF එක අපේ රටේ ආර්ථික ක්‍රියාවලියට මැදිහත් වෙච්ච පළමුවැනි මොහොතේ ඉඳලා මේ තිබිච්ච ණය කන්ද මේ රටට පෙන්වා දී තිබෙනවා. දැවැන්ත ණය කන්දක් ගොඩගහලා තිබෙනවා. ඒ ණය කන්ද මත මේ ණය ගෙවීමේ ක්‍රියාවලිය තිරසර නැහැ කියලා පෙන්වා දී තිබෙනවා. වගකීම් විරහිත, ප්‍රමුඛතා නොවන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත්, අවශ්‍ය වත්කම් ජනිත නොකිරීමත්, අදාළ කාලය තුළ මේ ව්‍යාපෘති නිම නොකිරීමත්, ණය කළමනාකරණයට අසමත්වීමත් යන කරුණු මත ලංකාවේ ණය ගෙවීමේ ක්‍රියාවලිය තිරසර නැහැ කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවා පෙන්වා දුන්නා.

ඒ ණය ගෙවීමේ ක්‍රියාවලිය තිරසර බවට පත් කරන එක අත්‍යවශ්‍ය කාරණයක්. ලංකාව තිබුණේ බුන්වත් වෙලා. දැන් අපි ලංකාව 'CCC plus'වලට ගෙනැල්ලා තිබෙනවා; එතැනට වෙනකන් දැන් ඇවිල්ලා තිබෙනවා. හැබැයි, අපි තවත් උඩට යන්න ඕනෑ. එහෙම නම් ණය තිරසරකරණයත් අත්‍යවශ්‍ය කාරණයක්. ඒ වෙනුවෙන් කටයුතු කරන්න ආණ්ඩුවක් විධියට දැවැන්ත මහන්සියක් දරමින් සිටිනවා. ඒ නිසා, ණය තිරසරකරණය ගැන කථා කරද්දී ඒ විශ්ලේෂණය, එහෙම නැත්නම් Debt Sustainability Analysis - DSA - එක වැදගත්. අපි ණය උගුලට හිර වෙච්ච රටක්. ඒ debt trap එකේ ඉඳගෙන අපි කල්පනා කරන්න ඕනෑ වෙලා තිබෙනවා, ණය ගෙවා ගෙන තවදුරටත් මේ රට සංවර්ධන ඉලක්ක කරා ගෙන යන්නේ කොහොමද කියලා. ඒකට හොඳම වෙන්නේ ණය ලබා දීපු කෙනාත්, ණය ලබා ගත් කෙනාත් නොවෙයි. ණය ලබා ගත් කෙනා කොහොමත් ණය තිරසාරව ගෙවා ගෙන යනවාද, නැද්ද කියලා assessment එකක් කරනවා. නමුත්, ඒකට යම් බාහිර පාර්ශ්වයක් ඕනෑ. දැනට ඒ කටයුත්ත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉටු කරනවා. ඔවුන් විවිධ කරුණු මත පෙන්වා දීලා තිබෙනවා, දැන් ලංකාවේ ආර්ථිකය ඇතුළේ මේ ණය ගෙවීමේ ක්‍රියාවලිය තිරසාර මට්ටමකට පත් වෙමින් තිබෙනවා කියලා. ඒක තමයි අපි ලබපු ජයග්‍රහණය. ඒක ප්‍රකාශ කරලා තිබෙන්නේ මේ අතරමැදි ආයතනය විසින්. ලංකාව ඇතුළේ ප්‍රාථමික අතිරික්තයක් පැවතීම, ඒ වාගේම ණය ප්‍රතිව්‍යුහගතකරණයන්ට ලැබුණු ඉඩ - ණය දුන් පාර්ශ්වයේ එකඟතාවන් මත - ඒ වාගේම සාර්ව ආර්ථිකයේ ස්ථාවරත්වය, ඒ වාගේම දළ මූල්‍යනයේ අවශ්‍යතාව සියයට 13ට අඩුවෙන් පැවතීම, විදේශ ණය සේවාකරණය සියයට 4.5ට අඩුවෙන් පැවතීම වාගේ කරුණු මත පදනම් වෙලා, මේ වනවිට ණය ගෙවීමේ ක්‍රියාවලිය ස්ථිරවම පවත්වාගෙන යා හැකි බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ප්‍රකාශ වෙලා තිබෙනවා. ඒක තමයි අපි ලබපු ජයග්‍රහණය. රටක් විධියට අපේ රට තිබුණේ දැවැන්ත වළක. මේ රට බුන්වත් කරලා තිබුණේ. බංකොලොත් කරලා තිබුණේ. එතැන ඉඳලා රටේ ජනතාවගේ ජීවත්වීමේ හැකියාව; ජීවත්වීමේ වුවමනාව සාක්ෂාත් කර ගන්නා ගමන්, ඔවුන් අවිනිශ්චිතභාවයන්ට නොවැටෙන්න ආර්ථිකයේ පදනම පවත්වාගෙන යන ගමන් මේ ආර්ථිකය රටේ සංවර්ධනය නැවත අත්පත් කර ගැනීමේ දිශානතියට මෙහෙයවන ගමන්, ණය තිරසරකරණයත් අත්‍යවශ්‍ය වෙලා තිබුණා. අපි ඒ වෙනුවෙන් මහන්සි වෙමින් හිටියේ. ඒ වෙනුවෙන් අපි ලබපු ජයග්‍රහණයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජන සමාජය වෙනුවෙන් අපේ මාලිමා ආණ්ඩු ගෙන යන ක්‍රියාවලිය සම්බන්ධව විපක්ෂයේ විවිධ මහත්වරු විවිධ කථා කියන්න පටන් ගත්තා. මම එක උදාහරණයක් කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙතෙක් ඔටිසම් රෝගය ගැන අවධානය යොමු වෙලා තිබුණේ නැහැ. 'ඔටිසම්' කියන්නේ, අපේ රටේ දරුවන් 93කින් එක් අයෙකුට වැලඳෙන සංජානන ස්නායු ආබාධයක්. එවැනි දරුවෙක් සිටින පවුලක අය තමයි දන්නේ ඒ දරුවා එක්ක ගතකරන ජීවිතය මොන වාගේද කියලා. ඔටිසම් රෝගයට ගොදුරු වෙච්ච දරුවෙක් ඉන්න දෙමව්පියන්ගෙන්, - අම්මා කෙනෙකුගෙන්, තාත්තා

[ගරු නිශාන්ත සමරවීර මහතා]

කෙනෙකුගෙන් - ආච්චි, සීයා කෙනෙකුගෙන් හෝ ඇහුවොත් කියයි ඒක මොන තරම් අසීරු ජීවිතයක් ද කියලා. ඒ වාගේ රෝගයකින් පෙළෙන ජන සමාජයක - trend එක වැඩි - increase - වෙමින් තිබුණේ; වැඩි වෙන trend එකක තිබුණේ. ඒ වෙනුවෙන් කවුරුවත් කිසිවක් කරලා තිබුණේ නැහැ. හැබැයි, අපි 2025 අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් කළා. දැන් කොළඹ, රිජ්වේ ආර්යා ළමා රෝහලට මේ වන විට රුපියල් මිලියන 200ක වියදමෙන් නව ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්; එහෙම නැත්නම්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි වෙමින් පවතිනවා. ඒ වැඩකටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම දිස්ත්‍රික්ක 25 තුළම අපි එවැනි මධ්‍යස්ථාන 25ක් ආරම්භ කරනවා. පසුගිය අය වැය තුළිනුත් අපි ඒ සඳහා මුදල් වෙන් කළා. මම දන්නා තොරතුරු අනුව මේ වනකොටත් දිස්ත්‍රික්ක 8ක මෙවැනි මධ්‍යස්ථාන ඉදි වෙමින් තිබෙනවා. මේ ස්ථාන ගොඩනැගෙමින් තිබෙනවා. අපි මේ අවුරුද්දේ තවත් රුපියල් මිලියන 500ක් වෙන් කළා, ඒ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් සහ ඒ දරුවන් එක්ක ජීවත් වෙන එම දෙමව්පියන්ගේ සමාජ ක්‍රියාවලිය, ඔවුන්ගේ ජීවිත පහසු කරන්න. ඒ නිසා, අපි හිතන විධියට, එක angle එකකින් නොවෙයි, විශාල පරාසයක් ඇතුළේ අපට හිතන්න සිදු වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have only two more minutes.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ 20වන පිටුවේ එතුමා මෙසේ සඳහන් කරනවා:

"ඔටිසම් ඇතුළු ආබාධිත තත්ත්වයන් සහිත දරුවන් වෙනුවෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදි කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය හා සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ දැනටමත් සිදු කරමින් පවතිනවා. එම කටයුතු ඉදිරි වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ රුපියල් මිලියන 100ක් සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ රුපියල් මිලියන 447ක් වෙන් කර තිබෙනවා. එම කාර්යයන් තවදුරටත් පුළුල් කිරීම සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම වෙනුවෙන් අමතර රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට යෝජනා කරනවා."

මේක තමයි, අපේ අය වැය. හිතන්න පුළුවන් හැම තැනක් ගැනම අපි හිතලා තිබෙනවා. අපේ අනෙක් කථික සහෝදරවරුන් -මන්ත්‍රීතුමන්ලා- සියලුදෙනාත් පැහැදිලි කළා, අපි ආණ්ඩුවක් විධියට මෙවර අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙන ජනතා හිතවාදී ආකෘතිය සම්බන්ධව. ඒ වාගේම ඔවුන් සියලුදෙනාම වෙහෙස වෙමින් ඉන්නවා, මේ රටේ ජන ජීවිත ස්ථාවර කරන ගමන් මේ රටේ ආර්ථිකයත් ස්ථාවර කරගන්න. ඒ අනුව අපි දැන් දැවැන්ත ඉලක්කයකට ළඟා වෙමින් ඉන්නවා. ඒ තමයි, ස්ථාවර ආර්ථික කළමනාකරණයක් සම්බන්ධ ඉලක්කය. ඒ ඉලක්කය අපි ළඟා කර ගනිමින් ඉන්න බව ජන සමාජයට දැනෙනවා. අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ අපි සමත් වෙලා තිබෙනවා, ආර්ථික ක්‍රියාවලිය ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Nishantha Samaraweera, your time is up.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්. මට තව තත්පර කිහිපයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පසුගිය අවුරුද්දේ අන්තිම කාර්තුව වෙනකම්ම ආණ්ඩු කරලා කිසිවක් කරගන්න බැරි වුණු විපක්ෂයට දැන් තිබෙන්නේ, තමන්ට අනාගතයේ මුහුණ දීමට නියමිත අසීරුතා පිළිබඳ ප්‍රශ්නයක් මිසක්, ජනතාවට ලැබෙන සහන පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Speaker, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Archchuna, you have been on your feet for some time. What is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, Standing Order No. 91(o). ඒක මම කියවන්නම්.

"Notwithstanding the provisions of this Standing Order, the Speaker shall be responsible for allocating time among Members in a fair and equitable manner."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් අපේ නම වැටෙන්නේ, list එකේ අන්තිමට. අපට විනාඩි 7ක් කියලා තිබුණත්, අන්තිමට ඉතිරි වෙන්නේ විනාඩි 3යි. හැබැයි, list එකේ මුලට නම තිබුණොත්, ඒ මන්ත්‍රීතුමාට විනාඩි 10ක් නියමිතව තිබුණත්, විනාඩි 12ක් වෙනකම් කථාව කරගෙන යන්න පුළුවන්. මම European Parliament එකට ගියා. එහේ තිබෙන්නේ, මෙන්න මෙහෙම ක්‍රමයක්. Screen එකක time එක වැටෙනවා; three minutes නම් three minutes කියලා වැටෙනවා. ඒ three minutesවලින් පසුව mike එක නතර කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙම list එකේ අන්තිමට නම වැටෙනකොට අපට අසාධාරණයි. මොකද අපට නියමිතව තිබෙන්නේ විනාඩි 7ක් වුණත්, අන්තිමට ඉතිරි වෙන්නේ විනාඩි 3යි, නැත්නම් විනාඩි 2යි. අපට ලක්ෂ 10ක් දීලා, - ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කථා කරන වෙලාව අර විධියට screen එකක දමන්න බැරි ඇයි?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Archchuna, your time allocations and the order of speakers come from the Office of the Leader of the Opposition. So, you have to discuss it with the Chief Opposition Whip, as to where you should be placed in the order of speakers. But, today, you are not listed to speak, I think.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අපි කථා කරන වෙලාව screen එකක දමන්න බැරි ඇයි?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I understand that.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
වෙලාව ඉවර වෙනකොට European Parliament එකේ mike එක off කරනවා. අපිත් එහෙම කළොත් අපේ වෙලාවත් ඉතිරි වෙනවා. පොඩ්ඩක් හිතලා බලන්නකෝ. එහෙම නැති වුණොත් අන්තිමට අපට කථා කරන්න වෙලාවක් ඉතිරි වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
A good point.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will bring it to the notice of the Hon. Speaker. I think a method where the start time and the end time are indicated on your laptop is coming through becuse they had come and briefed us on that.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Harshana Rajakaruna.

[අ.භා. 1.51]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2026 අය වැය විවාදයේ දෙවැනි දවසේදී වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා විසින් මෙම අය වැය ප්‍රකාශය පැය හතරහමාරකට ආසන්න කාලයක් තිස්සේ ඉදිරිපත් කළා. ඒ පැය හතරහමාරෙන් වැඩි කාලයක් ගත්තේ එතුමා ආර්ථිකය යම් ස්ථාවරත්වයකට පත් කළා කියන කාරණය කියන්න. එතුමා ඒක ඉතා පැහැදිලිව මුළු රටටම කිව්වා. අනුර කුමාර දිසානායක මහතා ජනාධිපතිවරයා බවට පත් වුණේ ආර්ථික ස්ථාවරත්වය ලැබුණාට පසුවයි. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා තමයි ආර්ථික අර්බුදය කාලයේදී රට පාලනය කළේ. එතුමා අපේ පක්ෂය නියෝජනය කළේ නැතත්, අපි විපක්ෂයේ හිටියත්, අපි ඒ ගෞරවය එතුමාට ලබා දෙන්න ඕනෑ.

ඒ කාල සීමාවේදී එතුමා ආර්ථිකයට යම් ස්ථාවරත්වයක් ලබා දුන්නාට පස්සේ පැවති ජනාධිපතිවරණයෙන් තමයි අනුර කුමාර දිසානායක මහතා ජනාධිපති බවට පත් වුණේ. මෙතැන ඉන්න මැති ඇමතිවරුන් කියනවා, "අපි රට බාර ගන්නකොට පෙට්‍රල් පෝලිම් තිබුණා; ඩීසල් පෝලිම් තිබුණා; විදුලිය කපලා තිබුණා; විදුලියත් නැති කාල වකවානුවක තමයි අපි ආණ්ඩුව බාර ගත්තේ" කියලා. මම හිතන විධියට, මේ අයට පොඩ්ඩක් පැටලිලා. ඉතාම පැහැදිලිව මම මේ කාරණය කියන්න ඕනෑ. අනුර කුමාර දිසානායක මහතා ජනාධිපතිවරයා බවට පත් වුණේත්, මේ ආණ්ඩුව බලයට පත් වුණේ ඒ අමාරු කාලය අවසන් කළාට පස්සේ. ඒ ප්‍රශ්නය තිබුණේ 2022-2023 කාලයේදී. අනුර කුමාර දිසානායක මහතා ජනාධිපතිවරයා බවට පත් වුණේ 2024දී. 2024 වර්ෂය වෙනකොට මේ ප්‍රශ්නය සෑහෙන දුරට අවසන් වෙලා තිබුණේ. දැන් එතුමාට තිබෙන්නේ මේ ස්ථාවරත්වය ඉදිරියට ගෙන යෑම පිළිබඳ ප්‍රශ්නයක්.

මේ ස්ථාවරත්වය ඉදිරියට ගෙන යෑම සඳහා මුලින්ම මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේදී මෙතුමන්ලාගේ මුල්ම අය වැය වාර්තාව ඉදිරිපත් කළා. මෙතුමන්ලා පළමුවැනි අය වැය වාර්තාව ඉදිරිපත් කරනකොට මේ රටේ ජනතාවට බලාපොරොත්තු ගොඩක් ලබා දුන්නා. එලෙස බලාපොරොත්තු ගොඩක් ලබා දීලා දැන් අවුරුද්දක් ගතවෙලා තිබෙනවා. ඉතාම කනගාටුයි කියන්න, ඒ යෝජනාවලින් සියයට 20ක් විතර තමයි ඉටු කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ යෝජනාවලින් සියයට 80ක්ම කථාවට පමණක්ම සීමා වෙලා තිබෙනවා. "කයියනායක" කියන්නේත් ඒක හින්දා දෝ කියලාත් අපට දැන් හිතෙනවා. කථාවට දක්ෂ වුණාට, අවුරුද්දක් ගත වෙලාත් වැඩේ කර ගන්න බැහැ කියන එක දැන් ඔප්පු වෙලා තිබෙනවා.

සමහර අය කියනවා, "නැහැ, නැහැ, පළාත් පාලන මැතිවරණය තිබුණා. ඒ හින්දා ඒ හැම දෙයක්ම කරන්න හැකි වුණේ නැහැ" කියලා. ලබන අවුරුද්දේ බොහෝ විට පළාත් සභා මැතිවරණය පවත්වන්න පුළුවන්. එතකොට ලබන අවුරුද්දේ දෙසැම්බර් වන විට මේ අය කියාවි, "අපට ඒ සියයට 80ත් කර ගන්න බැරි වුණේ පළාත් සභා මැතිවරණය තිබුණු හින්දා" කියලා. ඒ නිසා මැතිවරණ තිබෙනවා කියන එක වැඩ නොකරන්න හේතුවක් කර ගැනීමේ අවශ්‍යතාවක් නැහැ.

මේ වෙලාවේ මම මතක් කළ යුතු තව කාරණයක් තිබෙනවා. ඒ තමයි, මේ අය වැය පිළිබඳව අපේ රටේ ජනතාවට ලොකු විශ්වාසයක් නැහැ කියන එක. අද "මව්බිම" පුවත් පතේ ඇතුළු පිටුවක තිබෙනවා, විවිධ වෘත්තීය සමිති මේ අය වැය ගැන කියපු කථා. එහි එක් තැනක විදුහල්පති ශ්‍රේණිධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් කියනවා, "සුනඛයන්ට මිලියන 100යි. විදුහල්පතිවරුන්ට මිලියන 144යි. අපිට සැලකීම මේකෙන් පේනවා" කියලා. විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නය පිළිබඳව එක වෘත්තීය සමිතියක් මේ ආකාරයට ඉතා පැහැදිලිවම ප්‍රකාශ කරනවා. ඒ විතරක් නොවෙයි. ගොවිජන පවුර සංවිධානයේ කැඳවුම්කරු කියනවා, "තේ ගොවියාගේ ආර්ථිකය නැංවීමට නිසි පියවර අරන් නැහැ" කියලා. ලංකා ගුරු සංගමයේ සභාපති කියනවා, "අධ්‍යාපනයට සියයට හයක් වැඩි කරනවා කියා බලයට ඇවිත් වැඩි කළේ බින්දුවයි" කියලා. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංසදයේ සභාපති කියනවා, "විපක්ෂයේ සිටින විට කළ කතා බලයට ආවාම වෙනස් වෙලා" කියලා. ඒ වාගේම තව එක හොඳ දෙයකුත් මෙහි කියනවා, "වැටුප් වැඩි කළාට වතු කම්කරුවෝ සතුටින්" කියලා. ඒ පිළිබඳව නම් අපිත් සතුටු වෙනවා. නමුත්, අපට ගැටලුවක් තිබෙනවා. මොකද, මේ කථා ගිය අය වැයේදීත් කිව්වා, කෙරුණේ නැහැ. මේ අය වැයේදීත් කියලා ඒක නොකරයි ද කියන සැකය තිබෙනවා. ඒකත් අර සියයට 80 ගොඩට යයිද කියන ගැටලුව අපට තිබෙනවා. ජාතික ගොවිජන එකමුතුවේ

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

සභාපති කියනවා, "මුට්ටිකාසි අය වැයක්" කියලා. රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය කියනවා, "වෛද්‍යවරුන් රට හැර යෑම නැවැත්වීමට නම් මෙවර අය වැයෙන් සහන දිය යුතුයි" කියලා. ඒ වාගේම ශ්‍රී ලංකා ඉදිකිරීම් සංගමය කියනවා, "ඉදිකිරීම් කර්මාන්තය කඩා වැටිලා කිසිම සහනයක් නැ" කියලා. එතකොට රාජ්‍ය නිලධාරි වෘත්තීය සමිති සම්මේලනය කියනවා, "අනුර කුමාර විහිළු කරමින් ඉදිරිපත් කළේ පතෝල අය-වැයක්" කියලා. මෙන්න මේ ආකාරයට මේ රටේ නොයෙක් වෘත්තීය සමිති, මේ රටේ ජීවත් වන ජනතාව, වැඩ කරන ජනතාව දැන් මේ අය වැය පිළිබඳව සෘණාත්මක විධියට තමයි කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ගොවි ජනතාව පිළිබඳ මෙම ප්‍රශ්නය ඉතාම ගැටලු සහගත තත්ත්වයක්. මේ රටේ ඉතිහාසයේ ගොවි ජනතාව වෙනුවෙන් පෙනී හිටපු කෙනෙක් තමයි, ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන නාමල් කරුණාරත්න නියෝජ්‍ය අමාත්‍යවරයා. ගොවි ජනතාව වෙනුවෙන් උරෙන් උර ගැටී සටන් කරපු අය අද ගොවි ජනතාව දිහා බලන්නේ නැති තත්ත්වයට පත්වෙලා තිබෙනවා. මට හිතා ගන්න බැහැ, ලොකු ලූනු -බී ලූනු- පිළිබඳ ප්‍රශ්නයේදී මේ අය ලූනුවල වට ප්‍රමාණය මනින්න පටන් ගත්තා. ලූනුවල වට ප්‍රමාණය මනින්න කටයුතු කිරීම අද විහිළුවක් බවට පත්වෙලා තිබෙනවා. මේ අය ඒ ගොවි ජනතාවට අවශ්‍ය සහනය ලබා දෙන්න කටයුතු කරලා නැහැ.

ඒ වාගේම, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාත්, තමුන්නාන්සේලාත් ජනාධිපතිවරණයේදී කිව්ව කථා ගොඩක් තිබෙනවා. අපි මේ වෙලාවේදී ඒවා මතක් කළ යුතුයි. අපි බලාගෙන හිටියා, පළමුවැනි අය වැයෙන් ඒ පොරොන්දු ඉටු කරයි කියලා. ඒ වාගේම අපි බලාගෙන හිටියා, මේ දෙවැනි අය වැය කථාවේදීවත් ඒ ගැන මතක් කරයි ද කියලා. හැබැයි, කියන්න කනගාටුයි, ඒ වෙලාවේදී කිව්ව කථා සම්පූර්ණයෙන්ම අමතක කිරීමේ න්‍යාය පත්‍රයක තමුන්නාන්සේලා ඉන්නවා.

අපි මේ වෙලාවේදී මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. තමුන්නාන්සේලා කිව්වා, "රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව දැවැන්ත බදු ගහලා තිබෙනවා. ඒ බදු අඩු කරන්න කටයුතු කරනවා. ඒ සඳහා IMF එකත් එක්ක සාකච්ඡා කරනවා. IMF එකේ කොන්දේසි සංශෝධනය කරන්නත් සාකච්ඡා කරනවා" කියලා. මම අහන්න කැමැතියි, තමුන්නාන්සේලා ඒ කොන්දේසි වෙනස් කරන්න IMF එකත් එක්ක සාකච්ඡා කළේ කොයි වෙලාවේද කියලා. ඔබ ජනාධිපතිවරණයේදී කිව්වා, "බදු බර වැඩියි. ජනතාවට ජීවත් වෙන්න අමාරුයි. අපි බදු බර අඩු කරන්න කටයුතු කරනවා" කියලා. හැබැයි, තමුන්නාන්සේලා මෙවර අය වැයෙන් බදු අඩු කිරීම සම්පූර්ණයෙන් අමතක කරලා, "පවතින බදු මීට වඩා වැඩි කරන්නේ නැහැ" කියනවා. එහෙම කියලා මේ අය වැයෙනුත් බදු වැඩි කිරීමටත් කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. IMF එක දණ ගස්වලා, IMF එකට ඕනෑ විධියට නොව තමුන්නාන්සේලාගේ යෝජනා තමුන්නාන්සේලාට ඕනෑ විධියට ක්‍රියාත්මක කරන්න IMF එකත් එක්ක සාකච්ඡා කරනවාය කිව්වත්, මේ අය වැය IMF එක හදපු අය වැයක් දෝ කියන සැකයක් දැන් අපට තිබෙනවා.

ඒ වාගේම අපට මතකයි, තමුන්නාන්සේලා එක පැන් පහරින් යම් යම් පොරොන්දු ඉටු කරනවාය කිව්වා. සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යවරයා කිව්වා මට තවම මතකයි, පළමු අය වැයෙන් සියලුම රැකියා විරහිත උපාධිධාරින්ට රැකියා ලබා දෙන්න කටයුතු කරනවා කියලා. ඒක තමුන්නාන්සේලාට මතකද කියලා මම දන්නේ නැහැ. හැබැයි, අද ඒ ගැන කථාවක් නැහැ. අද කියනවා, අපි මෙච්චර ප්‍රමාණයකට රැකියා දෙන්න උත්සාහ කරනවා, අච්චර ප්‍රමාණයකට රැකියා දෙන්න උත්සාහ කරනවා කියලා. ඒ විතරක් නොවෙයි. ඔබ පළමුවැනි අය වැයෙන් කිව්වා මතකද, "එක පැන් පහරින් පෙට්‍රල් මිල අඩු කරනවා. ඩීසල් මිල අඩු කරනවා" කියලා? ඒ විතරක් නොවෙයි, "මේකට හෙනහුරා බවට පත්වෙලා තිබෙන්නේ මිල සූත්‍රය. එම නිසා අපි මේ මිල සූත්‍රයත් අහෝසි කරනවා" කිව්වා. මිල සූත්‍රය අහෝසි කිරීම කොහොම වෙතත්, මීට දින කිහිපයකට කලිනුත් ඒ මිල සූත්‍රය යොදාගෙනම ඉන්ධන මිල වෙනස් කරන්න කටයුතු කරලා තිබෙනවා. දැන් මිල සූත්‍රය වෙනස් කරන්න කිසිම සැලැස්මක් නැහැ කියන එක අපට ඉතා පැහැදිලිව දකින්න ලැබෙනවා.

ඒ විතරක් නොවෙයි, විදුලි බිල ගැනත් කිව්වා. මේ රටේ ජනතාවගෙන් ඡන්දය ලබා ගන්න කිව්ව තවත් බොරුවක් තමයි, විදුලි බිල තුනෙන් එකකින් අඩු කරන්න කටයුතු කරනවා කියපු එක. විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කිව්ව මේ ආණ්ඩුව, දැන් දිගින් දිගටම විදුලි බිල වැඩි කිරීමේ න්‍යායක යෙදෙනවා. මෙහෙම බොරු කියලා රවට්ටලා කටයුතු කරනකොට මේ රටේ ජනතාව තවත් බලාගෙන ඉදීවිද කියලා අපි දන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. අපි දැක්කා, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පසුගිය ජනාධිපතිවරණයේදී නොයෙක් ආකාරයේ දේවල් කියනවා. කොටින්ම කිව්වොත්, මේ රටේ ජනතාවට තමුන්නාන්සේලා ඉතා පැහැදිලිව කිව්වා, "විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කරනවා" කියලා.

විධායක ජනාධිපති ක්‍රමයට විරුද්ධ වෙච්ච තමුන්නාන්සේලා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳව අඩු ගණනේ සාකච්ඡාවක්වත් ක්‍රියාත්මක කරන්න ඕනෑ. නමුත්, තමුන්නාන්සේලා දැන් ඒක ඇහුණේ නැහැ වාගේ ඉන්නවා. විධායක ජනාධිපති ක්‍රමය තවත් ශක්තිමත් කරගෙන ඉදිරියට ගෙන යන්න උත්සාහයක යෙදෙනවා. ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා කිව්වා, අලුත් ව්‍යවස්ථාවක් ගේනවා කියලා. දැන් තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. ඉතින් අලුත් ව්‍යවස්ථාවක් ගේන්නේ කවදාද? අලුත් ව්‍යවස්ථාවක් ගේන්න බැහැ, සතියෙන් දෙකෙන්, මාසයෙන් දෙකෙන්. අලුත් ව්‍යවස්ථාවක් ගේන්න කොච්චර කාලයක් ගත වෙනවාද? ඒ පිළිබඳව තමුන්නාන්සේලා කිසිම අදහසක් ප්‍රකාශ කරන්නේ නැහැ. ඉදිරියේදී අපේ රටට අලුත් ව්‍යවස්ථාවක් ගේන්න ඔබතුමන්ලා ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද කියලා අපි ඇහුවාම, කවුරුවත් ඒ ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. ඒකට ඔබතුමන්ලා තුළ තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා ඇහුවාම, ඒ ගැන කථා කරන්නේත් නැහැ.

ඒ විතරක් නොවෙයි, ඉදිරියේදී මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරගන්න කියලා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා. මේ රටේ ජනතාව අවුරුදු ගණනක් තිස්සේ බලාගෙන ඉන්නවා, පළාත් සභා මැතිවරණය පවත්වන තුරු. දැන් පළාත් සභා මැතිවරණය ගැන කථා කරනකොට ජනාධිපතිතුමා විහිළු කථා කියනවා. අපි අහන්නේ මේ පළාත් සභා මැතිවරණය පවත්වන්නේ කවදාද කියායි. පළාත් සභා මැතිවරණය ගැන කථා කරනකොට දැන් කියනවා, ඒකට නීතියක් නැහැ කියලා. නීති හදන්න මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට තුනෙන් දෙකක බලයක් ලබා දීලා තිබෙනවා. ඒ නිසා කිසිම ගැටලුවක් නැහැ. එහෙනම්, නීති නැහැ කියලා බොරුවට අවුරුද්දක් බලාගෙන ඉන්න අවශ්‍යතාවක් නැහැ. තමුන්නාන්සේලාට මේ මැතිවරණය තියන්න අවශ්‍ය නම්, මන්ත්‍රී ධුර 159ක් -තුනෙන් දෙකක බලයක්- තිබෙන නිසා ඒ නීතිය ගෙනෙන්න අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්. ඒකට වුවමනාවක් තිබෙනවා නම් ඒ සඳහා වැඩි කාලයක් යන්නේ නැහැ. හැබැයි, අපට පෙනෙන හැටියට නම් පළාත් සභා

මැතිවරණය පැවැත්වීමේ දේශපාලන වුවමනාවක් තමුන්නාන්සේලාට නැහැ. මොකද, පළාත් පාලන මැතිවරණයේදී සියයට 20කින් විතර තමුන්නාන්සේලාගේ ඡන්ද අඩු වුණා. පළාත් පාලන මැතිවරණයේදී අත්වෙච්ච පරාජයට වඩා දරුණු පරාජයක් පළාත් සභා මැතිවරණයේදී අත්වෙනවා. ඒ නිසා පළාත් සභා මැතිවරණය පවත්වන්න තමුන්නාන්සේලාට වුවමනාවක් නැහැ කියන එක අපට පෙනෙනවා. නමුත් අපි ඉතා පැහැදිලිවම කියනවා, මේ රටේ ජනතාව වෙනුවෙන් පළාත් සභා මැතිවරණය පවත්වන්න කියලා. එය මේ වනකොටත් වසර ගණනාවක් පරක්කුයි. එම නිසා පළාත් සභා මැතිවරණය පවත්වන්න ඔබතුමන්ලා කටයුතු කළ යුතුමයි. ඒක අලුත් ක්‍රමයට තියන්න අවශ්‍ය නම්, අලුත් ක්‍රමයකට තියන්නත් කල් තිබෙනවා. ඉතාම කෙටියෙන්, ඉක්මනින් පවත්වන්න අවශ්‍ය නම් පරණ මනාප ක්‍රමයට මැතිවරණය පවත්වන්න කිසිම බාධාවක් නැහැ. ඒ නිසා පළාත් සභා මැතිවරණය පවත්වන්න කටයුතු කරන්න කියා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.06]

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක අපේ ආණ්ඩුවේ දෙවන අය වැය. ඒ වාගේම ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මුදල් ඇමතිතුමා විධියට ඉදිරිපත් කළ දෙවන අය වැය. මේ අය වැය තුළින් විපක්ෂය මොන තරම් අනාථ කරලාද කියනවා නම්, විපක්ෂයෙන් මේ අය වැය විවාදයට ඉදිරිපත් වන කථිකයන් මෙතැනදී පත්තරේ කියවන තැනට පත් කළා. නමුත්, ඒ අය මීට පෙර ඉතාම දක්ෂ කථිකයන්. පව්! මේකෙන් එතුමන්ලා මෙතැනදී පත්තරේ කියවන තැනට පත් කළා. ඊත් අපි උදේට පත්තරේ බලලා එන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සමහර මන්ත්‍රීවරුන් මළ ගෙදරක කථා කරනවා වාගේ මොනවා හරි දෙයක්, අඳෝනාවක්, අඬ ඇඬියාවක් කියන තැනට පත් කරලා තිබෙනවා. අනේ! අනුර සහෝදරයා ඔයා මොනවාද මේ කළේ? දැන් මේ අයට පට්ට අවුල්.

ඒ විතරක් නොවෙයි. උදේ මෙතැන තවත් මන්ත්‍රීතුමෙක් කරපු කථාවක් මම අහගෙන හිටියා. එතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවාද දන්නේ නැහැ. ඒ මන්ත්‍රීතුමා අපි මේ ආණ්ඩු බලය ගන්න කලින් මොනවාද කිව්වේ? අපට බලය දෙන්න එපා කිව්වා. අත්දැකීම් නැහැ, බුලත්විට කඩයක්වත් කරලා නැහැ කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? එතුමන්ලාටමත්, හෘදය සාක්ෂියක් ගැව්ලාවත් තිබෙන විපක්ෂයේ අයට සිදු වෙලා තිබෙනවා, "අන්න භාණ්ඩාගාරය රුපියල්වලින් පිරී ඉතිරී යනවා" කියන්න. ඔවුන් ඒ සංඛ්‍යාවත් කියනවා. අපි ඒක කියන්නේත් නැහැ. ට්‍රිලියන ගණන්වලින් භාණ්ඩාගාරය ඉතිරිලා යනවා කියලා හෘදය සාක්ෂියක් තිබෙන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අද කියන්න වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ තිබුණු අර්බුදය මොකක්ද? එක පැත්තකින් රුපියල් තිබුණේ නැහැ. අනෙක් පැත්තෙන් ඩොලර් තිබුණේ නැහැ.

දැන් සමහර මන්ත්‍රීවරු රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ගුණ ගායනා කරනවා හීනියට, සීතලට. කලින් විවේචනය කළා; තදට විවේචනය කළා. විවේචනය කරලා වෙනම පක්ෂත් හැදුවා. දැන් පූට්ටු වෙන්න යනවානේ. දැන් පූට්ටු වෙන්න යන නිසා ටික ටික, සීතලට දැන් ප්‍රශංසා කරනවා. කොහොමද ප්‍රශංසා කරන්නේ? ආර්ථිකය හැදුවා කියනවා. ඒ විතරක් නොවෙයි, පැටලෙනවා නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අර රාජකරුණා මන්ත්‍රීතුමා හොඳ කථිකයෙක්. අද එතුමාට පැටලුණා නේ. ජනාධිපති අනුර දිසානායක සහෝදරයා පත් වුණේ 2023 ලු. පැටලුණා. එතැන ඉඳලාම පැටලුණා. එච්චර පැටලෙනවා, මේ අපේ අය වැයෙන්. ඒ විතරක් නොවෙයි. එතුමා කියනවා, රනිල් රට හැදුවා ලු, ආර්ථිකය හැදුවා ලු. හැබැයි, අපි එක දෙයක් පිළිගන්නවා. 2022ට වඩා, 2023 හා 2024 මුල් කාර්තුවේ ආර්ථිකයේ යම් ප්‍රගතියක් තිබුණා. අපි ඒක නොකියන්න කුහක නැහැ. ඒක තමයි ඇත්ත, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ආර්ථිකයේ පදනම, ආර්ථික දේහය දෙදරා ගිහිල්ලා තිබුණා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, සියුම් කම්පනයකින් පවා ආර්ථිකය නැවත 2020, 2021 තිබුණු තැනට වැටෙන්න තිබුණා. හැබැයි, ගරු ජනාධිපති අනුර දිසානායක සහෝදරයා මුදල් ඇමතිවරයා විධියටත්, අපේ ආණ්ඩුවත්, ඉතාම සියුම්ව, ඉතාම මූල්‍ය විනයකින්, ඉතාම සැලැස්මකින්, දියුණු ක්‍රමයකින් අද වෙනකොට ආර්ථිකය ස්ථාවර කරලා තිබෙනවා; ආර්ථිකය ශක්තිමත් කරලා තිබෙනවා. ආර්ථිකයේ හැම ක්ෂේත්‍රයක්ම, හැම තැනක්ම ශක්තිමත් කරලා තිබෙනවා, අද මේ කථා කරන මොහොත වන විට. කොහොමද ඒක වුණේ? ඒ නිසා තමයි විපක්ෂය කියන්නේ රුපියල් ට්‍රිලියන ගණනක් භාණ්ඩාගාරයේ තිබෙනවා කියලා. අපට විදෙස් සංචිත තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 6.3ක්. මේ අවුරුද්ද අවසන් වෙන්න තව මාස දෙකක් තිබෙනවා. එතකොට අපි දන්නවා ඒක ඇමෙරිකානු ඩොලර් බිලියන හත පනිනවා කියලා. ඒ තැනට රට ගෙනාවා. ආර්ථිකය ශක්තිමත් කළා, අනුර සහෝදරයා. ඒ විතරක් නොවෙයි. දැන් සෘජු විදෙස් ආයෝජන ලැබෙනවා. ඒවා තිබුණේම නැහැ, වසර ගණනාවක්. හැබැයි, සෘජු විදෙස් ආයෝජන දැන් ලැබෙනවා.

අපේ ආණ්ඩුවේ විනිවිදභාවය ගැන අද ප්‍රශ්න කළා. විනිවිදභාවය තිබෙන නිසා තමයි විදෙස්ගත ශ්‍රී ලාංකිකයෝ මුදල් එවන්නේ. විදෙස් ප්‍රේෂණ වැඩි වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. කොටස් වෙළෙඳ පොළ ගැන බලන්න. මේ මහත්වරු කිව්වේ, කොටස් වෙළඳ පොළ වැටෙයි, IMF එක දාලා යයි, රුපියල මස්ත බාල්දු වෙයි, ඩොලර් එක 600ට නගියි කියලා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? හැම දවසකම නගින්නේ මොකක්ද? නගින්නේ කොටස් වෙළඳ පොළ. ඓතිහාසික නැඟිල්ලක් නගින්නේ.

[ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා]

ඒ විතරක් නොවෙයි, අපනයන ආදායම වැඩි වෙලා තිබෙනවා. මේවාත් එක්ක එක අවුරුද්දෙන් ආර්ථිකය ඉතා ප්‍රශස්ත තැනකට ඇවිල්ලා තිබෙනවා. අපි බලයට ඇවිල්ලා මාස 11යි. අනුර සහෝදරයා බලයට ඇවිල්ලා යන්තම් සත්තම් අවුරුද්දයි. අවුරුද්දක් වනකොට අපි ආර්ථිකය ශක්තිමත් කරලා තිබෙනවා. ඒ නිසා තමයි දෙවැනි අය වැය අපට මේ තරම් ප්‍රශස්තව, විපක්ෂය ගොළු වෙන, විපක්ෂය වෙව්ලන, විපක්ෂය පත්තර කැල්ල කියවන තැනට වැටෙන තැනට පත් කරන්න පුළුවන් අය වැයක් ලෙස ඉදිරිපත් කරන්න පුළුවන් වුණේ.

මම මුලින්ම විපක්ෂයේ අය මේ උත්තරීතර පාර්ලිමේන්තුවයි, රටයි නොමඟ යවපු කාරණා ටිකකට උත්තර දීගෙන යන්නම්. රාජ්‍ය සේවයට බඳවා ගැනීම් ගැන දෙතුන් දෙනෙක්ම කිව්වා. 2025.09.15 රාජ්‍ය සේවයට 68,441ක් බඳවා ගැනීමට කැබිනට් මණ්ඩලය තීන්දු කරනවා. එම සංඛ්‍යාවෙන් 10,711ක් උපාධිධාරීන්. ඒ විතරක් නොවෙයි. 2025.10.27 දින අමාත්‍ය මණ්ඩලය නැවත තීන්දුවක් ගන්නවා, තව 8,541ක් රාජ්‍ය සේවයට බඳවා ගන්න. මුළු එකතුව 76,982ක්. රාජ්‍ය සේවයට අපි මේ වසරේ බඳවා ගන්නවා 76,982ක්. *[බාධා කිරීමක්]* දෛනිකව බඳවා ගන්නවා. මේ මොහොතේත් බඳවා ගන්නවා, ලංකා බැංකුවට, මහජන බැංකුවට. හැබැයි බඳවා ගන්නේ කොහොමද? කුස්සිය පැත්තෙන් අපේ ගෙවල්වලට එන්නේ නැහැ. අපි දෙන්නේ නැහැ කොළ කෑලි. ඒවාට විධිමත් විධියට අයදුම්පත්‍ර කැඳවනවා; සම්මුඛ පරීක්ෂණ පවත්වනවා; සුදුස්සන්ට රාජ්‍ය සේවයේ පත්වීම් දෙනවා. ඒක තමයි ඇත්ත. 2026 අය වැයෙනුත් රාජ්‍ය සේවයට 75,000ක් බඳවා ගන්න අන්න ප්‍රතිපාදන වෙන් කළා.

ඒ විතරක් නොවෙයි. විපක්ෂයේ අය තවත් බොරු කිව්වා. එකක් තමයි අද උදේ කියපු කථාව. උදේ කිව්වා, විශ්වවිද්‍යාල ගැන කථාවක්. උසස් පෙළ සමතුන්ට ජාත්‍යන්තර පිළිගත් විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබා දෙන්න කටයුතු කරනවා කියලා අපි මුදල් වෙන් කළා. ඔව්. අපි මුදල් වෙන් කළා. දැන් මොකක්ද කියන්නේ? ඒගොල්ලන් කියනවා නැහැ ලු. ඇත්ත කතන්දරය මොකක්ද? ඉල්ලුම්පත්‍ර 600ක් ලැබුණා, උසස් පෙළ විශිෂ්ට ලෙස සමතුන්ගෙන්. එයින් 108 දෙනෙක් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවා. දැනට උසස් පෙළ සමතුන් 32දෙනෙක් තෝරාගෙන ඉන්නවා, ලෝකයේ තිබෙන ඉතාම විශිෂ්ට විශ්වවිද්‍යාලවලට යවන්න. මම උදාහරණ කිහිපයක් කියන්නම්. සිංගප්පූරු රාජ්‍ය විශ්වවිද්‍යාලය ආසියාවේ හොඳම විශ්වවිද්‍යාලයක්. ඒ විතරක් නොවෙයි. ඕස්ට්‍රේලියාවේ University of Sydney, ලෝකයේ හොඳම විශ්වවිද්‍යාල අතරේ 25 වැනි තැනට තිබෙන විශ්වවිද්‍යාලය; ඕස්ට්‍රේලියාවේ number one විශ්වවිද්‍යාලයක්. අන්න ඒකටත් සිසුන් තෝරාගෙන තිබෙනවා. ඇත්ත කතන්දරය හැටියට 32කට දැන් ඒ ප්‍රතිලාභ ලැබෙනවා.

ඊළඟට, තවත් බොරුවක් කිව්වා. ඒ තමයි බඩු මල්ලේ කථාව. ඔව්, මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ බඩු මල්ලක් දෙන්න තිබුණා. හැබැයි මැතිවරණ කොමිසමෙන් කිව්වා, "මේ වෙලාවේ මැතිවරණයක් තිබෙනවා, ඒක සුදුසු නැහැ, ඒක මැතිවරණ අල්ලසක් වෙනවා" කියලා. අපි ඉතාම ප්‍රජාතන්ත්‍රවාදීව ඒක පිළිගත්තා. ඒ නිසා අපි ඒක නැවැත්තුවා. හැබැයි දැන් මොකද කියන්නේ? ඒක ගසා කෑවාලු. නැහැ. කියන්න සන්තෝෂයි, ලබන දෙසැම්බර් 20වැනි දා ඉඳලා දෙසැම්බර් 31වැනි දා දක්වා ඒ බඩු මල්ල දෙනවා, ගර්භිණී මවුවරු 288,000කට. ලබන දෙසැම්බර් 20වැනි දා ඉඳලා දෙසැම්බර් 31වැනි දා දක්වා ගර්භිණී මවුවරු 288,000කට රුපියල් 5,000ක ඒ බඩු මල්ල දෙනවා. ඒක තමයි ඇත්ත.

IMF එක ගැන කථා කළා. IMF එක මේ රට දාලා යයි කියලා නේ කිව්වේ. දැන් අරහෙම කළේ නැහැ, මෙහෙම කළේ නැහැ කියලා කියනවා. පච්!

ඊළඟට, විදුලි බිල ගැන කථා කළා. විදුලි බිල සියයට 30කින් අඩු කළා. ඊට පස්සේ සියයට 18කින් වැඩි කළා. හැබැයි මේ කරන ප්‍රතිසංස්කරණ ඇතුළේ ඉස්සරහට අඩු වෙනවා, මාදුගොඩ මන්ත්‍රීතුමනි. ඒක තමයි ඇත්ත කතන්දරය. තෙල් මිලත් එහෙමයි. අපි එනකොට තිබ්බ මිල බලන්න. දැන් මිල බලන්න. දැන් රුපියල් 38කට වඩා අඩුවෙලා තිබෙනවා.

ඊළඟට, රාජ්‍ය සේවය ගැන කිඹුල් කඳුළු හෙළනවා. දැන් රාජ්‍ය සේවයට මොකද වෙන්නේ? ඔබතුමන්ලා අර සීතලට වර්ණනා කරන නායකයා 2016.01.01 සිට රාජ්‍ය සේවයට බඳවා ගන්නා සියලුදෙනාගේ විශ්‍රාම වැටුප අහෝසි කළා. ඒ වෙනුවට දායක විශ්‍රාම වැටුප කියලා මඟුලක් ගෙනාවා. හැබැයි, මේ අය වැයෙන් මොකක්ද කළේ? ඒක අහෝසි කළා. ඒ ගැසට් එක අහෝසි කරලා, සියලු රාජ්‍ය සේවකයන්ට විශ්‍රාම වැටුප යළි ප්‍රදානය කරනවා. ඒ විතරක් නොවෙයි. විවිධ හේතු නිසා අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමින් සේවකයන් බඳවා ගත්තා. අපට ඒ බඳවා ගැනීම් ගැන සෑහීමකට පත් වෙන්න බැහැ. හැබැයි, ඒ අය රාජ්‍ය සේවයට බඳවා ගෙන තිබෙනවා. ඒ නිසා ඒ සියලුදෙනා - 9,800ක් - අපි ස්ථිර කරනවා. මේ අය වැයෙන් අන්න ඒකටත් ප්‍රතිපාදන වෙන් වෙනවා. ඒ විතරක් නොවෙයි. පාසල් ගුරුවරු ගැන කිව්වා. රාජ්‍ය සේවකයන්ට පොදුවේ වැටුප් වැඩි වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මට තවත් පොඩි වෙලාවක් ඕනෑ. මේ අමතර කාරණා ටිකක් කියන්නේ. මේ අය වැය ගැන කියන්න සෑහෙන වෙලාවක් ඕනෑ. ඒ නිසා විනාඩි තුනක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
තවත් කථිකයෝ ගණනාවක් ඉන්නවා, ගරු මන්ත්‍රීතුමා. විනාඩි දෙකෙන් අවසන් කරන්න.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
විදුහල්පතිවරුන්ට, දුෂ්කර සේවයේ ඉන්න ගුරුවරුන්ට වැටුප් වැඩි කරන්න වෙන් කරලා තිබෙන්නේ එකසිය ගණනක් කියලා ලු පත්තරේ තිබුණේ. පත්තරේටත් වැරදිලා, ඔබතුමන්ලාටත් වැරදිලා. ඒකට මිලියන 1,500ක් වෙන් කරලා තිබෙනවා. රාජ්‍ය සේවකයන්ට වැඩි කරපු වැටුපේ කොටසක් ලබන ජනවාරි මාසයේ ඉඳලා ලැබෙනවා. 2027 ජනවාරි මාසයේ ඉඳලා ඉතුරු කොටස ලැබෙනවා. ඒකට මේ අවුරුද්දට රුපියල් බිලියන 110ක් වෙන් කරලා තිබෙනවා. මේ සඳහා වැය වන මුළු මුදල රුපියල් බිලියන 330ක්. ඒක තමයි ඇත්ත කතන්දරය. රාජ්‍ය සේවකයන්ට ලබා දෙන ආපදා ණය සම්බන්ධව, දේපළ ණය සම්බන්ධව අපි තීන්දු තීරණ ගොඩක් අරගෙන තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, අපේ හදවත කකියන, අපේ දෑසට කඳුළු ආපු කතන්දරයක් තිබෙනවා. ඒ වෙනුවෙන් සහනයක් සැලසීම ගැන ගරු ජනාධිපතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. රත්නපුර දිස්ත්‍රික්කය පුරා ඉන්නවා, අපේ මලෙයහම් ජනතාව; වතු සේවක ජනතාව. ඔවුන් සටන් කළේ නැහැ, පෙළපාළි ගියේ නැහැ, උද්ඝෝෂණ කළේ නැහැ. එම ජනතාව කුඩැල්ලන්ගෙන් පීඩා විඳිමින්, අව්වට වේළෙමින්, වැස්සට තෙමෙමින් වැඩ කරනවා. අන්න ඒ අය ද ඇතුළුව වතු සේවකයන්ට ඉතිහාසයේ පළමු වතාවට රුපියල් 10,000කින් වැටුප් වැඩි කරනවා. දෛනික වැටුප රුපියල් 400කින් වැඩි කර තිබෙනවා. ඒ කියන්නේ, දින 25ක් වැඩට ආවොත් රුපියල් 10,000යි. එය ඓතිහාසිකයි. ඒ නිසා තමයි ගරු ජනාධිපති අනුර සහෝදරයාට දැන් දේවත්වයෙන් වැඳුම් පිදුම් කරන්නේ. අපි ඒවා අනුමත කරන්නේ නැහැ. නමුත්, එතුමා දේවත්වයට පත් වෙන්නේ ඇයි? එතුමා ඒ අය ගැන බලපු නිසා. ඒක තමයි ඇත්ත කතන්දරය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියගෙන් යම් වෙලාවක් ඉල්ලා ගෙන රත්නපුර දිස්ත්‍රික්කය ගැනත් කියන්න ඕනෑ. "රත්නපුරය" කිව්වොත් පර්යාය වචනය "ගංවතුර". රත්නපුරය ද ඇතුළුව ගංවතුර ගැටලුවට විසඳුමක් සඳහා වන අධ්‍යයනයක් සිදු කිරීමට රුපියල් මිලියන 500ක් වෙන් කරනවා. ඒ විතරක් නොවෙයි. සමහර අය අඬ අඬා හිටියා නේ, "කෝ, රුවන්පුර අධිවේගී මාර්ගය, එය ඉදි කරන්නේ නැහැ" කියලා. අන්න, එහි මුල් පියවර කහතුඩුව සිට ඉංගිරිය දක්වා ආරම්භ කරන්න මූලික වටයේ රුපියල් මිලියන 1,500ක් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රත්නපුර පැරණි නගරයේ තිබෙන රාජ්‍ය සේවකයන්ගේ quarters ටික අයින් කරලා, නව නගරයේ අලුතින් රාජ්‍ය සේවක quarters හදන්න මුදල් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රුවන්පුර දුම්රිය මාර්ගය පවිත්‍රාගේ තාත්තා -ඒ හිටපු ඇමතිලා- නැවැත්තුවා, මීට අවුරුදු 53කට කලින්. අන්න, ඒ රුවන්පුර දුම්රිය මාර්ගයේ වැඩ නැවත ආරම්භ කරන්න පසුගිය වසරේ අය වැයෙන් රුපියල් මිලියන 250ක් වෙන් කළා. 2026 අය වැයෙනුත් රුපියල් මිලියන 840ක් වෙන් කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කථාව අවසන් කරන්නම් මෙන්න මේ උපමාවත් කියලා. නිවාස සැලසුම් ශිල්පියෙක් හැදුවා ලු, නිවාස සැලැස්මක්. ඒක හරි අපූරුයි ලු. අඩුපාඩුවක් නැති ලු. සාලය තිබෙනවා, කුස්සිය තිබෙනවා, නාන කාමරය තිබෙනවා; ඔක්කොම තිබෙනවා. හරියට නිකම් අර ජෙෆ්රි බාවා මහත්මයා මේ පාර්ලිමේන්තු ගොඩනැගිල්ල සැලසුම් කළා වාගේ විශිෂ්ටයි. සැලසුම හැදුවා. හැබැයි, මොකක් හරි අඩුපාඩුවක් හොයන්න ඕන කෙනා කියනවා, "ආ, කුස්සිය තිබෙනවා, සාලය තිබෙනවා, නාන කාමරය තිබෙනවා. ඒත් ඒ කුස්සියේ, ලුණු පොල්කට්ට ඇඳලා නැහැ නේ" කියලා. අන්න එහෙම එකක් තමයි විපක්ෂයටත් මේ අය වැය ගැන කියන්න සිදු වෙලා තිබෙන්නේ. අපේ අනුර සහෝදරයා ඉදිරිපත් කළ දෙවැනි අය වැය -2026 අය වැය- ඉතා විශිෂ්ට අය වැයක්; ඉතා හොඳ අය වැයක්. නමුත් විපක්ෂය අර ලුණු පොල්කට්ට හොයනවා වාගේ වැඩක් කරනවා. පව්!

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.21]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

ලෙනින්ගේ "Imperialism: The Highest Stage of Capitalism" කියන පොතේ කියනවා, "වර්තමාන ලෝකය වෙළෙඳ පොළ බෙදාගෙන අවසන් වී තිබීම සහ නැවත නැවත බෙදා ගැනීම සඳහා වූ අරගළයක නිරන්තරයෙන් නිරත වෙමින් ඉන්නවා" කියලා. එසේ තරගයක නිරත වන ලෝක ආර්ථික දේශපාලනය තුළ වරක් බංකොලොත්භාවයට පත් වූ අපේ මව්බිමේ පාලන තන්ත්‍රය වෙනස් කරලා අපේ පාලනය යටතේ පළමු වරට ඉදිරිපත් කළ අය වැය ලේඛනයෙන් ආර්ථිකය ස්ථාවරත්වයට පත් කළාට පසුව අප ඉදිරිපත් කරන දෙවන අය වැය ලේඛනයයි, මේ. ඒ වාගේම, මෙය පාර්ලිමේන්තු ඉතිහාසයේ 80වන අය වැය ලේඛනයයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙවර අය වැය කොයි ආකාරයටද විහිදිලා තිබෙන්නේ කියලා අපි බලමු. අය වැය ලේඛනයේ මුළු ආදායම විධියට සටහන් වෙනවා රුපියල් බිලියන 5,305ක්. මේ රුපියල් බිලියන 5,305 හැදෙන්නේ කොහොමද? අප ගන්නා VAT එක, සෙස් බද්ද, සුරාබදු දෙපාර්තමේන්තුවේ බදු ආදායම් යනාදියෙන් අපට එකතු වෙනවා රුපියල් බිලියන 4,850ක්. ඒ වාගේම, දෙපාර්තමේන්තු ආදායම්, කුලී, ලාභාංශ වාගේ ඒවායෙන් තවත් රුපියල් බිලියන 425ක් සහ ප්‍රදාන විධියට රුපියල් බිලියන 30ක් එකතු වෙනවා. ඒ ආකාරයට රුපියල් බිලියන 5,305ක මුළු ආදායමක් සටහන් වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රුපියල් බිලියන 5,305ක රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තොත්, එනම් ඉරට උඩින් ආදායම දාලා ඉරට යටින් දළ දේශීය නිෂ්පාදිතය දාලා 100න් වැඩි කළොත්, අපි සියයට 15.3ක, 15.4ක ඉලක්කයක් කරා ළඟා වෙලා තිබෙනවා. ඒක අවුරුදු 20කට පස්සේ ලංකාව ළඟා කරගත්තු වැඩිම අගය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි බලාපොරොත්තු වෙනවා මේ අගය තවත් වැඩි කරගෙන ඉදිරියට යන්න. ඒත් එක්කම මේ ආදායම් උත්පාදනය නිසා අපට අනියමාර්ථයෙන් තවත් වාසි කිහිපයක් සැලසී තිබෙනවා. අප 2026 සහ 2027 වර්ෂවල මේ ඉලක්කය මේ අයුරින් සපුරාගෙන යෑම සහ නියමිත කාලය තුළ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට පත් කිරීම යන කරුණු කාරණා දෙක නිසා ණය ප්‍රතිව්‍යුහගතකරණයේදී ණය හිමියන් අප හා එකඟ වෙලා තිබෙනවා 2028 සහ 2035 අතර ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතය 0.75කින් අඩු කරන්න. මේ නිසා අපට වසරකට රුපියල් මිලියන 7.9ක USD ණය සේවාකරණ වාසියක් ලැබෙනවා. ආර්ථිකය ස්ථායී කරගෙන යෑම නිසා මේක අපට අමතරව ලැබෙන වාසියක්.

ඒ වාගේමයි රාජ්‍ය වියදම ගෙන බැලුවත්. අපට ණය පොලී සහ වට්ටම් ගෙවන්න සාමාන්‍යයෙන් 2026 අවුරුද්දේ රුපියල් බිලියන 2,617ක් වෙන් කරන්න සිද්ධ වෙනවා. ඒ වාගේම, ප්‍රාථමික වියදම ගෙන බලන්න. සාමාන්‍යයෙන් අපි දන්නවා,

[ගරු ප්‍රසන්න ගුණසේන මහතා]

ප්‍රාථමික වියදම පුනරාවර්තන වියදම් සහ මූලධන වියදම් - Capital Expenditure and Recurrent Expenditure - කියා ආකාර දෙකකට වෙන් වෙන බව. පුනරාවර්තන වියදම් වශයෙන් තමයි අපි පඩි නඩි ගෙවාගෙන යන්නේ. ඒ අනුව අපට සාමාන්‍යයෙන් වැටුප් ගෙවන්න රුපියල් බිලියන 1,464ක් යනවා. විශ්‍රාම වැටුප් ගෙවන්න රුපියල් බිලියන 530ක් යනවා. වෙනත් පුනරාවර්තන වියදම් සඳහා තවත් රුපියල් බිලියන 1,131ක් වශයෙන් සම්පූර්ණයෙන් රුපියල් බිලියන 3,105ක් යනවා, පුනරාවර්තන වියදම් - Recurrent Expenditure - විධියට. ඊළඟට, ප්‍රාග්ධන වියදම් ගැන තමයි වැඩි දෙනෙක් කථා කළේ, අරවාට වෙන් කළා, මේවාට වෙන් කළා කියලා. මෙවර අය වැයෙන් ඒ සඳහා රුපියල් බිලියන 1,380ක් වෙන් කර තිබෙනවා. ඒක දැවැන්ත මුදල් ප්‍රමාණයක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට, සියයට 20.5ක මට්ටමක 2026 අවුරුද්ද පුරාවට පවත්වාගෙන යන්න අපි බලාපොරොත්තු වනවා. ඒක අපට ලේසියෙන්ම කරන්න පුළුවන්. ඒ වාගේම ආදායම් වියදම් පරතරය ගත්තත්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට එය සියයට 5.1ක මට්ටමකින් පවත්වාගෙන යන්න අපට හැකි වෙලා තිබෙනවා.

අපි ඉන්නේ IMF එකත් එක්ක negotiationsවල. ඒ සාකච්ඡාවට අදාළ නිර්ණායක තිබෙනවා. ඒ නිසා රටක් විධියට, රජයක් විධියට අපි ඒ මූල්‍ය නිර්ණායක, මූල්‍ය විනය, නියමාකාරයෙන් පවත්වාගෙන යා යුතුයි. අපි ඒ ඉලක්ක නිරන්තරයෙන් achieve කරන්න අවශ්‍යයි. එහෙම නැතිව මේ ආර්ථිකය ගොඩ දමන්න බැහැ. ඒගොල්ලන් කියලා තිබෙනවා, ප්‍රාථමික ගිණුමේ - primary account එකේ - සියයට 2.3ක් තිබෙන්න ඕනෑ කියලා. ඒ කියන්නේ රාජ්‍ය ආදායම අඩු කරනවා, ණය පොලී වාරික හැර රාජ්‍ය වියදමින්. ඒක බෙදනවා, දළ දේශීය නිෂ්පාදිතයෙන්. ඒක වැඩි කරනවා, 100න්. සියයට 2.3ක් ප්‍රාථමික ගිණුමේ තියා ගන්න ඕනෑ. අපි සාර්ථක ලෙස ඊට වඩා වැඩි අගයක් තියාගෙන ගිහිල්ලා තිබෙනවා. 2026 වසරේ සහ ඉදිරියටත් අපට ඒ අගය පවත්වාගෙන යන්න හැකියාව ලැබෙනවා.

ඒ වාගේම මධ්‍යම රජයේ ණය ප්‍රමාණය ගත්තොත්, 2022දී තිබුණේ සියයට 128කට. 2024 වනකොට ඒක සියයට 114ක් වෙන්න ඕනෑ. 2026 වනකොට අපි බලාපොරොත්තු වෙන්නේ එය සියයට 96.8ක තබාගන්නයි. හැබැයි, IMF එක කියන්නේ, එය සියයට සියයක් ලෙස තබාගන්න කියලායි. අපි ඊට වඩා අඩු අගයකට යනවා. 2030 වනකොට අපට පුළුවන් වෙයි එය සියයට 87ක අගයක පවත්වාගෙන යන්න. හැබැයි මේ ඉලක්කම්, මේ කතන්දර මොනවා කිව්වත් විපක්ෂයට මේවා තේරෙනවාද කියලා සැකයක් තිබෙනවා. අවාසනාවට කාරණය ඒකයි. මේ ගැන කියද්දී මට මතක් වෙනවා, කවියක්. ඒ කවිය තිබෙන්නේ, "ආකිමිඩීස් සිය දිවි නසා ගනී" කියන කවි පොතේ. මේ කාව්‍ය නිර්මාණයේ තිබෙන්නේ ආකිමිඩීස්ගේ බිරිඳ ආකිමිඩීස්ව ප්‍රශ්න කරන ආකාරයයි. එහි මෙන්න මෙහෙමයි කියන්නේ. *[බාධා කිරීමක්]* අහගන්නකෝ, පොඩ්ඩක්. මේක ඔබතුමාට ගැළපෙනවා, හොඳටම.

"ඊයෙ මහ දවල් දෙකට
මං ගෙදර නැති වුණු ටිකට
කියාපන් පාර දිගේ
හෙළුවෙන් දිව්වෙ මොකද
විළිලැජ්ජාවේ බෑ මිනිහො
පිස්සු හැදිලද උඹට
ඒවායින් කාරි නෑ
ඇත්ත කියාපන් මට
යුරේකා කියන්නෙ
කොයි සක්කරවට්ටමේ නමද?"

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ ඉලක්කම්, දර්ශක මොනවා කිව්වත්, මට මේ විපක්ෂයේ කථා ඔක්කොම ඇහෙන්නේ ආකිමිඩීස්ගේ බිරිඳ ප්‍රශ්න කරනවා වාගෙයි. ආකිමිඩීස්ගේ ගැනිත් මීට වඩා හොඳයි කියලා හිතෙනවා, වෙලාවකට. *[බාධා කිරීමක්]* ලජ්ජයි!

ජනාධිපතිතුමා අය වැය ලේඛනය ඉදිරිපත් කරනවා; සමහරු නින්දේ ඉන්නවා. කැබ් ගැන කියපු ගමන් ඇහැරෙනවා, නින්දෙන්. අහනවා, "අවුරුදු 5කට පස්සේ අපට ඒක ගෙදර අරගෙන යන්න දෙනවාද?" කියලා. එහෙමයි හැසිරෙන්නේ. ලජ්ජයි! අපි ඔයගොල්ලන් ගැන බලා ගන්නම්. භය වෙන්න එපා. මේ අය වැය සම්පූර්ණ අය වැය ලේඛනයක්. අංශක 360ක් කැරකෙන අය වැය ලේඛනයක්. අපි හැම මිනිහා ගැනම හිතනවා. බල්ලෝ, පූසෝ ගැනත් හිතනවා. මම හිතනවා බල්ලන්ට, පූසන්ට වඩා ඔබතුමාගේ වටිනාකමක් තිබෙනවා කියලා. ඒ නිසා අපි ඔබතුමා ගැනත් හිතනවා. ගෙදර ගෙන යන්න වාහන ඉල්ලන්න එපා. වාහන ගෙදර ගෙන යන්න දෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

ඊළඟට, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා පත්තර වාර්තා ටිකක් කියාගෙන ආවා. දැන් ඒ මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පත්තර වාර්තා ගැන කියන කොට අපි බලන්න ඕනෑ, ඒ පත්තර වාර්තා ඉදිරිපත් කරන්නේ කවුද කියලා. මා ළඟත් තිබෙනවා, පත්තර වාර්තාවක්. මේ පත්තර වාර්තා ඉදිරිපත් කරන්නේ අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා. එතුමා හිටපු අගමැතිතුමෙකුගේ පුතෙක්. ඒ නිසා මම හිතනවා, වෘත්තීය සමිති නායකයන් ඉදිරිපත් කරනවාට වඩා මේකේ වටිනාකමක් තිබෙනවා කියලා. ඒකේ මොකක්ද කියන්නේ? "ගිය අය වැයෙන් ගමේ පාරට දුන් මුදලින් සියයට 90ක් වියදම් කර නැහැ - මන්ත්‍රී අනුරාධ ජයරත්න". ඔන්න පත්තරය ඇතුළේ පිටුවේ තිබෙන කාරණය අහගන්න. ග්‍රාමීය මාර්ග සංවර්ධනයට රුපියල් මිලියන 4,000ක් පසුගිය අය වැය ලේඛනයෙන් වෙන් කරලා ලු. ඒ සඳහා රුපියල් මිලියන 14,000ක් වෙන් කළා. ඉලක්කම් එකක් අඩු වෙලා ද මම දන්නේ නැහැ. මේ, "මව්බිම" පත්තරය. වරද්දලා ගහලා ද දන්නේ නැහැ, වැරදිලා කියලා ද දන්නේ නැහැ. රුපියල් මිලියන 14,000ක් වෙන් කළා. රුපියල් මිලියන 14,000 මදි වුණා. තව රුපියල් මිලියන 19,000ක් වෙන් කළා. නමුත්, වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 272යි ලු.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ග්‍රාමීය මාර්ග සංවර්ධනයේ "පුනරුදයට මග" කියන programme එක අපි ආකාර දෙකකින් කරගෙන යනවා. එකක්, RDA එක මැදිහත් වෙලා direct labour යොදාගෙන කරනවා. දිසාපති හරහා තවත් පාරවල් ටිකක් කරගෙන යනවා. RDA එක මැදිහත් වෙලා direct labour යොදාගෙන කරන ප්‍රමාණයෙන් පාරවල් 288කින් මේ වනකොට - number of awarded roads - 154ක් award කරලා තිබෙනවා. ඒකේ වියදම විතරක් රුපියල් මිලියන 4,775යි. මෙතුමා කියන්නේ, වියදම් කළේ රුපියල් මිලියන 275ක් කියලායි. සමහර වෙලාවකට එක පාරකුත් ඊට වඩා වටිනවා. ඊළඟට, completed roadsවලට මේ වනකොට සම්පූර්ණ වශයෙන් රුපියල් මිලියන 2,039ක් වියදම් කර තිබෙනවා, RDA එකෙන් විතරක්.

ඊළඟට, GAsලා හරහා කෙරෙනවා පාරවල් 1,145ක වැඩකටයුතු. ඒකෙන් 511ක් මේ වනකොට අවසන්. තව 538ක් ongoing projects. ඉතින් මේ මිලියන 272ක් කියන ගණන කොහෙන් හොයා ගත්තාද දන්නේ නැහැ. මේ ඉලක්කම් ලබා දෙන කට්ටිය ගැන ලොකු අර්බුදයක් තිබෙනවා. මට වෙලාව තිබුණා නම් එතුමා ඉදිරිපත් කළ පත්තර වාර්තා එකින් එකටත් මට උත්තර දෙන්න තිබුණා. පත්තර වාර්තාවල තිබෙන්නෙත් මේවාම තමයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමන්ලා කථා කරන්නේ අපට ඇතෙක් බරට රත්තරන් එක්ක ආණ්ඩුවක් ලබා දුන්නා වාගෙයි. භාර දුන්නේ, ඇතෙක් බරට කුඩු ව්‍යාප්ත වුණු රටක්. රත්තරන් නොවෙයි, ඇතෙක් බරට කුඩු දුන්න රටක් ගැන තමයි අපි මේ කථා කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ දූෂණය ඉහ වහා ගිහින් තිබෙනවා. දූෂණය අවප්‍රමාණය කරන්න නම් අපි පුළුවන් තරම් මුදල් භාවිත නොවන ගනුදෙනුවලට - cashless transactionsවලට - මාරු වෙන්න ඕනෑ. Ministry of Digital Economy හරහා ඒ සම්බන්ධව කටයුතු කෙරීගෙන යනවා. අපි ඩිජිටල් ආර්ථිකයට ක්‍රමයෙන් මාරු වෙනවා. හැම අමාත්‍යාංශයකම එම කටයුත්ත කෙරෙනවා. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේත් - DMT එකේත් - ඩිජිටල්කරණය සඳහා වූ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවා. අපි ඒකේ දූෂණය අවම කරන්න නම්, පුළුවන් තරම් සේවා ලබා ගන්නා customersලා සේවා සපයන්නා හමුවීම අඩු කරන්න ඕනෑ. ඒ වාගේම අපේ යම් backlog එකක් තිබෙනවා නම් සේවාව ලබා දෙන්න වැඩි කාලයක් ගත වනවා නේ. එම නිසා backlog එක අඩු කර ගන්න අවශ්‍යයි. අපේ timeline එක අනුව ලබන වසරේ අප්‍රේල්, මැයි වනකොට වාගේ මාර්ගගත ක්‍රමයට අනුව ලංකාව පුරාම ඉන්න අයට ලයිසන් ලබා ගැනීමේ වැඩකටයුතු ටික අවසන් කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි, ලයිසන් print කරන මැෂින් අපට තිබුණේ තුනයි. අපි තව මැෂින් දෙකක් අලුතින් මිලදී ගත්තා. තව මිලියන 14ක් විතර වියදමක් යනවා. දැනට තිබෙනවා ලක්ෂ හතරහමාරක විතර backlog එකක්. මාස අටක් හෝ නවයක් ඇතුළත ඒක clear කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. මේ ආකාරයේ වැඩ කටයුතු ප්‍රමාණයක් අපි කරගෙන යනවා. ඊළඟට, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ - DMT එකේ - annual maintenance service එකක් කෙරෙනවා. සාමාන්‍යයෙන් කෙරිලා තිබුණේ Cabinet Papers දමමින් තිබුණු පෞද්ගලික ආයතනයම එම සේවාව ඉටු කිරීමට කාලය දීර්ඝ කර ගැනීමක්. අන්තිමට දීලා තිබුණේ, මිලියන 184ට. අපි ඒක ටෙන්ඩර් කළා. ටෙන්ඩරය දුන්නේ මිලියන 28ට. මිලියන 184ට ඉටු කළ සේවාවේ ටෙන්ඩරය දුන්නේ මිලියන 28ට. එහෙමයි කාර්යය මාරු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රජයේ අය වැය සම්පූර්ණයෙන් අංශක 360ක් කැරකෙන, සම්පූර්ණ සේවා සපයන, නිෂ්පාදනය කරන සැමදෙනා ගැන අවබෝධයක් තිබෙන, ඒ හැම කෙනා ගැනම හිතපු අය වැයක්. අපේ රටේ ආබාධිත ප්‍රජාව neglect කරලා තිබුණේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට, දුම්රිය ස්ථානවලට, බස් නැවතුම් පොළවලට ආදී සේවා ලබා ගන්න තැන්වලට ප්‍රවේශ වීමට සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීමට මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,000ක් වෙන් කරනවා. රජයේ සේවයට ආබාධ සහිත පුද්ගලයන් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිශතය සියයට 3ක් කියලා තිබුණා. හැබැයි, ඒක හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. ඒක ක්‍රියාත්මක කරන්න කියලා අපි යෝජනා කරනවා. ඒ වාගේම ආබාධ සහිත ප්‍රජාව පෞද්ගලික අංශයට ඇතුළු වනවා නම් ලබා ගන්නා වැටුපෙන් සියයට 50ක්, රුපියල් 15,000ක උපරිමයකට යටත්ව මාස 24ක් යන කල් රජය ගෙවන්න බලාපොරොත්තු වනවා. මොන ආණ්ඩුවද මෙහෙම කළේ? පාසල් යන ආබාධිත ළමයින් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරනවා නම් මාසිකව රුපියල් 5,000ක් දෙන්න යෝජනා කරනවා. ඒ වාගේම ආබාධිත දරුවෙක් උසස් අධ්‍යාපනය ලබනවා නම් ඒත් ඒ ආකාරයෙන් මාසිකව රුපියල් 5,000ක් දෙන්න යෝජනා කරනවා. විශ්වවිද්‍යාල ප්‍රජාව ගැනත් අවධානය යොමු කර තිබෙනවා. මේ රට ගොඩ ගන්න අපට scientific cadre එකක් අවශ්‍යයි. එය කළ හැකි වන්නේ අපේ විශ්වවිද්‍යාල තුළිනුයි. මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කරනවා. විශ්වවිද්‍යාලවල භෞතික සම්පත් වැඩි කිරීම වෙනුවෙන් මුදල් වෙන් කරනවා. මේ ආකාරයෙන් අපි දැවැන්ත සංවර්ධනයක් බිමට අරගෙන යන්න 2026 අවුරුද්දේත්, 2025 අවුරුද්දේත් continuation එකක් විධියට බලාපොරොත්තු වනවා. ඒ සඳහා මුදල් වෙන් කරමින් තිබෙනවා.

ඊළඟට ගනිමු, සෞඛ්‍ය සේවය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ජාතික රෝහල්වලට එන රෝගීන් ප්‍රමාණය දෛනිකව වැඩි වනවා. මොකද හේතුව, මූලික රෝහල්වලට මිනිස්සු ගියාම ඔවුන්ට හිතෙනවා එතැන කෙරෙන ප්‍රතිකාර, කර ගන්න පුළුවන් පරීක්ෂණ - tests - ප්‍රමාණයට වඩා වැඩි හොඳ සේවාවක් ජාතික රෝහල්වලින් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. අපේ සැලසුමක් තිබෙනවා, රුපියල් මිලියන 31,000ක් වෙන් කරලා අවුරුදු පහක් ඇතුළත මූලික රෝහල් 82ක් සංවර්ධනය කරන්න. අවුරුදු පහක දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් වෙනුවෙන් අපි පළමු අවුරුද්දේ ඒ සඳහා මුදල් වෙන් කරනවා. රෝහල්වල හෘද රෝග සැත්කම් සඳහා දැඩි තදබදයක් තිබෙනවා. ලොකු පොරොත්තු ලේඛනයක් තිබෙනවා. වැඩි පිරිසකට හෘද ශල්‍යකර්ම සිදු කරන්න පුළුවන් හෘද රෝග ඒකකයක් ඉදි කිරීම වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. එය අවුරුදු කිහිපයක් ගත වන වැඩක්. එහි වැඩ පටන් ගැනීම සඳහා මෙම අය වැයෙන් මුදල් වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා. තැලසීමියා රෝගීන් සඳහාත් මෙවැනි ගැටලුවක් මතු වෙලා තිබෙනවා. අඩු ආදායම්ලාභී තැලසීමියා රෝගීන් වෙනුවෙන් රුපියල් 10,000 බැගින් මාසික දීමනාවක් ලබා දීමටත් යෝජනා කර තිබෙනවා.

කාලයක් තිස්සේ තිබුණු ගැටලුවක් තමයි, අනාරක්ෂිත දුම්රිය ගේට්ටු. ලංකාව පුරා 1,200ක් වාගේ දුම්රිය ගේට්ටු තිබෙනවා. ඒ අතරින් 400ක් පමණ අනාරක්ෂිත දුම්රිය ගේට්ටු. ඒ සඳහා අපට වැඩ පිළිවෙළක් තිබෙනවා. එය අවුරුදු කිහිපයක් ගත වන වැඩ පිළිවෙළක්. ඒ තමයි, දුම්රිය ගේට්ටු bell and light system එක හෝ වෙන යම් ක්‍රමයකට ආරක්ෂිත කිරීම. හැබැයි, එයට ටික කාලයක් ගත වනවා. මොකද, එම දුම්රිය ආරක්ෂිත උපකරණ සඳහා වැඩි වියදමක් වැය වන නිසා. අවුරුදු ගණනාවක සිට දුම්රිය ගේට්ටු ක්‍රියාකරුවන් සේවයේ යෙදී සිටියා. ඔවුන්ට රුපියල් 7,500යි මාසිකව හම්බ වුණේ. ඔවුන් නිරන්තරයෙන් ඇවිත් අපව හමු වුණා. එම දීමනාව වැඩි කරන ලෙස ඔවුන් නිරන්තරයෙන් ඇවිටිලි කළා. මෙවර අය වැයෙන් එම දීමනාව දෙගුණයකින් වැඩි කරලා තිබෙනවා. එනම්, රුපියල් 15,000 දක්වා වැඩි කරලා තිබෙනවා.

අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමියලා ඇවිල්ලා, වතු කම්කරුවන් වෙනුවෙන් මොනවාද කළේ කියලා ඇහුවා. අප වතු කම්කරු වැටුප වැඩි කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්නේ අම්බිකාලා එක්කෙනායි. කියන්න සතුටුයි, මේ ගොඩ නැඟෙන විශ්වාසයේ බලාපොරොත්තුවත් එක්ක අපේ අවුරුදු 5 අවසානයේ අපි මේ රටේ අම්බිකාලා 1,000ක් හදනවා.

රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීම සඳහා අප ගිය අවුරුද්දේ රුපියල් බිලියන 110ක් වෙන් කළා. මේ අවුරුද්දේත් ඒ මිලියන 110 වෙන් කරනවා. 2027 අවුරුද්දටත් රුපියල් බිලියන 110ක් වෙන් කරනවා. වැටුප ක්‍රමිකව ස්ථාවර කරලා තමන්ගේ රැකියාව නියමාකාරයෙන් කරගෙන යා හැකි මුදලක් රාජ්‍ය සේවකයා අතට ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අය ගන්නා ආපදා ණය නවත්වා තිබුණා, අපි දැන් ඒකත් ගෙවන්න පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම අපි ඉදිරියේදී රාජ්‍ය සේවය සඳහා විශාල පිරිසක් බඳවා ගැනීමට බලාපොරොත්තු වෙනවා. ඒ අපි දාන listsවලින් නොවෙයි. හරියට ඉල්ලුම් පත්‍ර කැඳවලා, විභාග

[ගරු ප්‍රසන්න ගුණසේන මහතා]

පවත්වලා, ඒ interviewsවලට සහභාගි කරගෙන තමයි අපි ඒ බඳවා ගැනීම් සිදු කරන්නේ. රාජ්‍ය සේවයේ වැඩි පිරිසක් ඉන්නවා තාවකාලික, අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් සේවකයන් විධියට. අපි පසුගිය දවසක මාර්ග සංවර්ධන අධිකාරියේ සිටි අනියම් සේවකයෝ 700දෙනෙකු ස්ථිර කළා. ඒ කවුරුත් අපි රක්ෂා දීපු අය නොවෙයි. අපි ඡන්ද පැකට් නඩත්තු - maintain - කරන්නේ නැහැ. අපි නියම සුදුස්සාට නියමිත තැන ලබා දෙනවා. ඒ අනුව ඉදිරි කාලයේදී සුදුසුකම් තිබෙනවාද, නැද්ද කියලා සොයා බලලා අපි ඒ සේවකයන්ව ක්‍රමිකව ස්ථිර කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟට නිවාස පැත්තෙන් ගත්තොත්, 2026 අය වැයෙන් නිවාස 10,000ක් සඳහා මුදල් වෙන් කරනවා. වතු ජනතාව වෙනුවෙන් නිවාස 2,000කට වෙනමම මුදල් වෙන් කරනවා. ගම් උදාව, අර උදාව, මේ උදාව කියලා අපට ඒවාට ලොකු නම් නැහැ. හැබැයි හෙවණක් නැති මනුස්සයෙකුට හෙවණක් ලබා දෙනවා, ඒක ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තිය.

අපි පසුගිය දවසක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා. ඒ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්න හේතු වුණේ මේකයි. අපි විදේශ ණය ගන්නවා. ඒ ණය ගන්නකොට විදේශයෙන් දෙන ණය වාරිකයේ component එකක් තිබෙනවා, ඒ වාගේම රජයේ භාණ්ඩාගාරයෙන් වෙන් කරන මුදල් ප්‍රමාණයක් තිබෙනවා. වර්ෂය මුලදී තමයි ඒ මුදල් ප්‍රමාණය වෙන් වෙන්නේ. හැබැයි පසුගිය කාලය පුරාම විදේශීය ණය ගන්න පරක්කු වෙනවා, සමහර ණය cancel වෙලා තිබෙනවා. නමුත් රජයේ භාණ්ඩාගාරයෙන් අවුරුද්ද මුල වෙන් කරන මුදල ඒ විධියටම තිබෙනවා. අපි ඒක analyse කර බැලුවාම පෙනුණා වර්ෂය මැද වෙනකොට ඒ ප්‍රමාණය ඉතිරි වෙනවා කියලා. ඒක ඉතුරු වුණොත් අපරාදේ. මොකද, ඒක ඊළඟ අවුරුදුවලට යන්නේ නැහැ. ඒ නිසා අපි පරිපූරක ඇස්තමේන්තුවක් දාලා අපට ගෙවන්න තිබෙන; මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවන්න තිබෙන මුදල්, ණය පියෙව්වා. ඒ පියවීම නිසා සිදු වුණු ලාභයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ 35වෙනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා.

> "...රඹුක්කන ගලගෙදර කොටසෙහි ඉදිකිරීම් කටයුතු රාජ්‍ය මූල්‍ය අවකාශය කෙරෙහි ද අවධානය යොමු කරමින් දේශීය අරමුදල් යටතේ ආරම්භ කිරීමට යෝජනා කරනවා. ඒ සඳහා, මාර්ග සංවර්ධන අධිකාරිය ලබාගෙන ඇති ණය මුදලින් ඉදිරි වර්ෂයන්හි දී ගෙවිය යුතු ණය මුදලෙහි කොටසක් මෙම වසර තුළ දී ගෙවා අවසන් කිරීම නිසා ඉදිරි වර්ෂයේ දී ඉතිරි වන ප්‍රතිපාදන සහ තවත් අතිරේක ප්‍රතිපාදනයක් ද ඇතුළුව රුපියල් මිලියන 20,000ක ප්‍රතිපාදනයක් සලසා දීමට යෝජනා කරනවා."

මොකද වෙන්නේ? නියමාකාර මූල්‍ය සැලසුම් සහ මූල්‍ය කළමනාකරණය කියන්නේ ඕක තමයි. අපි ගෙවන්න තිබුණු ණය කලින් ගෙව්වා. ඒ නිසා මේ අවුරුද්දේ අපට හැකියාව ලැබෙනවා ඒ ආයෝජන සඳහා මුදල් යොදවන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට ප්‍රාථමික වියදම සියයට 13ක මට්ටමක පවත්වාගෙන යන්න හැකි වෙලා තිබෙනවා. මොකද, මේ ඉලක්කම වැදගත්. ඒ නිසා අපට සමාජ ආරක්ෂණය සඳහා මුදල් වෙන් කිරීමේ හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම යටිතල පහසුකම් සඳහාත්, සංවර්ධනය සඳහාත් මුදල් වෙන් කිරීමේ වාසිය ලැබිලා තිබෙනවා. ඒ අනුව අපට අවශ්‍ය රාජ්‍ය ආයෝජන ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක මට්ටමේ තියා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි රඹුක්කන ගලගෙදර කොටස ලංකාවේ GOSL fundsවලින් ආරම්භ කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මේක තමයි ආර්ථික සැලසුම්කරණය කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, Communist Party of Chinaහි - CPCහි - නායක ෂී ජින්පින් 2013 වර්ෂයේ සංචාරයකදී මෙහෙම කියනවා. "සපත්තුව ගැළපෙනවාද නැද්ද කියලා දන්නේ සපත්තු දාන කෙනා විතරයි. මහ ජනයාට විතරයි හරියටම කියන්න පුළුවන් තමන්ගේ රට වෙනුවෙන් තෝරාගෙන තිබෙන සංවර්ධන මාවත ගැළපෙනවාද නැද්ද කියලා." ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලංකාවට ගැළපෙන සංවර්ධන මාවත, දේශපාලන ව්‍යාපාරය ලාංකීය ජනතාව වසරකට කලින් හරියාකාරව තෝරා ගත්තා, ඒක තමයි ජාතික ජන බලවේගය. මේ රටට ගැළපෙන ආර්ථික මොඩලයේ සපත්තුව වියන්නේ කවුද කියලා අවුරුද්දකට කලින් ජනතාව තෝරා ගත්තා, ඒක තමයි ජාතික ජන බලවේගය. සියයට 4.6කට තිබුණු අපේ ආර්ථික වර්ධන වේගය සියයට 4.8කට ගෙනාවා. මේ අවුරුද්ද වෙනකොට ඒක සියයට 7කට අරගෙන යන්නෙත් මේ පාලනයම තමයි. රනිල්ගේ කාලයේ අපේ විරැකියාව තිබුණේ සියයට 4.5ට, දැන් අපි ඒක සියයට 3.8කට අඩුකර තිබෙනවා. ඒක තව අවප්‍රමාණය කරන්නේත් මේ පාලනය යටතේම තමයි. අපේ රටේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.3කට අපි ගෙනාවා. එම ප්‍රමාණය ඩොලර් බිලියන 7ට ගෙනියන්න අපි බලාපොරොත්තු වෙනවා. අපේ target එක තිබෙන්නේ ඩොලර් බිලියන 15ක විදේශ සංචිත ප්‍රමාණයකට. ඒ ප්‍රමාණයට යන්න හැකියාව තිබෙන්නේත්, විනිමය කළමනාකරණය ගැන දැනුම තිබෙන්නේත් මේ පාලනයටම තමයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සංචාරක ආදායම ගිය අවුරුද්දේ පළමු මාස 9 තුළ තිබුණේ ඩොලර් බිලියන 2.3ට. මේ අවුරුද්දේ එම ප්‍රමාණය ඩොලර් බිලියන 2.6කට ආවා. 2030 අවුරුද්ද වනවිට එම ප්‍රමාණය ඩොලර් බිලියන 8කට ගෙනියන්නේත් මේ පාලනය යටතේම තමයි. ඒ වාගේම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වශයෙන් ඩොලර් බිලියන 4.8යි, 2024 අවුරුද්දේ මුල් මාස 9ට ලැබුණේ. අපි එම ප්‍රමාණය ඩොලර් බිලියන 5.8ට වැඩි කළා. එම ප්‍රමාණය ඩොලර් බිලියන 10ට වඩා වැඩි කරගන්නේත් මේ පාලනය යටතේම තමයි.

අපිට private agendas නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපේ එකම අරමුණ මේ රටේ ආර්ථිකය ගොඩ දැමීමයි. ආර්ථිකය ගොඩ දැමීම වෙනුවෙන් 2026 අය වැයෙන් සෑම අංශයක්ම ආවරණය වන පරිදි අපි යෝජනා ගෙනැවිත් තිබෙනවා. ඒවා අපි නිසියාකාරයෙන් ක්‍රියාත්මක කරනවා. ගිය අවුරුද්දට වඩා මෙම අය වැය අපට සාර්ථක කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. මොකද, වැඩිපුර - අමතර - මාස 2ක් තිබෙනවා, අපිට මේක සැලසුම් කරන්න. ඒ නිසා සම්පූර්ණ මුදල් බිමට යොදවා දැවැන්ත සංවර්ධනයක් කිරීමට අප බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.40]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ කථාව ආරම්භ කරන්නට කලින් මීට පෙර කථා කළ මන්ත්‍රීවරයකු සඳහන් කළ කාරණයක් ගැන වචන කීපයක් කියන්න කැමැතියි. එතුමා සඳහන් කළා, විශ්වවිද්‍යාල අතර ශිෂ්‍ය හුවමාරුව ගැන. මම

කියන්න ඕනෑ, ඒක ආරම්භ කළේ ලලිත් ඇතුළත්මුදලි ඇමතිතුමාගේ කාලයේ බව. ඒ පිළිබඳව ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හමුවකදී කථා කළේ Dr. Wickrema Weerasooria. ඒක ඉදිරියට ගෙන ගියේ අනුර බණ්ඩාරනායක අධ්‍යාපන ඇමතිතුමාය කියන එකත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

අද මේ අය වැය ගැන කරන කථා ඇහෙද්දී, මට පරණ මුදල් ඇමතිවරුන් ගැන මතක් වෙනවා. විශේෂයෙන්ම විශිෂ්ටම මුදල් ඇමතිවරයා හැටියට හඳුන්වන, විද්‍යාත්මකව කථා කළා කියන ජේ.ආර්. ජයවර්ධන මුදල් ඇමතිතුමා, රොනී ද මැල් මුදල් ඇමතිතුමා, මංගල සමරවීර, රවී කරුණානායක, රනිල් වික්‍රමසිංහ වාගේ හිටපු මුදල් ඇමතිවරුන් මතක් වුණා, අනුර කුමාර දිසානායක මුදල් ඇමතිතුමා කථා කරනකොට. විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නාට පසුව රොනී ද මැල් මුදල් ඇමතිතුමා එතුමාගේ පළමු වැනි අය වැය කථාවේදී කියා තිබෙනවා, "වසර 20ක් තිස්සේ ක්‍රියාත්මක වෙමින් පවතින හැකිළුණු ආර්ථිකය වෙනුවට විවෘත ආර්ථිකයක් නිර්මාණය කිරීම අපගේ ප්‍රධාන අරමුණ වේ" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අනුර කුමාර දිසානායක මුදල් ඇමතිතුමාගේ අය වැය සහ පෙර රජයන්ගේ අය වැය අතර තිබෙන වෙනස මොකක්ද කියන එක අපට පැහැදිලි නැහැ. හැබැයි, එතුමාට ඒක කියන්න තිබුණේ, "වසර 7 ½ක් තිස්සේ රනිල් වික්‍රමසිංහ විසින් පවත්වා ගෙන ගිය IMF හිතවාදී, විවෘත ආර්ථිකය තවදුරටත් එලෙසම පවත්වා ගෙන යාම අපේ ආණ්ඩුවේද ප්‍රධාන අරමුණ වේ" කියලායි. එහෙම කිව්වා නම් හරි, අර පැය 4යි ගණනක් තිස්සේ කළ විහිළුවට වඩා.

ඇත්තටම මේ අය වැය තුළ දිගින් දිගටම තිබුණේ මොනවාද? ඒ තුළ තිබුණේ පරණ ආණ්ඩුවලට දෝෂාරෝපණය කිරීම, ඒ වාගේම ගැලරිය චූන් කිරීම කිව්වොත් හරි. මේක ඇත්තටම වමට පොරොන්දු දීලා අතිදක්ෂිණාංශික ලෙස වැඩ කරන අය වැයක් හැටියට මම දකිනවා. ගොවියාට, විශ්‍රාමිකයාට, රාජ්‍ය සේවකයාට පොරොන්දු දීලා අලුත් ව්‍යාපාරික හිතවතුන්ට සහන දුන් අය වැයක් හැටියට තමයි අපි මෙය දකින්නේ, අල ගොවීන්ට සහ බී ලූනු ගොවීන්ට අද සිදු වෙලා තිබෙන දේවල් දිහා දැක්කාම. ඇත්තටම කිව්වොත්, තව අවුරුදු 2ක්, 3ක් මේ මුදල් ඇමතිතුමාම අය වැය ඉදිරිපත් කළොත්, ලෝක බැංකුවෙන් කීකරුම රාජ්‍ය පාලකයාට සම්මානයක් හදලා ඒක ජනාධිපතිතුමාට දෙනවා. ඒ වාගේම IMF එකෙන් හොඳටම කරන රාජ්‍ය නායකයා කියලා පදක්කමක් දෙන්න බැරිකමකුත් නැහැ. ඒ වාගේම නැඟී එන හොඳම ධනපති රාජ්‍ය නායකයා කියලා වොෂින්ටන්වල පිළිරුවක් හැදුවොත් අපිට ඒ ගැන පුදුම වෙන්න දෙයක් නැහැ. ඒක හිතාගන්න බැරි දේකුත් නොවෙයි. මේ අය මේ රටේ පැවැති ආණ්ඩුවලට කරන්න නොදුන් සියලු දේවල්, සියලු ප්‍රතිසංස්කරණ ගෙඩිය පිටින්ම පුස් පැටව් වාගේ කරන තත්ත්වයකට අද පත්වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුදල් ඇමතිතුමාගේ 2026 අය වැය ලේඛනයේ 2.3 වැනි ඡේදයට මම එන්නම්. එතුමා ඒ තුළ ණය ස්ථායීකරණය ගැන කිව්වා. මම කියන්නම්, ආණ්ඩුව ණය ස්ථායීකරණය කර තිබෙන්නේ කොහොමද කියලා. පසුගිය ජනාධිපතිවරණය පැවැති 2024 සැප්තැම්බර් මාසය වනවිට මධ්‍ය රජයේ නොපියවූ ණය ප්‍රමාණය රුපියල් බිලියන 28,574.65යි. 2025 ජූනි අවසානය වනවිට එම ණය ප්‍රමාණය රුපියල් බිලියන 29,634.78ට වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, එම මාස 9ට ණය වැඩි වීම රුපියල් බිලියන 1,060යි. ඒ කියන්නේ, රුපියල් 1,060 කියන ඉලක්කමට තව බින්දු 9ක් දාගන්න ඕනෑ.

ඊළඟට මම කියන්නම්, විදේශ සංචිත කාබාසිනියා වීම ගැන. ඉස්සෙල්ලා කථා කරපු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, අපට තිබෙන විදේශ සංචිත ප්‍රමාණය ගැන. මම දන්නේ නැහැ, පැලවත්තේ ගිණුමේ තිබෙන එක ගැන කිව්වාද කියලා. 2025 මාර්තු මාසයේ ඩොලර් මිලියන 6,531ක් වූ විදේශ සංචිත ප්‍රමාණය 2025 සැප්තැම්බර් වනවිට ඩොලර් මිලියන 6,244ක් දක්වා අඩු වෙලා තිබෙනවා. මාස 6ට ඩොලර් මිලියන 287ක් අඩු වෙලා තිබෙනවා. මුදල් සංචිත පහත වැටෙනකොට, ණය වැඩි වෙනකොට - ජනාධිපතිතුමාගේ න්‍යායට අනුව- ණය ස්ථායීකරණය වෙනවා කියනවා නම්, එතැනින් එහාට මේ රට ගැන අපිට කථා කරන්න දෙයක් නැහැ.

ඒ වාගේම, මුදල් ඇමතිතුමා උද්ධමනය ගැන හරි උජාරුවෙන් කථා කළා. මේ වාගේ කථා බැසිල් රාජපක්ෂත්, අජිත් නිවාඩ් කබ්රාල් හිටපු ඇමතිතුමාත් කියනවා අපි දැක තිබෙනවා. දැන් මේ ආණ්ඩුව යන්නේ ඒ පාරේ. ඔයගොල්ලන්ට ඡන්දය දීපු cadre එක ගමේ ඉඳන් අලුත් සටන් පාඨ හදනවා ඇති, "අපි යන්නේ කොයි පාරේ - බැසිල් අයියා ගිය පාරේ, අපි යන්නේ කොයි පාරේ - කබ්රාල්ලා ගිය පාරේ" කියලා. මොකද, උද්ධමනය ගැන මේගොල්ලෝ අද කියන්නේත් ඒවාගේ දේවල්ම තමයි. ඒ වාගේම ජීවිත කාලය පුරාවටම ජීවන වියදම පහත දමන්න කියලා පෝස්ටර් ගහපු, වේදිකාවල නැඟලා කථා කියපු මුදල් ඇමතිතුමා මේ අය වැය කථාවේදී කියනවා, ජීවන වියදම වැඩි කරන්නේ ආර්ථික වර්ධන වේගය වැඩි කරන්න කියලා. ධනපති අය වැයක් ගෙනාවා කියලා හංවඩු ගැහිච්ච ජේ.ආර්. ජයවර්ධන මහත්මයා, ඒ වාගේම රොනී ද මැල්, මංගල සමරවීර කියන හිටපු ඇමතිතුමන්ලා කියපු නැති විධියේ කථාවක් තමයි එතුමා කිව්වේ. එතකොට මේ ආණ්ඩුව කොයිතරම් ධනපතිද, කොයි තරම් නියෝ ලිබරල්වාදී අය වැයක්ද මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එක මේ රටේ ජනතාව තේරුම් ගන්න ඕනෑ.

ජනාධිපතිතුමා ජනාධිපති ධුරයට පත් වෙලා පෝය 13ක් ගෙවිලා අවසානයි. මම දන්නේ නැහැ, ඒක එතුමාට කොහොම දැනුණාද කියලා. මාස 12ට රුපියල සියයට 5කින් බාල්දු වෙලා තිබෙනවා. ඉස්සෙල්ලා කිව්වා, එහෙම වෙලා නැහැ කියලා. ආණ්ඩුවේ ජනප්‍රියත්වය සියයට 50කින් බාල්දුවෙලා තිබෙනවා. ගුරුවරු, විදුහල්පතිවරු සියයට 75කින් බාල්දු කරලා තිබෙනවා. විශ්‍රාමිකයින් සියයට 90කින් විතර බාල්දු කරලා තිබෙනවා. මම මේ වෙලාවේ විශේෂයෙන්ම කියන්න ඕනෑ, 2020-2024 කාලයේ රජයේ සේවයෙන් විශ්‍රාම ගිය අයට ලොකු ප්‍රශ්නයක් තිබෙන බව. එකට සේවය කළ සමානයන් අතර විශ්‍රාම වැටුප් විෂමතාවක් හදලා තිබෙනවා. ඒ කියන්නේ, නුපුහුණු කම්කරුවන් දෙදෙනෙකු අතර රුපියල් 25,000ක සහ අමාත්‍යාංශ ලේකම්වරු දෙදෙනෙකු අතර රුපියල් 90,000ක වාගේ විෂමතාවක් හදලා තිබෙනවා. අනෙක් සේවකයින් අතරත් රුපියල් 25,000ත් රුපියල් 90,000ත් අතර විෂමතාවක් තිබෙනවා. මෙන්න මෙහෙම විෂමතාවක් අද හදලා තිබෙනවා. 2019දී යහ පාලන ආණ්ඩුවෙන් 2017ට කලින් විශ්‍රාම ගිය සැමට ගළපපු සංශෝධිත විශ්‍රාම වැටුප පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට ප්‍රමාදයකින් තොරව ලැබුණා. හැබැයි, පසුගිය අය වැයෙන් යෝජිත 2018 වැටුප් ව්‍යුහයට ගැළපුණු සංශෝධිත විශ්‍රාම වැටුප එක එක හේතු කියමින් මේ අයට ලබා දීලා නැහැ. ඒවා නිවැරදි වෙන්න ඕනෑ. ඒ වාගේම 2022ට පෙර විශ්‍රාම ගිය ගුරුවරු, 2/97 චක්‍රලේඛයෙන් ලොකු අසාධාරණයකට පත් වෙච්ච අය; ඒ සටන පාරට ගෙනාපු අය. හැබැයි, අද සොච්චම් විශ්‍රාම වැටුපක් එක්ක ඒ අය එතැනම ඉන්නවා. හැබැයි, මේ ආණ්ඩුව ගන්නට ඒ අයව පාරට ගෙන්නාගෙන වැඩ ගත්තා.

ඒ වාගේම අල, ලූනු, උක්, වී, බඩඉරිඟු, උඳු, තල ගොවීන් සියයට 99කින්ම බාල්දු කරලා තිබෙනවා. මේ මොහොත වෙනකොටත් අල ගොවියෝ, බී ලූනු ගොවියෝ පාරට වැටිලා ඉන්නවා. මොකද, ඒගොල්ලන්ගෙන් මිලදී ගැනීම් සිද්ධ වෙන්නේ නැහැ. ඊළඟට නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීමක් ගැනත්

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

කිව්වා. 2025දී අමාත්‍යාංශවලට වෙන් කරපු ප්‍රාග්ධන මුදල්වලින් සියයට 85ක් ඉතුරු වෙච්ච අමාත්‍යාංශත් තිබෙනවා. කිසිම පළාත් සභාවක් සියයට 25ක ප්‍රාග්ධන අරමුදල් වැය කරලා නැහැ. හැබැයි, ආණ්ඩුව වාහන - කැබ් රථ - ගන්න රුපියල් බිලියන 42ක් වියදම් කරනවා. අමාත්‍යාංශ 24න් අමාත්‍යාංශ 17කටම ප්‍රාග්ධන වියදම් වශයෙන් රුපියල් බිලියන 42කට වඩා වෙන් කරලා තිබෙනවා. ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයට රුපියල් බිලියන 6.5යි. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට රුපියල් බිලියන 12යි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට රුපියල් බිලියන 6යි, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට රුපියල් බිලියන 10.1යි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයට රුපියල් බිලියන 6යි. මම තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය ගැනත් කියන්න ඕනෑ. අපි දන්නවා, සජියා යම්ක් ගැන. ආසියාවේ වේගවත්ම කාන්තාව හැටියට ඒ දරුවා අභිෂේක ලබනවා. මම උගන්වපු පාසලක තමයි ඒ දරුවා ඉගෙන ගත්තේ. ඒ දරුවාට අවශ්‍ය පහසුකම් දෙමව්පියන් විසිනුත්, ඒ හිටපු විදුහල්පතිවරුන් විසිනුත් සැලසුවා. මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, චම්පිකා මායාදුන්න, ජයන්ති දිසානායක, විශේෂයෙන්ම නිලක්ෂි හපුගොඩ කියන විදුහල්පතිවරියන්. එතුමියලාත්, ඒ වෙලාවේ හිටපු ක්‍රීඩා ගුරුවරිය වන අමරසේකර මහත්මියත්, ඒ දැරියගේ දෙමව්පියන් එක්ක එකතු වෙලා ඒ දැරිය රැක නොගත්තා නම්, ඇය වෙනුවෙන් මේ අය පෙනී නොසිටියා නම් අද සජියා යම්ක් ජාත්‍යන්තරයට යන්නේ නැහැ.

ඒ වාගේම මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්තෙන් ඉදිරිපත් වී, හෙල්ල විසි කිරීමේ තරගයෙන් තුන්වැනි ස්ථානය ලබා ගත් චතුර ජයතිස්ස කියන දරුවා ගැනත් මේ වෙලාවේ මම කියන්න ඕනෑ. මේ දරුවන්ට ඉස්සරහට එන්න ක්‍රීඩා අමාත්‍යාංශය ඇතුළේ අවස්ථාවක් තිබෙන්න ඕනෑ. දැන් අපට ඇහුණා, ක්‍රීඩා පාසල් වහන්න යන කථාවක්. එහෙම කථාවකුත් දැන් සමාජයේ තිබෙනවා. ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මේ දරුවන්ට අවස්ථාවක් ලබා දෙන්නේ නැතිව මේ දරුවන් ඉස්සරහට යන්නේ කොහොමද?

මම අහනවා, නිෂ්පාදන ආර්ථිකයකට මුදල් වෙන් කරන්නේ නැතිව නිෂ්පාදනයක් ඉස්සරහට යන්නේ කොහොමද, නිෂ්පාදන අර්ථිකයක් ඉස්සරහට යන්නේ කොහොමද කියලා. දැන් ඩිජිටල්කරණය ගැන කථා කරනවා. දැන් ඇත්තටම වෙන්නේ digitizing ද, digitalizing ද කියන කාරණය පිළිබඳව කථා කරන්න කියලා මම විද්වත් සමාජයට ආරාධනා කරනවා.

ඊළඟට මම අධ්‍යාපනය සහ පුහුණුව ගැන කථා කරන්නම්. අධ්‍යාපන අමාත්‍යාංශයට 2025 වසර වෙනුවෙන් වෙන් කළ මුදල්වලින් සියයට 75ක් ආපහු භාණ්ඩාගාරයට ගිහින් තිබෙනවා. එම නිසා පසුගිය අය වැයෙන් වෙන් කරපු මුදල්වලින් සැලකිය යුතු කිසිදු සංවර්ධනයක් සිදු වෙලා නැහැ. ඒ වාගේම දැන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැනත් කථා කරනවා. ගුරුවරුන්ගෙන් සියයට 80ක් විතර මාලිමාවට තමයි ඡන්දය දුන්නේ. හැබැයි පසුගිය කාලය ඇතුළත ඒ අයගේ ජීවිත මොන විධියටද ගොඩනැඟුණේ කියන එක පිළිබඳව අද ඒගොල්ලන් කලකිරීමෙන් ඉන්නේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරනකොට මට කියන්න තිබෙන්නේ, ADB project එකේ ඉතිරි වෙලා තිබෙන රුපියල් මිලියන එකසිය ගාන ඉවර වුණායින් පසුවත් එම ප්‍රතිසංස්කරණ ඉදිරියට කරගෙන යන්න ඕනෑ කියලායි. ඒක මම මේ වෙලාවේ අවධාරණයෙන් කියනවා.

ඊළඟට, විදුහල්පතිවරුන්ව අද කොතැනද තබා තිබෙන්නේ? සුනඛයන්ට පොඩ්ඩක් උඩින් තියලා තිබෙනවා. මම කියනවා, හැම විදුහල්පතිවරයෙක්ම කුඩු බිස්නස් කරන්නේ නැහැ කියලා. එම නිසා අපි විදුහල්පතිවරුන් ගැන මීට වඩා හිතන්න ඕනෑ. අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විවාද කරන කාරක සභා අවස්ථාවේදී අපි මේ ගැන කථා කරනවා. හැබැයි, මම එකක් කියනවා. බලහත්කාරයෙන් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න ගියොත්, ලබන ජනවාරි මාසය වෙනකොට ගුරුවරු ටික පාරේ ඉඳීවි. එහෙම වුණොත් ඒකේ පාඩුව සිද්ධ වෙන්නේ දරුවන්ට.

සෞඛ්‍යය ගැන කථා කරනකොට ජනාධිපතිතුමා කිව්වා, "සංවර්ධිත රටක් වෙනුවෙන් සෞඛ්‍ය සම්පන්න ජනතාවක්" කියන තේමාව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඉස්පිරිතාලයක් තිබෙනවා නම් ඒකේ බෙහෙත් තිබෙන්න ඕනෑ. මුදල් ඇමතිතුමා සෞඛ්‍ය ගැන කියපු සිකුරාදා දවසේ ලංකාවේ බෙහෙත් වර්ග 312ක් නැහැ. මම පසුගිය අය වැයේදී මේ ගැන කථා කරනකොට නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිතුමා මට කිව්වා, බොරු කියන්න එපා කියලා. මේ අවුරුද්දේ මාස 12 පුරාම -සෑම දවසකටම- අඩුම ගණනේ බෙහෙත් වර්ග 280ක් හෝ ඊට වඩා වැඩි ගානක් තිබිලා නැහැ. සමහර බෙහෙත් ඇත්තේම නැහැ.

ඊළඟට, මූලික රෝහල් නවීකරණය සඳහා දඹුල්ලට මුදල් වෙන් කර තිබෙනවා. හැබැයි, ඒ මුදලින් එක වාට්ටුවක්වත් හදන්න පුළුවන් වෙයිද කියලා ගැටලුවක් තිබෙනවා. මොකද, දඹුල්ලේ හා දෙනියායේ තිබෙන රෝහල් දෙකටම තමයි රුපියල් කෝටි 100ක් වෙන් කරලා තිබෙන්නේ. 2017දී අපි මේ කරුණු ඉදිරිපත් කරනකොට රාජිත සේනාරත්න මැතිතුමාත් හිටියා. ඒ වාගේම ඒ වෙලාවේ විපක්ෂයේ හිටපු ජනක තෙන්නකෝන් මැතිතුමාත් මම මේ වෙලාවේ ස්තුති පූර්වකව සිහිපත් කරනවා. මොකද, මේ කටයුතු ඉදිරියට ගෙන යන්නට ඒ අයගේ සහයෝගයත් එදා අපට ලැබුණා.

ලග්ගල, පල්ලේගම රෝහල ගැන කථා කළොත්, මම 2018 වසරේ ඉඳලා මහන්සි වුණා, එහි භූමියේ විශාලත්වය සහ ප්‍රදේශයේ තිබෙන දුෂ්කරතාව ගැන සලකා එය මූලික රෝහලක් බවට පත් කරන්න. කෙසේ හෝ, 2023දී ඒ සඳහා අනුමැතිය දුන්නා. හැබැයි මට පසුගිය සතියේ ආරංචි වුණා, දැන් ඒක "C" ශ්‍රේණියේ රෝහලක් බවට පත් කරලා තිබෙන්නේ කියලා. මුලින් කිව්ව විධියට ඒක මූලික රෝහලක් වුණොත් අපට VOG කෙනෙක්, VP කෙනෙක්, paediatrician කෙනෙක්, ඒ වාගේම ශල්‍ය වෛද්‍යවරයෙක් ලැබෙනවා. හැබැයි, දැන් VP කෙනෙක් විතරයි ලැබෙන්නේ. මම කියනවා, ඒ VP හෝ ඉක්මනට අපට ලබා දෙන්න කියලා. මොකද ඇත්තටම කිව්වොත්, මේ යන විධියට -දඹුල්ලේ රෝහල හදන විධියට- ලග්ගල රෝහලත් හදන්න ගියොත් ඒක හදන්න වෙන්නේ 2048දී.

මම මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ කාරණයත්. ආසියාවේ හොඳම රෝහල හැදුවත් වැඩක් නැහැ, ඊට ඉස්සෙල්ලා රෝහල්වලට අවශ්‍ය බෙහෙත් ටික ලබා දෙන්න ඕනෑ. බෙහෙත් නැතිව ලෙඩ්ඩු මැරුණාට පස්සේ රත්තරන්වලින් රෝහල් හැදුවත් වැඩක් වෙන්නේ නැහැ.

ඊළඟට, වතු කම්කරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම ගැනත් කථා කළා. මේ පිළිබඳව අවබෝධයක් නැතිව මේ කථාව කිව්වාද කියලා මට ප්‍රශ්නයක් ඇති වනවා. මොකද, නියෝජ්‍ය භාණ්ඩාගාරිකවරුන්, ලේකම්වරුන් මේ වාගේ යෝජනාවලට සහාය දෙන්නේ කොහොමද කියලා මේ වෙලාවේ මට ප්‍රශ්නයක් මතු වනවා. මොකද මේ මුදල් අනුමත කරන, සහතික කරන සියලු නිලධාරීන් මේවායෙන් අමාරුවේ වැටෙන්න පුළුවන්. අපි දන්නවා, මේ යෝජනා ඉදිරිපත් වූ හැම වෙලාවකම, මේවා අනීතිකයි කියලා භාණ්ඩාගාර නිලධාරීන් ඒවා බැහැර කර තිබෙන බව.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසන්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

අධ්‍යක්ෂ ජනරාල්තුමා දැනගෙනමයි මේ යෝජනාව දීලා තිබෙන්නේ. අධ්‍යක්ෂ ජනරාල්තුමනි, හැබැයි ඔබතුමාටත් හිරේ යන්න වෙයිද කියා මම දන්නේ නැහැ. මොකද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ මේකේ වගකීම තිබෙන්නේ අය වැය අධ්‍යක්ෂ ජනරාල්තුමාට. මතක තියාගන්න, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට නොවෙයි මෙහි වගකීම තිබෙන්නේ. දැනටමත් අපි දන්නවා, හර්ෂ ඉලුක්පිටිය ඇතුළේ කියලා. ඊළඟට, චරිත රත්වත්ත ඇතුළට දාන්න යනවා. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉහළම නිලධාරියාට ප්‍රශ්නයක් මතුව තිබෙනවා. ඒ නිසා රජයේ සේවකයෝ මේ විධියට අමාරුවේ දාන්න එපා, ඔවුන්ට කරන්න පුළුවන් දේවල් විතරක් කියන්න. එහෙම නැත්නම් භාණ්ඩාගාර නිලධාරින්ටත් ඊළඟ ආණ්ඩුවක් යටතේ හිරේ යන්න වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමිය, දැන් කථාව අවසන් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ඉක්මනින් අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම ස්තුති කරන්න ඕනෑ, මෙන්න මේ ගැන. මම පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ, න්‍යාය පුස්තකයේ 43 වන යෝජනාව. එහි තිබෙන්නේ රට විරුවන්ට දායකත්ව විශ්‍රාම වැටුපක් ලබා දෙන්න කියලා. ඒක මේ අය වැයේ යෝජනාවක් හැටියට ඇවිල්ලා තිබෙනවා. අපි දන්නවා, විදේශ ප්‍රේෂණවලින් වැඩි ප්‍රමාණයක් රටට ගේන්නේ ඒ අය බව. ඒ අය සම්බන්ධයෙන් මම ගෙනාපු යෝජනාව අද ඔබේ යෝජනාවක් හැටියට එනවා. මම ඒ ගැන ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම විශේෂයෙන්ම අලි - මිනිස් ගැටුම ගැනත් මම කථා කරන්න ඕනෑ. ඒ කාරණය කියලා මගේ කථාව අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේ වෙනකොට මාතලේ නගරයට කිලෝමීටර තුනයි කාලක් පමණ එහායින් රත්තොට, දුනුකේවත්ත ප්‍රදේශයේදී අලියෙක් මැරුණා. වන අලි හතර දෙනෙක් ඇවිල්ලා මාසයක විතර කාලයක් තිස්සේ ඒ ප්‍රදේශයේ ඉන්නවා. හැබැයි, ගෙනියන්න විධියක් නැහැ. මාතලේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් මීට කලින් අලියෙක් අල්ලන්නට රජ්ජම්මන අලි ඒකකයේ තිබුණු වාහනය අරගෙන ගිහිල්ලා කැකිරාවේදී එය අනතුරකට පත් වුණා. ඒ අවස්ථාවේදී ඒ මන්ත්‍රීවරුනුත් රෝහල්ගත වුණා. අලි එළවන්න යන්න නිලධාරින්ට වාහන නැහැ. ඒ නිසා මම කියනවා, මෙන්න මේ වාගේ ප්‍රශ්න තිබෙන තැන් ගැන විශේෂයෙන් අවධානය යොමු කරන්න, ඒ වාගේම විදුලි වැට රකින නිලධාරින්ට ඉන්න සුදුසු විධියට අවශ්‍ය කාර්යාල සකස් කරලා දෙන්න, එහෙම නැත්නම් ඒ අයට අවශ්‍ය පහසුකම් දෙන්න කියලා. මොකද, වනජීවීන් සහ වන සංරක්ෂණ නිලධාරින් මේ තරම් අසරණ කරපු ආණ්ඩුවක් මීට පෙර මම දැක්කේ නැහැ. ඒ නිසා මම කියනවා, මේ ආණ්ඩුව නිකම්ම නිකම් වචන ටිකක් විතරයි ඉදිරිපත් කළේ කියලා. මොකද, පසුගිය කාලයේ යම් යම් දේවල්වලට වියදම් නොකිරීම මත මුදල් ඉතිරිව තිබෙන නිසා අද කියනවා, භාණ්ඩාගාරය හොඳට තිබෙනවා කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.57]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තවශයෙන්ම ප්‍රතිපත්තිමය පුරෝකථනය, මූල්‍ය ඒකාබද්ධතාව සහ විනයගරුක ණය කළමනාකරණය පිළිබඳව පැහැදිලි ඉදිරි දැක්මක් සහිත ජාතික ජන බලවේග රජයේ දෙවන අය වැය විවාදයට එකතු වීමට ලැබීම සතුටක් කියලා ප්‍රකාශ කරමින්, මගේ කථාව ආරම්භයේදී මීට කලින් අදහස් දක්වපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමිය කියපු ඇතැම් කාරණා කිහිපයකට පිළිතුරු ලබා දීම අවශ්‍යයි කියා මා හිතනවා. ඇත්තවශයෙන්ම එතුමියගේ කථාව අහගෙන ඉන්නකොට අපට දැනිච්ච දේ තමයි, ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අය වැය යෝජනාවලිය කියවලාද, එහෙම නැත්නම් එය පරිශීලනය කරලාද එතුමිය මේ කථාව කළේ කියන කාරණය. එතුමිය ඉදිරිපත් කරපු තොරතුරු කුමන මූලාශ්‍රයන්ගෙන් ලබා ගෙනද මේ කථාව කළේ කියන ප්‍රශ්නය අපට මතු වෙනවා. මට නම් දැනුණේ එතුමිය යම් මට්ටමක ව්‍යාකූලතාවකින් කථා කරනවා වාගෙයි. මොකද, මම ඒ අවස්ථාවේදී එතුමියගේ ෆේස්බුක් පිටුව පරීක්ෂා කළා. එතුමිය ඊයේ දවසේ එහි යම් පළ කිරීමක් කරනවා, එතුමියගේ සමාජ ජාලය පරිශීලනය කරන අයට. ඒ තමයි අය වැය කථාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්න කරුණු තිබෙනවා නම්, එතුමියට ලබා දෙන්න කියලා. මම හිතනවා, එතුමිය අද දවසේ මේ ඉදිරිපත් කරපු ප්‍රශ්න, එතුමිය මේ ලේඛනය පරිශීලනය කර ලබා ගත් දෙයකට වඩා තුන්වන පාර්ශ්වයක් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු, එහෙන් මෙහෙන් අහුලාගෙන ඉදිරිපත් කරපු කාරණා කියලා. ඒ වාගේම එතුමිය අවසාන මොහොතේදී ස්තුතිවන්ත වුණා, එතුමියගේ යෝජනාවක් මේ අය වැය යෝජනාවලට ඇතුළත් වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම එතුමිය ෆේස්බුක් එකේ පළ කරලා තිබෙනවා, එතුමිය විසින් ඉදිරිපත් කරන ලද තවත් යෝජනාවකට මුදල් අනුමත වෙලා තිබෙනවා කියලා. ඒ නිසා ඇත්තවශයෙන්ම එතුමිය මේ අය වැය සම්බන්ධයෙන් විවේචනයක් ගේනවාද, අගය කිරීමක් කරනවාද කියන එක පවා සොයා ගන්න මට නම් බැරි වෙලා තිබෙනවා. එක මොහොතකට, මේක ඔවුන්ගේ පක්ෂවල සිටි අතීත නායකයන්ගේ අය වැය යෝජනාවලියක් වාගේය කියලාත් එතුමිය කියනවා. තවත් වෙලාවකට, මේක බැසිල් රාජපක්ෂගේ, කබ්රාල්ගේ අය වැයක් වාගේ කියනවා. ඒ කියන්නේ, එක ස්ථාවරයක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්ත වශයෙන්ම අපි අද මේ පාර්ලිමේන්තුවේ වටිනා කාලය මිඩංගු කරමින් සිදු කරමින් ඉන්නේ මේ රටේ ඉදිරි වසර සඳහා අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති සහ එදිනෙදා කටයුතු වෙනුවෙන් මුදල් වෙන්කර ගැනීමේ අය වැය විවාදයයි. හැබැයි, කනගාටුවට

[ගරු සුසන්ත දොඩාවත්ත මහතා]

කාරණාව මෙයයි. විපක්ෂය මඟින් මෙවැනි අය වැය විවාදයක් තුළින් මතු විය යුතු හරයාත්මක විවේචනයක්, විචාරයක් නැතිමකින් තොරව ඉතාම බාල, අවර ගණයේ, මීට කලින් කථා කළ මන්ත්‍රීතුමිය කිව්වා වාගේ ගැලරිය වුන් කරන ආකාරයේ කථා සිදු කරන බව තමයි අපට දකින්න ලැබෙන්නේ. ඒ නිසා අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, එවැනි දේශපාලන සංස්කෘතියක්, එවැනි දේශපාලන හර පද්ධතියක් ප්‍රතික්ෂේප කරලා තමයි ජාතික ජන බලවේගය මේ රටේ බලයට පත් වුණේ කියන එක. ජනතාව විසින් එවැනි අවර ගණයේ දේශපාලන භාවිතාව ප්‍රතික්ෂේප කරලා ගෙදර යවපු විශාල කණ්ඩායමක් ඉන්නවා. ඒ අයට අත් වෙච්ච ඉරණම අද මේ ප්‍රධාන විපක්ෂය අත්කර නොගෙන ඉඳීවි කියලා අපි අපේක්ෂා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ රජයේ දෙවන අය වැය ඉදිරිපත් කරන අවස්ථාව වනවිට මේ රටේ මූල්‍ය ස්ථාවරභාවය මේ රජය විසින් තහවුරු කර තිබෙනවා. ඇයි අපි එහෙම කියන්නේ? 2024 සහ 2025 කියන වසර දෙක සාපේක්ෂව සලකා බලනකොට අපි මුළු ආදායම රුපියල් බිලියන 737කින් වැඩි කරගෙන තිබෙනවා. ඒ වාගේම, අය වැය හිඟය රුපියල් බිලියන 500කින් අඩු කරගෙන තිබෙනවා. 2020 වසරේ සියයට 14ක්ව පැවතුණු අය වැය හිඟය 2025 වනකොට සියයට 4.5 දක්වා අඩු කරගෙන තිබෙන තත්ත්වයක් තුළ තමයි අපි මේ අලුත් අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ වාගේම, අපගේ අපනයන ආදායම ඩොලර් බිලියන 8.5 සිට ඩොලර් බිලියන 9.1 දක්වා මේ වසර දෙක තුළදී වැඩි කරගෙන තිබෙනවා. එමෙන්ම, සේවක ප්‍රේෂණ ඩොලර් බිලියන 4.8 සිට ඩොලර් බිලියන 5.8 දක්වාත්, සංචාරක ඉපැයීම් ඩොලර් බිලියන 2.3 සිට ඩොලර් බිලියන 2.5 දක්වාත්, ආදායම් සහ ප්‍රදාන රුපියල් ට්‍රිලියන 2.9 සිට රුපියල් ට්‍රිලියන 3.8 දක්වාත් වැඩි කරගෙන තිබෙනවා. මේ ආකාරයට, 2024 වසරට සාපේක්ෂව මේ රටේ ආර්ථිකය කොයිතරම් ස්ථාවර මට්ටමකට ගෙනැල්ලා තිබෙනවාද කියන එක සම්බන්ධයෙන් ජනාධිපතිතුමා අය වැය කථාවේදී දීර්ඝ වශයෙන් කරුණු දැක්වූවා. ඒ නිසා සම්බන්ධයෙන් මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, මේ අය වැය හරහා ඉදිරි වසර තුළ මේ රට අලුත් මාවතකට ගෙන යෑමේ යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. මම හිතනවා, මේ විවාදය තුළ ඒ සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීම වඩා වැදගත් කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ අවස්ථාවේදී විශේෂයෙන් සංචාරක කර්මාන්තය කෙරෙහි අවධානය යොමු කරනවා. 2024 වසරේදී සංචාරකයන්ගේ පැමිණීම 1,362,668යි, 2025දී සංචාරකයන් 1,566,532ක් වශයෙන් 203,864ක වැඩිවීමක් අපි දකිනවා. ඒක ඉපැයීම් විධියට ගත්තොත්, ඩොලර් මිලියන 828ක වැඩිපුර ඉපැයීමක්. මේ තත්ත්වය තුළ මෙවර ඉදිරිපත් කර තිබෙන අය වැය යටතේ සංචාරක කර්මාන්තය ඉහළ නැංවීම සඳහා යෝජනා කරලා තිබෙන්නේ මොනවාද? ජාතික ජන බලවේගය රජය 2030 වනවිට සංචාරක කර්මාන්තයේ ආදායම ඩොලර් බිලියන 8ක් දක්වා ඉහළ නංවන්න සැලසුම් සකස් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ යෝජනා අතරේ තිබෙනවා, සොබාදහම කේන්ද්‍ර කරගත් හා ඓතිහාසික උරුමයන් සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන වශයෙන් දියුණු කිරීම සඳහා වන යෝජනාවක්. විශේෂයෙන් හැමිල්ටන් ඇල, මීගමු කළපුව සංචාරක කලාපයක් විධියට අපි දියුණු කරන්නේ කොහොමද කියන යෝජනාවත් තිබෙනවා. විදේශ රටවල නාගරික ඇළ මාර්ග සංචාරක කර්මාන්තය සඳහා ප්‍රයෝජනයට අරගෙන තිබෙන්නේ කොහොමද, ඒවා -රෙස්ටුරන්ට් වෙන්න පුළුවන්, වෙනත් ව්‍යාපාර වෙන්න පුළුවන්- සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා යොදාගෙන තිබෙන්නේ කොහොමද කියලා අපි දන්නවා. ඒ සඳහා රුපියල් මිලියන 3,500ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරන්න යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම ඌව පළාතේ හපුතලේ, බෙරගල හා ඉදල්ගස්හින්න යන ප්‍රදේශ විශේෂ සංචාරක ආකර්ෂණය තිබෙන කලාපයක් විධියට හඳුනාගෙන ඒවායේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම රජයට අයත් ඌන උපයෝජිත ස්ථාන වශයෙන් සංචාරක බංගලා 900ක් පමණ මේ රජය පත් වුණාට පසුව හඳුනාගෙන තිබෙනවා. මෙවායේ පහසුකම් සංවර්ධනය කරලා, දේශීය සහ විදේශීය සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමේ වැඩ පිළිවෙළක් සඳහා අවශ්‍ය පියවර රජය ගනිමින් තිබෙනවා. ඒ වාගේම 2030 වසර වනවිට සංචාරක කර්මාන්තය සඳහා අවශ්‍ය පුහුණු නිපුණතා සහිත ශ්‍රමිකයන් නිර්මාණය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය හා ඒකාබද්ධ වෙලා කටයුතු කරනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කරන්න මෙවර අය වැයෙන් තීරණය කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සංචාරකයන් සඳහා අභ්‍යන්තර ගුවන් ගමන් ප්‍රවර්ධනය කිරීම සඳහා හිඟුරක්ගොඩ ගුවන් තොටුපොළ සංවර්ධනය කරන්නත්, සීගිරිය, ත්‍රිකුණාමලය අභ්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධනය හා යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ මෙහෙයුම් කටයුතු පුළුල් කිරීම සඳහාත් මුදල් වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, දැනටමත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ තිබෙන තදබදය පිළිබඳව. මේ තදබදය අඩු කරගෙන ඒ කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි විශේෂයෙන් කියන්න ඕනෑ, ඩිජිටල් සමාජයක් නිර්මාණය කිරීම රටක සංවර්ධනයේ මූලික ක්‍රියාවලියක් බවට පත් වෙච්ච ලෝකයකයි අපි ජීවත් වෙන්නේ කියලා. අද දියුණු රටවල ATM card එක පාවිච්චි කරලා බස් එකේ, කෝච්චියේ යන්න පුළුවන් තත්ත්වයක් තිබියදී තමයි අපි මෙවන් පසුගාමී තැනක ඉන්නේ. ඒ නිසා අපි මුදල් නෝට්ටු පරිහරණය කිරීමකින් තොරව ඉලෙක්ට්‍රොනික තාක්ෂණය භාවිත කරලා මේ ගෙවීම් කරන්නේ කොහොමද කියන කාරණය ප්‍රවර්ධනය කිරීමට විශාල පියවර ප්‍රමාණයක් 2026 වසර සඳහා ඉදිරිපත් කරන ලද අය වැය හරහා යෝජනා කරලා තිබෙනවා. ඒ අතර ගනුදෙනු පිරිවැය ආවරණය කිරීමත්, පද්ධති වැඩිදියුණු කිරීමත් සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. QR කේතය හරහා ගෙවීම් කරනවා නම් රුපියල් 5,000ට අඩු ගෙවීම් පිරිවැයකින් තොරව ලබා දෙන්න යෝජනා කරලා තිබෙනවා.

අපි උදාහරණයක් ලෙස ඉන්දියාව ගත්තොත්, ඉන්දියාව 2024 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 9174.5ක් data centres හරහා උපයනවා. අපි හඳුනාගෙන තිබෙනවා, මේ data centres ස්ථාපිත කරලා, ඒක නව ආදායම් මාර්ග උත්පාදනය කර ගැනීමේ ක්‍රමයක් විධියට මේ රට තුළ පවත්වාගෙන යන්න කොයි තරම් විභවතාවක් තිබෙනවාද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ මිනිස්සු මැරිලා ඉපදිලා නැහැ. මේ මිනිස්සුන්ට මතකයි, ඉන්ධන ටික, ගෑස් ටික ගන්න පෝලිමේ හිටපු කාලය. එවැනි කාලයක් පසු කරගෙන ඇවිල්ලා, අද වනකොට මේ රටේ සිනමා ශාලා පුරවැසියන්ගෙන් ඉතිරෙමින් තිබෙනවා. නාට්‍ය ශාලා පුරවැසියන්ගෙන් පිරී යමින් තිබෙනවා. මේ, ජනතාව නව බලාපොරොත්තු ඇති කරගෙන තිබෙන යුගයක්. ඒ නිසා අපි විපක්ෂයට ආරාධනා කරනවා, ප්‍රතිපත්තිමය දේශපාලනයක නියැළෙමු කියා. මේ අය

වැය යෝජනා සම්බන්ධයෙන් ඔබගේ හරයාත්මක, දියුණු දේශපාලන විවේචනය ගේන්න, විචාරය ගේන්න. මේ පත් වෙලා තිබෙන්නේ එවැනි දියුණු හරයාත්මක විවේචනයක්, විචාරයක් භාර ගන්න පුළුවන් රජයක්. අපි ඒකට සූදානම්.

අවසාන වශයෙන් මේ කාරණය කියමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මාර්ටින් ලූතර් කිං වරෙක මෙන්න මෙහෙම කියනවා: “The ultimate measure of a man is not where he stands in moments of comfort and convenience, but where he stands at times of challenge and controversy.” නායකයෙකු සැබෑ ලෙස පරීක්ෂාවට ලක් වන්නේ සුව පහසු මොහොතවල් තුළ නොව ඔහු අභියෝගාත්මක, මතභේදාත්මක තත්ත්වයන් තුළ ගන්නා ක්‍රියාමාර්ග තුළින්. ඒ නිසා අපි විපක්ෂයට කියනවා, ඔබතුමන්ලා මේ රට භාර ගත්තේ, පාලනය කළේ, සුව පහසු තත්ත්ව තුළ කියන එක. අපහසු තත්ත්ව තුළ භාරගෙන තමයි අපි අද මේ රට ස්ථාවර කර තිබෙන්නේ. මේ ස්ථාවරය ඉදිරියටත් පවත්වාගෙන යෑමේ වගකීම අපි දිවි හිමියෙන් ආරක්ෂා කරනවා කියමින් මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා.3.09]

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආර්ථික අනාගතය අලුතින්ම නිර්වචනය කරන ඓතිහාසික 2026 අය වැය විවාදයට සහභාගි වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ කෘතඥතාව ඔබතුමියට මුලින්ම පළ කරනවා. ඇයි මම එහෙම කිව්වේ? මෙය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඓතිහාසික අය වැයක්. මේ අය වැය කොයි තරම් ඓතිහාසිකද කියනවා නම් විපක්ෂයට මේක තේරුම් ගන්න බැරි තරම් දුරයි. මේ සියල්ල සිදු වන්නේ ඒකයි. විපක්ෂයෙන් ඉදිරිපත් වන සියලු කථා ශෛලීන්, ඒ body language ඇතුළු හැම එකකින්ම අපට පෙනෙන්න පටන්ගෙන තිබෙන්නේ මෙය විපක්ෂය තුෂ්ණිම්භූත කරපු ඓතිහාසික අය වැයක් කියන එකයි. ඒ නිසා අපි මේ අය වැය විවාදයට අවතීර්ණ වෙන්න ඕනෑ ඇත්තටම විද්‍යාත්මක ක්‍රමයකට. දැන් මෙතුමන්ලා මේ අය වැයේ කෑලි-කෑලි වියුක්ත ලෙස අරගෙන, සංයුක්තව හිතන්නේ නැතුව තැන් තැන්වල විවේචන කරනවා. එක පැත්තකින් පත්තර කෑලි ගේනවා. තව තැනකින් තව කෑලි කියනවා. එක මන්ත්‍රීතුමියක් කියනවා මම අහගෙන හිටියා, රෝහල් හදන එක ගැන. රෝහල් හැදුවාට වැඩක් නැතිලු බෙහෙත් නැති නිසා. මේ සියල්ලම එකිනෙක පටලවමින් කිසි අරුතක් නැති, කිසි වැදගැම්මක් නැති ප්‍රකාශ ඉදිරිපත් කරන තැනට විපක්ෂය පත් වුණේ අවුරුදු 76ක ඉතිහාසය පුරා ඒගොල්ලන් පවත්වාගෙන ආපු මමත්වය සහ පෞද්ගලික, පටු අරමුණු වෙනුවෙන් හදපු අය වැයවලට වඩා මෙය වෙනස් අය වැයක් වෙච්ච නිසායි. ඒ නිසා මේ ඓතිහාසික අවස්ථාවේදී මට ලබා දුන් මේ අවස්ථාව ගැන නැවතත් මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මෙහි ප්‍රතිපත්තිමය පදනම හා ආර්ථික ස්ථාවරත්වය ගැන කථා කළොත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අප රජය ඉදිරිපත් කර ඇති මෙම අය වැය ලේඛනය හුදෙක් වාර්ෂික මූල්‍ය ඇස්තමේන්තුවක් පමණක් නොවෙයි. පසුගිය වසර තුළ අපේ ආණ්ඩුව තහවුරු කරපු සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණවල - macroeconomic reformsවල - ස්වාභාවික අනුප්‍රාප්තිකය - natural continuation - තමයි, මේ අපි අත්දකිමින් ඉන්නේ. ඒ වාගේම අපේ ප්‍රමුඛතාව වුණේ මූල්‍ය විනය - fiscal discipline - යළි ස්ථාපිත කිරීම සහ ණය මත යැපීමේ ආකෘතියෙන් - debt dependency model එකෙන් - මිදී ස්වයංපෝෂිත රාජ්‍ය ආදායම් මාර්ග - sovereign revenue sources - ශක්තිමත් කිරීමයි. ඒක තමයි මේ continue වෙමින් යන්නේ.

විපක්ෂය හැම විටම සඟවන සත්‍යයක් තිබෙනවා. ඒ තමයි, 2025 වසරේ අය වැය ඉලක්ක. විශේෂයෙන් ප්‍රාථමික ශේෂය - primary balance එක - සහ රාජ්‍ය ණය තිරසරභාවය - public debt sustainability - සම්බන්ධයෙන් අපි විශිෂ්ට ලෙස සාර්ථක වෙලා තිබෙනවා. විපක්ෂය පත්තර කෑලි ගෙනැල්ලා කියවලා ඒවා සඟවන්න හදනවා. ඒක සාර්ථක වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මෙම දැඩි ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස අද වන විට භාණ්ඩාගාරය පිරී ඉතිරී යමින් පවතින අතර, එය ජාතික ආර්ථිකයේ ශක්‍යතාව - viability of the national economy - පිළිබඳව අපගේ සාක්ෂියයි. පිරී ඉතිරී යන භාණ්ඩාගාරයක් අපේ රටේ කවදාද දැක්කේ? විපක්ෂයට පුළුවන් මේ ගැන ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගෙන් අහගන්න.

ඒ වාගේම විපක්ෂයේ මේ හැසිරීම ගැන, ප්‍රතිපත්තිමය නොවන විධියට මෙවැනි විවාදයකදී හැසිරෙන එක ගැනත් අපි කථා කරන්න ඕනෑ. රටක් මෙවැනි මූල්‍යමය විප්ලවයක් අත්දකින මොහොතක, එරටේ ජනතාව විපක්ෂයෙන් අපේක්ෂා කරන්නේ මෙවැනි දෙයක් නොවෙයි. වගකීම්සහගත සහ නිර්මාණාත්මක විවේචනයක් තමයි අපට විපක්ෂයෙන් අවශ්‍ය වෙලා තිබෙන්නේ. නමුත්, අපේ ජනතාවගේ මුදල් අමාත්‍යවරයා වශයෙන් ගරු ජනාධිපතිතුමා අය වැය කථාව ඉදිරිපත් කරන මොහොතේ ජාතියේ මූල්‍ය අනාගතය පිළිබඳ විවාදයකට වඩා, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අවධානය යොමු කළේ පෞද්ගලික වරප්‍රසාද ගැනයි. Personal emoluments ගැන තමයි ඒ ගොල්ලන් අවධානය යොමු කළේ. මේක තමයි ඔවුන්ගේ දේශපාලන ප්‍රමුඛතාවල අවලස්සනම ප්‍රතිබිම්බය; this is the ugliest reflection of their political priorities. මූල්‍ය ස්ථාවරත්වය සහ ජාතික ආයෝජන වර්ධනය පිළිබඳ කරුණු පසෙක තබා ඔවුන්ගේ එකම අරමුණ වුණේ, මන්ත්‍රීවරුන් සඳහා වන ප්‍රවාහන වරප්‍රසාද - duty-free vehicles - ගන්න පුළුවන් ද කියන එකයි. හැමදාම කල්පනා කළේ ඒක අරගෙන විකුණාගෙන කන එක ගැනයි. ඒක ඇත්තටම වාහනයක වරප්‍රසාදයට මුවා වෙලා විපක්ෂයේත් ඉඳගෙනම ජනතාවගේ මුදල් පෞද්ගලිකව තමන් සතු කර ගැනීමට දරන උත්සාහයක්. ඒ අය තවමත් ඒක අතහැර නැහැ. ඒ උදවිය ආණ්ඩු පක්ෂයේ හිටියත්, විපක්ෂයේ හිටියත් මෙතෙක් කල් කළේ ඒක. දැන් අපි ඒවා නතර කරන්න ඕනෑ. මේක පරිවර්තනීය අවස්ථාවක්. මේ පරිවර්තනීය යුගයට අපි මුහුණ දෙන්න ඕනෑ. මේක මේ රට වෙනස් කිරීමේ තීරණාත්මක අය වැයක්; සන්ධිස්ථානයක්.

ඔවුන් ඊළඟට තව කාරණයක් බලාපොරොත්තු වුණා. ඒ තමයි, ප්‍රාදේශීය සංවර්ධනය සඳහා තමන්ගේම නමට මුදල් වෙන් කරන්නේ කොපමණද, කොච්චරද කියන එක. මෙතෙක් කල් කරපු ලොකු සෙල්ලමක් ඒකෙන් කළා. පාරවල් හදන්න මුදල් වෙන් කරගෙන, තමන්ට හිතවත් කොන්ත්‍රාත්කරුවන්ට ඒ පාරවල් හදන්න දීලා, ඒකෙන් ගසා කාලා අවසානයේදී පාරවල් හදලා මුහුණත් තහඩුවත් බෝඩ් එකක ගහ ගන්නවා අපි දැක තිබෙනවා. අහිංසක මිනිසුන්ගේ බදු මුදල්වලින් පාර හදලා, ගොඩනැඟිල්ලක් ඉදිකරලා ඒකට තමන්ගේ නම ගහගන්න ලජ්ජා නැද්ද, මම

[ගරු ලාල් ප්‍රේමනාත් මහතා]

අහන්නේ? ලෝකයේ මොන රටේ ද එහෙම කරන්නේ? ලක්ෂ 5ක් විතර වියදම් කරලා ගමේ පොඩි පාරකට කොන්ක්‍රීට් දාලා, ගමේ ඉන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීගේ ඉඳලා ඒ ගොල්ලන්ගේ ජනාධිපතිවරයාගේ දක්වා මුහුණත් තහඩුවක් ගහනවා. උදේ පාන්දර පාරට බහින්න විධියක් නැහැ, මූසලකම. මෙන්න, රටට ඇති කරපු තත්ත්වය. ඒ දේශපාලනය, ඒ සංස්කෘතිය දැන් අපි වෙනස් කර තිබෙනවා. ඒ උදවිය තවමත් ඒවාට පොරකනවා. තවමත් පොරකනවා එතැනට මුදල් ඇදගන්න. දැන් ඒවා කරන එක ලේසි නැහැ. අපි 159දෙනාම ඒවා ප්‍රතික්ෂේප කරලා මේ පාර්ලිමේන්තුවට ආපු මිනිස්සු. ඒවා වෙනස් කරන්න ඔබතුමන්ලාට ලේසි නැහැ. ඒ නිසා පටු දේශපාලන වාසි තකා රටේ ආර්ථිකය විනාශ කළ එක, අතීතයේ බදු සහන ලබාදීලා ආර්ථිකයේ හිල් හදපු එක, fiscal gaps නිර්මාණය කරපු එක වැරදියි. අද අපි මේ ගෙවන්නේ ඒ ගොල්ලන් ඒ ගනිපු දේශපාලන ණය. ඒක තමයි මේ වෙලා තිබෙන්නේ. මේක තනි තනි පුද්ගලයන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. මේ system එකම ඒ වැරැද්ද කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බදු අය කිරීම කියන්නේ, ණය ගෙවීම වෙනුවට ස්වයංපෝෂණය තහවුරු කිරීමේ මූලික පියවර.

ඒ වාගේම ජාත්‍යන්තර විශ්වාසය සහ ආයෝජන ප්‍රවර්ධනය ගැනත් අපි කථා කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ප්‍රතිපත්තිවල ගැඹුරු සහ ස්ථාවරත්වය ජාත්‍යන්තර ප්‍රජාව වෙත නැවත නැවතත් අවධාරණය කිරීම වැදගත් යැයි මම හිතනවා.

Hon. Deputy Chairperson of Committees, the core ethos of this Budget transcends mere austerity; it is founded upon forging sustainable economic resilience and cultivating a pro-investment climate. Our successful shift from debt overhang to fiscal discipline has been acknowledged globally.

The Government is unequivocally committed to structural and transparent reforms, thereby guaranteeing that both Foreign Direct Investment - FDI - and domestic enterprises are equally protected, encouraged and anchored. This, Madam Chairperson, is the robust foundation of the "New Sri Lankan Economy".

අපගේ ණය ශ්‍රේණිගත කිරීම්වල ස්ථාවරත්වය - stabilized credit ratings - සහ විදේශ විනිමය සංචිතවල ප්‍රගතිශීලී වර්ධනය - progressive growth in foreign reserves - පසුගිය වසරේ අත්කර ගත් ජාත්‍යන්තර විශ්වාසයේ සෘජු ප්‍රතිඵලයක්. 2026 වසරට අදාළ අය වැය මඟින් මෙම ප්‍රාග්ධන ප්‍රවාහයන් - capital inflows - සහ රටේ නිෂ්පාදන ධාරිතාව - productive capacity - ඉහළ නැංවීම සඳහා උපායමාර්ගිකව යෙදවීමට අපේ ආණ්ඩුව අපේක්ෂා කරනවා.

ඒ වාගේම කලාපීය වශයෙන් අපේ ගම් බිම් ගැනත් කථා කරන්න අවශ්‍යයි. ජාතික මට්ටමේ මූල්‍යමය සාර්ථකත්වය ප්‍රාදේශීය මට්ටමේ යථාර්ථයක් බවටත් පරිවර්තනය කිරීම මෙම අය වැයේ මූලික අරමුණක්. එහිදී අපට උදාහරණයක් හැටියට කෘෂි අපනයන සහ වෘත්තීය තාක්ෂණය ගන්න පුළුවන්. ප්‍රාදේශීය උදාහරණයක් ලෙස මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය කේන්ද්‍ර කර ගත් අපේ ප්‍රධාන අපනයන භෝගය වන තේ වගාව ගත්තොත්, එය ජාතික අපනයන ඉලක්කයේ කේන්ද්‍රීය අංගයක්. එබැවින්, තේ දලු නිෂ්පාදනය සඳහා වන මිල සූත්‍රය - price formula- ග්‍රාමීය ආර්ථිකය සහ කුඩා තේ වතු හිමියා ආරක්ෂා කරන ආකාරයෙන් වහා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අප කල්පනා කර බැලිය යුතු වනවා. එසේම මෙම අය වැයෙන් තාක්ෂණික අධ්‍යාපනයට වෙන් කළ ප්‍රතිපාදන,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
මට තව තත්පර 10ක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මම කලින් කිව්වා වගේ දෙනියාය වැනි රටේ ඈත ප්‍රදේශවල නවීන කෘෂි තාක්ෂණය - agritechnology - සහ වටිනාකම් එකතු කිරීමේ ක්‍රියාවලිය - value-added process - ඉලක්ක කර ගත් උසස් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - advanced vocational training centres - පිහිටුවිය යුතුයි.

රටක් මේ වාගේ තීරණාත්මක ලෙස හැරවීමට අපි ගන්නා උත්සාහයට බාධා කරන්න එපා කියලා අපි විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා. ඔබ දැන් මේ රටේ කඩාකප්පල්කාරී පිරිසක් බවට පත් වෙමින් සිටිනවා. ඔබ ඒක හරියට තේරුම් ගන්න. මේ දැවැන්ත වෙනසට ඔබ එකඟ වෙන්න ඕනෑ. ඒ වාගේම මම විපක්ෂයේ නෝනා මහත්වරුන්ගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර මේ දැවැන්ත වෙනස තේරුම් අරගෙන මේකට සහයෝගය දෙන්න කියලා. ලබන අවුරුද්ද අවසන් වෙන්න කලින් අපි අපේ උපරිම කැප කිරීමෙන් මේ සියල්ල ජයග්‍රහණය කරනවා. ගිය වසරේ අය වැය වාගේම -මාස 8ක් සඳහා වූ ඒ අය වැය වාගේම- මාස 12ක් සඳහා වන මේ අය වැයේ සියලු දේත් සාක්ෂාත් කර ගන්න අපි සියලුදෙනා එක මිටට පොරබඳලා සටන් කරනවා කියලා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.20]

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රජයේ දෙවැනි අය වැය වෙනුවෙන් මේ වෙලාවේ කථා කරන්නට ලැබීම පිළිබඳව මම ඉතාම සතුටු වෙනවා.

ගරු ජනාධිපතිතුමා පසුගිය දවසේ පාර්ලිමේන්තුවට අය වැය ඉදිරිපත් කළා. සියලුදෙනාගේම සාකච්ඡාවට බඳුන් වුණා, මෙමඅය වැය පෙනුමත්, හරයත් ඉතාම ඉහළින් තිබෙන අය වැයක් කියලා. පෙනුමට අදාළව හරයත් අන්තර්ගතයි. මේ අය වැය සම්බන්ධව විවිධ මත පළ වුණා; අදහස් හා යෝජනා ආවා. විපක්ෂය පැත්තෙනුත් අදහස් හා යෝජනා ආවා. ඔවුන්ගේ

පැත්තෙන් විවේචනත් සමඟම මෙහි හරයට අදාළව සාධනීය කරුණු ඉදිරිපත් වුණා. එම නිසා අපට පැහැදිලි වෙනවා, විපක්ෂයෙන් ඉදිරිපත් වන විවේචන සමූහය අතරේ සමාජීය දකින්නේ අය වැය ගැන සාධනීය පැත්තකින්. ඒක හොඳයි. තමුන්නාන්සේලා ඒ ගැන සාකච්ඡා කිරීම අපි අගයනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අය වැය තුළ මේ රට ගොඩනඟන වැඩ පිළිවෙළක් පැහැදිලිව ඉදිරිපත් වෙලා තිබෙනවා. මීට පෙර කථා බහ වුණා, නිෂ්පාදන ආර්ථිකය නඟා සිටුවන වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ කියලා. ඒ ගැන මුලින් පුංචියට කිව්වා. හැබැයි අවසන් කළා, මේක හොඳයි කියලා. නමුත්, නිෂ්පාදන ආර්ථිකයට දැවැන්ත හයියක් - ශක්තියක් - ලබා දුන් අය වැයක් මෙදා ඉදිරිපත් වුණා. ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ විධියට නිෂ්පාදන ආර්ථිකයක්, නිෂ්පාදන ආර්ථිකයට මහජනතා සහභාගිත්වයක්, නිෂ්පාදන ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට සාධාරණව බෙදී යෑමේ වැඩ පිළිවෙළක් තමයි අපේ රට තුළ අපේ ආර්ථික ප්‍රතිපත්තිය හැටියට ක්‍රියාත්මක වෙන්නේ. ඒ ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ තුළ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය සඳහා රුපියල් බිලියන 221ක මුදලක් වෙන් කරලා තිබෙනවා අපි දැක්කා. මේක සැලකිය යුතු වෙනසක්. ඒ හරහා නිෂ්පාදන ආර්ථිකයට දැවැන්ත හයියක්, ශක්තියක් ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට ගොඩනඟන්න තිබුණේ බිඳ වැටුණු රාජ්‍යයක්. ඒක අලුතින් ස්ථාපිත කරන්න අපට සිද්ධ වෙලා තිබුණා. බිඳ වට්ටපු ආයතන තිබුණා. ඒවාට යළි පණ දෙන්න අපට වුවමනාවක් තිබුණා. අලුත් ආයතන ස්ථාපිත කරන්න අපට සිදු වෙලා තිබුණා. ඒවා ස්ථාපිත කරන්න අමතර මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න අපට සිද්ධ වුණා. ඒ වාගේම, නාමිකව පැවතුණු ආයතන සක්‍රිය කරන්න අපට සිද්ධ වුණා.

ඒ වාගේම අපි පැවැති දේශපාලන සංස්කෘතිය වෙනස් කළා. මෙතෙක් තිබුණු දේශපාලන සංස්කෘතිය, අවංකභාවය, මේ රට පිළිබඳ හැඟීම ආදියෙන් ඈත් වෙච්ච එකක්. අන්න ඒ සංස්කෘතිය වෙනස් වුණා. අපි විශ්වාස කරනවා, ගත වූ වර්ෂයක කාලය තුළ අපි අපේ රටේ නව දේශපාලන සංස්කෘතියක් ගොඩ නැඟුවා කියලා.

පසුගිය කාලයේ රාජ්‍ය ආයතන ගණනාවක් බිඳ වැටුණා. සමහර ආයතන පාඩු ලබන ආයතන බවට පත් වුණා. මේ රටේ ප්‍රධාන ආයතන 10ක සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සඳහා මුදල් බැර කරලා තිබුණේ නැහැ. සේවක අර්ථසාධක අරමුදල සඳහා මුදල් බැර කරලා තිබුණේ නැහැ. පාරිතෝෂික දීමනා ගෙවලා තිබුණේ නැහැ. එවැනි ආයතන 10ක් ගැන අපි දන්නවා. ඒවා අතර මා නියෝජනය කරන ධීවර අමාත්‍යාංශයට අයත් ලංකා ධීවර සංස්ථාවත්, නෝර්ත් සී සමාගමත් තිබෙනවා. ඊට අමතරව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම ආදි වශයෙන් ආයතන 10ක් පාඩු ලබා තිබෙනවා. පාඩු ලබා තිබෙනවා කියන්නේ, ඒ ආයතන EPF ගෙවලා නැහැ; ETF ගෙවලා නැහැ; පාරිතෝෂික ගෙවලා නැහැ. එකී ව්‍යවස්ථාපිත දීමනා සහ හිඟ බදු නිරවුල් කරන්න රුපියල් මිලියන 11,000ක් අවශ්‍ය වෙනවා. එම නිසා ඒ ආයතන කරගෙන යෑමට අපහසු තත්ත්වයක් තිබෙනවා. මම දන්නවා, මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ඉහත කී ආයතන දෙක නිසා ගැටලුවකට මුහුණ පෑ බව. අපි මේ ගැන රජයත් එක්ක සාකච්ඡා කළා. පාඩු ලබපු එම ආයතනවලට ගරු ජනාධිපතිතුමා 2026 රාජ්‍ය අය වැයෙන් විසඳුමක් ලබා දුන්නා.

නමුත්, විපක්ෂයේ ඔබතුමන්ලා පසුගිය දවස්වල කිව්වේ අපි ඒවා විකුණනවා කියලා නේ. අපි ඒවා විකුණන්නේ නැහැ. ඔන්න බලාගන්න අපි කරලා තිබෙන දේ. පාඩු ලබන රාජ්‍ය ආයතන 10ක් තිබුණා. මට මතකයි ගරු විපක්ෂ නායකතුමා මගෙන් ඇහුවා, ධීවර සංස්ථාව විකුණනවාද කියලා. ඔන්න විපක්ෂ නායකතුමා බලාගන්න අපි කරලා තිබෙන දේ. ලංකා ධීවර සංස්ථාව ඇතුළු රාජ්‍ය ආයතන 10ක් නැවත පණගන්වන්න 2026 අය වැයෙන් රුපියල් මිලියන 5,000ක මුදලක් යොදවා තිබෙනවා. ඒවා තමුන්නාන්සේලා වට්ටපු ආයතන. ඒවා ගොඩනඟන්න අපට සිදු වෙලා තිබෙනවා. රුපියල් මිලියන 11,000ක් පාඩු ලබා තිබෙන එම ආයතනවලට යළි පණ දෙන්න රුපියල් මිලියන 5,000ක් යොදවනවා, 2026 වර්ෂය සඳහා.

අපි ඉතින් විපක්ෂය ගැන දන්නවා නේ. ඇත්තම කියනවා නම්, විපක්ෂයේ අයගේ හෘදය සාක්ෂිය පිළිගන්නවා, මේ අය වැය හොඳයි කියලා. අපි ඒක දන්නවා. ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂිය ECG පටියකට ගත්තොත්, ලස්සනට ශීර්ෂ හා නිම්නවලින් යුත් ECG පටියක් ලැබෙයි කියලා මා විශ්වාස කරනවා. මොකද, ඒ හෘදය සාක්ෂිය නේ. ඔබතුමන්ලා හමු වුණු තැන්වල කථා කරනවා, මෙදා පාර අය වැය ගැන අපට විවේචන නැහැ කියලා. අපි දන්නවා ඒක. ඔබතුමන්ලා තැන් තැන්වල කථා කරනවා, අය වැය ගැන විවේචන නැහැ කියලා. එහෙම නේද? නමුත්, මෙතැනට ඇවිල්ලා මාධ්‍යයට පෙන්වන්න විවේචන ඉදිරිපත් කරනවා.

මීට කලින් කියැවුණා නේ, අපේ ආණ්ඩුවේ විදේශ සංචිත පහත වැටුණා කියලා. පහත වැටිලාද? ඒ ගැන කල්පනා කරලා බලන්න. හරියට සංසන්දනය කරලා බලන්න. ඊළඟට කියලා තිබුණා, ඖෂධ වර්ග 312ක් හිඟයි කියලා. දැන් ගිහින් බලන්න, කොහොමද කියලා. දැන් ගිහින් බලන්න මොකක්ද තත්ත්වය කියලා. මම බොහොම පැහැදිලිව කියනවා, අද වන විට ඒ තත්ත්වය සෑහෙන්න වෙනස් කරලා තිබෙන බව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි නව දේශපාලන සංස්කෘතියක් හදලා තිබෙනවා. කලින් කිව්වා වාගේ මේ දේශපාලන සංස්කෘතියත් එක්ක අපි සමාජයේ වෙනසක් කරලා තිබෙනවා. අද මේ රටේ ඉන්නවා මේ රටට ආදරය කරන නායකයෙක්. ඒ වාගේම, මේ රටට ආදරය කරන රජයක් තිබෙනවා. රට ගොඩ නඟන්න මැදිහත් වෙච්ච ආයතන ගණනාවක් තිබෙනවා. මේ දේශපාලන සංස්කෘතියේ වෙනස ඒකයි. කල්පනා කරලා බලන්න. අපි උදාහරණයක් ගනිමු. ජනතාවට අත්‍යවශ්‍ය දෙයක් තමයි, නිවාස.

පුංචි කාලයේ පරිසරය පාඩමට අපට උගන්වා තිබෙනවා නේ, ආහාර, ඉඳුම්-හිටුම්, ඇඳුම්-පැලඳුම් මිනිසාට අත්‍යවශ්‍ය දේවල් කියලා. නමුත්, නිවාස නොමැති අය මොන තරම් ප්‍රමාණයක් ලංකාව තුළ සිටියාද? පසු ගිය ආණ්ඩු කාලවල එක එක නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක වුණා; ලක්ෂ දෙකක ණයක් දීලා ගෙයක් හදා ගන්න කිව්වා; ලක්ෂ පහක ණයක් දීලා ගෙයක් හදා ගන්න කිව්වා; ලක්ෂ හයක ණයක් දීලා ගෙයක් හදා ගන්න කිව්වා. නමුත් අපේ රජය මේ කියන ලක්ෂ දෙක, පහ, හය විධියට ණයදීම් නොවෙයි කළේ. සෘජුව ලක්ෂ 10ක් දුන්නා. ඒ ලක්ෂ 10න් නිවසක් හදා ගන්න කිව්වා.

මෙවර ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් මේ රට තුළ රුපියල් මිලියනයක් වටිනා නිවාස 3,000ක් ජනතා අයිතියට පත් කරන්න පසුගිය ඔක්තෝබර් මාසයේ 5වැනි දා අපට හැකියාව ලැබුණා. ඒ නිවාසයක දෘශ්‍ය පෙනුම රුපියල් මිලියනයයි. සත්‍ය පෙනුම ගත්තාම, වටිනාකම රුපියල් මිලියන එකහමාරයි. ඒක රුපියල් මිලියන තුනක් වටිනවා කියන්න වුණත් පුළුවන්. මම ගියා මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ අහංගම

[ගරු රත්න ගමගේ මහතා]

ප්‍රදේශයේ හදපු එවැනි නිවසක් භාර දෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එහි ඉදිරිපස ටයිල් කරලා තිබෙනවා; කුස්සිය ටයිල් කරලා තිබෙනවා; pantry එක හොඳට හදලා තිබෙනවා. ඒ වාගේම washroom එක හොඳට හදලා තිබෙනවා. ඒ කොහොමද? ප්‍රජා දායකත්වයෙන්. ගමේ පෙදරේරු ශිල්පීන් ඉන්නවා. ගමේ හිතවතුන් ඉන්නවා. ඊට අමතරව, අපේ කොට්ඨාස සභාවේ නියෝජිතයෝ ඉන්නවා. ශ්‍රම දායකත්වයත්, ප්‍රජා දායකත්වයත් අරගෙන තමයි ඒ කටයුත්ත කරලා තිබෙන්නේ. ඒක නව සංස්කෘතියක්. ඊට අමතරව දකුණු පළාතේ විදුලිබල අමාත්‍යාංශය තීන්දුවක් ගත්තා, අඩු ආදායම් නිවාසලාභීන් සඳහා විදුලිය ලබා දීමේ කටයුත්තත් රජයෙන් කරන්න. කල්පනා කරලා බලන්න, මේ මොකක්ද කරමින් තිබෙන්නේ කියලා. මෙය, මේ රටේ නිවසක් නොමැති ජනතාවට නිවසක් ලබා දීමේ ජාතික ව්‍යාපාරයක් ගොඩනඟනවා හා සමානයි. මම දන්නවා, මඩකලපුව වාගේ ප්‍රදේශවල නිවාස හදන්න රාජ්‍ය නොවන සංවිධාන උදවු කරලා තිබෙන බව. ස්වේච්ඡා සංවිධාන උතුරු, නැඟෙනහිර ප්‍රදේශවලට ඒ සඳහා උදවු කරලා තිබෙනවා. නමුත් අපි මේ ගැන තැන් තැන්වල අඬබෙර ගහමින් යන්නේ නැහැ. මෙය ජාතික ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙනවා. ඒක මතක තියා ගන්න. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය ඒ සඳහා ස්වේච්ඡාවෙන් මැදිහත් වෙනවා. නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරින් අප්‍රතිහත ධෛර්යයකින්, ලොකු කැපකිරීමකින් වැඩ කළා. ප්‍රාදේශීය ලේකම්වරු මහන්සි වෙලා වැඩ කළා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරින් මහන්සි වෙලා වැඩ කළා. යුගයේ පරිවර්තනයක් මේ සිදු වෙන්නේ. ඒක තමයි අපි කිව්වේ, දේශපාලන පරිවර්තනයක් වෙනවා වාගේම ජනතා හදවත් තුළත් පරිවර්තනයක් වෙිගෙන එනවා කියලා. මේ අවුරුදු පහ ඇතුළත ගමන සුබයි - ජය නියතයි. අපි බොහොම පැහැදිලිවයි එය කියන්නේ.

පසුගිය දවස්වල දකුණු පළාතේ සංස්කෘතික මංගල්‍යයක් කළා, දිස්ත්‍රික්ක තුනක. සියලු දිසාපතිවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩල ස්වේච්ඡාවෙන් ඒ වැඩ කළේ. ඒ, OTවලට, බටාවලට නොවන බව මතක තියා ගන්න. ඒ නිසා රාජ්‍ය සේවකයන් පවා මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න දැන් අපිත් එක්ක අත්වැල් බැඳගෙන ඉන්නවා. එහෙම නම් මේ යන්නේ හොඳ තැනකට. අපි දන්නවා, අපි රජය ගන්න කොට තිබුණේ ටිකක් අමාරු තැනක කියලා. නමුත් අපි වසරක කාලයක් තුළ ආකල්පමය වෙනසක් ඇති කළා. දැන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල, ප්‍රාදේශීය ලේකම් කාර්යාවල ක්‍රියාකාරිත්වය වැඩි වෙලා තිබෙනවා. රාජ්‍ය නිලධාරින් දැන් දන්නවා, නායකත්වය, දේශපාලන අධිකාරිය අවංකව වැඩ කරනවා, කැප කිරීමෙන් වැඩ කරනවා, දිවා රෑ මහන්සි වෙලා වැඩ කරනවා කියලා. දැන් ඔවුනුත් එසේ වැඩ කරන්න පටන් ගෙන තිබෙනවා.

මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ නගරාධිපතිතුමන්ලා, ප්‍රාදේශීය සභාවල සභාපතිතුමන්ලා රාත්‍රිය වනකල් වැඩ කරනවා. ඒ අය විශාල වැඩ කන්දරාවක් කරනවා. ස්වේච්ඡාවෙන් ඒ වැඩ කරන්නේ. ඔවුන් ලබන්නේ ආත්ම තෘප්තියක්. එහෙම නම් මොකක්ද වෙන්නේ? මේ යන්නේ හොඳ ගමනක්. පසුගිය දවස්වල මම NAQDA එකට ගියා; CFC එකට ගියා; CFHC එකට ගියා. රාත්‍රී 10.00යි. සභාපතිවරු, කාර්ය මණ්ඩල වැඩ. කුමක්ද, මෙහි බලාපොරොත්තුව? රට හදන චේතනාවයි මේ තිබෙන්නේ. හොඳයි නේද? "පිරිසිදු චේතනා, ගෙන දේ වාසනා!", ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. රට හදන හොඳ තැනකට අපි දැන් ඇවිත් තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

රට හදන හොඳ තැනකටයි මේ අවතීර්ණ වෙලා තිබෙන්නේ. රටේ නායකත්වය හොඳ නම්, නිවැරැදි මාර්ගයක් පෙන්වනවා නම්, රට හදන මාර්ගයට වැඩ පිළිවෙළක් තිබෙනවා නම් ඒ වටා කවුරුත් ඒක රාශි වෙනවා. ඒක බොහොම පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය කාලයේ විපක්ෂය පැත්තෙන් හීන් කෙඳිරියක් ආවා, නිෂ්පාදන ආර්ථිකය වෙනුවෙන් මොකුත් වුණේ නැහැ කියලා. නමුත්, දැන් බලන්නකෝ, වාරි මාර්ග ක්ෂේත්‍රය දිහා. වාරි මාර්ග අමාත්‍යාංශයට ගිය අවුරුද්දේ රුපියල් බිලියන 78ක් වෙන් කළා. මේ පාර බිලියන 91.7යි. එය, සියයට 18.7ක වර්ධනයක්. අපි දැක්කා පසුගිය දවස්වල හැම තැනම වාගේ ඇළ වේලි ශුද්ධ කළා. වාරිමාර්ග ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය එහෙමයි. මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේ යෝජනා ඉදිරිපත් වුණා; වැඩ කළා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය, ලේකම්තුමන්ලා ඉතා වේගවත්ව වැඩ කළා. ඒ නිසා හැම තැනම ඇළ වේලි ශුද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම වාරි මාර්ග පුළුල් වෙලා තිබෙනවා. ඒකට හේතුව මොකක්ද දන්නවාද? ඒක අපට අනියමින් ආ වාසියක්. ඒ තමයි, පසුගිය දිනවල ඇති වුණු දැවැන්ත වර්ෂාපතනය. වෙන දා පළාතටම ගලනවා.

එහෙම වුණාම වෙන දා යන්නේ පාන් බෙදන්න. එහෙම නැත්නම් බත් පැකට් අරන් යන්නේ. දැන් ඉක්මනින්ම ජලය බැස යෑම සිදු වෙනවා. කෘෂි කර්මාන්තය වෙනුවෙන් තමයි අපි ඒ වාරි මාර්ග පුළුල් කිරීමේ කටයුතු කළේ. නමුත් ඒ තුළින් අපට යටිතල පහසුකමකුත් ලැබුණා, ජලය බැස යෑමට. අපි ඒ සියල්ල කරන්නේ පදනමක් සහිතව.

මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙන්නේ වැව් හතරයි. අපි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් යෝජනාවක් ගෙනාවා, තව පොඩි වැවක් හදන්න. ඒක අක්කර හතරක විතර වැවක්. යෝජනාව ගෙනැල්ලා සතියයි, වැව කැපුවා. ආයේ ඉතින් මොකුත් නැහැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව යුහුසුලුව වැඩ කළා. ඒ නිසා විපක්ෂයේ ඔබතුමන්ලා මතක තියාගන්න, ක්‍රියාකාරීව දැන් ඒ කටයුතු සිදු වන බව. නමුත් වෙන දා වාගේ දඟලන්න ගියේ නැහැ; බෝඩ් නැහැ. එතුමාගේ සංකල්පයකට අනුව, මෙතුමාගේ මහ පෙන්වීමෙන්, අහවලාගේ උපදේශකත්වයෙන්, අහවලාගේ නායකත්වයෙන්, අහවලාගේ සහභාගිත්වයෙන් විවෘත වුණා කියලා දෙයක් දැන් වෙන්නේ නැහැ.

ඒ නිසා දැන් රට හොඳ සංස්කෘතියකට යනවා. නිවැරදි ගමනක් යනවා. අපට විශ්වාසයි, මේ වර්ෂ පහ අවසන් වන විට මේ රට නිවැරදි තැනකට යන බව. ඒ අනුව ඉදිරියේදී පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගත කරන්න ජනතාවට අවස්ථාව උදා වෙයි කියා අපි විශ්වාස කරනවා. ඒ සඳහා ශක්තිය, ධෛර්යය ලැබේවා කියාත් මා ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.33]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ගේ කථා අහනකොට තම තමන්ට භාර වෙලා තිබෙන අමාත්‍යාංශවල වැඩ කටයුතු හරියට ඉෂ්ට වෙනවාද කියලා අපට සැකයක් මතු වනවා. මොකද, වෙනත් කාරණා ගැන තමයි එතුමන්ලා ගොඩක් වෙලාවට කථා කරන්නේ. දැන් අපේ ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ ගිහිල්ලා තිබෙනවාද කියලා මම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. නියෝජ්‍ය ඇමතිතුමනි, අවුරුද්දක් තිස්සේ ඔබතුමා ධීවර නියෝජ්‍ය ඇමති. නමුත් මම ඒ ගැන දිගට කථා කරන්නේ නැහැ.

2026 අය වැය යෝජනාවලිය ජනාධිපතිතුමා පැය හතරහමාරක් තිස්සේ ඉදිරිපත් කළා. එහිදී බොහොම ලස්සනට එතුමා කරුණු කාරණා ඉදිරිපත් කළා. හැබැයි අපි දැක්කා, ඒ ඉදිරිපත් කිරීම තුළ වැඩිපුර තිබුණේ දේශපාලන කථාවක් බව. අය වැය කථාවක් තුළින් අපි බලාපොරොත්තු වන්නේ, ඉදිරි වසර තුළ රටේ ආර්ථිකයත්, ඒ ඒ අමාත්‍යාංශවලට වෙන් වන වැය ශීර්ෂත් පිළිබඳව වාගේම රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළට ගන්න රජය දක්වන දායකත්වය පිළිබඳ කරුණු කාරණා. අපි දන්නවා, 2025 අය වැය යෝජනාවලින් තමුන්නාන්සේලා ඉදිරිපත් කළ සංවර්ධන යෝජනා ගණනාවක් ක්‍රියාත්මක වෙලා නැති බව. ඒ බොහෝ යෝජනාවල භෞතික ප්‍රගතිය සියයට 25යි, 30යි. ඒක කොහේ බැලුවත් එකයි. සෑම දිස්ත්‍රික්කයකම ඒ තත්ත්වය තමයි දක්නට තිබෙන්නේ. එතකොට ඒ තත්ත්වය තුළ කොහොමද අපි සතුටු වෙන්නේ?

ආණ්ඩු පක්ෂයේ ගොඩක් මන්ත්‍රීතුමන්ලා කථා කරද්දි කියනවා අපි දැක්කා, "අපි භාර ගන්නකොට රට බංකොලොත්. අපට දුන්නේ ඇදගෙන යන්න අමාරු රටක්" කියලා. හැබැයි අපි පැහැදිලිවම කියන්න ඕනෑ, තමුන්නාන්සේලා 2024 වසර අග භාගයේදී රට භාර ගන්නකොට මේ රට බංකොලොත්භාවයෙන් ඉහළට අරගෙන තිබුණු බව. ඩොලර් මිලියන 6,000ක් විතර භාණ්ඩාගාරයේ තියෙද්දි තමයි හිටපු ජනාධිපතිවරයා තමුන්නාන්සේලාට රට භාර දුන්නේ. ඒක අපට පිළිගන්න වෙනවා. අපි එකඟ වුණත් නැතත් අපට පිළිගන්න වෙනවා, හිටපු ජනාධිපතිවරයාගේ ආණ්ඩුව ඒ අමාරු තැනින් රට ගොඩ අරගෙන දීපු මාර්ගයේ තමයි තමුන්නාන්සේලා දැන් යන්නේ කියන එක. ඒක පිළිගන්නේ නැතුව කොහොමද එතැනින් එහාට යන්නේ? අධිකරණ ඇමතිවරයාගේ කථාවේදී කියනවා මම දැක්කා, තෙල් පෝලිම් තිබුණු, ගෑස් සිලින්ඩර පුපුරපු කාලයක තමයි එතුමන්ලා මේ රට භාර ගත්තේ කියලා. එහෙම කාලයක නොවෙයි තමුන්නාන්සේලා රට භාර ගත්තේ. මේ රටේ ජීවත් වන ජනතාව මෝඩයන්ට අන්දලා කථා කරන එක ගැන අධිකරණ ඇමතිතුමා ලජ්ජා වෙන්න ඕනෑ. එතුමා නොකිව්වේ ඉතිහාසයේ, රජ කාලයේදී වෙච්ච සිද්ධි විතරයි. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා, මේ රට භාර ගත් තැන ඉඳලා මේ වෙනකොට තිබෙන තත්ත්වය සම්බන්ධයෙන්, පසුගිය අය වැයෙන් ඉදිරිපත් කළ යෝජනාවල ප්‍රගතිය සම්බන්ධයෙන් අපට සෑහීමකට පත් වන්න බැරි බව. මේ තුළ ක්ෂේත්‍ර ගණනාවකම ඇති වෙලා තිබෙන තත්ත්වය බලන්න.

තමුන්නාන්සේලා අවුරුදු 76ක් ගැන කථා කරලා තමයි බලයට ආවේ. බලය ගන්න තමුන්නාන්සේලා ඒ වාගේ විශාල දේවල් ජනතාවට කිව්වා. හැබැයි වේදිකාවේ කියපු ඒ කාරණා විතරක් නොවෙයි, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තියම අංශක 180කින් දැන් වෙනස් කරලා තිබෙනවා. තමුන්නාන්සේලා එදා විශේෂයෙන්ම අවුරුදු 76ක් ගැන කථා කළා. ඒ වාගේම තමුන්නාන්සේලාගේ දේශපාලන පක්ෂය අවුරුදු 55ක්, 60ක් තිස්සේ මේ රට තුළ මොකක්ද කළේ? 1971, 1988-1989 කාලයේ ඒ ඇති වුණු තත්ත්වය තුළ එක් පැත්තකින් ජීවිත හානි වුණා, අනෙක් පැත්තෙන් දේපළ හානි වුණා. එතකොට තමුන්නාන්සේලා පෙනී සිටියේ මොන මතවාදයක් එක්කද? හැබැයි, තමුන්නාන්සේලා බලය අරගෙන අද මොකක්ද ක්‍රියාත්මක කරන්නේ? මේ රජය අද කරන මේ ක්‍රියාවලිය දෙස බැලුවාමත්, විශේෂයෙන්ම තමුන්නාන්සේලා කාලයක් තිස්සේ කරගෙන ආ කාරණා දෙස බැලුවාමත්, තමුන්නාන්සේලාගේ ඒ මතවාදය ඉස්සරහට ගෙනෙන්න උත්සාහ කළ කාලය තුළ මොන තරම් විනාශයක් සිදු වුණාද කියලා බලන්න. අද තමුන්නාන්සේලා වැඩකටයුතු කරගෙන යන්නේ ඒ කාරණා සියල්ල පැත්තකට දාලා.

මේ අය වැය පිළිබඳව කරන පොදු සාකච්ඡාවේදී අපට කරුණු කාරණා ගණනාවක් කථා කරන්න තිබෙනවා. අධ්‍යාපනය ගත්තාම, මුලින්ම තමුන්නාන්සේලා කථා කළේ අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරන්න ඕනෑ කියලා. පසුගිය කාලවල ඔබතුමන්ලා පෙනී සිටි පින්තූර බලද්දී මම දැක්කා, ගරු අගමැතිතුමිය ඇඳගෙන හිටපු ටී-ෂර්ට් එකේ ගහලා තිබුණා, "සියයට 6ක් අධ්‍යාපනයට" කියලා. එදා විශ්වවිද්‍යාල සිසුන්, පාසල් සිසුන් පාරට ගෙනාවා, අධ්‍යාපනයට සියයට 6ක් අවශ්‍යයි කියලා. නමුත් බලන්න, අද අධ්‍යාපනය සඳහා වෙන් කර තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳව. ඒ ප්‍රමාණය වැඩි කර තිබෙනවාද? ඒ වාගේම ගිය වර අය වැයෙන් අධ්‍යාපනයට වෙන් කරපු ප්‍රතිපාදන සියල්ල අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කර තිබෙනවාද? තමුන්නාන්සේලාට ඒවා බලන්න පුළුවන්. මේ සංඛ්‍යාලේඛන ඔක්කෝම ඉදිරිපත් කරන්න අපට වෙලාවක් නැහැ. ඒවා ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වන්නේත් නැහැ. තමුන්නාන්සේලා ඒවා බලන්න. ඒ නිසා විශේෂයෙන්ම කියන්න ඕනෑ, පසුගිය අය වැය තුළ කථා කරපු ගොඩක් දේවල් ක්‍රියාවෙන් ඔප්පු කරන්න බැරිවෙලා තිබෙන බව. ඒ නිසා අපි විශ්වාස කරනවා, අඩු ගණනේ මේ අය වැයෙන් වෙන් කර තිබෙන ප්‍රතිපාදන ටිකවත් අධ්‍යාපනය වෙනුවෙන්, ඒ ශිෂ්‍යයන් වෙනුවෙන් යොදවයි, අධ්‍යාපනය ඉහළට ගන්න යොදවයි කියලා.

අධ්‍යාපනය ගැන කථා කරද්දි මම තවත් දෙයක් මතක් කරන්න ඕනෑ. තමුන්නාන්සේලා කිව්වා, පාසල්වලට, ශිෂ්‍යයන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කටයුතු කරනවා කියලා. අද අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ලොකු විෂමතාවක් තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. ජනාධිපතිතුමාගේ කථාවේදීත් කිව්වා, පසුගිය අය වැයේදීත් කියැවුණා, ශිෂ්‍යයන් 50ට අඩු කුඩා පාසල් වහන්න ඕනෑය කියලා යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා කියලා. අපි පැහැදිලිව කියනවා, ඉතා දුෂ්කර ප්‍රදේශ වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ දොඩම්ගස්ලන්ද, මාවතගම වාගේ ආසනවල තිබෙන සමහර ගම්මානවල ළමයි 50ට අඩු කුඩා පාසල් තිබෙන බව. ඒවා වැහුණොත් ඒ දරුවන්ට ඊළඟ පාසලට යන්න ඇත්තටම තිබෙන මාර්ග පහසුකම් මදි. එහෙම වුණොත් කිලෝමීටර 4ක්, 5ක් ඒ දරුවන්ට යන්න වෙනවා. ඒ නිසා මේ විධියට ළමයි 50ට අඩුවෙන් ඉන්න හැම පාසලම වහනවා කියන එක නොවෙයි කළ යුත්තේ. ඒ පාසල්වලට අවශ්‍ය පහසුකම් ලබා දීලා, ඒ එක දරුවෙක්වත් අධ්‍යාපනයෙන් අයින් කරන්නේ නැතිව ඒ අයගේ අධ්‍යාපනය සඳහා අපි අවස්ථාව ලබා දෙන්න ඕනෑ. එහෙම නොවුණොත් වෙන්නේ මොකක්ද? ඇත්තටම ඒ වාගේ දුෂ්කරතා තිබෙන

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

ප්‍රදේශවල පාසල් වැහුවොත් වෙන්නේ මොකක්ද? ඒ ප්‍රදේශවල ගොඩක් තිබෙන්නේ 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පන්ති තිබෙන ප්‍රාථමික පාසල්. ඒ දරුවන්ගේ දෙමව්පියන් විශාල ලෙස දරිද්‍රතාවෙන් පෙළෙනවා. ඒ පාසල් වසා දැමුවොත්, ඒ දරුවන්ගේ පාසල් ගමන ගොඩක් වෙලාවට එතැනින්ම නතර වෙන්න පුළුවන්. ඒ දෙමව්පියන්ට බැරි වෙනවා, ඊළඟ පාසල දක්වා ඒ දරුවන් අරගෙන යන්න. මොකද, පොදු ප්‍රවාහන සේවයක් නැති ප්‍රදේශවල තමයි මෙවැනි පාසල් තිබෙන්නේ. එම නිසා විශේෂයෙන් ඒ ගැන අවධානය යොමු කරන්න කියලා අපි කියනවා. තමුන්නාන්සේලා මැතිවරණවලදී කරපු ප්‍රකාශවලදී විශේෂයෙන්ම කිව්වා, එවැනි පාසල් ආරක්ෂා කරගෙන, ඒ දරුවන්ටත් හැම පාසලකටම තිබෙන පහසුකම් ලබා දෙනවා කියලා. නමුත්, අද වෙනත් දෙයක් තමයි තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරන්න යන්නේ.

ඒ වාගේම මේ කාරණයත් විශේෂයෙන්ම මම කියන්න ඕනෑ. අද ගොවියා ගැන කථා කිරීමේදී කියන්න කනගාටුයි, අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේත් යම් ප්‍රදේශවල, විශේෂයෙන්ම යාපහුව, ගල්ගමුව වැනි ප්‍රදේශවල ජනතාව ලොකු ලූනු වගා කරනවා.

ඒ බව අපේ කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා. නමුත්, මේ වන විට ඒ ගොවීන් ඉතාම අසරණ තැනකට පත් වෙලා තිබෙනවා. ඔවුන් එවැනි තත්ත්වයක් බලාපොරොත්තු වුණේ නැහැ. ලූනු ගොවියා විතරක් නොවෙයි, අල ගොවියා, වී ගොවියා යන මේ සියලු ගොවි ජනතාව තමුන්නාන්සේලා කෙරෙහි ලොකු විශ්වාසයක් තැබුවා. තමුන්නාන්සේලා එදා ගොවි ජනතාවට කිව්වා, "නිසි මිලක් ලබා දෙනවා, නිසි වෙලාවට පොහොර දෙනවා, ගොවියා රැක ගන්නවා" කියලා. ඒ විශ්වාසය මත තමයි විශාල වශයෙන් ගොවි ජනතාවගේ ඡන්දය තමුන්නාන්සේලාට ලබා දුන්නේ. නමුත්, අද ඒ විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. ඒ ගොවි ජනතාව තමන්ගේ කන කර බඩු උකස් කරලා ගොවිතැන් කළත්, අද ඒවා බේරා ගන්න බැරිව ඉතාම අසරණ තැනකට පත් වෙලා ඉන්නවා. ඒ නිසා ඔබතුමන්ලා විශේෂයෙන්ම ගොවියා පිළිබඳව අවධානය යොමු කරන්න වෙනවා. මොකද, අද මේ තත්ත්වය තුළ ගොවියා තව තවත් අසරණභාවයට පත් වෙලා තිබෙනවා. ලූනු නිෂ්පාදනයේ අස්වැන්න එන වෙලාව වනකොට පිට රටින් ලූනු ගෙන ඒම අද විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගොවියාට තමන්ගේ ලූනු ටික විකුණා ගන්න බැරි වෙලා තිබෙනවා. මේ වනකොටත් දඹුල්ලේ ඒ හා සම්බන්ධ ගොවියාගේ දුක් ගැනවිල්ල ඉහළට ඇවිල්ලා තිබෙනවා. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා පැහැදිලිව කියනවා.

ඒ විතරක් නොවෙයි. අද රාජ්‍ය සේවකයන්ට, ඒ වාගේම විශ්‍රාමිකයන්ට ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අද රාජ්‍ය සේවකයාගේ වැටුපට අදාළ විෂමතා ගණනාවක් තිබෙනවා. 2015 - 2020 අතරතුර -මේ අවුරුදු පහ තුළ- රාජ්‍ය සේවකයාගේ මූලික වැටුප දෙගුණයකින් වැඩි වුණා; සියයට 107කින්. ඒ අතරතුර විශ්‍රාම ගිය, විශේෂයෙන්ම 2016ට ඉස්සෙල්ලා විශ්‍රාම ගිය විශ්‍රාමිකයන්ට 2020 ජනවාරි ඉඳලා වැඩි වෙන්න තිබුණු -එකතු වෙන්න තිබුණු- විශ්‍රාම වැටුප ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආණ්ඩුවෙන් නැවැත්වුවා. ඒක තවම අපට හරියට හදා ගන්න බැරි වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා විශ්‍රාමිකයා ගැන ගොඩක් කථා කළා. රාජ්‍ය සේවකයන් සියයට 75ක් විතර තමුන්නාන්සේලාට ඡන්දය දුන්නා. අය වැය ලේඛන දෙකක් තමුන්නාන්සේලා ඉදිරිපත් කර තිබෙනවා. ඒ දෙකෙන්ම යම් යම් සංශෝධන ඉදිරිපත් කළත්, සම්පූර්ණ වශයෙන් විශේෂයෙන්ම විශ්‍රාමිකයාගේ වැටුප් විෂමතා වෙනුවෙන් අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න හැකියාව ලැබිලා නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙනුත් අපි අවධානය යොමු කරවනවා. මොකද, අද වනකොට ජීවන බර ඉහළට ගිහිල්ලා, ඒ අයට ජීවත් වෙන්න බැරි තැනට පත් වෙලා තිබෙනවා.

ජීවන වියදම බැලුවත්, රාජ්‍ය සේවකයාට ලබාදෙන ජීවන වියදමෙන් භාගයයි විශ්‍රාමිකයාට ලබා දෙන්නේ. විශ්‍රාමිකයා කඩේට ගිහිල්ලා බඩු ගන්නකොට එයාගේ බඩුවලට මිල භාගයක් අඩු කරලා දෙන්නේ නැහැ. මේක ඉතාම අසාධාරණයි. එහෙම නම්, ජීවන වියදම කියන එක රාජ්‍ය සේවකයාටත් සමානයි, විශ්‍රාමිකයාටත් සමානයි. රාජ්‍ය සේවකයාට ලබාදෙන ජීවන වියදම් දීමනාවෙන් භාගයයි විශ්‍රාමිකයාට ලබා දෙන්නේ. එම නිසා අපි ඒ ගැනත් අවධානය යොමු කරවනවා. අද මේ කණ්ඩායම් ඉතාම අපහසුතාවට පත් වෙලා තිබෙනවා. මොකද, මේ අයට ජීවත් වෙන්න බැරි මට්ටමට අද භාණ්ඩ මිල ඉහළ ගිහිල්ලා තිබෙන නිසා.

එක පැත්තකින් සේවා අංශය පැත්තෙන් බැලුවාම, තමුන්නාන්සේලා ජනතාවට කිව්වා, "අපි විදුලි බිල අඩු කරලා දෙනවා, විදුලිබල ඇමතිට යන කොමිස් එක අඩු කළාම අපට ඒක කරන්න පුළුවන්" කියලා. ඒ වාගේම තමුන්නාන්සේලා කිව්වා, ඉන්ධන මිල අඩු කරනවා කියලා. විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වශයෙන් සිටි කංචන විජේසේකර ඇමතිතුමාට යන කොමිස් මුදල අඩු කළාම ඉන්ධන අඩුවට දෙන්න පුළුවන් කිව්වා. එහෙම කියලා තමයි ජනතාව රැවැට්ටුවේ. තමුන්නාන්සේලා එදා මිල සූත්‍රයට නොයෙකුත් දේවල් කිව්වා. නමුත් අද වනකොට ඒ අඩු කිරීම් කරන්න, ජනතාවට ඒ සහන ලබා දෙන්න හැකියාවක් ලැබිලා නැහැ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, අද වනකොට මේ රටේ දුප්පත්කම වැඩි වෙලා තිබෙනවාය කියන එක. අපි ඒක පිළිගන්න ඕනෑ. අපි හිතන්නේ නැති කණ්ඩායම් අද ඉතාම අසරණභාවයට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මධ්‍යම පන්තියට ඇවිල්ලා ජීවත් වුණු කණ්ඩායම් ගණනාවක් අද ඉතාම අසරණභාවයට පත් වෙලා තිබෙනවා. ඒ අයට වාහනයක් තිබෙනවා, ගෙයක් තිබෙනවා, දරුවා හොඳ පාසලකට යනවා. නමුත්, ඒ අයට ලැබෙන වැටුප ප්‍රමාණවත් නැහැ. විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක් අප සමඟ කිව්වා, එතුමාට ලැබෙන වැටුපෙන් එතුමාගේ වාහනයට ගෙවන්න තිබෙනවා, නිවාස ණය ගෙවන්න තිබෙනවා, ඒ දේවල් කළාම එතුමාට ජීවත් වෙන්න ඉතුරු වෙන්නේ රුපියල් 50,000ට අඩු ගණනක් කියලා. පවුලේ තුන්හතර දෙනෙකු ජීවත් වනවා. එවැනි තත්ත්වයක් තුළ මධ්‍යම පන්තියේ හොඳ ජීවිතයක් ගත කරමින් හිටපු විශාල පිරිසකටත් මේ රටේ ඇති වුණු ඒ අවාසනාවන්ත තත්ත්වය තුළ අද එතැනින් ගොඩ එන්නට බැරි වෙලා තිබෙනවා. එවැනි කණ්ඩායම්වල ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කරන්න තමුන්නාන්සේලා මේ අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙන යෝජනා මොනවාද?

අපි නිෂ්පාදන ආර්ථිකයක් ගැන කථා කරනවා. නිෂ්පාදන ආර්ථිකයකට විශාල හයියක් දෙන්නේ කවුද? ඒ තමයි කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන්. අපේ රටේ කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන්ට දැන් මොකක්ද වුණේ? කොවිඩ් වසංගතය නිසා රටේ ඇති වුණු තත්ත්වයේදී සහ රට බංකොලොත් වෙද්දී කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත ගණනාවක් කඩා වැටුණා. එම කර්මාන්ත කඩා වැටුණාම ඔවුන්ගේ දේපළ විකුණා ණය පියවීමට බැංකු විසින් යම් සහන කාලයක් ලබා දුන්නා. කර්මාන්තයක් ආරම්භ කරලා, රැකියා ලබා දීලා රටට ශක්තියක් වූ ගොඩක් දෙනෙකුගේ පෞද්ගලික දේපළ පවා අද බැංකුවලට උකස් වෙලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් ගණනාවක් කඩා වැටිලා තිබෙනවා. එම නිසා

රටට රැකියා විශාල ප්‍රමාණයක් අහිමි වෙලා තිබෙනවා. මේවා සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ අය වැයේ තිබෙන යෝජනා මොනවාද? යම් යම් යෝජනා තිබෙනවා. අපි නැහැ කියන්නේ නැහැ. නමුත්, මේ කර්මාන්ත නැවත සක්‍රිය කරලා, එම කර්මාන්තකරුවන් දිරි ගන්වලා, රැකියා අහිමිවූවන්ට නැවත රැකියා ලබා දීලා ඔවුන් ගොඩගන්න තමුන්නාන්සේලාගේ අය වැයේ තිබෙන යෝජනා මොනවාද? ගිය වසරේ මේ සඳහා තිබුණු යෝජනාවලිනුත් සාර්ථක ප්‍රතිඵල තිබුණේ නැහැ. අපි දැක්කා කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් කථා කරනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, ඒ අය මේ අය වැය ගැන කථා කරද්දී පැහැදිලිවම කියනවා, ඒ අය ඉතාම අමාරු තත්ත්වයකට වැටුණා කියලා. අපට මතකයි සංගමයක් හැටියට කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව හදන්න විශාල සහයෝගයක් ලබා දුන් බව. නමුත් එම ක්ෂේත්‍රයට අවශ්‍ය සහයෝගය රජයෙන් ලැබිලාත් නැහැ. ඒ නිසා අද ඒ අය ඉන්නේ කලකිරීමෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අය වැයේ නිෂ්පාදන ආර්ථිකයක් ගැන කථා කරනවා. එහෙම නම් නිෂ්පාදන ආරම්භ කරන්න අවශ්‍ය සහයෝගය කර්මාන්තකරුවන්ට ලබා දිය යුතුයි. ජනාධිපතිතුමා කිව්වා, එක කවුළුවකින් මේ වැඩකටයුතු ක්‍රියාත්මක කර ගැනීමට වැඩ පිළිවෙළක් හදනවා කියලා. මොකද, ගොඩක් ආයෝජකයන්ට ආයෝජන කරන්න, කර්මාන්තය පටන් ගන්න ගියාම ප්‍රශ්න ගණනාවක් එනවා. එම ප්‍රශ්නවලට විසඳුම් නැති නිසා තමයි ගොඩක් දෙනා ඒවා අත හැර දමන්නේ. දේශීය ව්‍යාපාරිකයන් වෙන්න පුළුවන්, විදේශීය ව්‍යාපාරිකයන් වෙන්න පුළුවන් ඒ අයට අවශ්‍ය සහාය ලබා දීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තිබුණාට, ගොඩක් තිබෙන්නේ බාධා තමයි. ගිය වර අය වැයේදීත් එය කිව්වා. අපි කියනවා, ඉතා ඉක්මනින් මෙම වැඩ පිළිවෙළ ආරම්භ කරන්න කියලා. එහෙම නොවුණොත් එය විශාල ප්‍රශ්නයක්. මොකද, මේ රටේ දැනට නිෂ්පාදන කර්මාන්තයේ යෙදී සිටින ව්‍යාපාරිකයනුත් වෙනත් රටවලට යන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. දැන් ඒක තමයි සිද්ධ වෙන්නේ. ආයෝජකයන්ට විශ්වාසය ඇති කරන්න ඕනෑ. ආයෝජන සඳහා තිබෙන බාධා ඉවත් කරන්න ඕනෑ. එක පැත්තකින් ගත්තාම අපේ විදුලි බිල. දකුණු ආසියාවේ රටවල් අතර දැන් විදුලි බිල වැඩිම රට බවට අපේ රට පත් වෙලා තිබෙනවා. විදුලි බිල අඩු කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළකට යන්නේ නැතුව, "අපි නිෂ්පාදන අර්ථිකයක් හදනවා, අපි මේක කරනවා, අපි අරක කරනවා" කිව්වාට ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නමුත් මේ අය වැය තුළින් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් තිබෙන බව අපි දකින්නේ නැහැ. ලස්සනට කථාව ඉදිරිපත් කළාට, රටේ ජනතාවට ප්‍රායෝගිකව ප්‍රතිඵල ලබා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් මේ අය වැය තුළ දකින්න නැති බව මා මතක් කරන්න කැමැතියි.

මා අවසාන වශයෙන් කියන්නේ මෙයයි. 2025 අය වැයෙන් තමුන්නාන්සේලා ගෙනාපු ගොඩක් යෝජනා ක්‍රියාත්මක වුණේ නැහැ. එම නිසා 2026 අය වැයෙන් ගෙනැවිත් තිබෙන සියයට 75කට වඩා වූ මේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන්න උත්සාහ කරන්න කියමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රියාස් ෆාරුක් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුදල් අමාත්‍යවරයා වශයෙන් ජනාධිපතිතුමා විසින් 2026 වසර වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැය සම්බන්ධයෙන් වූ විවාදයේ දෙවැනි දවසේ කථා කරන්නට ලැබීම ගැන මා සතුටු වනවා.

ඇත්තටම අපි කවුරුත් දන්නවා, අවුරුද්දක් තුළ රටේ ආර්ථිකය ස්ථාවර කරගෙනම අපේ ආණ්ඩුව මෙම අය වැය ඉදිරිපත් කරලා තිබෙන බව. අපට මතකයි, අපි පසුගිය අය වැය ඉදිරිපත් කළාම ගොඩක් කට්ටිය අපට උපදෙස් දුන්නා. ඒ වාගේම තමයි මේ සැරේත්. ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාත් උපදෙස් ගොඩක් දීලා ගියා.

ගිය සැරේ උපදෙස් දුන් එක මන්ත්‍රීවරයෙක් කිව්වා, "ආර්ථිකය ගැන අපි තමයි දන්නේ, ඔබතුමන්ලා වාහන ගෙන්වන්න අනුමත කරලා තිබෙනවා, ඒක කරන්න එපා, ආර්ථිකය වැටෙයි, රට වැටෙයි, ඩොලර් නැති වෙයි" වාගේ ගොඩක් දේවල්. මේ සැරේ එතුමාම කියනවා, "හොඳ අය වැයක්, ලංකාව රුපියල්වලින් උතුරලා යනවා" කියලා. චාමර සම්පත් මන්ත්‍රීතුමාටත් ලබන සැරේ කියන්න වෙන්නේ, "ඩොලර් උතුරලා යනවා" කියලායි. මම නම් කියන්නේ ඔබතුමන්ලා අපට උපදෙස් දීලා වැඩක් නැහැ කියලායි. ඔය උපදෙස් දෙන අය අවුරුදු හැත්තෑ ගාණක් ආණ්ඩු කළා නේ. අපි දැන් අය වැයෙන් වෙන් කරන මුදල්වලට වැඩ කරන්න ඕනෑ. ඒ වැඩ කරන්න ඔබතුමන්ලා අපට සහයෝගය දෙන්න.

ඔබතුමන්ලා කවුරුත් දන්නවා, රජයේ නිලධාරින් පිළිබඳව. උදාහරණයකට ගත්තොත්, අකුරණ ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය අපිත් එක්ක හොඳට වැඩ කරගෙන යනවා. ඒගොල්ලන් ඉරිදාත් වැඩ කරනවා, පෝය දවසටත් වැඩ කරනවා. සමහර වෙලාවට වැඩ පරක්කු වෙලා නම් රෑ වෙනකම් අපිත් එක්කම වැඩ කරනවා. ඒ වාගේම සමහර අය ඉන්නවා, පරණ සංස්කෘතියේම ඉන්න.

මම උදාහරණයකට ගන්නවා, අකුරණ. අපි කවුරුත් දන්නවා, අකුරණ ප්‍රදේශයේ තිබෙන ගංවතුර ප්‍රශ්නය. ඒක අවුරුදු ගාණක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. ඒ ගැන මේ පාර්ලිමේන්තුවේදීත් කිහිප සැරයක් කථා කරලා තිබෙනවා. ඒ ප්‍රශ්නය ඉවර කර ගන්න ඕනෑ. මැතිවරණ කාලයට නුවරට ඇවිල්ලා සමහර මන්ත්‍රීවරු ඒ ජනතාවගේ ඡන්දය ගත්තා. කොහොමද ඒ ඡන්ද ගත්තේ? ඒ ප්‍රශ්නය පෙන්වනවා, ගංවතුර ප්‍රශ්නයට විසඳුම කියලා පොතක් ගහනවා. පොතක් ගහලා පෙන්වලා ඡන්දය දිනාගෙන කොළඹ ආවාම ඒ පැත්තට එන්නේත් නැහැ, බලන්නේත් නැහැ. අන්තිමට කියනවා, "මම ජාතික නායකයෙක්, මට එතැනට ඇවිල්ලා බලන්න වෙලාව නැහැ" කියලා. අපි දන්නවා, මේ ගංවතුර ප්‍රශ්නයට හේතු කිහිපයක් තිබෙන බව. එකක් මහවැලි ගඟ. අනෙක් එක අනවශ්‍ය ඉදිකිරීම්. අනෙක් එක පස් සහ වැලි පිරිලා තිබීම. ඒ පස් සහ වැලි පිටින් ගෙනැල්ලා පුරවලා නොවෙයි. අනවසර ඉදිකිරීම් කරනකොට එතැනින්ම කපලා දාපු පස් තමයි තිබෙන්නේ. පසුගිය කාලවල ප්‍රාදේශීය සභාවලින් ඒක තමයි කළේ. මේ ඇළ තියාගෙන දේශපාලනය කළා. දැන් ඒවා අපටම ආපහු හරවලා ගහනවා.

දැන් ගංවතුරක් ආවාම රුපියල් කෝටි ගානක අලාභයක් වෙනවා. මම මේ ප්‍රශ්නය කථා කරන්න ගත්තේ, දැන් ආයෙත් මේ අනවසර ඉදිකිරීම් පටන් ගත්ත නිසායි. මේ ඉදිකිරීම් පොඩි කාලයක් නතර කරලා තිබුණා. සමහර විට ඔබතුමන්ලාත්

[ගරු රියාස් ෆාරුක් මහතා]

දන්නවා, අපේ NPP ප්‍රාදේශීය සභාත් තිබෙනවා, අපේ නොවන සජබය සහ වෙනත් පක්ෂ team එකක් විධියට එකතු වෙලා හදපු ප්‍රාදේශීය සභාත් තිබෙන බව. ඒවාත් එක්ක පසුගිය කාලවල වැඩ කළ සමහර නිලධාරින් ඉන්නවා, දැන් වෙන විධියකට මේ දේ කරන. උදාහරණයක් ගත්තොත්, මේ අනවසර ඉදිකිරීම් කරන්නේ සෙනසුරාදා, ඉරිදා, නිවාඩු දිනවල සහ දෙසැම්බර්වල උසාවිය නිවාඩු කාලවල. මම ගිය සතියේ දැක්කා, ප්‍රාදේශීය ලේකම්තුමියගේ කාර්යාලය ඉස්සරහත් අනවසර ඉදිකිරීමක් කරලා තිබෙනවා. මේක නතර කරන්න අපි විතරක් මැදිහත් වෙලා හරියන්නේ නැහැ. මුළු අකුරණ ජනතාවම මේ සඳහා මැදිහත් වෙන්න ඕනෑ. අපි දැන් plan එකක් හදනවා, ගංවතුර ප්‍රශ්නයත් ඉවර කරගෙන අකුරණ ටවුම දියුණු කරන්න. ඒ plan එකට සාමාන්‍යයෙන් රුපියල් කෝටි 2,000කට වැඩිය යාවි.

මම ඊයේ රෑ පරක්කු වෙලා අකුරණට ගියේ. උදේ පාන්දර 5.30ට මම ටවුමේ පල්ලියට ගියා, වඳින වෙලාවට. කාර් එක නතර කළ ගමන් එක්කෙනෙක් ඇවිල්ලා කාර් එකට තට්ටු කළා. මම ඇහුවා, කවුද තට්ටු කරන්නේ කියලා. රියදුරු මහත්මයාත් upset වුණා. ඒ කෙනා හදිසියෙන් වාගේ ඇවිල්ලා කියනවා, අපට වාහනය ගන්නලු, ලොරියකින් බඩු වගයක් බානවා කියලා. බලනකොට ලොකු සිලින්ඩර් වගයක්. ඇළ අයිනේ බිල්ඩින් හදන්න සිලින්ඩර් වගයක් බානවා. ඒක කාටවත් තේරෙන්නේ නැහැ, රෑට බානවා, උදේට කඩ වහනවා, ඇතුළේ වැඩ කරනවා. සමහර වෙලාට නිලධාරින්ට මොනවා හරි දීලා ෂේප් කර ගත්තා කියමුකෝ.

ඒ වාගේ දේවල් රෑට කරනකොට අපට ඒවා වළක්වන්නත් බැහැ. ඒ බිල්ඩින් එහෙම හදන්න පුළුවන්. හැබැයි, පසුව අපටම තමයි ඒවායෙන් වන අලාභය දරාගන්න වෙන්නේත්. ඒ නිසා අපි නිලධාරින්ටත්, ගමේ මිනිස්සුන්ටත් කියනවා, එවැනි කටයුතුවලින් ඉවත් වෙන්න කියලා. අපි ඒ වාගේ කටයුතුවලින් ඉවත් වෙලා රට දියුණු කරන්න ඕනෑ.

ඔයගොල්ලන් දන්නවා, මේ ආණ්ඩුව කරන දේවල් ගැන. අද වන විට ප්‍රාදේශීය සභාවලට සල්ලි නැහැ. නමුත් අපි ප්‍රාදේශීය සභාවලට අයිති පාරවල් හදනවා. RDA එකට අයිති කානු හදනවා, බැමි හදනවා. ඒවා හදාගෙන යන ගමන් පවතින්නේ. හැම තැනකම වාගේ දැන් වැඩ කරගෙන යමින් පවතින්නේ. ඒ නිසා අපට සහයෝගය දෙන්න කියා මා ඉල්ලනවා. ඒ වාගේ මාර්ගයක් හදන්න අපි තීරණයක් ගත්තා. රුපියල් මිලියන 77ක් ඒ සඳහා වැය වෙනවා. ඒක ප්‍රාදේශීය සභා පාරක්. ඒකට tenders open කරලා වැඩ පටන් ගන්න ඔන්න මෙන්න තිබෙන්නේ. ඒ අතර ඒකට කොන්දේසි දමනවා, සමහර ආයතනවලින්. එහෙම කරන්නේ මේ වැඩේ block කරන්නයි.

මෙවර අය වැයෙන් වෙන් කර තිබෙන මුදල්වලින් ලබන වසරේ අපට වැඩ ගොඩක් කරන්න තිබෙනවා. ඒ නිසා හැම ආයතනයකින්ම, හැම නිලධාරියෙකුගෙන්ම ඒකට සහයෝගය දෙන්න කියා මම ඉල්ලනවා. ඒ වාගේම අපට සහයෝගය දෙන්න කියා තමතමන්ගේ ආසනවල ඉන්න අයටත් කියන්න කියලාත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියන්න කැමැතියි. කකුලෙන් අදින්නේ නැතුව අපට සහයෝගය දෙන්න කියන්න. මෙවර අය වැයෙන් වැඩිකර ලබා දී තිබෙන මුදලින් ගම දියුණු කරන්න, රට දියුණු කරන්න අපි වැඩ කරන්න ඕනෑ.

පසුගිය අය වැයෙන් වෙන් කර තිබෙන මුදල්වලින් ආණ්ඩුව වැඩ කටයුතු කරමින් පවතින මේ මොහොතේ, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් කථා කරන දේවල් දිහා බැලුවාම ඒගොල්ලන්ට තිබෙන්නේ ඊර්ෂ්‍යාවද, එහෙම නැත්නම් දැනුවත්භාවයක් නැතුව කථා කරනවාද කියා අපට හඳුනා ගන්න බැහැ. ඒ නිසා මම කියන්නේ මේකයි. ඔයගොල්ලන් අවුරුද්දක් පසුපසට ගිහිල්ලා හිතා බලන්න. පසුගිය අය වැය ඉදිරිපත් කළ වෙලාවේ කිව්වේ මොනවාද? හැබැයි, රට තුළ වුණේ මොනවාද? ඔයගොල්ලන්ගේ කාලයේදී වැරදුණා කියලාත් කියනවා. වැරදුණා තමයි. ඒ කාලයේ බැංකුවල තිබුණු සල්ලි දිහා බලාගෙන ඉන්න බැරිකමක් තිබුණා නේ. අපි බැංකුවල සල්ලි තබාගෙන ඉන්නකොට, ඔයගොල්ලන්ට පොඩ්ඩක් අමාරුයි වාගේ අපට පෙනෙනවා. නමුත් 2027 වසර වන විට ඩොලර් සහ රුපියල් අපේ රට තුළ උතුරා යනවා කියන කාරණය සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තූතියි. ආයුබෝවන්!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.*

[අ.භා. 4.00]

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවට අය වැය ලේඛන 80ක් ඉදිරිපත් වෙලා තිබෙනවා. එම අය වැය ලේඛන 80න් 2කට සෘජුවම ජාතික ජන බලවේගය වගකියනු ලබනවා. ඒ

දෙකට අමතරව ඉතිහාසයේ ඉදිරිපත් වූ අය වැය ලේඛන 78කටම අද විපක්ෂයේ ඉන්න මහත්වරු වග කියන්නට ඕනෑ කියලා අපි විශ්වාස කරනවා.

අපි කොතෙක් සාර්ථකද, අසාර්ථකද කියන එක අපට නිර්ණය කරගන්න පුළුවන් වන්නේ කාරණා දෙකක් මතයි. ඉන් එක් කාරණාවක් තමයි, අපි ඉදිරිපත් කළ අය වැය ලේඛන දෙක මීට පෙර මේ රට පාලනය කරපු පාලක පන්තිය විසින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අය වැය ලේඛනවලට වඩා හොඳද, නරකද කියන එක. දෙවැනි තක්සේරුව තමයි, අපි 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනයට වඩා ඉදිරි ගමනක් යෑමේ හැකියාව 2026 අය වැය ලේඛනය තුළ තිබෙනවාද, නැද්ද කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙයින් පළමුවැනි කාරණය වන, අපි ඉදිරිපත් කරපු අය වැය ලේඛන, මීට පෙරාතුව ඉදිරිපත් කරපු අය වැය ලේඛනවලට වඩා සාධනීය තැනක තිබෙනවාද, නැද්ද කියන එක අපට දැන් තහවුරු කරගන්න පුළුවන්.

විශේෂයෙන්ම 2023, 2024 සහ ඊට පෙරාතුව පැවති වර්ෂවලදී ඉදිරිපත් වෙච්ච අය වැය ලේඛනවල රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කළාට, ඒ ඇස්තමේන්තු කරපු මුදල උපයා ගන්නට ඔවුන් සමත් වුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා විශාල අය වැය පරතරයක්, හිඟයක් ඔවුන් සතුව තිබුණා. විශේෂයෙන් මම සඳහන් කරන්න ඕනෑ, 2023 ඔක්තෝබර් මාසය වනකොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව රුපියල් කෝටි ලක්ෂයක් අය කරගෙන තිබුණේ නැති බව. ඔවුන්ගේ පාලන කාලයේදී රුපියල් කෝටි ලක්ෂයක් අයකර ගන්නට අසමත් වෙලා තිබුණා. හැබැයි, අද ඒ වෙනුවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව අපි අපේක්ෂා කරපු ආදායම් ඉලක්ක අභිභවා යමින් මේ රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් තමන්ගේ කාර්යභාරය ඉෂ්ට සිද්ධ කරමින් ඉන්නවා. පසුගිය කාලයේ මේ රට පාලනය කරපු පාලකයන්ගේ හැසිරීමෙන් ප්‍රකට වුණේ ණය බර ඉහළ යෑම ඔවුන්ට ප්‍රශ්නයක් නොවන බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2023 ඔක්තෝබර් 26වැනි දා ලෝක බැංකුව නිකුත් කළ ලෝක සංවර්ධන දර්ශක පිළිබඳ වාර්තාවට අනුව රටේ ආදායමින් සියයට 71.62ක් රට විසින් ගනු ලැබූ ණය පොලී ගෙවීමට වැය කරන එක රටයි ලෝකයේ තිබුණේ. ඒ රට තමයි, අපේ රට. රටේ ආදායමින් සියයට 71.62ක් ණය පොලී වාරිකය ගෙවන තැනට අපේ රට පරිවර්තනය කරලා තිබුණා. එහෙම කරන ලෝකයේ එකම රට බවට අපේ රට ඇද දමලා තිබුණා. නමුත් අපි ක්‍රමානුකූලව අපේ රටේ ආර්ථිකය ඉතා හොඳ දිශාවකට පරිවර්තනය කර ගත්තා.

දෙවන කාරණාව, 2025 අය වැය ලේඛනයට වඩා 2026 ඉදිරි වර්ෂය සඳහා ඉදිරිපත් කළ අය වැය ලේඛනය ශක්තිමත්ද, නැද්ද කියන එකයි. ආණ්ඩු පක්ෂය විධියට අපි ප්‍රකාශ කරනවාට වඩා ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ඒකට ඉතාම හොඳ නිර්වචනය ලබා දුන්නා. එතුමා විපක්ෂ නායකතුමාගේ කණ්ඩායමේ ඉන්න දක්ෂතම පිතිකරුවා. ඒ වාගේම, හොඳට ලකුණු ගන්න පුළුවන්, හොඳට පහර දෙන්න පුළුවන් ආරම්භක පිතිකරුවා. 2025 අය වැය ලේඛනය පිළිබඳ විවාදය වෙනුවෙන් කථා කරන්න එතුමා පළමුවෙන්ම එච්චා. එතුමා හතර අතේ පහර දුන්නා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සංඛ්‍යාලේඛන, දත්ත අරගෙන 2025 අය වැය ලේඛනය ගැන මේ පාර්ලිමේන්තුව තුළ විශාල විවේචනයක් කළා. හැබැයි, 2026 අය වැය ලේඛනය ඉදිරිපත් කළාට පස්සේ, 2025දී opening batsman විධියට ඇවිල්ලා හොඳට bat කරපු ක්‍රීඩකයා විපක්ෂ නායකතුමාට කියලා ආවා, "මාලිමාව ඉතාම හොඳට ball කරනවා. ඒ නිසා පන්දුවට පහර දෙන්න නම් බැහැ. පසු පාදයේ ඉඳලා කඩුල්ල ආරක්ෂා කරගෙන ගෙදර එන්නම්" කියලා. ඒ නිසා තමයි එතුමා කිව්වේ, සාර්ව ආර්ථිකය ස්ථාවර කරපු අය වැයක්, ඉතිහාසයේ පළමුවැනි වතාවට මහ භාණ්ඩාගාරය රුපියල්වලින් පිරිලා තිබෙන අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා එතුමාගේ කථාවෙන් පසුව මම අදත් දවස පුරාම බලාගෙන හිටියා, විපක්ෂය මොන තරම් අන්ත අසරණ වෙලා සිටිනවාද කියලා. අපට මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඇත්තටම පෙනෙන්න තිබෙන්නේ විපක්ෂයක් නොවෙයි, මැනිං මාර්කට් එක. ඒ සියලු කරීකයන් අද අසමත් වුණා, අල සහ ලූනුවලින් තොරව එතුමන්ලාගේ කථාව කරන්න.

කාලයකට හාල් අල්ලා ගන්නවා, කාලයකට පොල් අල්ලා ගන්නවා, කාලයකට ලුණු අල්ලා ගන්නවා, කාලයකට අල අල්ලා ගන්නවා, කාලයකට ලූනු අල්ලා ගන්නවා. අල, ලූනු විපක්ෂයක් තමයි අද දවස පුරාම දක්නට ලැබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අවුරුද්දේ අපි ඉදිරිපත් කරපු අය වැය ලේඛනයෙන් රාජ්‍ය ආදායම විධියට රුපියල් බිලියන 4,990ක් එකතු කර ගන්නට අප ඇස්තමේන්තු කළා. හැබැයි, අද අපි ඒ අගය ඉක්මවා යමින් රුපියල් බිලියන 5,100 දක්වා අපේ රාජ්‍ය ආදායම් ඉහළ නංවා ගන්න සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම අපි 2025 අවුරුද්දේ රාජ්‍ය වියදම් විධියට ඇස්තමේන්තු කළා, රුපියල් බිලියන 8,835ක්. එළඹෙන 2026 වර්ෂයේ රාජ්‍ය ආදායම රුපියල් බිලියන 5,305 දක්වා අපි වැඩි කරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රුපියල් බිලියන 4,990 ඉඳලා රුපියල් බිලියන 5,305 දක්වා රාජ්‍ය ආදායම වැඩි කර ගන්නකොට බදු නොවන ආදායම තමයි වැඩිපුර වැඩි කරගෙන තිබෙන්නේ. ඒක තමයි වැදගත්ම කාරණාව. 2025දී රුපියල් බිලියන 400ක බදු නොවන ආදායමක් අපේක්ෂා කළා. හැබැයි, අපි 2026දී අපේක්ෂා කරනවා, රුපියල් බිලියන 455ක බදු නොවන ආදායමක්. 2025දී රුපියල් බිලියන 3,845ක් වෙච්ච අය වැය හිඟය, මෙවර අපි අඩු කර ගන්න සමත් වෙලා තිබෙනවා, රුපියල් බිලියන 3,675ක් දක්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2025 අය වැය ලේඛනයෙන් රාජ්‍ය වියදම විධියට රුපියල් බිලියන 8,835ක් වෙන් කළේ මේ නිසායි. විශේෂයෙන්ම රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සහ වේතන ගෙවීම සඳහා රුපියල් බිලියන 1,232ක් වෙන් කළා. හැබැයි, මෙවර රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමත් එක්ක රුපියල් බිලියන 1,464ක් දක්වා රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සහ වේතන ගෙවීම සඳහා මුදල් වෙන් කර තිබෙනවා. ඒ වාගේම අපි විශ්‍රාම වැටුප් දීමනා වැඩි කළා. 2025දී විශ්‍රාමික වැටුප් දීමනාව සඳහා රුපියල් බිලියන 431ක් වෙන් කළා. මේ වතාවේ එය අපි රුපියල් බිලියන 510ක් දක්වා වැඩි කරලා තිබෙනවා.

අපි 2025 අය වැයෙන් වෙනත් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් බිලියන 1,073ක් වෙන් කළා. හැබැයි, 2026 වනකොට අපි මේ මුදල රුපියල් බිලියන 1,131 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාග්ධන වියදම් සඳහා අපි 2025දී රුපියල් බිලියන 1,315 වෙන් කළා. හැබැයි, 2026දී එය රුපියල් බිලියන 1,380 දක්වා වැඩි කරලා තිබෙනවා.

මම දැක්කා, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ප්‍රකාශ කරනවා, 2025 අය වැයෙන් වෙන් කරපු ප්‍රාග්ධන මුදල්වලින් විශාල ප්‍රමාණයක් අපි ආයෝජනය කර ගන්නට අසමත් වෙලා තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා 2025 අය වැයෙන් රුපියල් බිලියන 1,315ක් වෙන් කළා. ඒ රුපියල් බිලියන 1,315න් මේ වනකොට රුපියල් බිලියන 1,033ක් ප්‍රාග්ධන වියදම් විධියට වැය කර අවසාන කර තිබෙනවා.

[ගරු සුනිල් රත්නසිරි මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් කියන්නට තිබෙන්නේ මේකයි. ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, අපේ රටේ දිළිඳු බව තුරන් කිරීම සඳහා ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගන්නා බවත්, දූෂණය කියන්නේ දුප්පතුන් මත පටවන ලද බද්දක්, අපගේ සංවර්ධනය වෙළා ගත් විලංගුවක් බවත්. ඒ විලංගුවෙන් අපේ රටේ ජනතාව මුදාගෙන අපේ රට නිවැරදි ආර්ථික දිශානතියක් කරා අරගෙන යන අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්න සමත් වීම ගැන අපි සතුටු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.12]

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අභියෝගාත්මක වසරක පුරවැසි අය වැයක් ඉදිරිපත් කරලා, ඒ පුරවැසි අය වැය මත පදනම් වෙලා අදහස් දැක්වීමට ලැබීම පිළිබඳව මම ප්‍රථමයෙන් සන්තෝෂයට පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථාවක් තිබෙනවා, සමහර පිරිස් ඉන්නවා, ඒගොල්ලන් කවදාවත් හිරු එළිය බලන්න කැමැති කට්ටිය නොවෙයි කියලා. ඒ නිසා හැමදාම හිරු එළියට පිටිපස්ස හරවාගෙන ඉන්න පිරිසක් ඉන්නවා. මට හිතෙනවා, අපේ විපක්ෂයටත් අද වෙලා තිබෙන්නේ ඒකයි කියලා. මොකද, ඔවුන් හිරු එළිය බලන්න කැමැති පිරිසක් නොවෙයි. ඒ නිසා ඔවුන් ගල් ගුහාවක් අස්සට වෙලා ඉඳගෙන එළියෙන් වැටෙන දෙයක් දැනගෙන, ඒකට බය වෙමින්, ඒකට කලබල වෙමින් අදහස් ප්‍රකාශ කරන තැනට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මහජන බලයක් අත්පත් කර ගත්ත පුරවැසි ආණ්ඩුවක් විධියට, පුරවැසි අය වැයක් ඉදිරිපත් කරලා, -මේ අවුරුද්දේ මාර්තු මාසයේ පළමු අය වැය ඉදිරිපත් කරලා- ඊට පසු මාස නවයක් වාගේ කෙටි කාලයක් ඇතුළත එහි ප්‍රතිඵල මෙතැනට ගේන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. මේ විපක්ෂයට අද ඇති වෙලා තිබෙන තත්ත්වය අනුව අපට හිතා ගන්න පුළුවන් අපේ රටේ පුරවැසියන්ගේ බලවත්වීම කොයි තරම් ප්‍රබලද කියන එක. ඒ සාධකය තමයි අපට පෙන්වන්න තිබෙන හොඳම සාධකය බවට පත් වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මේ අය වැය ඉදිරිපත් කරන්න පෙර විපක්ෂයේ හිටපු පිරිස් පරණ පොත් පාඩම් කරන්න පටන් ගත්තා. සමහර පොත් අරගෙන ගිහිල්ලා, highlight කළා, වැඩමුළු තිබ්බා. එහෙම තියලා කථා කරලා, සෙට් වෙලා ආවා, අවුලක් නැහැ මේ ඉදිරිපත් කරන දෙවන අය වැයට දෙන්නම් බැටේ කියලා. හැබැයි, මොකද වුණේ? විශේෂයෙන්ම අනුර දිසානායක ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුව ඇතුළේ අය වැය ඉදිරිපත් කරන්න පටන් ගත්තාට පස්සේ පැය භාගයක්, පැයක් යද්දී, කට්ටියට තේරෙන්න පටන් ගත්තා, වැඩේ වැරදුණා කියලා. ඇයි? තොරතුරු, දත්ත මත එකින් එකට පෙන්වන්න පටන් ගත්තා, බිඳ වැටුණු ආර්ථිකය කෙසේද ස්ථාවර වෙමින් තිබෙන්නේ කියලා. අපි රාජ්‍ය ආදායම කෙසේද වැඩි වෙන්නේ කියලා පෙන්වමින් තිබෙනවා. විදේශ සංචිත වැඩි වෙමින් තිබෙන්නේ කෙසේද කියලා පෙන්වමින් තිබෙනවා. අය වැය පරතරය අඩු කර ගත්තේ කොහොමද කියලා පෙන්වමින් තිබෙනවා. මහපොළ ආධාර, වතු කම්කරුවන්ගේ දීමනා වැඩිවීම් පිළිබඳ එකින් එකට පෙන්වන්න පටන් ගත්තා. එතකොට විපක්ෂයට මොකද වුණේ? විපක්ෂය කැරකෙන්න පටන් ගත්තා. ඔළුව කසන්න පටන් ගත්තා. සමහර කට්ටිය බොරුවට නිදා ගන්න පටන් ගත්තා. බොරුවට call කරන්න පටන් ගත්තා. ඇයි? ඒගොල්ලන් හිතපු දේ නොවෙයි, මේක ඇතුළේ වෙන්න පටන් අරගෙන තිබෙන්නේ. ඒ නිසා අපි විපක්ෂයට කියනවා, බොරුවට නිදා ගත්තාට ඇත්තට හීන පෙනෙන්නේ නැහැ කියලා. හැබැයි, ඒගොල්ලන් ඇත්තට නිදා ගත්තොත්, ඇත්තට හීන පෙනෙන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, අපි විපක්ෂයට කියනවා, ඔබ කැරකෙන මේ කැරකිල්ල හැදුවේ, අපේ රටේ පුරවැසියනුත්, අපත්, සියලුදෙනා එකට එකතු වෙලා මාස නවයක ක්‍රියාවලියක් ඇතුළේ බව. අප දැන් සැලසුම් කරමින් යන්නේ මේ පුරවැසි අය වැය ඉදිරිපත් කරලා, ඒක ඉතා වැඩි ඡන්ද ප්‍රමාණයකින් සම්මත කරගෙන ඉදිරි වසරේ මාස 12ත්, ඒ වාගේම මේ තිබෙන මාස දෙකත් ඇතුළු ඒ මාස 14ම පාවිච්චි කරමින් ලබන වසරේ අපේ අනුර දිසානායක සහෝදරයා අය වැය ඉදිරිපත් කරද්දී, විපක්ෂයට බොරුවට නිදා ගන්න නොවෙයි, පැදුරු දාගෙන බිම ඇල වෙලා ඉන්න පුළුවන් තත්ත්වයකට පත් කරනවා කියන පදනම, සහතිකය දෙන්න තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මෙහි තිබෙන ප්‍රධාන කරුණු කිහිපයක් මම මතු කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබ දන්නවා, අප වසරක් ඇතුළත, බිඳ වැටුණු, බලාපොරොත්තුවක් නොතිබුණු, අනාගතයක් නොතිබුණු මේ රටේ ජනතාව, පුරවැසියන් බලය අත්පත් කරමින් ඉන්න බව. ඒ නිසා විපක්ෂයට සිද්ධ වෙලා තිබෙනවා, හැමදාම sorry කියන්න; වැරදුණා කියන්න; අපි ඒක දැක්කේ නැහැ කියන්න. මොකද, අද විපක්ෂයේ කථා ඔක්කෝම ගත්තොත්, තිබෙන්නේ ඒක. ඇයි? විපක්ෂයට කථාව පටන් ගනිද්දීම, අය වැය ගැන හොඳ කියන්නත් බැහැ, නරක කියන්නත් බැහැ. ගඳයි කියන්නත් බැහැ, සුවඳයි කියන්නත් බැහැ. පුදුම අමාරුවකට වැටිලා තිබෙන්නේ.

විපක්ෂයට තවම තේරුම් ගන්න බැරි වෙලා තිබෙනවා, කුමන බලයක්ද මේ අත්පත් කරමින් තිබෙන්නේ කියලා. මේක තමයි අපේ රටේ මහජනතාවගේ බලය. ඒක නිසා මේක තනි පුද්ගලයෙකුගේ හෝ තනි කණ්ඩායමක හෝ තනි ඇමතිවරයෙකුගේ, මන්ත්‍රීවරයෙකුගේ ක්‍රියාවක ප්‍රතිඵලයක් නොවෙයි. මේක පුරවැසියාගේ නැඟිටීමක්. මේක පුරවැසි බලයක්. ඒක නිසා තමයි අපි මේක පුරවැසි අය වැයක් කියලා ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මේ පුරවැසි අය වැයේ කරුණු එකින් එකට සාර්ථක වෙන්න බලපෑ ප්‍රධාන කුලුනු 3ක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකක් තමයි දේශපාලන සංස්කෘතිය. දෙවැනි එක තමයි මූල්‍ය විනය. තුන්වැනි එක තමයි මූල්‍ය කළමනාකාරිත්වය. මේ කුලුනු තුන මත පදනම් වෙලා තමයි අපි මේ ප්‍රාතිහාර්යය පාන්න පටන් අරගෙන තිබෙන්නේ. එහෙම නැත්නම් මේක මේ විධියට ගොඩනඟන්න බැහැ. පුරවැසියන් එකතු වෙලා දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා තිබෙනවා. ඒ නිසා උඩ සිට පහළට ඒ ආදර්ශ දෙන්න පටන් අරගෙන තිබෙනවා. රටේ මූල්‍ය විනයක් හැදෙමින් එනවා. පුද්ගලයන් ලෙසත්, කණ්ඩායමක් ලෙසත්, අමාත්‍යාංශ ලෙසත්, පද්ධතියක් ලෙසත් මූල්‍ය විනය හැදෙමින් එනවා. ඒ වාගේම, මූල්‍ය කළමනාකාරිත්වය පැත්තෙන්

ගත්තත් පුද්ගලයෙක් ලෙසත්, කණ්ඩායමක් ලෙසත්, අමාත්‍යාංශ ලෙසත් පොදියට පොර කනවා ඒ විනය රකින්න. අන්න ඒ ප්‍රාතිහාර්යය නිසා තමයි අපට මේ අය වැය ගැන එකින් එක කරුණු දක්වන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ. ඒක විපක්ෂයට තේරුම් ගන්න බැහැ. ඒක නිසා තමයි ඒගොල්ලෝ සමහර ගණන් හදලා පෙන්වලා අහන්නේ, "මෙච්චර ගණනකින් මේක කොහොමද කරන්න පුළුවන් වෙන්නේ. කොහොමද මෙහෙම වුණේ?" කියලා. ඒගොල්ලන්ගේ සමහර න්‍යාය පත්‍ර, ඒගොල්ලන් දන්න සමහර දත්ත සමහර systemවලට දැම්මාට පස්සේ එන්නේ මේ වැඩේ කරන්නම බැහැ කියලා තමයි. ඒගොල්ලන්ට තිබෙන අත්දැකීම ඒකම තමයි. හැබැයි අපට මොකද වෙලා තිබෙන්නේ? දේශපාලන සංස්කෘතිය, මූල්‍ය කළමනාකාරිත්වය, මූල්‍ය විනය කියන එක අපි කළමනාකරණය කරන විධිය ඒගොල්ලන් දන්නේ නැහැ. අපේ system එක වෙනස් කියලා ඒගොල්ලන් දන්නේ නැහැ. ඒක තේරුම් ගැනීමේ අර්බුදය තමයි අද විපක්ෂයට තිබෙන්නේ. ඒක තමයි හොඳයි කියන්නත් බැරුව, නරකයි කියන්නත් බැරුව කැරකි කැරකි ඉන්න තත්ත්වයට අද විපක්ෂය පත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයෙන් මතු කරන කරුණු කිහිපයක් ගැන මෙතැනදී පැහැදිලි කරන්න මම කැමැතියි. මම දැක්කා විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ ඉන්න කිහිපදෙනෙකුත් මේ අය වැයෙන් පස්සේ ගිහිල්ලා මාධ්‍ය සාකච්ඡාවකුත් තියලා, අපේ රටේ තරුණ තරුණියන් රැවැට්ටුවා, අපේ රටේ තරුණ තරුණියන්ට රැකියා දෙන්නේ නැහැ කියන සාකච්ඡාවක් දිගටම කරමින් තිබෙන බව. මම කියනවා, මේ පට්ටපල් බොරුව කරන්න එපා කියලා. ඇයි? මූලාසානාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා අපේ රටේ මෙච්චර කාලයක් රැකියා දීපු system එකක් තිබුණා කියලා. ඒ තිබුණු system එක මොකක්ද? ඒ system එක තමයි ගහක් ගාවට ඇවිල්ලා උසද, කොටද කියලා බලන එක. නැත්නම් මොකක්ද කරන්නේ? නැත්නම් කාර්යාලවලට ගෙන්වාගන්නවා, රැකියාවලට forms දෙනවා. අපට ඕනෑතරම් news ඇවිල්ලා තිබෙනවා, මැතිවරණ ඉවර වුණාට පස්සේ ඒ applications කුණුකූඩවල තිබෙනවා කියලා. අපි අද ඉන්න සමහර රාජ්‍ය ආයතන තිබෙනවා. ඒ ආයතනවලින් බස් පිටින් හවසට යනවා එක දිස්ත්‍රික්කයකට; එක ආසනයකට. ඇයි? බැලින්නම් ඒ ඇමතිවරයා ඉඳලා තිබෙන්නේ ඒ ආසනයේ; ඒ දිස්ත්‍රික්කයේ. එහෙම ඉතිහාසයක් තිබුණේ.

අපි මොකද කරමින් තිබෙන්නේ? අපි පොරොන්දු වුණා, අපේ රටේ තරුණ තරුණියන්ට රැකියා දෙන්න ඕනෑ කියලා. ඒක ඡන්ද පොරොන්දුවක් විතරක් නොවෙයි. මේ ආර්ථික පද්ධතිය ඔසවා තබන්න මේ රාජ්‍ය පද්ධතියට අනිවාර්යයෙන්ම තරුණ තරුණියන් ඕනෑ. ඒක නිසා ඒ වෙනුවෙන් අපි ඉතාම විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරමින් තිබෙනවා. මම විපක්ෂ නායකතුමාගේ අවධානය සඳහා මේ ලේඛනය සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

දැනට අපි, අපේ කැබිනට් මණ්ඩලය විසින් 2025.10.29වැනි දා අමාත්‍යාංශ 25 ඇතුළේ තිබෙන පුරප්පාඩු 62,699ක් ගැසට් කරලා තිබෙනවා. මම අමාත්‍යාංශ කීපයක පුරප්පාඩු විතරක් කියන්නම්. ආරක්ෂක අමාත්‍යාංශයේ 12,433යි. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 12,009යි, රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 8,687යි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ 10,225යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුරප්පාඩු 62,999ක් දැනට ගැසට් කරලා තිබෙනවා. මේ ක්‍රියාවලිය අතුළේ තමයි අපි යමින් ඉන්නේ.

ඒ විතරක් නොවෙයි, අපි ආණ්ඩුව ආවාට පස්සේ අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුවට අනුව ඒ ඒ රාජ්‍ය ආයතනවල තිබෙන පුරප්පාඩු එකින් එකට අධ්‍යයනය කරමින් යනවා. මේ අතර, ගරු විභාගය පිළිබඳ නඩු කීපයක් තිබෙනවා. ඒ නඩු කිහිපය ගැන ඉතාම සාර්ථකව දැන් සාකච්ඡා කරමින් යනවා. ඒ අනුව ඒ ගැන අමාත්‍ය මණ්ඩලය තීරණයක් අරගෙන ඉදිරි දින කිහිපයේදී ශ්‍රේෂ්ඨාධිකරණයත් එක්ක යම් එකඟතාවකට යනවා. ඒක නිසා තමයි ජනාධිපතිවරයා ඇවිල්ලා කියලා තිබෙන්නේ අපි 75,000කට රැකියා දෙන්න හදනවා කියලා. රැකියා දෙන්න ගැසට් කරලා තිබියදී, අමාත්‍යාංශවලින් ගැසට් කරලා තිබෙද්දී, මෙතැන බොරුවට නිදාගෙන ඉඳලා එළියට ගිහිල්ලා කියනවා, අපි තරුණයන්ට රස්සා දෙන්නේ නැහැ කියලා. හැබැයි තරුණයෝ දන්නවා.

මේ ගැසට් කරලා තිබෙන එකට අනුව ගත්තොත්, සැලකිය යුතු ප්‍රමාණයක් උපාධිධාරීන්ට රැකියා ලැබෙනවා. අප ඒක දකින්නේ ඡන්ද පොරොන්දුවක් විධියට නොවෙයි. අපට ඔවුන් ඕනෑ. ඒ මොකටද? ඔවුන් මේ ආර්ථික ක්‍රියාවලියේ පදනම බවට පත් කර ගැනීමටයි. අපට ඒ අරමුණ තිබෙනවා. අපට ඒ ඕනෑකම තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන් වනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු එරංග ගුණසේකර මහතා**
**(மாண்புமிகு எரங்க குணசேகர)**
(The Hon. Eranga Gunasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක කාලයක් දෙන්න.

අවසාන වශයෙන් මම මේ කාරණය මතු කරන්න කැමැතියි. මේ පුරවැසි අය වැය යටතේ අපි ඉතාම මහන්සියෙන්, අමාරුවෙන් මහජන සහභාගිත්වය ඇතිව මේ රට ගොඩනැඟීම කරමින් සිටිනවා. වපුරන්න අමාරුම වෙලා තිබුණු පොළොවක් මත අපි බීජ වපුරන්න පටන් ගත්තා. මේ වන විට ඒ බීජ රෝපණය වෙලා ඉතාම කෙටි කාලයක් තුළ පැළ උඩට මතු වෙන්න පටන් ගෙන තිබෙනවා. ඒ නිසා විපක්ෂයට ඒක මරු වළල්ලක් වාගේ පෙනෙනවා ඇති. නමුත් අපට ඒකට කරන්න දෙයක් නැහැ. අපි ජනතාවත් සමඟ එකතු වෙලා ඒ අමාරුවෙන් වපුරපු බීජ පැළ බවට පත් කරගෙන එහි ප්‍රතිඵල මේ රටේ සමස්ත මහ ජනතාවට ලබා දෙනවා, පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් ලබා දීමේ බලාපොරොත්තුව ඇතිව වැඩ කරනවා. අප ඒ අධිෂ්ඨානය සහිතව සිටින බව විශ්වාසයෙන් යුතුව කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.23]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
**(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)**
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ අය වැය ගැන කථා කරන කොට අපට හැඟෙන්නේ පරණ වයින් අලුත්

[ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

JVP බෝතලයකට දලා දෙනවා වාගේයි. ඇයි අපි එහෙම කියන්නේ? හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ රටේ විවෘත ආර්ථිකය ඇති කරලා, අලුත් ආර්ථික ප්‍රතිසංස්කරණ සිදු කරලා කටයුතු කරගෙන යන කොට එතුමාගේ ආර්ථික වැඩ පිළිවෙළ පරද්දන්න මේ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු කණ්ඩායම එදා පාරට බැහැලා, මිනී මරමින්, ගිනි තියමින්, රාජ්‍ය දේපළ විනාශ කරමින්, තරුණ පිරිසගේ ජීවිත අහිමි කරමින් සටන් කළා. ඊට පස්සේ 2022දී මේ රටේ ආර්ථික අර්බුදය ඇවිල්ලා රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා රට භාර ගන්න කොට විපක්ෂය හැටියට ගරු හර්ෂ ද සිල්වා මැතිතුමන්ලා ඇතුළු අපි සියලුදෙනා කිව්වා, IMF එකත් එක්ක ගනුදෙනු කරලා මේ රටේ ආර්ථිකය ගොඩ ගන්න කටයුතු කරන්න කියලා. හැබැයි, මේ NPP එක ඇතුළු ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායම මොකක්ද කිව්වේ? වේදිකාවක්, වේදිකාවක් ගානේ යමින් කට කැඩෙනකල් කෑ ගහමින් මේ රටේ ජනතාවට කිව්වා, මේ IMF එක කියන්නේ මර උගුලක්. IMF එක කියන විධියට අපි වැඩ කරන්නේ නැහැ, අපට ඕනෑ විධියට වැඩ කරන්න, ඔය ගොල්ලෝ අපේ තීන්දු තීරණ, අපේ යෝජනා අනුව ණය දෙන්න, එහෙම නැත්නම් අපට ඔයගොල්ලන්ගේ ණය එපා කියලා IMF එකේ අයට කියන බව. එහෙම IMF එකත් එක්ක ගනුදෙනු කරනවා කියපු, IMF එකත් එක්ක තිබෙන ඒ Agreement එක reschedule කරනවා කියපු මේ අය ජනතාවට සහන දෙනවා කියලා, මේ රටේ ජනතාව අන්දලා, බොරු පොරොන්දු දීලා බලය ලබා ගත්තා. බලය ලබා ගත්තාට පසුව මේ අය මොකද කළේ කියලා මම කියන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඒක කියන්න කලින් මම කැමැතියි, විශේෂ කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න. 2023 අප්‍රේල් මාසයේ 28වෙනි දා "ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) විස්තීර්ණ අරමුදල් පහසුකම (EFF) යටතේ වූ සැකසුම ක්‍රියාත්මක කිරීම" මැයෙන් වූ යෝජනා සම්මතය පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාදයක් පැවැත්වුණා. වර්තමාන ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා, අග්‍රාමාත්‍ය ගරු හරිනි අමරසූරිය මැතිනිය, ගරු විජිත හේරත් මැතිතුමා ඒ EFF එකට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා. ඒ කියන්නේ මොකක්ද? The Resolution for the Implementation of the Arrangement under the Extended Fund Facility (EFF) of the International Monetary Fund (IMF) for Sri Lanka. ඒ යෝජනා සම්මතයට විරුද්ධව ඡන්දය දුන්නු අනුර කුමාර දිසානායක මැතිතුමන්ලා ඇතුළු NPP එක අද ඒ වැඩ පිළිවෙළ ඉතාම ලස්සනට ක්‍රියාත්මක කරගෙන යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. Extended Fund Facility එක තමයි මේ ක්‍රියාත්මක කරගෙන යන්නේ.

2023 අප්‍රේල් 28වැනි දා පැවැති ඉහත කී යෝජනා සම්මතය පිළිබඳ විවාදයේදී ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා කරපු කථාවේ එතුමා Withholding Tax එක ගැන, VAT එක ගැන, PAYE Tax එක ගැන සඳහන් කළා. එතුමා එදා ඒ සියල්ල විවේචනය කරමින් පාර්ලිමේන්තුවේදී කිව්වා, PAYE Tax එක හරහා, VAT එක වැඩි කිරීම හරහා, Withholding Tax එක හරහා මේ ආර්ථිකය කඩා වැටෙනවා කියලා. ඒ වාගේම ඇහුවා, PAYE Tax එක නිසා සමාජයට සහ ජීවිතවලට වන හානිය මොකක්ද කියලා සොයා බැලුවාද කියලා. කැලණිය විශ්වවිද්‍යාලයේ IT Department එකට බඳවා ගන්න දැන්වීම් දාලා තිබුණත් ආචාර්යවරු එන්නේ නැහැ කියලාත් කිව්වා. එම IT Department එකේ ආචාර්යවරු 26දෙනෙක් සිටිය යුතු වුණත් ඉන්නේ 4දෙනක් පමණයි කිව්වා. ඒ විතරක් නොවෙයි, අනුරාධපුරයේ ළමා රෝහල දවස් කිහිපයක් වසා තිබෙනවා කියලාත් කිව්වා. වෛද්‍යවරුන් රට හැර දමා යනවා කියලාත් කිව්වා. Account balance එක පවත්වා ගෙන යන්න IMF එකට ඕනෑ විධියට EFF එක - Extended Fund Facility එක - ලබා ගත්තොත් මේ රටේ වෘත්තිකයන් රට හැර දමා යන තත්ත්වයට පත් වෙනවා කියලාත් එතුමා කිව්වා. 2027 අවුරුද්ද වනකොට ඩොලර් බිලියන 10.3ක විදේශ සංචිත පවත්වාගෙන යන්න අවශ්‍ය බව කියූ එතුමා එය සොයා ගන්නා උපාය මාර්ගය මොකක්ද කියලාත් ඇහුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2027ට තිබෙන්නේ තව අවුරුද්දයි. 2026න් පසුව 2027. මේ ආණ්ඩුව ඒ ඩොලර් බිලියන 10.3 සොයා ගන්නේ කොහොමද කියන එක මේ අය වැයෙන් කියනවාද? ඒ සම්බන්ධයෙන් වූ මාර්ග සිතියම මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවාද? එහෙම කරලා නැහැ.

ඒ විතරක් නොවෙයි. එතුමා කිව්වා, මේ ක්‍රියාත්මක වෙන්නේ විකුණා ජීවත් වන සංස්කෘතියක් කියලා. විකුණන්නේ මොනවා කියලාද එතුමා කිව්වේ? ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා ටෙලිකොම් එක, වෝටර්ස් එජ් හෝටලය, Lanka Hospital එක, ලිට්රෝ ගෑස් සමාගම ආදිය ගැන එතුමා කිව්වා. එම ආයතන 2022 වසරේ ලැබූ ලාභය ගැනත් එතුමා කිව්වා. 2022 වසරේ Lanka Hospital එක ලැබූ ලාභය රුපියල් මිලියන 2,333ක් වන බවත්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ලැබූ ලාභය රුපියල් මිලියන 10,410ක් වන බවත්, ටෙලිකොම් එක ලැබූ ලාභය රුපියල් මිලියන 13,846ක් වන බවත්, වෝටර්ස් එජ් හෝටලය ලැබූ ලාභය රුපියල් මිලියන 360ක් බවත් එතුමා කිව්වා. ඒ වාගේම ලිට්රෝ සමාගමේ ලාභය ඒ ආසන්න මාස තුනෙහි රුපියල් මිලියන 233ක් වන බවත් කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය සකස් කර තිබෙන්නේ, IMF එකේ Extended Fund Facility එක අනුව නිසි ක්‍රමයටයි කියන එක ඉතාම පැහැදිලියි. ඉදිරියේදී -2026න් පසුව- මෙතුමන්ලා ඒ කියපු ලාභ ලබන ආයතනවලට මොකක්ද කරන්නේ? ආණ්ඩු පක්ෂයේ එක්තරා ඇමතිවරයෙකුත් කිව්වා, මේ ආණ්ඩුව ව්‍යාපාර කරන්න ඕනෑ නැහැ, ඒ නිසා අපි මේ ආයතන දෙන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, එදා IMF එකේ විස්තීර්ණ අරමුදල් පහසුකම යටතේ වූ සැකසුම ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා සම්මතයට විරුද්ධව ඡන්දය දුන්නු, අද IMF එකේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන කණ්ඩායම ද ඇතුළත් නාමලේඛනය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එදා ඒකට පක්ෂව ඡන්දය දුන්නේ නැහැ. අපි abstain වෙලා හිටියා. අපි මේ ආණ්ඩුවේ ඔබතුමන්ලාට කියනවා, ඔබතුමන්ලා අද සාර්ථකයි කියන මේ අය වැය ක්‍රියාත්මක කරන්නේ, ඔබතුමන්ලා එදා අසාර්ථකයි කියපු IMF එකයි කියලා මේ රටේ මිනිසුන්ට කියන ලෙස. ඔබතුමන්ලා මේ රටේ ජනතාවට එදා බොරු කිව්වාය කියන එක ඔබතුමන්ලා පිළිගන්න. අපට ප්‍රශ්නයක් නැහැ, හොඳට කරගෙන යනවා නම්. අපට ඒකේ ගැටලුවක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රජය බලයට පත් වෙන්න කලින් වේදිකාවක් වේදිකාවක් ගාණේ පැහැදිලිව කිව්වා, පාසල් උපකරණවලට පනවා තිබෙන VAT එක ඉවත් කරනවා කියලා. නමුත් ඒක කළේ නැහැ.

සෞඛ්‍ය සේවා සඳහා පනවා තිබෙන VAT එක ඉවත් කරනවා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඒක කළේත් නැහැ. ඒ විතරක් නොවෙයි. 2026න් පස්සේ 2027 වෙනකොට තිබෙන ආර්ථික වැඩ පිළිවෙළ මොකක්ද, ක්‍රියාත්මක කරන්නේ මොනවාද කියලා මේ අය වැයේ කියලා නැහැ.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උද්ධමනය ගත්තොත්, අගෝස්තු මාසයේ සියයට 1.5ක්ව තිබුණු උද්ධමනය, සැප්තැම්බර් මාසය වෙනකොට සියයට 2.1ක් බවට පත්වෙලා තිබෙනවා. අගෝස්තු මාසයේ සියයට 2.9ක්ව තිබුණු ආහාර උද්ධමනය, සැප්තැම්බර් මාසය වෙනකොට සියයට 3.8ක් බවට පත්වෙලා තිබෙනවා.

ඒ වාගේම, 2025 ඔක්තෝබර් 07වැනි දින ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ලෝක බැංකුව නිකුත් කර තිබුණු වාර්තාවට අනුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුප්පතුන් සියයට 22ක් ඉන්නවා. ඒ වාගේම, margin එකේ සියයට 10ක් ඉන්නවා. මේ අය මොනයම් හෝ මොහොතක දුප්පතුන් බවට පත් වෙන්න පුළුවන් කියලා වාර්තා වෙලා තිබෙනවා.

ඒ වාගේම 2024 සැප්තැම්බර් මාසය අග වෙනකොට සමස්ත නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් බිලියන 28,574.65යි. මාස 9ක් ගත වෙනකොට එය රුපියල් බිලියන 29,634.78ක් දක්වා වැඩි වෙලා තිබුණා. ඒ කියන්නේ, රුපියල් බිලියන 1,060ක් වැඩි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ මාස 9 තුළ දේශීය ණය රුපියල් බිලියන 1,211කින් වැඩි වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම, එම කාලය තුළ රුපියල් බිලියන 10,429.04ක් වූ විදේශ ණය ප්‍රමාණය, රුපියල් බිලියන 10,828.70ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් බිලියන 400කට ආසන්න ප්‍රමාණයකින් වැඩිවෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024-2025 කාලය තුළ ශ්‍රීලන්කන් ගුවන් සේවය ලබා තිබෙන පාඩුව රුපියල් බිලියන 7.5යි. හැබැයි, 2023-2024 කාල සීමාව තුළ -මේ ආණ්ඩුව රට භාර ගන්න කලින්- ශ්‍රීලන්කන් ගුවන් සේවය රුපියල් බිලියන 3.8ක ලාභයක් ලබා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් මන්ත්‍රීවරයෙක් කථා කරනකොට කිව්වා, විපක්ෂය "අල - ලූනු විපක්ෂයක්" කියලා. කවුරු හරි "අල - ලූනු විපක්ෂයක්" කියලා අපට කියනවා නම් අපි ඒකට කැමැතියි. මේ රටේ දුක් විඳින අල, ලූනු ගොවියා වෙනුවෙන් කථා කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන් වන අපට "අල - ලූනු විපක්ෂය" කියලා කොලොප්පම් කරනවා නම්, ඒක අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ ආණ්ඩුව බලයට පත් කරන්න වැඩ කරපු අහිංසක ගොවියෝ අද පාරේ. අල ගොවියා, ලූනු ගොවියා, වී ගොවියා ඇතුළු සමස්ත ගොවි ජනතාවම අද පාරට බැහැලා කෑ මොර දෙන්නේ මේ ආණ්ඩුව ඔවුන්ට කරන අසාධාරණයට විරුද්ධවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වෙනුවෙන් විපක්ෂයක් හැටියට අපේ යුතුකම සහ වගකීම අපි ඉෂ්ට කරනවා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ மயில்வாகனம் ஜெகதீஸ்வரன் அவர்கள்! உங்களுக்கு 7 நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.35]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**

(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)

(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய நாள் மிகவும் முக்கியத்துவம் வாய்ந்த நாளாகக் காணப்படுகின்றது. எமது அரசாங்கத்தால் சமர்ப்பிக்கப்பட்ட இரண்டாவது வரவு செலவுத்திட்டம் மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன். முன்னாள் பாராளுமன்ற உறுப்பினர் மாமனிதர் நடராஜா ரவிராஜ் அவர்கள் இந்த உலகை விட்டுச்சென்று இன்று 19 வருடங்களாகின்றது. தனது அதிகாரத்தையும் வரப்பிரசாதங்களையும் துஷ்பிரயோகம் செய்யாமல், எந்தவித ஊழல், மோசடியிலும் ஈடுபடாமல், எந்தவித எதிர்பார்ப்பும் இன்றி தமிழ் மக்களின் குரலாக ஒலித்த மாமனிதர் நடராஜா ரவிராஜ் அவர்கள் சிறந்ததோர் அரசியல்வாதிக்கு இலக்கணமாகக் காணப்பட்டார். இன்றுவரை அந்த சிறந்த மனிதருடைய இடம் நிரப்பப்படவில்லை. அவருக்கு எனது அஞ்சலியைச் செலுத்துகின்றேன்.

"கற்க கசடறக் கற்பவை கற்றபின்
நிற்க அதற்குத் தக"

என்பது வள்ளுவரின் வாக்கு. Learn thoroughly what is worth learning, and once you have learnt it, live according to it என்பது இதன் பொருளாகும். நாங்கள் கற்கின்றோம். இந்த உயரிய சபையில் கற்றவர்கள் என்று நாங்கள் எங்களைக் கூறிக்கொள்கின்றோம். ஆனால், நாங்கள் கற்றதற்கு ஏற்ப எவ்வளவு தூரம் நடந்துகொள்கிறோம் என்பதைப் பார்த்தால் மிகவும் வேதனையாக இருக்கின்றது.

Maintaining and safeguarding the dignity and authority of Parliament is very important, as it is the supreme body of our country. But, I have observed that there are a few Members who continuously damage its dignity. People elect and send Parliamentarians to this supreme body to act as a model of a disciplined person. However, I have noticed here that there are some Members who speak and behave very badly. Especially, they breach the Privileges of the other Members using unparliamentary words. This has been continuously happening here. So, as a Parliamentarian, I humbly request you all to safeguard the dignity and the authority of Parliament.

நாங்கள் மக்களால் தெரிவுசெய்யப்பட்டு, பாராளுமன்ற உறுப்பினர்களாக இந்த உயரிய சபைக்கு வருகை தந்திருக்கிறோம். நாங்கள் இந்தச் சபையில் எவ்வாறு நடந்துகொள்ள வேண்டும், எவ்வாறான வார்த்தைப் பிரயோகங்களை மேற்கொள்ள வேண்டும் என்று சில விதிமுறைகள் இருக்கின்றன. ஒரு மனிதனுடைய பலவீனத்தை அல்லது இயலாமையைச் சுட்டிக்காட்டி, ஏளனம் செய்து பேசுகின்ற மனிதன் மிகவும் பலவீனமான அல்லது கீழ்மட்டத்திலான ஒருவனாகவே கருதப்படுவான். எனவே, எதிர்வரும் காலங்களில் இவ்வாறான விடயங்களைத் தவிர்த்துக்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, நிதி அமைச்சர் என்ற ரீதியில் மாண்புமிகு சனாதிபதி அவர்களால் இங்கு முன்மொழியப்பட்ட வரவு செலவுத்திட்டத்தை நாங்கள் நோக்குவோம். எமது நாடு பொருளாதார ஸ்திரத்தன்மையை நோக்கி, நம்பிக்கையோடு படிப்படியாகப் பயணித்துச் செல்வதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. கடந்த கால நிதி நிலைமை அறிக்கைகளை நாங்கள் உற்று நோக்கினால் ஒரு விடயம் புலப்படும். நாங்கள் இந்த நாட்டைப் பொறுப்பெடுக்கும்போது, ஒரு விலங்கினுடைய வால் பகுதி எவ்வாறு கீழ்நோக்கி வளர்ந்து செல்லுமோ அதேபோல, -7 சதவீதமாகக் காணப்பட்ட பொருளாதார வளர்ச்சியானது தற்பொழுது மிக விரைவாக வளர்ச்சியடைந்து +4 சதவீதமாக உயர்வடைந்துள்ளது. நாங்கள் இந்த நிலைமையை மிகுந்த அர்ப்பணிப்புக்கு மத்தியிலேயே எட்டியிருக்கின்றோம்.

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

அதுமாத்திரமல்ல, எமது டொலர் கையிருப்பானது 6 பில்லியனை எட்டியிருக்கின்றது. அதேவேளை, ஒரு ரில்லியன் இலங்கை ரூபாய் நாட்டின் கையிருப்பில் இருக்கின்றது. இவ்வாறான நிலை இந்த ஒரு வருடத்துக்குள்ளேயே ஏற்படுத்தப்பட்டுள்ளது. எமது நாட்டை அனைத்து விதமான ஊழல் மோசடிகளிலிருந்தும் மீட்டு வருகின்ற அதேவேளை, பொருளாதார ஸ்திரத்தன்மையையும் எமது அரசாங்கம் பேணி வருகின்றது.

கடந்த காலங்களில் எதிர்க்கட்சியினர் கூறியிருந்தார்கள், 2028ஆம் ஆண்டாகும்பொழுது இந்த நாடு கடன் சுமையிலிருந்து மீளமுடியாமல் மிகவும் மோசமான நிலைக்குச் செல்லும் என்று. நாங்கள் கடனைச் செலுத்துவது மட்டுமல்லாமல், அவர்கள் பெற்ற கடனுக்கான வட்டியையும் சேர்த்துச் செலுத்திக்கொண்டு இருக்கின்றோம் என்பதை அவர்களுக்குக் கூற விரும்புகின்றோம். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான மீள்செலுத்த வேண்டிய கடன் தொகையில், 1,878 பில்லியன் ரூபாயைச் செலுத்துவதற்கு நாங்கள் உத்தேசித்துள்ளோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைந்துவிட்டது.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு இன்னும் ஒரு நிமிடம் தருமாறு கேட்டுக் கொள்கின்றேன்.

மேலும், கடந்த காலங்களில் இவர்கள் பெற்ற கடனுக்கான வட்டியையும் - 2,617 பில்லியன் ரூபாயையும் - நாங்கள் செலுத்திக்கொண்டு இருக்கின்றோம். படுகடன் சேவைக் கொடுப்பனவாக மொத்தம் 4,495 பில்லியன் ரூபாயை எங்களுடைய அரசாங்கம் செலுத்த இருக்கின்றது. அதுமட்டுமல்ல, 4,485 பில்லியன் ரூபாயை நாட்டு மக்களின் அபிவிருத்திக்காக நாங்கள் செலவு செய்திருக்கின்றோம். மொத்தம் 8,980 பில்லியன் ரூபாயை நாங்கள் உத்தேச செலவுகளில் ஈடுபடுத்த இருக்கின்றோம். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாங்கள் இங்கு ஒரு விடயத்தைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அதாவது, மொத்த செலவினத்தில் 50 சதவீதத்துக்கும் மேற்பட்ட தொகையை நாங்கள் கடன் மற்றும் வட்டியைச் செலுத்துவதற்குச் செலவழித்துக்கொண்டு இருக்கின்றோம். இந்தத் தொகை மக்களின் அபிவிருத்திக்குச் செலவழிக்கப்படுமானால், எமது நாடு மிக விரைவாக அபிவிருத்தியை நோக்கிய பயணத்தை மேற்கொள்ளக்கூடியதாக இருக்கும். நிச்சயமாக நாங்கள் இதனை எங்களுடைய அரசாங்க காலப்பகுதியில் பூரணமாக நடைமுறைப்படுத்துவதற்கு எதிர்பார்க்கின்றோம்.

மேலும், நேற்றையதினம் இங்கு உரையாற்றிய சில உறுப்பினர்கள், வடக்கு மாகாணத்துக்கு எந்தவித ஒதுக்கீடும் செய்யப்படவில்லை என்பதாகக் கூறியிருந்தார்கள். நான் இங்கு சில புள்ளிவிபரங்களைக் குறிப்பிட விரும்புகின்றேன். மன்னார் வைத்தியசாலையின் திடீர் விபத்துப் பிரிவு மற்றும் அவசர சிகிச்சைப் பிரிவை அபிவிருத்தி செய்வதற்காக 230 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கின்றது. யாழ்ப்பாணம், கிளிநொச்சி மற்றும் அவற்றின் புறநகர்ப் பகுதிகளுக்கு குழாய்மூலம் நீர் வழங்குவதற்கு 6 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. மேலும், முருங்கன்-சிலாவத்துறை பாதையை அகலமாக்குதல், மாங்குளம்-வெள்ளாங்குளம் பாதையை அகலமாக்குதல், ஆவரங்கால்-தொண்டைமானாறு வீதியைப் புனரமைத்தல், யாழ்ப்பாணம்-பொன்னாலை வீதியைப் புனரமைத்தல் உட்பட பல்வேறு விடயங்களுக்கு எமது அரசாங்கம் நிதி ஒதுக்கி இருக்கின்றது. அதுமட்டுமல்ல, முதல் முறையாக வடக்கு மாகாணத்தின் மன்னார் மற்றும் யாழ்ப்பாண மாவட்டங்களில் கடலட்டைக் குஞ்சுகளை வளர்ப்பதற்காக 1,285 மில்லியன் ரூபாயை NAQDA நிறுவனத்துக்கு ஒதுக்கி இருக்கின்றது என்ற விடயத்தையும் இவ்விடத்தில் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ எம்.ஏ.எம். தாஹிர் அவர்கள்! உங்களுக்கு 11 நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.44]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அரசாங்கத்தின் இரண்டாவது வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் வாசிப்பு மீதான விவாதத்தில் கலந்துகொண்டு கருத்துத் தெரிவிப்பதையிட்டு மகிழ்வுறுகின்றேன்.

மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த நாட்டின் வளர்ச்சிக்காகவும் அபிவிருத்திக்காகவும் துறைசார்ந்தவர்களுடைய ஆலோசனைகளைப் பெற்று, 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தை முன்வைத்திருக்கிறார். அவர், எமது பிரதேசத்திலுள்ள சுமார் 27 வருடங்கள் பழைமைவாய்ந்த ஒரு கட்டிடத்தின் அபிவிருத்திக்காக 300 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறார். அதற்காக அவருக்கு இச்சந்தர்ப்பத்தில் நன்றியைக் கூறிக்கொள்கின்றேன். இந்தக் கட்டிடம் சம்பந்தமாக நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களிடம் பேசியிருந்தோம். அகில இலங்கை மக்கள் காங்கிரஸின் தலைவர் றிஸாட் பதியுதீன் அவர்கள் இந்த வேலைத்திட்டத்தைச் செய்துதர வேண்டுமென அவரிடம் கேட்டிருந்தார். நாங்கள் இந்த வேலைத்திட்டத்தைச் செய்வதற்காக, நிந்தவூரில் நடைபெற்ற DDC Meetingஇல் அதற்கான முன் அனுமதியைப் பெற்றோம். அதன் பின்னர், அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுவில் அது தொடர்பான முன்மொழிவைச் சமர்ப்பித்து, பின்னர் தேசிய ரீதியான பாதீட்டுக்கும் கொண்டுவந்தோம்.

அகில இலங்கை மக்கள் காங்கிரஸின் தலைவர் றிஸாட் பதியுதீன் அவர்கள், நான் பாராளுமன்றத்துக்கு வருகின்ற ஒவ்வொரு தடவையும் இந்த proposalஐத் தயாரித்து விட்டீர்களா? கொண்டுவந்தீர்களா? என்ற கேள்விகளோடுதான் என்னை ஸலாம்கூறி வரவேற்பார். அவ்வாறு இந்த விடயத்தைக் கையிலெடுத்து, எப்படியேனும் செய்ய வேண்டும் என்பதில் கவனம் செலுத்தியவர்தான் கௌரவ றிஸாட் பதியுதீன் அவர்கள். எனவே, அவருக்கும்

இச்சந்தர்ப்பத்தில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த வேலைத்திட்டத்தை முன்னெடுப்பதற்குப் பங்களிப்புச் செய்த அம்பாறை மாவட்ட அரசாங்க அதிபர் சிந்தக்க அபேவிக்ரம அவர்களுக்கும், அவருடைய staffஐச் சேர்ந்த திட்டமிடல் பணிப்பாளர் சகோதரர் முனாஸிர் அவர்களுக்கும், பொறியியலாளர் ஸாஹிர் அவர்களுக்கும், கணக்காளர் பாரிஸ் அவர்களுக்கும், நிந்தவூர் பிரதேச செயலாளருக்கும், திட்டப் பணிப்பாளருக்கும் எனது நன்றிகளைக் கூறுகின்றேன். இந்தக் கட்டிடத்தின் வேலைகள் முடிவுற வேண்டுமென எமது பிரதேசத்தில் இருக்கின்ற சகோதரர்கள் இறைவனிடத்தில் பிரார்த்தித்தார்கள். அவர்களுக்கும் எனது நன்றிகளைக் கூறுகின்றேன்.

இந்தக் கட்டிடத்தின் வரலாற்றை நான் இந்த இடத்தில் கூற வேண்டுமென நினைக்கின்றேன். 1988ஆம் ஆண்டு நடைபெற்ற சனாதிபதித் தேர்தலில் ஆர். பிரேமதாச அவர்கள் வேட்பாளராக இருந்தபோது, எங்களுடைய பெரும் தலைவர் எம்.எச்.எம். அஷ்ரப் அவர்களைச் சந்தித்து, தனக்கு ஆதரவு வழங்க வேண்டுமெனக் கேட்டுக் கொண்டார். அந்தக் காலப்பகுதியில் ஒரு கட்சியானது பாராளுமன்றத்தில் ஓர் ஆசனத்தைப் பெறுவதற்கு குறிப்பிட்ட மாவட்டத்தில் செல்லுபடியாகும் வாக்குகளில் 12.5 சதவீதத்தைப் பெற வேண்டியிருந்தது. அதாவது, அதற்கான வெட்டுப்புள்ளி 12.5 சதவீதமாகக் காணப்பட்டது. அந்த வெட்டுப்புள்ளியை 5 சதவீதமாகக் குறைத்துத் தந்தால் முஸ்லிம் சமூகத்தின் வாக்குகளைப் பெற்றுத்தருவதாக அப்பொழுது அஷ்ரப் அவர்கள் கூறியிருந்தார். அதன் அடிப்படையிலேதான் தற்பொழுது அந்த வெட்டுப்புள்ளி 5 சதவீதமாகக் காணப்படுகின்றது.

நானும் எங்களுடைய கட்சியின் தலைவர் றிஸாட் பதியுதீன் அவர்களும் மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்தித்துக் கதைத்தபோது, "நீங்கள் சனாதிபதியாக வருவதற்கு காரணகர்த்தாவாக இருந்தவர்களில் எங்களுடைய மறைந்த தலைவர் எம்.எச்.எம். அஷ்ரப் அவர்களும் ஒருவர்" எனவும், அவரால் 1997ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்ட அந்தக் கட்டிடத்தின் நிர்மாண வேலைகள் இன்றும் முடிவுறாமல் இருக்கின்ற விடயத்தையும், அதற்கு இடைப்பட்ட காலப்பகுதியில் பாராளுமன்ற உறுப்பினர்கள், அமைச்சர்கள் எனப் பலர் அங்கு வந்து சென்றபோதிலும் அதன் நிர்மாண வேலைகள் எவராலும் முன்னெடுக்கப்படவில்லை என்ற விடயத்தையும், சிறிய கட்சிகள் பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவம் செய்வதற்குக் காரணகர்த்தாவாக இருந்த மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரப் அவர்களுடைய பெயரிலே அந்தக் கட்டிடம் இருக்கின்றது என்ற விடயத்தையும், அந்த வெட்டுப்புள்ளி 5 சதவீதமாகக் குறைக்கப்படாதிருந்தால், இன்று பாராளுமன்றத்தில் 159 ஆசனங்களையும் சனாதிபதிப் பதவியையும் பெறுவதற்கான வாய்ப்பு இருந்திருக்காது என்ற விடயத்தையும் நாங்கள் அவருக்கு மிகத் தெளிவாக எடுத்துக் கூறினோம்.

மாண்புமிகு சனாதிபதி அவர்கள் தன்னால் முடியுமானவற்றைச் செய்து தருவதாக அதன்போது வாக்குறுதி வழங்கினார். அதற்காக அவருக்கு இந்தச் சந்தர்ப்பத்தில் நன்றிகளைக் கூறிக் கொள்கின்றேன். அம்பாறை மாவட்ட கரையோரப் பிரதேசத்துக்கான ஒருங்கிணைப்புக் குழுத் தலைவராக இருக்கின்ற கௌரவ அபூபக்கர் ஆதம்பாவா அவர்களும் அம்பாறை மாவட்டத்தின் DCC Chairmanஆக இருக்கின்ற கௌரவ வசந்த பியதிஸ்ஸ அவர்களும் இந்த விடயத்தை முன்னெடுப்பதற்கு உதவியாக இருந்தார்கள். அதற்காக அவர்களுக்கும் இச்சந்தர்ப்பத்தில் எனது நன்றியைக் கூறுகின்றேன். கிழக்கு மாகாண ஆளுநர் திரு. ஜெயந்த லால் அவர்கள் இந்த விடயத்தை மிக உன்னிப்பாக உற்றுநோக்கி, தான் இதற்காக ஒவ்வொரு வருடமும் பத்து மில்லியன் ரூபாயைத் தருவதாக அம்பாறையில் நடைபெற்ற DCC meettingஇல் கூறினார். அவருக்கும் இச்சந்தர்ப்பத்தில் எனது நன்றிகளைக் கூறிக்கொள்கின்றேன்.

எதிர்க்கட்சியில் இருந்துகொண்டு இவ்வாறான வேலைத்திட்டங்களைச் செய்ய முடியுமா? என்றெல்லாம் இன்று விமர்சனங்கள் எழுகின்றன. நாங்கள் பாராளுமன்றத்துக்கு வருவது, இங்கு இருக்கின்ற வரப்பிரசாதங்களைப் பெற்றுவிட்டுப் போவதற்கு அல்ல. மக்களுடைய பிரச்சினைகளை இந்தத் தளத்தில் கொண்டுசேர்ப்பதற்காகவே வந்திருக்கின்றோம். மிகக் காத்திரமானதோர் எதிர்க்கட்சி அமைகின்றபோதுதான் ஜனநாயகம்மிக்க ஒரு தேசம் பிறக்கும். அவ்வாறு நீங்கள் மூன்று பாராளுமன்ற உறுப்பினர்களாக இருந்து, ஆளும் தரப்பின் தவறான செயற்பாடுகளைத் தொடர்ச்சியாக சுட்டிக்காட்டியதன் விளைவாகத்தான் இன்று நாட்டு மக்கள் உங்கள்மீது கொண்ட நம்பிக்கையின் அடிப்படையில் 159 ஆசனங்களை வழங்கி இருக்கிறார்கள். அவ்வாறு செயற்படுவதற்குத்தான் நாங்களும் வந்திருக்கிறோம். எங்களுடைய மூதாதையர்கள் பாராளுமன்றத்தில் இருந்தார்கள் என்பதற்காக, அப்பாராளுமன்றப் பிரதிநிதித்துவத்தைப் பாதுகாப்பதற்காக நாங்கள் வரவில்லை.

தற்போதைய எங்களுடைய அரசியல் தலைவர்களின் அரசியல் செயற்பாடுகளை உற்றுநோக்கியபோது, அவர்கள் எங்களுடைய சமூகத்துக்காக எந்தவிதப் பணியையும் செய்வதற்குத் தயார் நிலையில் இல்லை என்பது எங்களுக்குத் தெரிந்தது. அதன்பிறகுதான், சாதாரண விவசாயினுடைய, வர்த்தகருடைய பிள்ளைகளாகிய நாங்கள், அரசியலில் இறங்கி இங்கே வந்திருக்கின்றோம். யார் பிழை செய்தாலும் அதைச் சுட்டிக்காட்ட வேண்டும், மக்களுக்கு என்ன தேவை இருக்கின்றதோ அதை இங்கு சுட்டிக்காட்ட வேண்டும் என்ற அடிப்படையில்தான் நாங்கள் இங்கு வந்திருக்கிறோம். வழங்கப்பட்டு இருக்கின்ற 300 மில்லியன் ரூபாய் நிதிக்கு, நீங்கள் இந்த Budgetக்கு ஆதரவு வழங்குவீர்களா? என்றெல்லாம் கேள்வி எழுகின்றது. இவ்வாறான கேள்விகளை முன்வைக்கின்ற சகோதரர்களைப் பார்த்து, நாங்கள் நிறைய விடயங்களைக் கேட்க விரும்புகின்றோம்.

இன்று நாட்டில் பல்வேறு விடயங்களுக்கு நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது. அன்று 2025ஆம் ஆண்டுக்கான பாதீட்டில் அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை போன்ற சிறுபான்மைச் சமூகத்தினர் வாழும் பிரதேசங்களுக்கு ஒதுக்கப்பட்டு இருக்கின்ற நிதி போதாமல் இருக்கின்றது எனக் கூறியபோது, ஆளும்தரப்பில் உள்ளவர்கள் எழுந்து பதில் சொன்னார்கள், "இந்தியாவின் நிதி உதவிமூலம் உங்களுடைய பிரதேசங்களை நாங்கள் கட்டியெழுப்புவதற்குத் தயாராக இருக்கின்றோம்" என்று. இன்னும் ஒரு மாதத்துடன் இந்த 2025ஆம் ஆண்டு முடிவடைய இருக்கின்றது. எனினும், எந்த நிதியும் எங்களுக்கு வந்து சேரவில்லை.

எங்களுடைய பிரதேசத்தில் ஆரம்பிக்கப்பட்ட ஒலுவில் துறைமுகத்தின் நிர்மாணப் பணிகள் காரணமாக 120 ஹெக்டெயாருக்கும் மேற்பட்ட காணிகள் கடலரிப்பால் காவுகொள்ளப்பட்டு இருக்கின்றது. அந்தப் பிரதேசத்தில் இருந்த தென்னந்தோட்டங்களை, வயற் காணிகளை மக்கள் இழந்தார்கள். அது மாத்திரமல்லாமல், இரண்டு துறைசார்ந்த துறைமுகங்களும் அங்கு மூடப்பட்டு இருக்கின்றன. ஒன்று,

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

வர்த்தகம் சார்ந்த துறைமுகம். அடுத்தது, மீன்பிடித் துறைமுகம். வர்த்தகம் சார்ந்த துறைமுகத்தை நீங்கள் இப்போது அமைக்காவிட்டாலும், ஏன் மீன்பிடித் துறைமுகத்தை அமைப்பதற்கு நிதி ஒதுக்கவில்லை? இதனால் 5,000க்கும் மேற்பட்ட மீனவர்கள் நேரடியாகவும், 15,000க்கும் மேற்பட்ட மீனவச் சமூகத்தினர் மறைமுகமாகவும் பாதிக்கப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். இந்தத் துறைமுகத்தின் அபிவிருத்தி நடவடிக்கைகள் காரணமாக ஏற்பட்ட கடலரிப்பால் பாதிக்கப்பட்ட காணிச் சொந்தக்காரர்களுக்கு இதுவரை எந்தவிதமான நஷ்டஈடும் வழங்கப்படவில்லை. அதற்குரிய நடவடிக்கைகளையும் இந்த அரசாங்கம் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று வர்த்தகம் சார்ந்த விடயங்கள் நிறையவே பேசப்பட்டன. கல்முனை என்பது வர்த்தகம் சார்ந்த ஒரு பிரதேசமாகக் காணப்படுகின்றது. சுமார் 80 வருடங்கள் பழைமைவாய்ந்த கல்முனை பொதுச் சந்தையில், 50 வருடங்களுக்கு முன்னர் மர்ஹூம் ஏ.ஆர். மன்சூர் அவர்களால் கட்டிக்கொடுக்கப்பட்ட வர்த்தகக் கட்டிடத் தொகுதி இன்று பாவனைக்கு உதவாத நிலையிலே உள்ளது. நேரடியாக வர்த்தகத்தில் ஈடுபடுகின்ற 10,000க்கும் மேற்பட்ட மக்கள் அன்றாடம் சென்று வருகின்ற அந்த வர்த்தகக் கட்டிடத்தொகுதி இன்று பாதுகாப்பற்ற நிலையிலே இருக்கின்றது. அதாவது, மக்கள் அங்கு சென்று வரும்பொழுது, அது இடிந்து விழுமோ என்ற ஐயப்பாடு காணப்படுகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உரையை முடித்துக் கொள்ளுங்கள்!

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
எனக்கு 14 நிமிடங்கள் ஒதுக்கப்பட்டு இருந்தது. தயவுசெய்து, இன்னும் 2 நிமிடங்கள் தருமாறு கேட்டுக்கொள்கின்றேன்.

இன்று மாநகர சபையாகக் காணப்படுகின்ற கல்முனை ஒரு காலத்தில் பட்டின சபையாக இருந்தது. பின்னர் அது பிரதேச சபையாக மாறி, நகர சபையாக மாறி, மாநகர சபையாக மாறியிருக்கின்றது. சுமார் 80 வருடங்களாகியும் இன்றும் அதே பழைய கட்டிடத்திலும் வாடகைக் கட்டிடங்களிலுமே அது இயங்கி வருகின்றது. இவ்வாறான விடயங்களில் அந்தப் பிராந்தியத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் கவனம் செலுத்தாமல் இருந்திருக்கிறார்கள். அம்பாறை மாவட்டத்தின் கரையோரப் பிரதேசத்திலுள்ள 85,000க்கும் மேற்பட்ட தமிழ், முஸ்லிம் மக்கள் உங்களுக்கு வாக்களித்து இருந்தார்கள். அம்பாறை தொகுதியில் 65,000 வாக்குகளைப் பெற்ற உங்களுடைய கட்சி, நான்கு பிரதிநிதிகளைப் பெற்றிருக் கின்றது. எங்களுடைய பிரதேசத்திலிருந்து இவ்வளவு வாக்குகளைப் பெற்ற நீங்கள், வெறுமனே ஒரு தேசியப் பட்டியல் உறுப்பினர் பதவியை மாத்திரம் வழங்கி இருக்கின்றீர்கள். இவ்வாறான நிலையில், நாங்கள் இந்த Budgetக்கு வாக்களிக்க வேண்டுமா, இல்லையா? என்ற கேள்வி எழுகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைந்துவிட்டது.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
தயவுசெய்து, எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

இப்பொழுது permit சம்பந்தமாகப் பேசப்படுகின்றது. மாண்புமிகு சனாதிபதி அவர்கள், வெளிநாட்டில் இருக்கின்ற இலங்கையைச் சேர்ந்த கல்விமான்களை நாட்டுக்கு மீள வருமாறு அழைக்கிறார். இப்பொழுது இந்த நாட்டில் இருக்கின்ற படித்தவர்களுக்கு நீங்கள் என்ன சலுகைகளை வழங்கி இருக்கிறீர்கள்? Doctorsக்குரிய permit வழங்கப் படவில்லை. அதுமாத்திரமல்ல, படித்துப் பல்கலைக் கழகங்களில் பேராசிரியர்களாக இருக்கின்றவர்களுக்கு நீங்கள் எந்த வசதிகளையும் செய்யாமல் இருக்கின்றீர்கள். அவர்களுக்குக் கொடுக்கின்ற சம்பளம் போதாமல் இருக்கின்றது. பொதுப் போக்குவரத்தில்கூட அவர்கள் பயணம் செய்வதற்கான வசதி வாய்ப்புகள் இல்லாமல் இருக்கின்றது. சாதாரணமாக பஸ்களில் பிரயாணம் செய்தால், ஆடைகளை மாற்றிவிட்டுத்தான் அலுவலகத்துக்குச் செல்லவேண்டி இருக்கின்றது. இவ்வாறான நிலைமைகள் இருக்கையில், எவ்வாறு நாங்கள் இந்தப் பாதீட்டுக்கு ஆதரவாக வாக்களிக்க முடியும்? எனக் கேட்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைந்துவிட்டது.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
மின் கட்டணம் குறைக்கப்படும் என்றீர்கள்; நீர்க் கட்டணம் குறைக்கப்படும் என்றீர்கள்; எரிபொருள் விலை குறைக்கப் படும் என்றீர்கள். ஆனால், எதுவுமே நடந்தேறவில்லை. இவ்வாறான நிலையில், நாங்கள் ஒரு விடயத்துக்காக மாத்திரம் பாதீட்டுக்கு ஆதரவாக வாக்களிக்க முடியாது. மறைந்த மாமனிதர் அஷ்ரப் அவர்கள் கூறியதுபோன்று, "தங்கப் பாதணிகள் தருகின்றோம்; உங்கள் கால்களைத் தாருங்கள்" என்று கேட்கின்ற அரசியல்வாதிகளுக்கு மத்தியில், இவ்வாறு நாங்கள் எங்களுடைய கௌரவத்தையும் மானத்தையும் இழந்து நிற்க முடியாது. 300 மில்லியனுக்காக எங்களுடைய -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.58]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු රාශියක් අද උදේ ඉඳලා අප ආණ්ඩුවේ දෙවන අය වැය සම්බන්ධයෙන්

තමන්ගේ අදහස් ඉදිරිපත් කළා. එතුමන්ලා ඉදිරිපත් කළ බොහෝ කථාවල සඳහන් වුණේ මෙම අය වැය විනිවිදභාවයෙන් යුතු නැහැ, අපි කියපු දේවල් කරලා නැහැ, අපි ජනතාවට පොරොන්දු වුණු දේවල් කරලා නැහැ, තරුණයෝ මං මුළා කරලා වාගේ දේවල්. මම විපක්ෂයෙන් මේ කාරණය අහන්න කැමැතියි. මීට කලින් ගරු මන්ත්‍රීවරියක් කථා කරනකොට කිව්වා, රොනී ද මැල් මැතිතුමා අය වැය කථාව පටන් ගනිද්දී කොහොමද ඒක පටන් ගත්තේ කියලා. "හැකිළුණු ආර්ථිකය වෙනුවට විවෘත ආර්ථිකයක් සහිත රටක් හදන්න මේ අය වැය මූලික වෙනවා" කියමින් රොනී ද මැල් මැතිතුමා අය වැය කථාව පටන් ගත්ත බව තමයි එතුමිය කිව්වේ. රොනී ද මැල් මැතිතුමාට ඉස්සර අපේ තාත්තා කිව්වේ, "පනී ද පිල්" කියලා. කිසිම ප්‍රතිපත්තියක් නැති, එහෙන් මෙහාට පනින, මෙහෙන් එහාට පනින දේශපාලන සංස්කෘතියක් ඇති කරපු රොනී ද මැල්වයි, අනුර කුමාර දිසානායකයි සංසන්දනය කරන්න තිබෙන අයිතිය මොකක්ද? අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මේ රටේ සුවහසක් ජනතාවගේ විශ්වාසය දිනා ගත්, මේ රටේ සුවහසක් මිනිස්සු ආදරය කරන, ප්‍රතිපත්ති ගරුක, කියන දේ කරන, කරන දෙයට වගකියන ආදරණීය ජනාධිපතිවරයෙක්. රොනී ද මැල්ගේ ආර්ථික විශ්ලේෂණයන් හෝ රොනී ද මැල්ගේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාත්මක කරන්න අපි බැඳිලාත් නැහැ, අපි ඒ අනුව කටයුතු කරන්නේත් නැහැ. ජාතික ජන බලවේගයේ අපි කටයුතු කරන්නේ මිනිසුන්ගේ විශ්වසනීයභාවය ආරක්ෂා වන විධියට සහ ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් අපි ජනතාවට පොරොන්දු වුණු ලස්සන ජීවිතයක්, පොහොසත් රටක් උදා කර ගැනීම වෙනුවෙන් කියන එක මම මූලික වශයෙන් සඳහන් කළ යුතු වෙනවා.

ජනාධිපතිතුමා අය වැය කථාව මඟින් ප්‍රධාන කාරණා හයක් යටතේ වන උපාය මාර්ගික අරමුණු පිළිබඳව පැහැදිලි කරනු ලැබුවා. තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක්, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක්, ණය තිරසරභාවය සහතික කිරීම, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සහ ඩිජිටල්කරණ ප්‍රවර්ධනය යන ප්‍රධාන උපාය මාර්ගික කාරණා හය පදනම් කර ගනිමින් අය වැය ලේඛනය තුළ ඇති අතිවිශාල කාර්යයන් ප්‍රමාණයක් ජාතික ජන බලවේගය ආණ්ඩුවේ දෙවන අය වැය 2026 වසරේ සාර්ථක කර ගන්නා බව තමයි එතුමා එම කථාව තුළින් පැහැදිලි කරනු ලැබුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය වසර තුළ අපට විපක්ෂය ගෙනාපු ප්‍රධාන තර්කයක් වුණේ, තේ කඩයක් කරන්න බැරි පිරිසකට මේ රටේ ජනතාව බලය දීලා, ජනතාව මං මුළා වුණා කියන එකයි. අපට එවැනි හාස්‍යජනක කථා කිව්වා. තමන්ගේ හෘදය සාක්ෂියට කථා කරලා බලන්න, අද රටේ හැම පළාතකම, හැම දිස්ත්‍රික්කයකම, හැම ගමක් ගාණේම පුංචි, පුංචි පාරවල් කීයක් හැදෙනවාද කියලා. අපේ පළමු අය වැයෙන් ජනතාවට පොරොන්දු වුණා, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සහ ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීම වෙනුවෙන් අපි කටයුතු කරනවා කියලා. ගමේ පාරත් එක්ක බැඳුණු මහා දුක් කම්කටොලු රාශියක් මිනිසුන්ට තිබුණා. ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමේ ප්‍රධාන අංගයක් විධියට පළමුවැනි අවුරුද්ද තුළ ග්‍රාමීය පාරවල් ටික ප්‍රතිසංස්කරණය රට පුරා ක්‍රියාත්මක කරන්න අපි සමත් වුණා.

ඒ වාගේම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කළා. මේ රටේ මිනිස්සු අපට බලය ලබා දෙනකොට ඒ මිනිස්සු කවුරුවත් කිව්වේ නැහැ, යටිතල පහසුකම් ටික හොඳට හදලා දෙන්න කියලා. ඒ මිනිස්සු අපෙන් ඉල්ලීමක් කළා, අධ්‍යාපනය තුළ දරුවන්ට තිබෙන බර අඩු කරන්න කියලා. අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනාවා. ඒවා ක්‍රියාත්මක කරනකොට යම් යම් අයට රිදෙන්න පුළුවන්, යම් යම් අය ඒවාට අකැමති වෙන්න පුළුවන්. නමුත්, සුවහසක් මිනිසුන්ගේ, සුවහසක් දරුවන්ගේ සුබසාධනය වෙනුවෙන් අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනාවා. ඩිජිටල්කරණය සාක්ෂාත් කර ගැනීම සඳහා අපි කටයුතු කළා. අවුරුදු 76ක් තිස්සේ ආණ්ඩු කරපු විපක්ෂයේ අයට කරන්න බැරි වුණු බොහොමයක් දේවල් ගත වුණු අවුරුද්ද තුළ නවක සහ අත්දැකීම් නැති ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට පළමුවැනි අය වැය තුළින්ම ලස්සනට කරන්න පුළුවන් වුණා කියන එක ඔප්පු කරලා පෙන්නුවා. එම නිසා මේ රටේ මිනිස්සු කවුරුවත් අපට බණින්නේ නැහැ. මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියනවා, තමන්ගේ ෆෝන් එක පාවිච්චි කරලා සමාජ මාධ්‍යවලට ගිහිල්ලා බලන්න, ඒ වාගේම විපක්ෂයේ සමහරු කරන ප්‍රකාශවලට, සමහර මාධ්‍ය ප්‍රකාශවලට මිනිස්සු දමන comments පොඩ්ඩක් කියවලා බලන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී ඔබතුමා මූලාසනයේ ඉන්න එක ගැන මම සතුටු වෙනවා. ඔබතුමාත්, මගේ පියාත් වතු කම්කරු ප්‍රජාව වෙනුවෙන් අරගළයක නිරත වුණු, ඒ වෙනුවෙන් සටන් කරපු ආදරණීය සහෘදයන් දෙදෙනෙක්. කරුණු කාරණා ගොඩක් කියන්න තිබුණත්, මට ලැබී තිබෙන කාලය ඒ සඳහා ප්‍රමාණවත් නැහැ. නමුත් මම මේ වෙලාවේදී විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට 2019 වසරේ හොඳම නව කථාව ලෙස පිදුම් ලැබූ, ඒ වාගේම 2024 ස්වර්ණ පුස්තක සම්මානය හිමි වුණු, වසරේ විශිෂ්ටතම නවකථාව ලෙස සම්මාන ලැබූ විරාජිනී තෙන්නකෝන් මහත්මිය විසින් රචිත "කැමෙලියා" නමැති පොතේ ඡේදයක් උපුටා දක්වනවා. ඒක ඔබතුමාටත්, ඒ අරගළ කරපු සියලුදෙනාටත් දක්වන ගෞරවයක් විධියට මා සලකනවා. මම මේ ප්‍රකාශයෙන් කියන දෙය එතුමිය අදහස් කළේ නැත්නම් මම මේ සභාවේ ඉඳගෙන එතුමියගෙන් සමාව අයදිනවා. නමුත්, මේ පොත කියවන පාඨකයෙක් විධියට මටත් යම්කිසි අයිතියක් තිබෙනවා, මම තේරුම් ගන්න දේ මට වුවමනා ආකාරයෙන් කියන්න. එවකට පැවති සුදු අධිරාජ්‍යවාදය සහ ඒකට කත් ඇදපු ආණ්ඩුවේ හිටපු ලොකු ලොක්කන්ගේ වධ හිංසනයට ලක් වෙච්ච වතු කම්කරු ප්‍රජාව සම්බන්ධයෙන් සංකේත සහ මිනිස්සු පාවිච්චි කරලා මේ කථාව කියලා තිබෙනවා. එම පොතේ 191වැනි පිටුවේ ඇය සඳහන් කරනවා, ඒ පාලකයින් වතු කම්කරු ප්‍රජාව කොච්චර පීඩාවට පත් කරලා තිබුණාද කියලා. එක් අවස්ථාවක, මෙහි ප්‍රධාන චරිතය වුණු ජෙෆ්රි කියන වතු හාම්පුතා වතු කම්කරුවන්ගේ අරගළය සම්බන්ධයෙන් මෙන්න මෙහෙම ප්‍රකාශයක් කරනවා. "කැමෙලියා" නමැති පොතේ 191වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

> "ඔහු තම ක්‍රෝධයේ තුවක්කුවට භීතියේ පතරොම් පුරවමින් එය කම්කරුවන් හැම එකාගේ ම හිසට ඉහළින් අල්ලාගෙන සිටියේය. උඹලැ මහලොකු කෙරුමාට කියපල්ලා පුළුවං නම් උඹලගේ පඩි වැඩි කරලා දෙන්න කියලා"

මේක තමයි ඔවුන් කම්කරුවන්ට කථා කරපු විධිය. පසුගිය කාලයේ මධ්‍යම කඳුකරයේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමහර මන්ත්‍රීවරු පරාජයෙන් පීඩාවට පත් වෙලා දිස්ත්‍රික්කයේ එක එක තැන්වල රැස්වීම් පවත්වමින් අපට කිව්වා, "පුළුවන් නම් ජාතික ජන බලවේගයේ ඔයගොල්ලන්ගේ අයට කියලා පඩිය වැඩි කරලා පෙන්වන්න" කියලා. අපි පඩි වැඩි කරලා පෙන්නුවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව පළමුවැනි අවස්ථාවේදීම වතු කම්කරු ජනතාවගේ ජීවිත නඟාසිටුවීම වෙනුවෙන් ඔවුන්ගේ වැටුප රුපියල් 1,750ක් දක්වා වැඩි කරලා පෙන්නුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)

මම කථාව අවසන් කරන්නම්, ඒ පොතේම තව උපුටනයක් දක්වමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පොතේම තව තැනක තිබෙනවා, මිනිසුන්ට ජීවිත අහිමි කළ ඒ පාලනයන් ගැන. ඒ පොතේ එක තැනක ඉතාම සංවේදී සටහනක් තිබෙනවා, "මිය යන මිනිසුන් අහිමි වීම ස්වාභාවිකයි. එහෙත් ජීවත් වන මිනිසුන් අහිමි වීම මාරාන්තිකයි" කියලා. වතු කම්කරුවන් අන්න එහෙම මාරාන්තික ජීවිත තමයි ගත කළේ. ඒ නිසා අද දහසක් වතු කම්කරු ජනතාව ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුවට සුබ පතනවා සහ ආණ්ඩුව ප්‍රශංසාවට ලක් කරනවා, ඔවුන්ගේ ජීවිත නඟාසිටුවීම වෙනුවෙන්. ඒ නිසා අය වැය ගැන මොන විවාද කළත්, මොන කාරණා කිව්වත්; ආණ්ඩුව දැන් කුජීත වෙලා ඉන්නේ, ආණ්ඩුව මෙහෙමයි කියලා කිව්වත් ඇත්තටම කුජීත වෙලා ඉන්නේ ආණ්ඩුව නොවෙයි විපක්ෂය. විපක්ෂය කැලඹිලිකාර කුණාටුවකට අහු වෙලා වැරහැලි රුවල් සහිත අබලන් ඔරුවක නැඟලා අඬනවා; අඳෝනා දෙනවා; කෙඳිරි ගානවා. ඒ එකකටවත් අපිව වට්ටන්න බැහැ කියන එක හොඳට මතක තියා ගන්න. ජනතාව අපිත් එක්ක ඉන්නවා. අපිත් එක්ක සිටිමින් මේ අවුරුදු පහ තුළ අපේ රටට කරන්න පුළුවන් දෙය වෙනුවෙන් ඒ ජනතාව කටයුතු කරන්න ලැහැස්තියි කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.07]

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ කෙරුණු කථා අහගෙන හිටපු මට මෙන්න මෙහෙම දෙයක් හිතුණා. ඒ කියන්නේ, මේ හැම කථාවකම කියැවෙනවා අපි කරන්න හිතාගෙන හිටපු එකක් තමයි මේගොල්ලන් කරන්නේ, මේක අපි මීට කලින් කරන්න හිතාගෙන හිටියේ, අපේ නායකයින් මේක ගැන සෑහෙන්න සිහින දැක්කා වාගේ කථාවක්. මෙහෙමයි. ඉතින් හොඳයි නේ, ඒගොල්ලන් කරන්න හිතාගෙන හිටපු එක අපි කරනවා නම්. ඒගොල්ලන් හැම දාම කරනවා, කරනවා කියලා මිනිසුන් රවටමින් හිටපු එක දැන් අපි කරනවා.

මම කියන්නේ සතුටු වෙන්න කියලා; ඔයාලා සතුටු වෙන්න කියලා තමයි අපි විරුද්ධ පක්ෂයට කියන්නේ. ඒගොල්ලන් කරන්න හිතාගෙන හිටපු එකක් අපි කරනවා කියලා දුක් වෙන්න හොඳ නැහැ. මම වැඩ කරන ක්ෂේත්‍රය ගත්තොත්, මම ගොඩක් වෙලාවට වැඩ කරන්නේ සිනමාව, ටෙලි නාට්‍ය කලාව, නාට්‍ය කලාව තුළ නේ. අපේ ක්ෂේත්‍රයේ තිබෙනවා, මම කරන්න හිතාගෙන හිටපු එකක් තව කෙනෙක් කරපු නිසා දුක හිතෙන අවස්ථා. ඒ කියන්නේ මම කරන්න හිටපු ටෙලි නාට්‍යයක පිටපතක් තව කවුරු හරි කළොත් දුක හිතෙනවා. මේක ටෙලි නාට්‍ය පිටපතක් නොවෙයි. මේක අය වැය. ඒක නිසා මේකට දුක් වෙන්න එපා. මම විරුද්ධ පක්ෂයට කියන්නේ ඔයගොල්ලන් කරන්න හිතාගෙන හිටපු එක අපි කළා කියලා දුක් වෙන්න එපා කියලායි. මේක අය වැය. මේක ටෙලි නාට්‍ය පිටපතක් නොවෙයි. හැබැයි, සතුටු වෙන අයත් හිටියා.

මම දැක්කා, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඉතාම සතුටින් ඉපිලෙමින් කිව්වා, මහා භාණ්ඩාගාරය පිරී ඉතිරී යනවා, ට්‍රිලියනයක විතර මුදල් එකතු වෙලා තිබෙනවා, මීට කලින් ඉතිහාසයේ, පෙර නොවූ විරූ ලෙස; මීට කලින් දැකපු නැති තරම් මුදලක් එකතු වෙලා තිබෙනවා කියලා. ඒ සතුටු වීම දැකලා මට සතුටක් එනවාත් එක්කම පොඩි භයකුත් ආවා. සමහර ගම්වල ගෙවල්වල තිබෙන වත්කම් එළියට කියන්නේ නැහැ. ගෙදර රත්රන් බඩු මෙච්චරක් තිබෙනවා, වටිනා කියන බඩුබාහිරාදිය මෙච්චරක් තිබෙනවා කියලා කියන්න භයයි. හොරු පනිනවා. මහා භාණ්ඩාගාරය තුළ ට්‍රිලියනයක් විතර එකතු කරලා තිබෙනවා කියලා විපක්ෂය සතුටු වෙද්දී අපට පොඩි භයක් එනවා. මොකද, හොඳට තිබුණු මහ බැංකුවට කරපු වින්නැහිය අපි දන්නවා නේ. ඒක නිසා. එතුමාගේ ප්‍රකාශය සම්බන්ධව අපි සතුටු වෙන ගමන් -මහා භාණ්ඩාගාරය සශ්‍රීකව පුරවා තිබෙන එක ගැන එතුමා සතුටු වීම සම්බන්ධයෙන් අපි සතුටු වෙන ගමන්- අපට පොඩි භයකුත් තිබෙනවා කියන කාරණය අපි කියන්න ඕනෑ.

අපි 2025 වර්ෂයට අය වැයක් ඉදිරිපත් කළා; 2026 වර්ෂයට අය වැය ඉදිරිපත් කළා. 2025 අය වැයේ ප්‍රගතිය සම්බන්ධයෙන් සතුටු වෙන්නේ නැහැ කියලා නිතර, නිතර විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කියනවා අපට ඇහුණා. ඔව්. ඔබතුමන්ලා වාගේම තමයි අපටත් සියයට 100ක තෘප්තියක් නැහැ. අපි හිතපු දේවල් සියයට 100ක් කරගන්න අපට බැරි වෙන්න ඇති. මම හිතන්නේ නැහැ, ඉතිහාසයේ කිසිම අය වැයක් සියයට 100ක ප්‍රගතියක් පෙන්නුවා කියලා. එහෙම නැහැ. අපි සතුටු වෙන්නේත් නැහැ. අනෙක් එක තමයි, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියනවා, කිසිම විධියකින් ඔබතුමන්ලා කනගාටු වෙන්න එපා කියලා. අපට ඔබතුමන්ලා එක්ක තරගයක් නැහැ. අපට තරගයක් තිබෙන්නේ අපිත් එක්ක. අපි උත්සාහ කරනවා සංවර්ධනය සඳහා වෙන් කරන මුදල් පුළුවන් තරම් වියදම් කරලා ඉවර කරන්න. මීට කලිනුත් අපේ මන්ත්‍රී සහෝදරවරු ඒක සඳහන් කළා. මේ අවුරුද්දේ මාර්තු මාසයේ වාගේ තමයි 2025 අය වැය සම්මත කර ගත්තේ. ඉතාම කෙටි කාලයක් තමයි අපට තිබුණේ සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීම සඳහා; ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා. සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අත්පත් කර ගැනීමේදී යම් පසුගාමීත්වයක් තිබෙනවා වෙන්න පුළුවන්. හැබැයි, ඒකට හේතුව තේරුම් ගන්න පුළුවන් ජනාධිපතිතුමන් කරපු කථාව හරියට අහගෙන හිටියා නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

මට බොහොම පොඩි කාලයක් නේ ලැබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ප්‍රවිෂ්ටය පමණයි.

ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය කථාවේ 42වන පිටුවේ තිබෙනවා, "රාජ්‍ය සේවය නවීකරණය කිරීම" කියලා මාතෘකාවක් සහිතව විස්තරයක්. ඒක යටතේ තිබෙනවා, රාජ්‍ය සේවය සඳහා 75,000කට ආසන්න පිරිසක් නිසි ක්‍රමවේදයන් යටතේ බඳවා ගැනීමට අනුමැතිය ලබා දීලා තිබෙනවා කියලා. ඇයි මේ? අපි දන්නවා, ගමක සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න ගියාට පස්සේ, යෝජනාවක් ක්‍රියාත්මක කරන්න ගියාට පස්සේ ඒ අදාළ ආයතනවල TAලා නැහැ; TOලා නැහැ; ඉංජිනේරු මහත්වරු නැහැ; designersලා නැහැ. එතකොට ඒවා ප්‍රමාද වෙනවා. ඒ මුදල් නැවත වතාවක් හැරිලා යනවා. ඒවා

නවත්වන්න බැහැ. ඒක නිසා මේක ක්‍රමවත් කරන්න ඕනෑ. ඒක නිසා තමයි මේ බඳවා ගැනීම් කරන්නේ. අපි එකවර නොවෙයි, ක්‍රමිකව මේ සංවර්ධනය ඉදිරියට අරගෙන යනවා.

ඒ විතරක් නොවෙයි. රජයේ ආයතනවල ඩිජිටල් ප්‍රවේශය ඉහළ නැංවීමත් සිදු කරනවා. ඇයි මෙහෙම කරන්නේ? ඒ ආයතනවල තිබෙන මේ මන්දගාමීත්වය නිසා. අපි මේ අය වැය කලින් ගෙනෙන්නේ, ජනවාරි විතර වෙද්දී මේ මුදල් ටික ගම්වලට යවන්න උත්සාහ කරන්නේ ගම්වල සංවර්ධන කටයුතු කරන්න ඕනෑ නිසා තමයි. ඒක නිසා තමයි රජයේ ආයතනවල ඩිජිටල් ප්‍රවේශය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේද යෝජනා කරලා, ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. රාජ්‍ය සේවයේ නියැළී ඉන්න සමහර සේවකයන්ගේ පත්වීම් ස්ථිර කරලා, ඔවුන්ට යම් ආත්ම විශ්වාසයක් ගොඩනඟන්න අපි උත්සාහ කරන්නේ ඒවා ක්‍රියාත්මක කරවන්න ඕනෑ නිසා තමයි. ඔය කියන ප්‍රගතිය කොහොමද කියලා අපි ලබන අවුරුද්දේ බලමු. කලබල වෙන්න එපා. මිනිසුන්ට හදිස්සියක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මිනිසුන්ට කිසිම හදිස්සියක් නැහැ, මේ රට යන ගමන සම්බන්ධයෙන්. මිනිස්සු හරිම සතුටින්, තෘප්තියෙන් ඉන්නේ. මේ අතෘප්තිකර හැසිරීම පෙනෙන්නේ, මේ පාර්ලිමේන්තු සභා ගර්භයේ සිටින විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් විතරයි.

ඒ වාගේම මට නැඟුණු චෝදනාවකට මම පොඩි උත්තරයක් දෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසුගිය සිකුරාදා දවසේ ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවෙන් පසුව අපි මේ සභා ගර්භයෙන් පිටවෙලා තේ පැන් සාදයට ගියා. මම දැක්කා මාධ්‍ය වාර්තා කරලා තිබුණා, ජගත් මනුවර්ණ තේ පැන් සාදයට සහභාගි වුණේ නැහැ, වරෙන්තු පිට ඉන්න නිසා මාධ්‍යයෙන් සැඟවුණා කියලා. නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නඩුව වසර 17ක් තිස්සේ මම උසාවියට ඉදිරිපත් වන නඩුවක්. මම උසාවිය මඟ හැරලා නැහැ. එදා නිශ්චිත දවසේ මට උසාවියට ඉදිරිපත් වෙන්න බැරි වීම සම්බන්ධයෙන් මම ලියකියවිලි ප්‍රමාණයක් උසාවියට ඉදිරිපත් කළා. නමුත් උසාවිය -ගරු අධිකරණය- ඒක ප්‍රතික්ෂේප කරලා තිබුණා. ඒක අධිකරණයේ අභිමතය. ඒකේ කිසි ගැටලුවක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)
නමුත් පහුවදාම මම motion එකක් මඟින් උසාවියට ඉදිරිපත් වෙලා warrant එක recall කරලා තිබෙන්නේ. නමුත් මාධ්‍යයෙන් නැවත නැවත වාර්තා කරනවා, මම කට්ටි පනිමින් ඉන්නවා, උසාවිය මඟ හරිමින් ඉන්නවාය කියලා. මේකෙන් මම විතරක් නොවෙයි, අපහසුතාවට පත් වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලංකාවේ පොලීසිය ඔවුන්ගේ රාජකාරිය අකුරට ඉටු කරන්නේ නැහැ කියලා මතයක් සමාජගත වෙන්න පුළුවන්. නමුත්, එහෙම නැහැ. පොලීසිය ඒ අයගේ රාජකාරිය හරියට ඉටු කරනවා. ඒ වාගේම අධිකරණයේ ක්‍රියාවලියට අපි ඉතාම ඉහළින් ගරු කරනවා. ඒ වාගේම අපට තිබෙන නඩුවලට වෙන්න පුළුවන්, චෝදනාවලට වෙන්න පුළුවන්, ඒවාට නිසි ආකාරයෙන් පිළිතුරු දෙමින්, ඒ අවශ්‍ය පරීක්ෂණවලට සහාය දක්වන්න අපි ඉදිරිපත් වෙනවාය කියන කාරණයත් මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ பி. சத்தியலிங்கம் உறுப்பினர் அவர்கள்! உங்களுக்கு 11 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[பி.ப. 5.15]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான பாதீடு தொடர்பாக இங்கு பேசுவதற்குச் சந்தர்ப்பமளித்தமைக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இலங்கை சுதந்திரமடைந்தபோது, இந்த நாட்டின் பொருளாதாரக் குறிகாட்டிகள் பல ஆசிய நாடுகளைவிட மிகவும் சிறப்பாக இருந்தன; யப்பானுக்கு அடுத்த நிலையில் இருந்ததாகச் சொல்கின்றார்கள். ஆனால், இலங்கை பின்பற்றிய பிழையான அரசியல் பொருளாதார கல்வி மற்றும் சமூகக் கொள்கைகளினால் பொருளாதாரத்திலும் சமூக விழுமியங்களிலும் பின்தள்ளப்பட்டு, இனக் குழுக்களுக்கு இடையே முரண்பாடுகள் ஏற்படுத்தப்பட்டு, இறுதியில் வங்குரோத்து அடைந்ததொரு நாடாக மாறி, மக்களைக் கொண்டுவந்து நடு வீதியில் நிறுத்தினார்கள். இந்த நிலையில்தான் தற்போதைய அரசாங்கம் சர்வதேச நாணய நிதியத்தினுடைய அனுசரணையுடனும், கூடிய வரி விதிப்புகள், வீண்விரயத்தைக் குறைத்தல் போன்ற நடவடிக்கைகளை எடுத்தும், அதிகரித்த உல்லாசப் பிரயாணிகளின் வருகைமூலமான வருமானம் மூலமாகவும் இலங்கையின் பொருளாதாரத்தை ஓரளவு உறுதி நிலைக்குக் கொண்டுவந்திருக்கின்றது. அந்த வகையில், இந்த அரசாங்கத்துக்கு என்னுடைய பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த நிலையைத் தக்கவைப்பதற்குத தொடர்ச்சியான, இறுக்கமான நிதி நிர்வாகத்தை ஏற்படுத்த வேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கிறது. அத்தோடு, நாட்டை மீளக் கட்டியெழுப்புவதற்கு அனைத்து மக்களையும் சமனாக நடத்தக்கூடிய அரசியல், பொருளாதார, கல்விக் கொள்கைகளை வகுத்துச் செயற்பட வேண்டிய பாரிய பொறுப்பும் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. ஓர் அரசின் வரவு செலவுத்திட்டம் என்பதை, நிதி முகாமைத்துவம் என்பதற்கு அப்பால், நாட்டினுடைய அரசியல் பொருளாதாரம் மற்றும் சமூகத்தைக் கட்டியெழுப்பும் ஒரு கொள்கைப் பிரகடனமாகவே நான் பார்க்கின்றேன். அதுவே நாட்டின் எதிர்காலப் போக்கை எதிர்வுகூறுகின்ற, நாட்டில் சமாதானத்துடன்கூடிய சக வாழ்வை உருவாக்குகின்ற அடிப்படையாக அமைய வேண்டும்.

[ගරු පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

இங்கே சமர்ப்பிக்கப்பட்டுள்ள 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட ஒதுக்கீட்டின் பெரும்பகுதி, அதாவது மொத்த ஒதுக்கீட்டில் 65 சதவீதம் கிட்டத்தட்ட ஆறு அமைச்சுகளுக்கு ஒதுக்கப்பட்டுள்ளது. நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு; பொது நிர்வாக, மாகாண சபைகள் அமைச்சு; சுகாதார மற்றும் வெகுசன ஊடக அமைச்சு; பாதுகாப்பு அமைச்சு; போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு என்பனவற்றுக்கே இந்த 65 சதவீதமான நிதி ஒதுக்கப்பட்டுள்ளது. இதிலிருந்து, நிர்வாகத்தைத் திறம்பட நடாத்துவதற்கும், அத்தியாவசிய சேவைகளை மக்களுக்கு வழங்குவதற்கும், கடனை மீளளிப்புச் செய்வதற்கும் இந்த அரசாங்கம் கூடுதலான கவனம் செலுத்துவதை நான் உணர்கிறேன்.

ஆனால், முக்கியமான இன்னும் சில அமைச்சுகள் இங்கு தவறவிடப்பட்டிருக்கிறது. கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சுக்கு 301 பில்லியன் ரூபாய் மட்டும் ஒதுக்கப்பட்டுள்ளது; இது மொத்த வரவு செலவுத்திட்டத்தின் 6.79 சதவீதமாக இருக்கின்றது. கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சுக்கு 221 பில்லியன் ரூபாய் மட்டுமே ஒதுக்கப்பட்டுள்ளது. அத்தோடு, வலுசக்தி அமைச்சு, digital பொருளாதார அமைச்சு என்பனவற்றுக்கும் குறைந்தளவு நிதியே ஒதுக்கப்பட்டுள்ளது. ஆனாலும், இந்த அமைச்சுகளின் மூலதனச் செலவுக்குக் கூடுதலான நிதி ஒதுக்கப்பட்டுள்ளமை பாராட்டக்கூடிய விஷயம். ஆனால், போர் முடிவடைந்து பதினாறு ஆண்டுகள் கடந்த பிற்பாடும் பாதுகாப்பு அமைச்சுக்கு மிகப்பெரிய தொகை - 455 பில்லியன் ரூபாய் - அதாவது மொத்த வரவு செலவுத்திட்டத்தின் 10.26 சதவீதம் ஒதுக்கப்பட்டிருப்பதை எந்தவிதத்தில் நியாயப்படுத்தலாம்? என்று நான் உங்களைக் கேட்கிறேன். இந்தப் பாரிய ஒதுக்கீடு இந்த நாட்டில் சமாதானத்தையோ அல்லது இந்த நாட்டினுடைய பொருளாதார அபிவிருத்தியையோ ஏற்படுத்துவதற்கு எந்தவிதத்திலும் பங்களிப்புச் செய்யப்போவதில்லை என்பதை இந்தச் சந்தர்ப்பத்திலே நான் உங்களுக்குத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோல, மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சுக்கு மொத்த Budgetஇன் 0.37 சதவீதம் ஒதுக்கப்பட்டிருக்கின்றது. சமூக வலுவூட்டுகை அமைச்சுக்கு 0.87 சதவீதம்தான் ஒதுக்கப்பட்டிருக்கின்றது. ஆனால், மேற்கூறிய இந்த இரண்டு அமைச்சுகளும் நாட்டினுடைய மனித வள மேம்பாட்டுக்கு மிகவும் அவசியமானவை. இந்த அமைச்சுகளுக்கான நிதியொதுக்கீடு குறைவாக இருப்பது மனவருத்தத்தைத் தருகின்றது.

ஒட்டுமொத்த நிதியில் 68 சதவீதம் மீண்டுவரும் செலவினங்களுக்குப் பயன்படுத்தப்படவிருக்கின்றது. 32 சதவீதமான நிதிதான் இந்த நாட்டினுடைய மூலதனச் செலவுக்காகப் பயன்படுத்தப்படவிருக்கின்றது. அந்த வகையில், 68:32 என்ற விகிதத்தில் மீண்டுவரும் செலவினங்களுக்கும் மூலதனச் செலவினங்களுக்குமான நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது. ஆனால், இந்த நாட்டினுடைய உற்பத்திப் பொருளாதாரத்தை நோக்கிய பயணத்தின் ஊடாகத் தேசிய உற்பத்தியைக் கூட்டி, ஏற்றுமதி வருமானத்தைப் பெருக்க வேண்டுமாயின் மூலதனச் செலவினத்திற்குத்தான் அதிக நிதி தேவை. அந்த விதத்தில் இந்த 32 சதவீதமான மூலதன நிதி போதாதென்றுதான் நான் கருதுகின்றேன்.

நிதியொதுக்கீடு செய்து அதனைச் செலவழிப்பது மாத்திரம் மாற்றத்தை ஏற்படுத்தாது. அந்தச் செலவால் ஏற்படும் விளைவை அளவிடக்கூடிய வகையிலே எதிர்காலத் திட்டங்கள் அமைக்கப்பட வேண்டும். நாடு நிலைபேறான பொருளாதார வளர்ச்சியை அடைய சமூகத்தில் காணப்படும் பாரிய ஏற்றத் தாழ்வுகள் நீக்கப்பட வேண்டுமானால் பொருத்தமான முதலீடுகளை நாட்டுக்குள் கொண்டுவர வேண்டும்; ஏற்றுமதி வருமானம் அதிகரிக்கப்பட வேண்டும்; இறக்குமதியைக் கட்டுப்படுத்தி, சிறிய மற்றும் நடுத்தரத் தொழில்முயற்சிகளை ஊக்கப்படுத்த வேண்டும். அதற்கான மானிய வசதிகள், தொழில்நுட்ப வசதிகள், இலகு கடன் சேவைகள் மக்களுக்கு ஏற்படுத்திக் கொடுக்கப்பட வேண்டும்.

கிராமிய வறுமையை ஒழித்தல் தொடர்பாக எடுத்துக்கொண்டால், உற்பத்தியில் ஈடுபடக்கூடியவாறு கிராமிய மக்களுக்கான வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்பட வேண்டும். கிராமிய உற்பத்தியில் காணி என்பது மிகவும் முக்கியமானது. அந்த வகையில், எங்களுடைய பிரதேசத்திலே மீளக் குடியேறுகின்ற பெருந்தொகையான மக்களுடைய காணிகள் இன்றும் பல திணைக்களங்களின் வசம் இருக்கின்றன. இவ்வாறு இருக்கும்போது சிறிய மற்றும் நடுத்தர உற்பத்தியாளர்கள் இந்த நாட்டுக்கு எவ்வாறு பங்களிப்புச் செய்ய முடியும்? ஆகவே, இந்தக் காணிகள் விடுவிக்கப்பட்டு, அவர்கள் அக்காணிகளில் பயிர் செய்வதற்குரிய ஏற்பாடுகள் மேற்கொள்ளப்பட வேண்டுமென்று நான் மிகவும் பணிவாகக் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோல, எங்களுடைய பிரதேசத்திலே, குறிப்பாக போருக்குப் பின்னரான காலப்பகுதியிலே மீளக் குடியேறிய பெரும்பாலான மக்களுக்கு விவசாயக் காணிகள் இல்லை அல்லது அவர்களது விவசாயக் காணிகளும் குளங்களும் வனப் பாதுகாப்புத் திணைக்களத்தினால் ஆக்கிரமிக்கப்பட்டிருக்கின்றது. வனமாக்கப்பட்ட அந்த இடத்திலே 40 வருடங்களுக்கும் மேற்பட்ட காலத்தில் எந்தப் புனரமைப்பும் செய்யப்படாத குளங்கள் இருக்கின்றன. ஆகவே, தயவுசெய்து அவை சம்பந்தமாகக் கவனம் எடுக்க வேண்டும்.

அதேபோல் உள்நாட்டு, வெளிநாட்டு முதலீட்டாளர்கள் இங்கு வரவேண்டும். மிகக் குறைந்த தனிநபர் வருமானத்தைக் கொண்ட, குறைந்தளவில் நாட்டின் மொத்தத் தேசிய உற்பத்திக்குப் பங்களிக்கின்ற வடக்கு மாகாணத்தில் முதலீட்டு வலயங்களைக் கொண்டுவருவதற்கான எந்த முன்மொழிவுகளும் இந்தப் பாதீட்டில் இல்லை. முதலீட்டாளர்கள் வடக்கு மாகாணத்திற்கு வர விரும்புகிறார்களில்லை. மூலப்பொருட்களை வெளிநாட்டிலிருந்து கொண்டுவர வேண்டும்; அதனால் அங்கு உற்பத்திச் செலவு அதிகம் என்று சொல்கிறார்கள். ஆகவே, நான் உங்களைக் கேட்டுக்கொள்வது, இந்திய அரசாங்கம் தரவிருக்கின்ற 61.5 மில்லியன் அமெரிக்க டொலர் நிதியைப் பயன்படுத்தி காங்கேசன்துறைத் துறைமுகத்தை அபிவிருத்தி செய்யுங்கள்! இப்போது காங்கேசன்துறைத் துறைமுகத்திற்குப் போனால், இந்திய சினிமாக்களில் சண்டைப் பயிற்சிக்கு தெரிவுசெய்த இடங்களைப்போல் அந்த இடங்கள் இருப்பதைக் காண முடிகிறது. அதேபோல, தலைமன்னாரில் இருக்கின்ற இறங்குதுறை அபிவிருத்தி செய்யப்பட வேண்டும்.

அதுமட்டுமல்ல, இந்தப் பாதீட்டிலே சுற்றுலாத் துறை சம்பந்தமாக நிறைய விடயங்கள் பேசப்பட்டிருக்கின்றன. ஆனால், அது தொடர்பில் எங்களுடைய வடக்கு, கிழக்கு

மாகாணங்கள் முற்றாகக் கைவிடப்பட்டிருக்கின்றது. வடக்கு, கிழக்கு மாகாணங்களிலே சுற்றுலாத் துறைக்கான எந்தத் திட்டமும் இந்த வரவு செலவுத்திட்டத்தில் முன்மொழியப்படவில்லை. சுற்றுலாவுக்கான உட்கட்டமைப்பு வசதிகள் அங்கு இல்லை. சுற்றுலா மற்றும் உபசரிப்புத் துறையில் முதலீடுகள் இல்லை. வடக்கில் சுற்றுலாவை மேம்படுத்த சந்தைப்படுத்தல் தொடர்பான திட்டம் எதுவும் சொல்லப்படவில்லை.

அதேபோல், Clean Sri Lanka வேலைத்திட்டத்தை எடுத்துக்கொண்டால், இதன் நோக்கம் சூழலைத் துப்புரவாக்குவது மட்டுமல்ல, ஒரு தூய்மையான சமூகத்தைக் கட்டியெழுப்பும் திட்டமாகவே இதை நான் பார்க்கின்றேன். கையூட்டல் இல்லாத, ஊழல் இல்லாத, போதையற்ற, இனவாதமற்ற, மொழிவாதமற்ற, மதவாதமற்ற, சமூக ஏற்றத்தாழ்வுகள் இல்லாத இலங்கையை உருவாக்குகின்ற முயற்சியே இந்த Clean Sri Lanka வேலைத்திட்டம். ஆனால், எங்களுடைய பிரதேசத்திலே என்ன நடக்கின்றது?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
தயவுசெய்து, இரண்டு நிமிடம் தாருங்கள்! எனக்கு 14 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்தது.

சில திணைக்களங்களால் மொழிவாரியாகப் பாகுபாடு காட்டப்படுகிறது; இன ரீதியாகப் பாகுபாடு காட்டப்படுகிறது. உதாரணமாக, தமிழ் மக்கள் மீளக் குடியேறிய சில இடங்களிலே மகாவலி அபிவிருத்தி அதிகாரசபை, வன வளத் திணைக்களம் ஆகியவை தமிழ் மக்களை மீண்டும் அங்கு பயிர்ச்செய்கை செய்ய விடாமல் தடுப்பதுடன், அங்கு குடியேற்றப்பட்ட மக்களை எந்தவிதமான அனுமதியும் இல்லாமல் ஆயிரக்கணக்கான ஏக்கர் காடுகளைத் துப்புரவு செய்ய அனுமதிக்கின்றன. எந்த விதத்தில் அந்தத் திணைக்களங்கள் அதைச் செய்கின்றன? அதற்கு எதிராக அரசாங்கமும் எந்த நடவடிக்கையும் எடுக்கவில்லை. நான் Clean Sri Lanka என்பதை மேற்கூறிய விடயங்கள் இல்லாத ஓர் ஆட்சியைக் கொண்டுவருவதற்கான திட்டமாகவே பார்க்கிறேன். தயவுசெய்து, இந்த விடயம் சம்பந்தமாக நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும்.

அடுத்து, 'ஒரு தேசம் - ஒன்றுபட்ட தேசிய நடவடிக்கை' என்ற போதைப்பொருளுக்கு எதிரான நடவடிக்கையை நாங்கள் வரவேற்கிறோம். எங்களுடைய சமூகத்தை இந்தப் போதைவஸ்து என்ற பேரழிவிலிருந்து காப்பாற்றுங்கள்! நாடு முழுவதும் தன்னார்வப் புனர்வாழ்வு நிலையங்களை அமைக்க முன்மொழியப்பட்டுள்ளதாகச் சொல்லப்பட்டிருக்கின்றது. எங்களுடைய வடக்கு, மாகாணத்திலே மாகாண சபை இயங்கியபோது, 5 மாவட்டங்களிலும் மருத்துவப் புனர்வாழ்வு நிலையங்கள் அமைக்கப்பட்டு இருந்தன. ஆளணிப் பற்றாக்குறையால் அந்த நிலையங்களிலிருந்து முழுமையான பயனைப் பெற முடியாமல் இருக்கின்றது. அந்த நிலையங்களை நீங்கள் இந்தத் தேவைக்காக முழுமையாகப் பயன்படுத்தலாம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கான நேரம் நிறைவடைகின்றது.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
தயவுசெய்து எனக்கு ஒரு நிமிடம் தாருங்கள், சமூக வலுவூட்டல் சம்பந்தமாக முக்கியமான ஒரு விடயத்தைக் கூறி முடிக்கிறேன்.

'அஸ்வெசும' திட்டத்தினூடாக வலதுகுறைந்தோருக்கு ஒதுக்கப்பட்ட நிதி மிகவும் குறைவாகக் காணப்படுகின்றது. மேலும், அவர்களது electricity bill பாரிய தொகையாக இருப்பதாகக் கூறி, பல வலுவிழந்தவர்களுக்கு இந்த 'அஸ்வெசும' கொடுப்பனவு நிறுத்தப்பட்டிருக்கின்றது. அவர்கள் இயலாதவர்கள்; இந்த electricity வசதியை நம்பி வாழ்கின்றவர்கள். அவர்களுக்கு அது மிகவும் அவசியம். ஆகவே, electricity billஐக் காரணமாகக்கொண்டு அவர்களுக்கான நிதியை ஒதுக்காமல் விட்டுவிட வேண்டாம் என்பதை இந்தச் சந்தர்ப்பத்திலே கூறிக்கொள்ள விரும்புகிறேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 5.27]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැහැරී දණින් වැටුණු ශ්‍රී ලාංකීය සමාජ, ආර්ථික දේහය දෙපයින් නඟා සිටුවා, මේ රටේ ජනතාවට සතුටු වෙන්න පුළුවන් ජීවිතයක් -සතුටුදායක ජීවිතයක්- ලබා දීම සඳහා අපේ ජනතා රජය දෙවන වරට ඉදිරිපත් කරන මේ අය වැය සම්බන්ධව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන මම පළමුව ස්තුතිය පුද කරනවා. අපි මේ දින කිහිපයේම මැනවින් සවන් දුන්නා අපේ ජනතා රජයේ වසරක ශේෂ පත්‍රය ගැන විවිධ විධියට විපක්ෂය දක්වන අදහස්වලට. හැබැයි, ඒ කවුරුවත් කථා කරන්නේ නැහැ, අපට මේ වගකීම භාර දෙන කොට අපට ලබා දීපු ශේෂ පත්‍රයේ තත්ත්වය පිළිබඳව. ඒ කවුරුවත් කථා කරන්නේ නැහැ එදා මේ රටේ ජනගහනයෙන් සියයට 70ක් සහනාධාර මත ජීවත් වෙන්න යොමු කර තිබුණු බව; ගුවන් තොටුපොළ, අධිවේගී මාර්ග වාගේ සංවර්ධන ව්‍යාපෘති නැවතිලා එක තැන රැඳිලා තිබුණු බව; එවැනි ආර්ථිකයක් අපට භාර දුන්නු බව. පසුගිය වසරක කාලය තුළ අපි දැඩි උත්සාහයක් ගෙන තිබෙනවා ලාංකීය ආර්ථිකය, සමාජය වාගේම සංස්කෘතිය පිරිහීමට බලපෑ හේතු සාධක ඉවත් කරන්න. එය සාර්ථක වෙලා තිබෙනවා. අපි ඒක ආදර්ශයෙන්ම පෙන්වා තිබෙනවා. ආර්ථික සංවර්ධනයට බාධාවක් වෙච්ච වංචාව, දූෂණය, නාස්තිය, හොරකම තුරන් කරන්න අවශ්‍ය කටයුතු කරලා, අනවශ්‍ය වියදම් පාලනය කරලා, ආර්ථිකයේ අත්‍යවශ්‍ය තැන්වලට අවශ්‍ය සම්පත් යොමු කරන්න අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, අපේ සමාජයීය, සංස්කෘතික දියුණුවට බාධක වූ සාධක ඉවත් කිරීම සඳහා ද අපි කටයුතු කරමින් සිටිනවා. මට පෙර කථා කළ මන්ත්‍රීතුමා ද සඳහන් කළ "Clean Sri Lanka" වැඩසටහන, "රටම එකට" මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන ආදි වැඩසටහන් තුළින් මේ රටේ සමාජ, සංස්කෘතික දියුණුව තහවුරු කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා.

අප මේ රට භාර ගන්න කොට, විපක්ෂය කියූ ආකාරයට, විපක්ෂය පුරෝකථනය කරපු ආකාරයට මේ රටේ ආර්ථිකය බිඳ වැටුණේ නැහැ. අද වනකොට මේ සභාවේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ද පොදුවේ පිළිගන්නා කාරණයක් තමයි අප මේ වසර තුළ ආර්ථික ස්ථාවරත්වය ඇති කළා කියන එක. විපක්ෂයේ ඉන්න ආර්ථික ඔස්තාර්ලා තමයි පසුගිය දශක කිහිපයේම මේ රට කරවූයේ. ඒ අය රට කරවලා තමයි ආර්ථිකය වැට්ටුවේ. අපි සතුටු වෙනවා ක්‍රමක්‍රමයෙන්, දවසින් දවස මේ ආර්ථිකය ගොඩනඟා ගැනීම සඳහා, මේ රට ගොඩනඟා ගැනීම සඳහා පියවර ගැනීමට අපට හැකි වීම පිළිබඳව. ඒකට සාක්ෂි සපයනවා, දිනෙන් දින ඉහළ යන අපේ රුපියල් සංචිත සහ ඩොලර් සංචිත.

ඒ විතරක් නොවෙයි. ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන දැන් අපේ රට ණය ශ්‍රේණිගත කිරීම්වලින් ඉහළට යවමින් ඉන්නවා. අපට පුළුවන්කම ලැබී තිබෙනවා, ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ අය වැය හිඟය අඩු කර ගන්න. ඒ වාගේම අපි දිනෙන් දින විදේශ ප්‍රේෂණ වැඩි කර ගනිමින් ඉන්නවා. ඒ වාගේම පසු ගිය මාස ගණනාවේදීම ජංගම ගිණුමේ ශේෂය ධන අගයක පවත්වා ගන්නත් අපට පුළුවන්කම ලැබී තිබෙනවා. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමියක් කිව්වා, අපේ ණය ගැනීම ගැන. මෙවර අය වැයෙන් අපි ගිය වරට වඩා ණය ගැනීමේ සීමාව පහත දමාගෙනත් තිබෙනවා. එහෙම තමයි අපි ණය කළමනාකරණය කරන්නේ. හැබැයි, ණය ගැන කථා කරනකොට අපි එක දෙයක් කියන්න ඕනෑ. ඔව්, අපි ණය අරගෙන තිබෙනවා. නමුත් අපි ගත්ත ණය යොදවා තිබෙන්නේ, මේ රටේ ජනතාව වෙනුවෙන්; ඒ අයගේ ජීවිත ගොඩනැඟීම වෙනුවෙන්; මේ රටේ සංවර්ධනය වෙනුවෙන්. ඒ ණයවලින් සතයක්වත් මේ 159දෙනාගේ සාක්කුවලට ගිහිල්ලා නැහැ. අපි දන්නා අතීතයේ නම්, ණය ගත්තා; ණයවලින් ව්‍යාපෘතිවලට සල්ලි වෙන් කර ගත්තා; ඒවායින් වැඩි කොටසක් වෙන් කර ගත්ත අයගේ සාක්කුවලටත් ගියා. අන්න ඒ නිසා තමයි පසුගිය දශක හතහමාර අවසානයේදී අපට දුප්පත් රටක් ඉතුරු වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොයි තරම් බාධක ආවත් අපි අපේ ගමන නවත්වන්නේ නැතුව ඉස්සරහට යනවා. අපි මේ රටේ ආර්ථිකය වඩාත් සුබදායක, වඩාත් සතුටු විය හැකි තැනකට ගෙන යන්න අවශ්‍ය කටයුතු කරනවා; ඒකට අවශ්‍ය පියවර ජනතා ආණ්ඩුවේ දෙවැනි අය වැයෙන්ද අපි අරගෙන තිබෙනවා. නිෂ්පාදන ආර්ථිකය ගැන නිතර නිතර මේ සභාව තුළ කථා කළා. මම සතුටු වෙනවා, අපි යන්නේත් එතැනට. අපි අවබෝධ කරගෙන තිබෙනවා, අපි අඛණ්ඩව නිෂ්පාදන ආර්ථිකයක් අවධාරණය කරමින්, නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනඟා ගැනීම සඳහා කටයුතු නොකළ නිසා තමයි අභාග්‍ය සම්පන්න තත්ත්වයකට රට ඇද වැටිලා තිබෙන්නේ.

නැවත වතාවක් අපි මේ රට ඒ ආකාරයෙන් ඇද වැටෙන්න ඉඩ තියන්නේ නැහැ. ඒ නිසා මෙවර අපි අය වැය තුළින් කෘෂි කර්මාන්තය, කර්මාන්ත හා ව්‍යවසායකත්වය, ඒ වාගේම සංචාරක ව්‍යාපාරය, ඩිජිටල් ආර්ථික කටයුතු ආදී රටේ සංවර්ධනයට අවශ්‍ය සුවිශාල වටිනාකම් ඇති ක්ෂේත්‍ර කෙරෙහි දැඩි අවධානයක් යොමු කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම විශේෂයෙන් අවධාරණය කරනවා වඩා හොඳින් කියවලා බලන්න කියලා, අපි මෙවර සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් නඟා සිටුවන්න කොයි තරම් මුදලක් වෙන් කරලා තිබෙනවාද කියන එක. ඒ විතරක් නොවෙයි, මේ ආර්ථික ප්‍රතිලාභ තනි කෙනෙකුට යන්නේ නැතිව සමාජ ආරක්ෂණ අරමුදල්වලින් යැපෙන මිනිසුන් පවා ආර්ථික වශයෙන් දිරිමත් කරන්නට, ආර්ථික වශයෙන් සවිබලගන්වන්නට අපි මේ අය වැයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ සම්බන්ධව සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්න අවස්ථාවක් නැහැ. නමුත් අපි දැඩි විශ්වාසයෙන් කියනවා, විපක්ෂය බලාපොරොත්තු වෙන විධියට, ප්‍රාර්ථනා කරන විධියට මේ රට වැටෙන්න අපි කිසිදාක ඉඩ නොතියන බව. අපේ අරමුණ ජයගෙන මිසක් අපි මේ ගමන නවත්වන්නේ නැහැ. මේ රටේ ජනතාවට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" උදා කර දෙනතුරු අපි මේ ගමන නොබියව ඉදිරියට යන බව ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.36]

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டுக்காகச் சமர்ப்பிக்கப்பட்டுள்ள வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் வாசிப்பின்போது இந்த உயரிய சபையிலே உரையாற்றுவதில் நான் மிகவும் மகிழ்ச்சியடைகின்றேன். இந்த வரவு செலவுத்திட்டத்திலே முதன்முறையாக இந்நாட்டின் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை 1,750 ரூபாயாக உறுதிப்படுத்தி இருக்கின்றார். அது இலங்கையில் இருக்கின்ற தோட்டத் தொழிலாளர்களின் வரலாற்று வெற்றியாகும். அந்த வெற்றியின் உச்ச நாயகனாக இன்று இருக்கக்கூடிய மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் வரலாற்றில் பதியப்படுவதை எவராலும் தவிர்க்க முடியாது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாம் ஏன் அவ்வாறு கூறுகின்றோம் என்றால், பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு வரலாறு என்பது போராட்டம் நிறைந்த ஒன்றென்பது நம் அனைவருக்கும் தெரியும்! 1939ஆம் ஆண்டு முல்லோயாத் தோட்டத்திலே தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வுப் போராட்டத்துக்கான பிள்ளையார் சுழி போடப்பட்டது. அப்பொழுது 16 சதமாக இருந்த தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை மேலும் 10 சத வீதத்தால் உயர்த்தித் தருமாறு கேட்டபொழுது, அன்றைய ஆட்சியாளர்களினால் கோவிந்தன் என்ற தோட்டத் தொழிலாளி சுட்டுக் கொலைசெய்யப்பட்டார். இவ்வாறாக, தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு பற்றிய வரலாறு என்பது போராட்டம் மிக்கதாகும், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! ஆனால், இன்று இந்த நாட்டிலே உழைக்கும் வர்க்கத்தின் ஆட்சி அமைக்கப்பட்டிருக்கின்றது; உழைக்கும் வர்க்கத்தின் உரிமைகள் உறுதிப்படுத்தப்பட்டிருக்கின்றன. அந்த வகையில், இலங்கையின் பாட்டாளி - உழைப்பாளர் - வர்க்கமாகிய தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு 1,750 ரூபாயாக வரையறுத்து அதிகரிக்கப்பட்டிருப்பது என்பது வரலாற்று வெற்றியாகும். இது போராட்டம் இல்லாமல், ஆர்ப்பாட்டம் இல்லாமல், கெஞ்சல் இல்லாமல் பெற்றுக்கொள்ளப்பட்ட சம்பள உயர்வாகும்.

இந்தச் சம்பள உயர்வு சம்பந்தமாகக் கடந்த காலத்திலே தொழிலாளர்களின் சார்பாகப் போராட்டம் செய்த பிரதிநிதி என்ற வகையிலே, நான் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வு வேண்டும் என்றால், அது போராட்டத்தின் பிரதிபலனாகவே கிடைக்கும் எனத் தொடர்ச்சியாக வலியுறுத்தி வந்திருக்கின்றேன். ஆனால், இப்பொழுது நாங்கள் ஆட்சிக்கு வந்து சம்பளத்தை உயர்த்துவோம் என்று கூறியவுடன், மலையகத்தை இதுவரை நாள் பிரதிநிதித்துவம் செய்த தொண்டமான் அணியைச் சேர்ந்த ஜீவன் தொண்டமான் அவர்கள் - இப்போது அவர் சபையில் இல்லை; இருந்திருந்தால் மிகவும் நன்றாக இருந்திருக்கும் - முடியுமாக இருந்தால் தோட்டத் தொழிலாளர்களின் அடிப்படைச் சம்பளத்தை 10 ரூபாயால் உயர்த்திக் காட்டுமாறு கூறினார். ஆனால், இந்த அரசாங்கம் தோட்டத் தொழிலாளர்களின் அடிப்படைச் சம்பளத்தை 200 ரூபாயால் உயர்த்தியிருக்கின்றது. அதுமட்டுமல்ல, வரலாற்றில் இல்லாதவாறு மேலதிகமாக 200 ரூபாயை வருகைக் கொடுப்பனவாக வழங்கும் நோக்கில் அரசாங்கம் நேரடியாகத் தலையிட்டு அதற்கான நிதியைத் திறைசேரியில் இருந்து பெற்றுக் கொடுப்பதற்கேதுவான வழிவகைகளைச் செய்திருக்கின்றது.

கௌரவ ஜீவன் அவர்களே, நீங்கள் உங்களது பதவியிலிருந்து விலகுவீரா, இராஜினாமா செய்வீரா? அப்படி முடியாவிட்டால், நீங்கள் தோட்டத் தொழிலாளர்களிடம் மன்னிப்புக் கோர வேண்டும். ஏன்? நாம் 10 ரூபாய்கூட சம்பள உயர்வைப் பெற்றுக்கொடுத்து விடக்கூடாது என்று கனவு கண்டவர்தான் ஜீவன் தொண்டமான் அவர்கள்! ஆனால், இன்று அடிப்படைச் சம்பளம் 200 ரூபாயாக அதிகரிக்கப்பட்டு, வருகைக் கொடுப்பனவாக மேலதிகமாக 200 ரூபாய் வழங்குவதாக இருக்கின்றபோது, ஜீவனின் அணியினர் தோட்டங்களிலும் தொழிலாளர் மத்தியிலும் பொய்யான கருத்துகளைப் பரப்புரை செய்கின்றார்கள். அதாவது, "வருகை நாள் குறையுமானால் தோட்டத் தொழிலாளர்களுக்கு அந்த 200 ரூபாய் கொடுப்பனவு கிடைக்காது" என்று கூறுகின்றனர். பரம்பரைப் பொய்யர்களின் இறுதிப் பொய்யரின் பொய்யாக இது வரலாற்றில் பதியப்பட வேண்டும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தோட்டத் தொழிலாளர்கள் ஒரு நாள் வேலைக்கு சென்றால்கூட, அரசாங்கத்தால் முன்மொழியப்பட்ட வருகைக் கொடுப்பனவு வழங்கப்படும்; இதை ஜீவன் அவர்கள் தெரிந்துகொள்ள வேண்டும். ஆனால், இவ்வாறு ஜீவன் துள்ளும்போது, சம்பள உயர்வைக் கண்டு அஞ்சும்போது, மறுபக்கம் இலங்கைத் தொழிலாளர் காங்கிரஸின் செந்தில் தொண்டமான் என்ன கூறுகின்றார்? அவர் இந்த வரவு செலவுத்திட்டத்தை வரவேற்கின்றார். அவர்களுக்குள்ளும் இரு வேறு கருத்துக்கள்!

இன்று முன்மொழியப்பட்டிருக்கின்ற இந்த வரவு செலவுத்திட்டத்தினூடாகத் தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு உறுதிப்படுத்தப்பட்டு இருக்கின்றது. நம்மனைவருக்கும் தெரியும், 2005ஆம் ஆண்டு ஒரு தோட்டத் தொழிலாளியின் நாட் சம்பளம் 135 ரூபாய்; 2017ஆம் ஆண்டில் நாட் சம்பளம் 500 ரூபாய். அவ்வாறு கடந்த காலங்களில் கிட்டத்தட்ட 12 வருடங்களுக்குப் பிறகுதான் ஒரு தோட்டத் தொழிலாளிக்கு குறிப்பிட்ட தொகைச் சம்பளம் அதிகரிக்கப்பட்டிருப்பதைக் காண்கின்றோம். அதாவது, 2005ஆம் ஆண்டிலிருந்து 2017ஆம் ஆண்டுவரையான 12 வருட காலத்தின் பின்னர்தான் அது 365 ரூபாயால் அதிகரித்திருந்தது. அப்பொழுது இந்த நாட்டின் ஆட்சிக்குத் தூண்களாகவும் அவர்களின் எடுபிடிகளாகவும் இருந்தவர்கள் இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் கட்சியினர். ஆனால், இன்று இந்த அரசாங்கம் ஒரே தடவையில் 400 ரூபாயை அதிகரித்திருப்பது ஒரு வரலாற்று வெற்றியாகும்.

அதுமட்டுமல்ல, மலையகத் தோட்டப்புறங்களின் உட்கட்டமைப்பு வேலைத்திட்டங்களை முன்னெடுப்பதற்கு அதிகளவான நிதியை ஒதுக்கி, தோட்டங்களிலுள்ள உள்வீதிகள் மற்றும் பிரதான வீதிகளின் அபிவிருத்தித் திட்டங்களையும், குடிநீர் மற்றும் போக்குவரத்துத் திட்டங்களையும், தோட்டப்புறங்களில் உல்லாசப் பயணத் துறையைக் கட்டியெழுப்புவதற்கு ஏதுவான நடவடிக்கைகளையும் இந்தத் தேசிய மக்கள் சக்தி அரசாங்கம் முன்னெடுப்பதைக் காண்கின்றபொழுது, எதிர்காலத்தில் தங்களது அரசியல் செல்வாக்கை இழக்க நேரிடும் என்ற அச்சத்தில் என்ன செய்வதென்று தெரியாது ஜீவன் தொண்டமான் அவர்கள் சபையில் ஏதேதோ உளறிவிட்டுச் சென்றுள்ளார், கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! எனவே, மலையகத் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வைப் பெற்றுக்கொடுத்த மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுக்கும் தேசிய மக்கள் சக்தி அரசாங்கத்துக்கும் அகில இலங்கை தோட்டத் தொழிலாளர்கள் சார்பில் மனமார்ந்த வாழ்த்துகளையும் நன்றியையும் தெரிவித்து, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මොහොමඩ් නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.43]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 අය වැය ලේඛනය දකිනකොට මට යමක් මතක් වුණා. 2025 අය වැය කථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු වෙලාවේ නවක මන්ත්‍රීවරයකු හැටියට මම ඒක වීසි කරලා යන්න ඕනෑ කියලා එදා හිතුවත්, වාසනාවට ඒක ගෙදර තියා ගත්තා. මොකද, මම ඒක කුණු කූඩයට විසි කර තිබුණා නම්, ජනාධිපතිතුමා ගිය සිකුරාදා ඇවිල්ලා මේ සභාවේ පවත්වපු කථාවේ තිබෙන repeat telecasts - පරණ teledramas නැවත විකාශනය කියලා කියනවා නේ - ටික මට හොයා ගන්න බැරි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 අය වැය ඇත්තටම සුරංගනා කථාවක් වාගෙයි. අපි බලමු මේ අය වැය ලේඛනයේ ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු වියදම් යෝජනා ටික. මම මේ ඇමුණුම III බලන්නේ. ඒකට ඉස්සෙල්ලා ඇමුණුම IIහි කියා තිබෙනවා, මුළු ප්‍රාථමික වියදම රුපියල් බිලියන 4,485යි; පුනරාවර්තන වියදම - Recurrent Expenditure - රුපියල් බිලියන 3,105යි; ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 1,380යි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා අය වැය ඉතිහාසයේ පළමුවැනි වරට එක් එක් අමාත්‍යාංශයට අදාළ අය වැය සම්බන්ධ විශ්ලේෂණයේදී පුනරාවර්තන වියදමයි, ප්‍රාග්ධන වියදමයි වෙන් කර හඳුන්වා දීලා නැහැ. ඔක්කොම එකට ගැට ගහලා තිබෙන්නේ. ඒකට හේතුවක් තිබෙනවා.

මොකද, පුනරාවර්තන වියදම - Recurrent Expenditure - යම්කිසි ප්‍රතිශතයකින් අඩු කිරීමේ අවශ්‍යතාවක් රජයට තිබෙනවා. රජය හැම දාම කිව්වේ, පසුගිය අවුරුදු 76ක ශාපය තමයි ආර්ථික අර්බුදයට හේතුව කියලා. පැවති රජයන් සුඛෝපභෝගී වියදම් කළා. අනවශ්‍ය වියදම් කළා. ඒ හේතුකොටගෙන විදුලිය, බංගලා, වාහන හා තෙල් නාස්තියක් සිදු වුණා. නාස්තිය අඩු කිරීම හරහා පුනරාවර්තන වියදම අඩු කිරීම තමන්ට කළ හැකියි කියලා වත්මන් ආණ්ඩුව කිව්වා.

මට කවුරු හරි මේක කියන්න. ඔයගොල්ලන්ට අවස්ථාවක් ලැබුණොත් හෙට පුනරාවර්තන වියදම - Recurrent Expenditure - කුමන ප්‍රතිශතයකින් අඩු කරනවාද? ඔබතුමන්ලා ගිහිල්ලා බලන්න, පාර්ලිමේන්තු විශ්ලේෂණ කමිටුවක් විසින් 2025 ප්‍රගතිය හදලා තිබෙනවා. පසුගිය වසරේ ප්‍රගතිය හරියට කියවා බැලුවොත් කිසිම අඩු කිරීමක් පුනරාවර්තන වියදම්වල කරලා නැහැ. දැන් ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම් එකට ගැට ගහලා ඉදිරිපත් කළේ වෙන මොකටවත් නොවෙයි. ලබා ගත යුතු ඒ අරමුණ ඉෂ්ට කර ගැනීම සඳහා. ඒ සඳහා කප්පාදු කළේ ප්‍රාග්ධන වියදම. உண்மையிலேயே இந்த வரவு செலவுத் திட்டத்தில் மீண்டெழும் செலவினத்தைவிட மூலதனச் செலவினம்தான் பாரியளவில் குறைக்கப்பட்டுள்ளது. அதை என்னால் சுட்டிக்காட்ட முடியும்.

බලන්න, ගිය සැරේ ප්‍රාග්ධන වියදම යටතේ නැඟෙනහිර පළාතට කිසිම දෙයක් දුන්නේ නැහැ කියලා මම ලොකු ප්‍රශ්නයක් මතු කළා. ඒ අවස්ථාවේදී ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ මිලියන 150ක් කල්මුනේට ලබා දුන්නා සන්ධන්කනි ක්‍රීඩාංගණය ගෘහස්ථ ක්‍රීඩාංගණයක් කිරීම සඳහා. 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டில் கிழக்குக்கு நடந்த அநியாயம் பற்றி நான் பேசியபோது, கல்முனை - சந்தாங்கேணி மைதானத்துக்கென 150 மில்லியன் ரூபாயை வழங்கியிருந்தார்கள். எனினும், அந்த மூலதன ஒதுக்கத்திலிருந்து ஒரு சதமேனும் செலவழிக்கப் படவில்லை. ඒකෙන් ශත පහක්වත් වියදම් කරලා තිබුණේ නැහැ මුල් ගලක්වත් තබා තිබුණේ නැහැ. ඒකේ කිසි වැඩක් කෙරිලා තිබුණේ නැහැ. ඔන්න ඕක තමයි ඔබතුමන්ලාගේ කෙරුවාව.

දැන් මේ සැරේ අපි ස්තුතිවන්ත වුණා, අපේ නින්දවූර්වල ශ්‍රවණාගාරයට මිලියන 300ක් දීලා තිබෙනවා කියලා. දැන් බලමු, ඔය ඇමුණුම් තුනේ දීලා තිබෙන වියදම්. අම්පාර, මඩකලපුව දිස්ත්‍රික්කයට ලබා දී තිබෙන වියදම් ටික බැලුවාම පුදුම හිතෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔක්කෝම මිලියන 1,000ක්වත් නැහැ. இம்முறை அம்பாறை, மட்டக்களப்பு மாவட்டங்களுக்கு ஒதுக்கப்பட்டுள்ள மூலதனச் செலவினம் 1,000 மில்லியன் ரூபாயை விடவும் குறைவு. 2026ஆம் ஆண்டுக்கான மொத்த மூலதனச் செலவினம் 1,380 பில்லியன் ரூபாய்! அப்படி என்றால், 1,000 மில்லியன் ரூபாய் எத்தனை சதவீதம்? 0.00725 சதவீதம். අපේ අම්පාර, මඩකලපුව දිස්ත්‍රික්කවලට -ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය අතහැරලා තිබුණේ නැහැ- දීලා තිබෙන ප්‍රාග්ධන වියදම, මුළු ප්‍රාග්ධන වියදමෙන් සියයට0 .00725යි. මෙන්න ඔබතුමන්ලාගේ කෙරුවාව. මම දැන් 2026 අය වැයේදීත් කිව්වා. මට 2027දීත් කියන්න වෙයිද දන්නේ නැහැ, අපේ නින්දවූර්වල ශ්‍රවණාගාරයට ශත පහක්වත් වියදම් කරලා නැහැ කියලා. ඒකෙන් මේ පෙන්වන්න හදන්නේ වෙන මොකවත් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජනතාවට ලස්සන සුරංගනා අය වැයක් ඉදිරිපත් කිරීම සඳහා තමයි ජනාධිපතිතුමා ආවේ. පැය හතරහමාරක් කථා කළා නේ, එතුමා. එතුමා එක තැනක මෙහෙම කියනවා. එතුමා හිර වන හැම තැනකදීම විපක්ෂය ඇඳා ගත්තා. මම හොඳ උදාහරණක් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආයතනයක් VAT සඳහා ලියාපදිංචි කිරීමේ threshold එක තිබුණේ අවුරුද්දකට රුපියල් මිලියන 60යි. ඕක රුපියල් මිලියන 36ට අඩු කරන්න ඉස්සෙල්ලා ලස්සන කථා ටිකක් කිව්වා. රවී කරුණානායක මන්ත්‍රීතුමාවත් ඒකට ඇඳා ගත්තා, අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාවත් ඒකට ඇඳා ගත්තා. ඒ වෙන මොකටවත් නොවෙයි. රුපියල් මිලියන 60ට තිබුණු threshold එක රුපියල් මිලියන 36ට අඩු කළාම දවසකට රුපියල් 100,000යි. දැන් දවසකට රුපියල් 100,000ක් ගන්න ව්‍යාපාරිකයෝ ලියාපදිංචි කර ගන්න ඕනෑ, ඒගොල්ලන්ගේ වෙළෙඳ සැල හෝ සේවා සැපයීම VAT සඳහා. එතකොට මොකද වෙන්නේ? ජනතාව සියයට 18ක් ගෙවන්න ඕනෑ. ඒකටත් මහා ලොකු කථාවක් කිව්වා, පොඩ්ඩක් අය වැය කථාව කියවලා බලන්න. ඔය threshold එක දවසකට රුපියල් 150,000 සිට 100,000 දක්වා අඩු කිරීම හරහා වෙළෙඳ සහ සේවා සැපයීම් ආයතන 30,000ක් ලියාපදිංචි කර ගැනීමට බලාපොරොත්තු වෙනවා. එතකොට මොනවාද වෙන්නේ? ඒකෙන් ලබා ගන්න බලාපොරොත්තු වන, පුරෝකථනය කරන ලද මුදල කොපමණද කියලා පොඩ්ඩක් හොයලා බලන්න ඕනෑ. එහෙම තමයි මිනිස්සුන්ගෙන් බදු අරගෙන දැන් මේ රජය ගෙනියන්න හදන්නේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අපි ගෙවිය යුතු ආදායම් බදු ceiling එක ගැහුවා, රුපියල් 150,000කට. දැන් දවසක turnover එක රුපියල් 100,000කට අඩු කරලා තිබෙනවා. මම කල්මුනේ ඉඳලා කොළඹට එනවා කියමු, seats 54ක් තිබෙන private bus

එකක. ඒ එක seat එකකට රුපියල් 2,500යි කියමුකෝ. ඒ කියන්නේ, බස් ටිකට් එකක් රුපියල් 2,500ක් නම්, seats 54ක් තිබෙන බස් රථයක දවසක පිරිවැටුම, එහෙම නැත්නම් එදා turnover එක රුපියල් 100,000ක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට ඒ මනුස්සයාට සිද්ධ වෙනවා, දැන් ඒක ලියාපදිංචි කරන්න. ඒක ලියාපදිංචි කළාම මොකද වෙන්නේ? එතකොට රුපියල් 2,500ක් ගෙවන්න ඕනෑ බස් ගාස්තුවට මට තව සියයට 18ක් ගෙවන්න වෙනවා. ඒ කියන්නේ මම රුපියල් හාරසිය ගාණක් වැඩිපුර ගෙවන්න ඕනෑ. එතකොට මගේ බස් ටිකට් එකේ ගාන රුපියල් 3,000කට ළං වෙනවා. එහෙම තමයි, ජනතාවගෙන්ම තමයි සල්ලි හූරන්නේ. මේකද ඔබතුමන්ලාගේ සමාජ සාධාරණ බදු අය කර ගැනීමේ ප්‍රතිපත්තිය? හරි පුදුමයි.

දැන් තව ලස්සන කථාවක් තිබෙනවා. මට පෙර කථා කළ මන්ත්‍රීතුමා දැන් සභාවේ නැහැ. එතුමා ගැන මට ලොකු පැහැදීමක් තිබෙනවා, එතුමා ලස්සනට සිංහල සහ දෙමළ කථා කරනවා. අපි දැන් වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම ගැන බලමු. බලන්න, ඒ සඳහා කීයක්ද වෙන් කරලා තිබෙන්නේ? රුපියල් මිලියන 5,000ක්. මාර වැඩක් නේ. *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හොඳ නැද්ද?

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
හොඳද, නැද්ද කියලා මම කියන්නම්. Thank you very much, ගරු මන්ත්‍රීතුමා ඒක අහපු එකට. ඔය වතුවලින් සියයට 60ක් කාටද අයිති? කියන්නකෝ මන්ත්‍රීතුමා, මගේ ළඟ නේ ඉන්නේ. පෞද්ගලික සමාගම්වලට, ලොකු ලොකු ව්‍යාපාරික සමාගම්වලට. ඒ මිනිස්සුත් දෙන්නේ වැඩිපුර රුපියල් 200ක් නම්, අපි මොකටද රටේ ජනතාවගේ බදු සල්ලිවලින් ගෙවන්නේ? එහෙම අවශ්‍ය නැහැ. ඒ මිනිස්සු රුපියල් ලක්ෂ ගණන්, කෝටි ගණන් ලාභ ලබනවා. ඉතින් ඒ මිනිස්සුන්ගෙන් ඉල්ලා ගන්නකෝ. එතකොට රුපියල් මිලියන 5,000කින් රුපියල් මිලියන 4,000ක් අපට එතැනින් අඩු කර ගන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
එච්චර ඉක්මනට යනවාද, මගේ වෙලාව?

ஒட்டுமொத்தமாக இந்த Budgetஇல் உள்ள விடயங்களை நான் சுருக்கமாகச் சொல்லிக்கொண்டு வந்திருக்கின்றேன். இப்பொழுது நான் குறிப்பிடுவதை மனதில் வைத்துக் கொள்ளுங்கள்! கல்முனையில், பொத்துவிலில் அல்லது நுவரெலியாவில் இருக்கின்ற சில்லறைக் கடை ஒன்றில் ஒரு நாளைக்கு ஓரிலட்சம் ரூபாய்க்கு business நடந்தால், நீங்கள் அதற்காக அவர்களை VAT registration செய்ய வேண்டும்; அதில் 18 சதவீத வரியை மக்களிடம் இருந்து அறவிட வேண்டும். அதுபோல, 2,500 ரூபாய்க்கு நாங்கள் பஸ் ticket எடுத்து கல்முனையில் இருந்து கொழும்புக்கு வரவேண்டியிருக்கின்ற நிலையில், அந்த 54 seats உள்ள பஸ்ஸிற்கு ஒரு நாளைக்கு ஓரிலட்சம் வருமானம் கிடைத்தால், அதற்கு VAT register பண்ணப்படும். அதில் பயணம் செய்யும் பொதுமக்கள் 18 சதவீத வரியாக ஏறத்தாழ 500 ரூபாயை மேலதிகமாகக் கட்ட வேண்டும். இதைத்தான் நான் சொல்லுகின்றேன் -

ඒක සුරංගනා කථාවක්. මගේ වෙලාව අවසන් වෙනවා. මා ළඟ පින්තූර වගයක් තිබෙනවා. මේවා පෙන්වන්න අපට අවස්ථාවක් නැහැ නේ. මේක පෙනෙයිද දන්නේ නැහැ, නමුත් මම මේ ටික පෙන්වනවා. මේක ජනාධිපතිතුමාගේ අය වැය කථාව පිළිබඳව "බූකියේ සොමිය" හි තිබුණු කථාවක්. එදා ජනාධිපතිතුමාගේ ඓතිහාසික කථාවේ වැදගත් සිද්ධීන් දෙකක් වුණා. එකක්, එතුමාගේ පැය හතරහමාරක කථාව. අනෙක් එක තමයි, අපේ වෛද්‍ය අර්චචුනා මන්ත්‍රීතුමාගේ නින්ද. සමහර විට ඔබතුමන්ලා මේක දැකලා ඇති. එහි කියලා තිබෙනවා, "ජනාධිපතිගේ අය වැය කථාව මැද මන්ත්‍රී අර්චචුනා සැපට නිදියයි. අනුර සුරංගනා කථා කියපු ඒ පැය හතරෙන් ප්‍රයෝජනයක් ගත්තේ ඌ විතරයි ඕයි" කියලා. ඒක තමයි ඇත්ත තත්ත්වය, ඕනෑ නම් මේක බලන්න.

ඊළඟට, ආකිමිඩීස්ගේ wifeගේ කථාව ගැනත් කියලාම මගේ කථාව අවසන් කරන්නම්. සමහර විට මට තව තත්පර 30ක් විතර වැඩිපුර දෙන්න වෙයි, මම ඉක්මනින් කථාව ඉවර කරන්න බලන්නම්. ආකිමිඩීස්ගේ wife කියපු කවියක් ගැන ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැනටමත් අවසන්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
හොඳයි. මම තත්පර 30කින් කථාව අවසන් කරන්නම්.

ආකිමිඩීස් කියන්නේ ඔබතුමන්ලා නම්, නිරුවතින් දුවන්නේ කවුද? පසුගිය දෙසැම්බර් මාසයේ 07වැනි දා නිරුවතින් දිව්වේ කවුද? එහෙම නම්, "යුරේකා! යුරේකා! අපි ආර්ථික ස්ථාවරය ලබා ගත්තා" කියලා ජනතාව අන්දවා නිරුවතින් දිව්වේ, ඔබතුමා සහ ඔබතුමාගේ මුදල් ඇමතිතුමා කියා සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා වතු කම්කරු වැටුප් පිළිබඳව කථා කළා. ඒ ගැන පැහැදිලි කිරීමට විනාඩියක් ලබා දෙන ලෙස මා ඉල්ලනවා. *[බාධා කිරීම්]*

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
එතුමාට ඒ ගැන කියන්න දෙන්න. අපි ඒක දැනගන්න ඕනෑ.

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාවෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාට විනාඩියක් ලබා දෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ කරුණ වැරදියි. මොකද, අපි වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදී අපේ අමාත්‍යාංශ දෙක ඒකාබද්ධවත්, ඒ වාගේම ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කර තිබෙනවා. අවස්ථා දෙකකට වඩා සාකච්ඡා කළා, වතු හාම්පුතුන් සමඟ. එසේ සාකච්ඡා කරලා තමයි අපි මේ එකඟතාවට ආවේ. වතුවලින් සියයට 60ක් පෞද්ගලික අංශයට තිබෙනවාය කියපු කථාව නිවැරදි වෙන්න පුළුවන්. නමුත් මේ එකඟතාවට ආවේ මේ සියලුදෙනා ඒකාබද්ධව කරපු සාකච්ඡාවේ ප්‍රතිඵලයක් වශයෙනුයි. ඒ අනුව ඔවුන් රුපියල් 200කින් වැටුප් වැඩි කරන්නත්, රජය විසින් පැමිණීමේ දෛනික දිරි දීමනාවක් ලෙස රුපියල් 200ක් දෙන්නත් එකඟ වුණා. අපේ රටේ ඉන්නේ වතු කම්කරුවන් 100,000යි. අපි රුපියල් මිලියන 5,000ක මුදලක් වෙන් කර තිබෙන්නේ ඒ 100,000ක් වන පිරිසට.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබෙන්නේ විනාඩි 7ක කාලයක්.

[අ.භා. 5.59]

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ජනාධිපතිතුමා පසුගිය දවසක ජාතික ජන බලවේගය ආණ්ඩුවේ දෙවන අය වැය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ අනුව සැමට ප්‍රතිලාභ ලබා දෙන ආර්ථික වර්ධනයක් හැදීම, අපනයන විවිධාංගීකරණය කර අපනයන ආදායම වැඩි කර ගැනීම, ණය තිරසරභාවය සහතික කිරීම, ඒ වාගේම අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම, ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීම සහ ඩිජිටල්කරණය හරහා මේ රට අලුත් ප්‍රවේශයකට අරගෙන යෑම කියන අරමුණු 6 ඔස්සේ අපේ රට නව පරිවර්තනයක් කරා ගෙන යන්න සමත් අය වැයක් එතුමා ඉදිරිපත් කර තිබෙනවා. ඇත්තටම මේ අය වැය සම්බන්ධව අදහස් දක්වන අපේ රටේ සියලු විද්වතුන් ඉතාම ධනාත්මක ප්‍රවේශයකින් තමයි මෙවර ඉදිරිපත් කළ අය වැය සම්බන්ධයෙන් කරුණු දක්වා තිබෙන්නේ.

ඒ සමඟම මා කියන්න කැමැතියි, මේ අය වැය තුළ විශේෂයෙන්ම ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීමට අදාළව විශාල ව්‍යාපෘති ගණනාවක් තිබෙන බව. ඒ එකක්, දෙකක් ගැන සඳහන් කරනවා නම්, විශේෂයෙන්ම වාරිමාර්ග ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනා ප්‍රමාණය දැක්විය හැකියි. සමස්ත වාරි කර්මාන්තය නඟාසිටුවීම සඳහා රුපියල් මිලියන 91,700ක මුදලක් වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම දැනට අතරමඟ නතර වෙලා තිබෙන වාරිමාර්ග ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම තුළින් අපේ රටේ කෘෂිකර්මය නඟාසිටුවා, එහි ඵලදාව අපේ ආර්ථිකයට ගෙනෙන්නට හැකියාව ලැබෙනවා. ඒ වාගේම දැනටත් ක්‍රියාත්මක වන රාජාංගණය, ගල්ඔය, මින්නේරිය වාගේ ව්‍යාපාරවල පහළ ඇළ වෙලි සංවර්ධනය කිරීම සඳහාත් මෙවර අය වැයෙන් රුපියල් මිලියන 6,500කට ආසන්න මුදලක් වෙන් කර තිබෙනවා. ඇත්තටම එවැනි වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමෙන් ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීමට හැකි වෙනවා.

ඒත් එක්කම අපේ රටේ තිබෙන කුඩා වැව් හා අපේ ඓතිහාසික උරුමයක් වන එල්ලංගා පද්ධති නැවත සංවර්ධනය කරන්නත්, දේශගුණික විපර්යාසයන්ට මුහුණ දෙමින් පීඩාවට පත් වන, ජල හිඟය නිසා පීඩාවට පත් වන ජනතාව ඉන් මුදා ගැනීම සඳහාත් රුපියල් මිලියන 8,500ක පමණ මුදලක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම කුඩා වැව් 650ක් සහ ඇළ වෙලි 350ක් සංවර්ධනය කිරීමටත් මෙවර අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේවා මේ රට තුළ ක්‍රියාත්මක වුණාට පස්සේ අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයට එක පැත්තකින් දායකත්වය ලැබෙන අතර අනෙක් පැත්තෙන් අපේ රටේ කෘෂි කර්මාන්තයේ වේගවත් පිම්මකටත් මෙය පිටුවහලක් වෙයි කියලා.

විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, පසුගිය කාලයේ සිටි පාලකයන් විසින් දශක ගණනාවක් තිස්සේ අත්හැර දමා තිබුණු ප්‍රශ්නයක් වන අලි-මිනිස් ගැටුම ගැනත්.

අපේ රටේ පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව කියන ප්‍රදේශවලත්, දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේත්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොටසකත් ජීවත් වන ජනතාව මේ අලි -මිනිස් ගැටුමේ ඛේදවාචකයට මුහුණ දෙමින් ඉන්නවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය, අඹන්පොල, ගල්ගමුව, ගිරිබාව, ඇහැටුවැව සහ පොල්පිතිගම වාගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මෙම අලි-මිනිස් ගැටුම තීව්‍ර ලෙස පවතින බව අපි දන්නවා. පසුගිය මාස කිහිපය ඇතුළත වනඅලි සහ මිනිස්සු අතර පවතින මෙම ගැටුම තීව්‍ර වෙලා තිබෙනවා. පසුගිය කාලයේ පැවති කිසිදු රජයක් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා නැහැ. අපි ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා, ග්‍රාමීය ප්‍රජාව වෙනුවෙන් මේ අලි-මිනිස් ගැටුම තුරන් කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම පිළිබඳව.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වනජීවී කටයුතු සඳහා යොදා ගැනීමට වාහන 294ක් සහ නවීන තාක්ෂණික උපකරණ ලබා ගැනීමටත් අනුමැතිය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම අලුතින් අලි වැටවල් ඉදි කිරීම සඳහා දැනට වෙන් කර තිබෙන මුදලට අමතරව තවත් රුපියල් මිලියන 300ක මුදලක් වෙන් කරලා තිබෙනවා. මෙම ගැටලුවට කාර්ය මණ්ඩලවල හිඟයත් විශේෂයෙන්ම බලපා තිබෙනවා. ඒ සඳහා කඩිනම් විසඳුමක් විධියට සිවිල් ආරක්ෂක සේවාවේ නිලධාරින් 5,000ක් එම කාර්යය සඳහා අනුයුක්ත කරන්නත්, ඔවුන්ට අවශ්‍ය ඉන්ධන සහ අනෙකුත් දීමනා ලබා දීම සඳහා රුපියල් මිලියන 375ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරන්නත් ජනාධිපතිතුමා කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම අලින්ට අවශ්‍ය ආහාර සහ ජලය ලබා ගැනීම සඳහා වනාන්තර සහ ජල මූලාශ්‍ර සුපෝෂණය කරන්න රුපියල් මිලියන 80ක් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම මම කියන්න කැමතියි, ලංකාවේ අලි-මිනිස් ගැටුමට අදාළව නිශ්චිත විද්‍යාත්මක ප්‍රවේශයක්, විද්‍යාත්මක විසඳුමක් මෙතෙක් ඉදිරිපත් වෙලා නැහැ කියන එක. අන්න ඒ පර්යේෂණ ක්‍රියාවලිය සඳහා තවත් රුපියල් මිලියන 10ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. අලි-මිනිස් ගැටුම්වලට මුහුණ දෙන ප්‍රදේශවල ජනතාව නියෝජනය කරන නියෝජිතයින් විධියට අපි එය ඉතාම ප්‍රශස්ත කාර්ය භාරයක් ලෙස අගය කරන්න කැමැතියි. ඒ වාගේම ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කරන්න, ග්‍රාමීය මාර්ග හදන්න වාගේම ග්‍රාමීය ප්‍රවාහනය දියුණු කරන්නත් විශාල මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

ග්‍රාමීය ජනතාව මුහුණ දෙන තවත් ගැටලුවක් තමයි, නිවාස ප්‍රශ්නය. "සැමට නිවහන" වැඩසටහන යටතේ අපි මේ අවුරුද්දේත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිවාස 402ක් හදන්න රුපියල් ලක්ෂ 10 ගණනේ ලබා දෙන්න සැලසුම් කරලා තිබෙනවා. ඒකෙන් නිවාස 305ක වැඩ දැනටමත් අවසන් කරලා තිබෙනවා. ඒ සඳහා ලබන වසරටත් රුපියල් මිලියන 10,200ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒක මේ අය වැය තුළ තිබෙන ප්‍රශස්ත යෝජනාවක් විධියට අපට සලකන්න පුළුවන්.

ඒ වාගේම අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයට මේ අය වැය තුළින් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් දරුවන්ට පොත් සහ උපකරණ ලබා ගන්න රුපියල් මිලියන 9,000කුත්, ආබාධිත දරුවන්ගේ අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා එක් දරුවෙකුට රුපියල් 5,000ක දීමනාවකුත්, විශ්වවිද්‍යාල ඇතුළු වෛද්‍ය පීඨ සංවර්ධනය සඳහා රුපියල් මිලියන 11,000කුත්, විශ්වවිද්‍යාලවල සහ උසස් අධ්‍යාපන ආයතනවල පහසුකම් වැඩිදියුණු කරන්න රුපියල් මිලියන 11,500කුත් වෙන් කරලා තිබෙනවා.

අපි බලයට එනකොට මාසික මහපොළ දීමනාව වශයෙන් ලබා දුන්නේ රුපියල් 5,000යි. අපි ඒක ගියවර අය වැයෙන් රුපියල් 7,500ක් දක්වා වැඩි කළා. මෙවර අය වැයෙන් එම මාසික මහපොළ දීමනාව රුපියල් 10,000ක් දක්වා වැඩි කර තිබෙනවා. විශ්වවිද්‍යාල දරුවන් සඳහා ලබා දෙන ලද රුපියල් 4,000ක ශිෂ්‍යාධාර දීමනාව ගියවර අය වැයෙන් රුපියල් 6,500 දක්වා වර්ධනය කළා. මෙවර එය රුපියල් 9,000 දක්වා නැවත වර්ධනය කර තිබෙනවා.

ඒ වාගේම "නිපුණතා සිසු දිරිය දීමනාව" රුපියල් 2,500කින් වැඩි කරලා තිබෙනවා. ඒ ආදී වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් එක පැත්තකින් ග්‍රාමීය ආර්ථිකය දියුණු කරන්නත්, අනෙක් පැත්තෙන් ආර්ථිකයේ තිරසරභාවය සඳහාත් වෙන් කරලා තිබෙනවා. අපේ රටේ දේශීය නිෂ්පාදන වැඩි කරලා, අපනයනය විවිධාංගීකරණය කරලා ආර්ථිකය ස්ථාවර කරන්නත් අදාළ යෝජනා රාශියක් මෙවර අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා මේ රටේ ක්‍රියාත්මක වෙද්දී අපේ විපක්ෂයට මේ අය වැය ගැන කථා කියමින් තමයි ඉන්න සිදු වෙන්නේ කියන කාරණය මතක් කරමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඩබ්ලිව්.එම්.එම්. අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.07]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම අලුත් ආණ්ඩුව ඉදිරිපත් කළ දෙවන අය වැය සම්බන්ධයෙන් අපට අදහස් පළ කරන්න ලැබුණු අවස්ථාවක් මේක. අය වැයක් කියන්නේ, රටේ ආදායම් සහ වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් ලියවිල්ලක් පමණක්ම නොවෙයි, රටේ සියලුදෙනාම තමන්ගේ ඉදිරි අනාගතය කවර දිශානතියකට ගෙන යනවාද කියලා බලාපොරොත්තු සහගතව බලාගෙන ඉන්න ලියවිල්ලක්. රටේ ඉන්න මහජනතාව තමන්ට පරිභෝජනය කරන භාණ්ඩවල මිල අඩු වෙනවාද, තරුණ පිරිස රැකියා උත්පාදනය වන ආකාරයේ අය වැයක්ද, ව්‍යාපාරිකයන් තමන්ගේ ව්‍යාපාරවලට පහසුකම් සහිත පරිසරයක් හැදෙන අය වැයක්ද, ආයෝජකයන් තමන්ගේ ආයෝජන සුරක්ෂිත වන නිශ්චිත ප්‍රතිපත්ති සහිතව ඉදිරිපත් කරන අය වැයක්ද කියන එක පිළිබඳව අවධානයෙන් ඉන්න අවස්ථාවක් තමයි, මේක. මේ අය වැය තුළ අපට දිගින් දිගටම දකින්න ලැබෙන ප්‍රධාන කාරණාව මේකයි. මේ අය වැය ඉදිරිපත් කරන ආණ්ඩුවට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන අර්බුදය අය වැය පුරාම දකින්න ලැබෙනවා. මොකක්ද, අර්බුදය? මීට අවුරුද්දකට, එකහමාරකට කලින් ධනවාදය පිළිබඳව විවේචන ඉදිරිපත් කරපු, මාක්ස්වාදයේ ඔළුවක් එක්ක කටයුතු කරපු දේශපාලන නායකයා සහ ඒ පක්ෂය ධනවාදී ආර්ථිකය කළමනාකරණය කරන්නට දරන උත්සාහය ඇතුළේ ආර්ථිකය හසුරුවන මොහොතක් හැටියට තමයි මේ අය වැය වාර්තාව අපට දකින්න ලැබෙන්නේ. මේ ධනවාදී ආර්ථිකය හසුරුවන්න දරන වෑයම ඇතුළේම මාක්ස්වාදී අදහස් ගැළපිලා මේ තුළ පොඩි පටලැවිල්ලක් දිගින් දිගටම දකින්න ලැබෙනවා. මොකක්ද, මේ පටලැවිල්ල කියලා අපි එකින් එක බලමු.

ජනාධිපතිතුමා පැය හතරහමාරක ලස්සන කථාවක් කරමින් කිව්වා, ආනයන වියදම් වැඩි වෙලා තිබෙනවා, ඒ නිසා ලංකාවේ ආර්ථිකය ඉහළට එසවෙමින් තිබෙනවා කියලා. මම පොඩ්ඩක් බැලුවා, මේ ආනයන වියදම් වැඩි වෙලා තිබෙන්නේ කොහොමද කියලා. ආනයන වියදම් ප්‍රධාන කොටස් තුනකින් සමන්විතයි. ඒ, පරිභෝජන භාණ්ඩ, ආයෝජන භාණ්ඩ සහ අතරමැදි භාණ්ඩ වශයෙන්. ජනාධිපතිතුමා කිව්ව කථාව ඇත්ත. ආනයන වියදම් වැඩි වෙලා තිබෙනවා තමයි. හැබැයි, වැඩි වෙලා තිබෙන්නේ පරිභෝජන භාණ්ඩ. ඒ කියන්නේ, එදිනෙදා ආහාරයට ගන්න දේවල්. අන්න ඒ දේවල්වල මිල වැඩි වෙලා තිබෙනවා, සියයට 51කින් විතර. ඒකේ තේරුම මේකයි. පරිභෝජන භාණ්ඩ තමයි ආනයන ලෙස වැඩි වෙලා තිබෙන්නේ. නිෂ්පාදන ආර්ථිකයක් වෙනුවෙන් පෙනී හිටපු පක්ෂයකට, ආනයන සීමා කරලා, ඒ වෙනුවට ආදේශක ඉදිරිපත් කරන්න ඕනෑ කියලා මහජනතාව ඉදිරියේ සපථ කරපු පක්ෂයකට තවමත් ඒ ඉහළ යෑම පාලනය කර ගන්න බැරි වෙලා තිබෙනවා. අවසානයේදී ආනයන වියදම් වැඩි වීම අස්සේ තිබෙන්නේත් අතරමැදි හෝ ආයෝජන භාණ්ඩ නොවෙයි, ආහාර පානවලට යන වියදම. දැනට සිග්නල් ලයිට් වාගේ ඉන්න අයට පුළුවන්, මේවා සටහන් කරගෙන මේවාට උත්තර දෙන්න. මොකද, ඔබතුමන්ලා ඒ හැම එකකටම අත්පුඩි ගැහුවා. සිග්නල් ලයිට් කියන්නේ ඒක නේ. ජනාධිපතිතුමා කියනවා වාගේ තබුත්තේගම තිබෙන තනි කණුවේ සිග්නල් ලයිට් එක වාගේ ඕනෑ එකකට අත්පුඩි ගහනවා. ලියා ගෙන මේවාට උත්තර දෙන්න පුළුවන්.

ඊළඟ කාරණාව මේකයි. පසුගිය අවුරුද්දේත් අය වැයක් ඉදිරිපත් වුණා නේ. පසුගිය අය වැය වෙලාවේදීත් රුපියල් බිලියන 7,000ක විතර වියදම් ගැන කිව්වා, මෙන්න වියදම්, අරකට මෙච්චරයි, මේකට මෙච්චරයි කියලා. හැබැයි, අවසානයේදී ඒ

[ගරු අමිල ප්‍රසාද් මහතා]

මුදල වියදම් කළේ නැහැ. එතකොට ඒ හැම එකකටම අත්පුඩි ගහපු කට්ටිය දැනුත් අත්පුඩි ගහනවා. හැබැයි, පසුගිය අවුරුද්ද තුළ මේ මුදල් ටික වියදම් කර ගන්න බැරි වුණා. ඒ මුදල් වියදම් කර ගන්න බැරි වීමේ ප්‍රතිඵලය මේකයි. පුනරාවර්තන වියදම් ටික -පඩි ටික, අනම් මනම් ටික- කොහොමත් වියදම් වෙනවා නේ. හැබැයි, ප්‍රාග්ධනය වියදම් කර ගන්න බැරි වෙනවා කියන්නේ ඒක ජනාධිපතිතුමාගේ විතරක් නොවෙයි, ආණ්ඩුවේ ඉන්න ඔය සියලුදෙනාගේත්, මේ බලාගෙන ඉන්න අයගේත්, දැන් ගෙවල්වලට වෙලා ඉන්න අයගේත් අකාර්යක්ෂමතාව. ඒකට හේතුව තමයි, රාජ්‍ය නිලධාරීන් එකතු කරගෙන මේ වෙන් කරපු මුදල් ටික ජනතාව අතරට අරගෙන ගිහිල්ලා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කර ගන්න බැරි වීම. ඒ නිසා මම මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, සිග්නල් ලයිට් වාගේ අත්පුඩි ගහමින් ඉන්නේ නැතුව ගම්වලට ගිහිල්ලා ජනාධිපතිතුමා වෙන් කරලා තිබෙන මුදල් ටික වියදම් කරන්න කියලා. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා මම කියනවා. එක මන්ත්‍රීවරයෙක් කිව්වා, එක එක ප්‍රතිශත ගැන. මම ඒ ගැන කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

දෙවැනි කාරණාව මෙයයි. මේ අර්බුදය එහාට මෙහාට කළමනාකරණය කරමින් තිබෙන අර්බුදයක් කියලා මම කලිනුත් කිව්වා නේ. ජනාධිපතිතුමා කිව්වා, අඛණ්ඩව සියයට 7ක ආර්ථික වර්ධනයක් පවත්වාගෙන යෑම තමයි අපේක්ෂාව කියලා. සියයට 7ක අඛණ්ඩ ආර්ථික වර්ධනයක් පවත්වා ගෙන යන්න නම් මුලින්ම මේ රටට දේශීය සහ විදේශීය ආයෝජන පැමිණෙන්න ඕනෑ. ඒක තමයි විය යුත්තේ. දැනට එමින් පවතින ආයෝජන ප්‍රමාණය අඩුම තරමින් තව හතර, පස් ගුණයකින් ඉහළ ගියේ නැත්නම් මේ සියයට 7ක ආර්ථික වර්ධනය අපට දිගින් දිගටම පවත්වා ගෙන යන්න බැහැ. මේ ආණ්ඩුව මේ අය වැය ඉදිරිපත් කිරීම හරහා මේ විධියට දෙගුණයකින්, තුන් ගුණයකින්, හතර ගුණයකින් වාර්ෂිකව ආයෝජන ඉහළ නංවන්නට ගත් විප්ලවීය ක්‍රියාමාර්ග මොනවාද කියලා අත්පුඩි ගහමින් හිටපු කට්ටියගෙන් මම අහන්න කැමැතියි. ඒ කියන්නේ සාමාන්‍ය, සාම්ප්‍රදායිකව ගත්ත ක්‍රියාමාර්ගවලට අමතරව විප්ලවීය ක්‍රියාමාර්ග ගන්නේ නැතුව සියයට 7ක ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යන්නත් බැහැ, මේ වාගේ ආයෝජන හතර, පස් ගුණයක් ලංකාව ඇතුළට ආකර්ෂණය කර ගන්නත් බැහැ. ඒ නිසා මේ අය වැය ඇතුළේ කොහේද තිබුණේ, ඒ වාගේ විප්ලවීය තීරණ කියලා තමන්ගේ කථාවලදී උත්තර දෙන්න පුළුවන්.

ඊළඟ කාරණාව, මේ ආණ්ඩුව බලයට ආවේ එකම එක ප්‍රධාන සටන් පාඨයක් එක්ක. "අල්ලස, දූෂණය, නාස්තිය සහ වංචාව නැවැත්තුවොත්, මේ රට දියුණු කරන්න පුළුවන්; ඒක තමයි මෙතෙක් කල් සිද්ධ නොවුණේ; හැබැයි, අපි ඇවිල්ලා මේක වෙනස් කරනවා" කියලා කිව්වා. ගෙවුණු දශක දෙකක කාල සීමාව පිළිබඳවවත් විගණන පරීක්ෂාවක් කරලා කොහෙන්ද හොරකම් ටික වුණේ, කොතැනද වංචා ටික සිද්ධ වුණේ, කොතැනින්ද අපට මේක අඩු කර ගන්න පුළුවන් කියලා හෙව්වාද කියලා නැවත සැරයක් මම මේ සිග්නල් ලයිට්වලින් අහන්න කැමැතියි. කොතැනින්ද, ඒක ආරම්භ කළේ? කෝ, මේකේ එහෙම එකකටවත් සල්ලි වෙන් කළාද? අවුරුද්දක් ගෙවුණා. සම්පූර්ණ විගණන පරීක්ෂාවක් කරලා, ඒ තැන් ටික වහන්න තිබුණා, ඇත්තටම එහෙම වුණා නම්. එහෙම නම් ඒකෙන් කියැවෙන දේ තමයි, ඒකත් ඔබ බලය ලබා ගැනීම සඳහා භාවිත කළ සටන් පාඨයක් මිසක අවංකව මේ හොරකම, නාස්තිය, දූෂණය පිළිබඳව ගණනය කිරීමක් කරන්නට සූදානම් නැහැ කියන එක. එය අවුරුද්දකට පසුවත් පෙන්නුම් කරනවා.

ඊළඟ කාරණාව මේකයි. නාස්තිය, දූෂණය, වංචාව පිළිබඳව කථා කරන හැම මොහොතකම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම පිළිබඳව සාකච්ඡාවට ගැනෙනවා. අද දවසේ මම දැක්කා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කියනවා, දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කරන්නට ඒ අයට මූල්‍ය හරහා කොමිෂන් සභාව පාලනය කිරීමේ උත්සාහයක ආණ්ඩුව නියැළෙමින් ඉන්නවා කියලා. ඔහු පුවත්පතකට එහෙම කියලා තිබෙනවා. ඒ කියන්නේ ඒ අයට අවශ්‍ය මූල්‍ය නිදහස ආණ්ඩුව පැත්තෙන් ලබා දීලා නැහැ කියන එක. හැබැයි, ඔබේ ආණ්ඩුව එන්න කලින් ඉදිරිපත් වෙච්ච දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක වෙන්න පටන් අරගෙන අවුරුදු දෙකයි. දූෂණ විරෝධී පනත ආශ්‍රිතව තමයි ඔබේ සටන් පාඨ සියල්ල කැරකුණේ. මේ රටේ අල්ලස, දූෂණය, නාස්තිය නවත්වන්න තිබෙන ප්‍රබලතම ආයතනයට අවශ්‍ය කරන මූල්‍ය ස්වාධීනත්වය අද වෙනකම් දෙන්න බැරි වෙලා තිබෙනවා කියලා එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා කියනවා. එහෙම නම් මොකක්ද ඒකේ තේරුම? නැවත වතාවක් දෙබිඩි පිළිවෙත. රටට කියනවා, අපි අල්ලස, දූෂණය, නාස්තිය නවත්වන්න ලැහැස්තියි; අපි ආවේ ඒකට; අපි පරම පිවිතුරුයි කියලා. හැබැයි, ඒකට ඕනෑ කරන සල්ලි ටික වෙන් කර ගන්න බැහැ. මූල්‍ය නිදහස දෙන්න බැහැ. මූල්‍ය නිදහස නොදීමෙන් ඔබ පෙන්නුම් කරන්නේ කුමක්ද? ආණ්ඩුවේ දූෂණ හොයන්න බැහැයි කියලායි ඒ කියන්නේ. විපක්ෂයේ ටික හොයන්න; ආණ්ඩුවේ ටික හොයන්න බැහැ; හොයන්න ආවොත් සල්ලි නවත්වනවා. කරුණාකරලා තමන්ගේ ජන වරමට එකඟව කටයුතු කරමින් ඒ මූල්‍ය නිදහස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ලබා දෙන්න කියලා ඉල්ලනවා. මොකද, ඔබටත් වඩා මේ රටේ නාස්තිය, දූෂණය, වංචාව නවත්වා ගන්න අපට වුවමනායි. හේතුව, ඔබ කිව්වා ඒක නැවැත්තුවොත් මේ රට ආර්ථික වශයෙන් දියුණු වෙනවා කියලා. අපි කිව්වේ, ඒක පමණක් නොවෙයි, තව බොහෝ තැන් තිබෙනවා කියලා. ඔබ කියපු ප්‍රධාන සටන් පාඨයටවත් අවශ්‍ය අවස්ථාව, ඉඩ මේ අය වැය වාර්තාව තුළත් ලබා දෙන්නේ නැහැයි කියන කාරණාව කියනවා.

ඊළඟ කාරණාව, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පිළිබඳව ජනාධිපතිවරයා දැක් වූ අදහස. බලය ලබා ගැනීම උදෙසා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, රැකියා විරහිත උපාධිධාරීන් පාරට දාලා, පෙළපාළි යවලා ඒ මිනිස්සුන්ගේ කර මතින් ආපු ආණ්ඩුව අද කියනවා, ගෙවල්වලට ගිහිල්ලා පාඩම් කරලා විභාග පාස් කරලා එන්න කියලා. මෙතැන ඇති සමහර විට තව සිග්නල් කණුවක්, රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංගම් කියලා හඳාගෙන බල්ක් එක පිටින් ලබා දෙනවා කියපු. එක තැනක මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා කියනවා, 2005දී ජනතා විමුක්ති පෙරමුණ විසින් දාපු කොන්දේසිය නිසා තමයි රාජ්‍ය සේවය මෙච්චර ඉහළ නංවන්න සිද්ධ වුණේ කියලා. 2005දී ජනාධිපතිවරණයේදී ඔබ දැම්මා, බල්ක් එක පිටින් ගත්තේ නැත්නම් අපි උදවු කරන්නේ නැහැ කියලා කොන්දේසියක්. අන්න, එදා ඇති කරපු රාජ්‍ය සේවය පුළුල්වීමේ අර්බුදයට මේ රටේ මිනිස්සු මේ දක්වා මුහුණ දෙනවා. මේ ඉස්සර පේළියේ ඉන්න අය එහෙම කියපු කථාවල videos තිබෙනවා. එහෙම කොන්දේසි දාලා මේ රට ඉස්සරහට ගෙනියන එක නවත්වන්න කරන්න පුළුවන් හැම එකම කරලා ඔබ ආණ්ඩුව ගත්තාට පස්සේ අර තමන්ට බලය ලබා දීම උදෙසා මෙවලම් ලෙස භාවිත කරපු මිනිසුන්ට ලජ්ජා නැතුව කියනවා, ගෙවල්වලට ගිහිල්ලා පාඩම් කරලා එන්න කියලා.

ඊළඟ කාරණාව, ඒකෙන් කියැවෙන දේ තමයි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට කියනවා, සමාජවාදී බොරුවෙන් අයින් වෙලා නිදහස් මිනිස්සු විධියට ලෝකය දිහා බලන්න මේක අවස්ථාවක් කර ගන්න කියා. අදටත් ඔබව මේ අය භාවිත කරනවා, එක එක ක්‍රමවලට අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය හරහා. එහි කැඳවුම්කරුත් මෙහි ඉන්නවා නේ. ලජ්ජයි නේ. ඒ දවස්වල කියපු

දේවල් ටික. සියලු විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මෙතැන හිටපු ඇමති කෙනෙක් කියනවා, උපාධියක් තිබෙනවා නම්, රැකියාව අනිවාර්යයෙන් දීම වගකීමක් කියලා. එහෙම කියපු අයට ජනාධිපතිවරයා මෙතැනට ඇවිල්ලා පැය හතරහමාර මැද්දේ කියනවා, ගෙවල්වලට ගිහිල්ලා පාඩම් කරන්න කියලා. හැබැයි මම සතුටු වෙන දෙයක් තිබෙනවා. ඔක අවුරුදු 30කට කලින් කිව්වා නම්, මේ රට අද මෙතැන නොවෙයි තිබෙන්නේ. හැබැයි, අවුරුදු 30කට පසුව හරි ඔබ මේක කියපු එක ලොකු දෙයක්. දැන් අපි කියනවා, මේ පක්ෂය කියන්නෙත් එහෙම බල්ක් පිටින් දෙන්නේ නැහැ. අපි කියන්නෙත් එහෙම දෙන්න බැහැ. ඒ නිසා දැන්වත් නින්දෙන් ඇහැරෙන්න කියලා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට සහ උපාධිධාරීන්ට කියනවා. මොකද, මේ අය ඔබව රැවැට්ටුවා. අපි ඇත්ත කියලා විපක්ෂයේ ඉන්නවා. ඒක තමයි වෙනස. ඒ වාගේම අදින් පස්සේවත් මිනිස්සු රවට්ටන එක නවත්වන්න කියලා කියනවා. අපේ නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවට ඇවිල්ලා ඉන්නවා. අපට ආරංචි වුණා, ඔබතුමා පොලීසියට කථා කරලා මොකක් හරි කේස් එකකුත් ගියා කියලා.

එහෙන් මෙහෙන් පණිවුඩයකුත් යනවා, පොලීසියට කෝල් එකක් දුන්නා කියලා. *[බාධා කිරීමක්]* දන්නේ නැහැ, පොලීසියටත් කෝල් කළා කියලා. හරි, මගේ කථාවට එන්නම්. ඔබතුමාව දැක්කාම මතක් වුණේ. වෙන මොකුත් නොවෙයි. දැක්කාම මතක් වුණේ. *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බොරු කියන්න එපා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
නැහැ, නැහැ. මට ආපු ආරංචියක්. මම කිව්වේ එක නේ. මේක දැන් ආපු ආරංචියක්. එච්චරයි. මහ ලොකු දෙයක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි බොරු කියන්නේ?

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
හරි. ඉන්නකෝ, මම කථා කරන්න. *[බාධා කිරීම්]* හරි, හරි, හරි. *[බාධා කිරීම්]* මේ ඉන්නකෝ. පොඩ්ඩක් ඉන්නකෝ. *[බාධා කිරීම්]* හරි. මගේ කථාව අහන්නකෝ දැන්. මම කිය කියා හිටපු එක.

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මම නැවත වතාවක් කියනවා, මේ බොරුකාරයන්ට රැවටෙන්න එපා කියලා. ආයේ බල්ක් පිටින් රස්සා හම්බ වෙන්නේ නැහැ. උපාධිධාරීන්ව එහෙම රැවැට්ටුවා තමයි. දැන් කරන්න දෙයක් නැහැ. කොහොම හරි අපි මේ වැඩේ ගැන බලමු. ඔබ වෙනුවෙන් ඔබේ උගත්කමට හරියන රස්සාවක් කොහොම හරි හොයාගන්න අපි උත්සාහ කරමු. ඒ නිසා නැවත රැවටෙන්න එපා කියලා කියනවා.

ඊළඟ එක සමුපකාර ක්‍රමය. විපක්ෂයේ ඉන්නකම් කයිය ගැහුවේම ඕවා ගැන. "සමුපකාර ක්‍රමය ආපු ගමන් පරිභෝජන භාණ්ඩ අඩු වෙනවා, නිෂ්පාදකයාට හොඳ මිලක් දෙනවා, තරග කරන්න පුළුවන්. සමුපකාර ටික අපිට දෙන්න, අපිට දුන්නාම ඒක කරලා දෙන්නම්" කියලා කිව්වා. එහෙම කියලා ගත්ත සමුපකාර ටික අන්න දකුණු පළාත පුරා පරාද වී ගෙන, පරාද වී ගෙන යනවා. මොකක්ද ඒකේ තේරුම? කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමාත් මේ සභාවේ ඉන්නවා නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් ඉන්නවා නේ.*[බාධා කිරීමක්]* මම මේ කියන කථාව අහගන්නකෝ, ඔය කථාවට වඩා. පරාද නොවුණත් කමක් නැහැ කියමුකෝ. සමුපකාර ක්‍රමය හරහා ඔබට බැරි වුණා, පරිභෝජන භාණ්ඩවල මිල අඩු කරගන්න. අර පැත්තේ අල ගොවියාට, ලූනු ගොවියාට ඒ ටික විකුණා ගන්න බැරි වුණා. එහෙනම් නැවත වතාවක් සමුපකාර ක්‍රමය හරහා මේ ආර්ථිකය ශක්තිමත් කරනවා කියලා ඔබතුමන්ලා කියපු කාරණාවත් බිඳ වැටිලා තිබෙනවා.

හැබැයි ජනාධිපතිවරයා මේ අය වැය හරහා කරපු හොඳ දෙවල් දෙක තුනකුත් කියන්නම්. එකක් තමයි, එතුමා කියපු විධියට කොළඹ කළුගල්වලින් පුරවලා හදපු අර Colombo Port City එක ඇතුළේ සමාගම්වලට කම්කරුවන්ගේ රැකියාව අවසන් කිරීමේ පනත අදාළ නොකිරීම සඳහා ගැසට් නිවේදනයක් පාර්ලිමේන්තු අනුමැතියට යොමු කළා කියලා අද පුවත්පත් වාර්තාවල තිබෙනවා. කම්කරුවන්ට අන්න ඒ වාගේ දැකැත්තයි, මිටියයි පැත්තකට තියන්න කියලා ජනාධිපතිතුමා කියලා තිබෙනවා; අලුත් ගැසට් නිවේදනයක් පාර්ලිමේන්තු අනුමැතියට දුන්නා කියලා කියලා අද පුවත්පත් වාර්තා කරනවා.

ඊළඟ එක මොකක්ද? වාහන පර්මිට් අවලංගු කිරීම. ඉතා හොඳ වැඩක්. ජනාධිපතිතුමාම කියන විධියට හොඳ වැඩක්. ජනාධිපතිතුමා නේ කියන්නේ. වාහන පර්මිට් අයින් කරනවා කියන එක ඇතුළේ තිබෙන ඊළඟ එක මොකක්ද? ඒකෙන් කියන්නේ මන්ත්‍රීවරුන්ගේ වාහන පර්මිට් අයින් කරන එක විතරක් නොවෙයි නේ. මේ රටේ වාහන පර්මිට් ඉවත් කිරීම හරහා රෝහල්වල ඉන්න වෛද්‍යවරුන්ට - වෛද්‍යවරු මෙතැන ඉන්නවා නේ- බලපෑමක් වෙනවා. අඩු වැටුපකට සේවය කරන්නේ ඒ අයට ඔය පර්මිට් වාගේ වරප්‍රසාද දීලා. ඒ මිනිස්සුන්ගේ ඒවා අයින් කළාම රැකියාව කෙරෙහි තිබෙන කැමැත්ත අඩු වෙනවා. ඒ වාගේ රස්සාවල එක්කෝ පඩි වැඩි කරන්න. එහෙම නැත්නම් ඒ අයට තවත් ක්‍රමවේදවලින් පහසුකම් හදන්න. නැත්නම් ඒ රැකියාවලට අනිවාර්යයෙන්ම තරගාකාරීත්වයක් නැති වෙනවා. ඒක රටට බලපෑමක් වෙනවා. හැබැයි වාහන පර්මිට් නවත්වන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඒක ඔබතුමන්ලාගේ එකඟතාව නේ. අපිට ඒකේ ප්‍රශ්නයක් නැහැ. මන්ත්‍රීවරුන්ගේ වාහන පර්මිට් නවත්වන එක ගැනත් අපට ප්‍රශ්නයක් නැහැ. ඒක පිළිබඳව කිසි ගැටලුවක් නැහැ. මොකද, ගෝඨාභය රාජපක්ෂ දුන්නේත් නැහැ. 2015දී අන්තිමට දුන්නා. හැබැයි අනුර දිසානායක ජනාධිපතිවරයා ඒක ගත්තා. ඒක තමයි මේකේ තිබෙන දෙබිඩි ප්‍රතිපත්තිය. 2015දී ඒක අරගෙන ඊට පස්සේ පර්මිට් එකට බැණගෙන, බැණගෙන, බැණගෙන යනවා. හැම එකම එහෙම නේ කරගෙන ගියේ. හැබැයි වාහන පර්මිට් නවත්වන එක හොඳයි. ඒ හරහා-*[බාධා කිරීමක්]* එතුමා ඇතුළු ඉතුරු සියලුදෙනාත් ඒක අරගත්තා.

ඊළඟ එක තමයි, වතු සේවක ප්‍රශ්නය. වතු සේවක ප්‍රශ්නයේ තිබෙන කථාව අද ඇදිලා ආවා. මෙතැන තිබෙනවා, පොඩි අර්බුදයක්. මොකක්ද අර්බුදය? වතු සේවකයන්ගේ වැටුප් වැඩි කරන එක හොඳයි. හැබැයි ඔබ මෙතැනදී කරනවා, තව වැදගත් දෙයක්. මේ රටේ මහජනතාවගේ බදු මුදල් පෞද්ගලික අංශයේ වැඩ කරන අයගේ වැටුප් වැඩි කරන්න යොදා ගන්නවා. එතැන අර්බුදයක් තිබෙනවා. ආයේ ඒකේ කථාවක් නැහැ. හේතුව- *[බාධා කිරීමක්]* ඔබතුමාගේ වෙලාවේදී උත්තර දෙන්න කියලා කිව්වා නේ. 2022 අර්බුදය හරහා මිනිස්සුන්ගෙන් ඇදලා ගන්න බදු මුදල් ටික පෞද්ගලික අංශයේ වැටුප් ගෙවන්න භාවිත කිරීම. මම

[ගරු අමිල ප්‍රසාද් මහතා]

කිව්වා නේ, මේක පැටලිලා තිබෙන්නේ කියලා. අල ගොවියා, ලූනු ගොවියා, ඇඟලුම් සේවකයා මේකම ඉල්ලන්න පටන් ගත්තොත් මොකද වෙන්නේ? මොකද, ඒ අයත් මේ රටේ ඉන්න පෞද්ගලික අංශයේ සේවය කරන නිශ්චිත වැටුපක් නොලැබෙන අය වෙන්න පුළුවන්. ඒ අයත් මේක ඉල්ලන්න පටන් ගත්තොත් මහජන බදු මුදල් විනයානුකූලව භාවිත කරනවා කියපු ඔබතුමන්ලා මේ ක්‍රමයට ඒවා භාවිත කරන්නේ කුමන විනය යටතේද කියලා අහන්න කැමැතියි.

ඊළඟට, මේ සතියේ වැඩියෙන්ම ප්‍රවෘත්ති විකාශවල ගියේ, මේගොල්ලෝ; ලයිට් කණු ටිකයි, සිග්නල් ලයිට් ටිකයි එල්ලිලාම හිටියේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවේ. මොකක්ද හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වේ? එතුමා කියපු දේ තමයි, "අපේක්ෂා නොකළ මට්ටමේ වාහන ප්‍රමාණයක් ගෙනාවා. ඒ ගෙන ඒම හරහා රාජ්‍ය ආදායම විශාල ලෙස ඉහළ ගියා, අපේක්ෂා නොකළ තත්ත්වයට. ඒක තමයි භාණ්ඩාගාරය පිරුණේ. මේ භාණ්ඩාගාරයේ මෙතරම් මුදල් පිරෙන විටත්, මහජනතාවට සුව පහසුව උදෙසා බදු අඩු කිරීම එහෙම නැත්නම් ඒ අයට කිසියම් සහනයක් ලබා දීම, තරුණ පිරිසට මොකක් හරි සහනයක් දෙන එක, IT ක්ෂේත්‍රයට මොකක් හරි සහනයක් දෙන එක නොකරන්නේ ඇයි?" කියන එක. ඇයි මෙතරම් මුදල් තියෙද්දිත් - ස්වීප් ටිකට් එකක් ඇදුණේ- ඒක නොකරන්නේ කියන එක ඇහුවේ. එහෙම ඇහුවාම ආණ්ඩුවේ සිග්නල් ලයිට් මොකද කිව්වේ? "මෙන්න, හර්ෂ කියනවා, ආර්ථිකය හොඳට යනවා" කියලා ඒ අය කිව්වා. ඇත්ත කථාව ඒක නොවෙයි. ඔබතුමන්ලාටම පුළුවන්; මේ රටේ මිනිස්සුන්ටත් පුළුවන්, ආණ්ඩුවේ අයටත් පුළුවන්, වාහනවලින් ආව මුදල හැර ඉතුරු මුදල් ටික අඩු වුණාද, වැඩි වුණාද කියලා බලන්න.

ගරු ජනාධිපතිතුමා කියනවා, "රජය ඉන්නේ ව්‍යාපාර කරන්න නොවෙයි" කියලා. ඇමතිවරු කියනවා, "රජය ඉන්නේ රාජ්‍ය ව්‍යාපාර කරන්න" කියලා. ඉතින් ආයෝජකයන්ගේ විශ්වාසය අහිමි වෙනවා. අර ස්වීප් ටිකට් එක ඇදුණේ නැත්නම් මොකද වෙන්නේ? බොහෝ තැන්වල අනෙකුත් ආදායම් ක්ෂේත්‍ර ගණනාවක් -ඛනිජ තෙල් සංස්ථාව, විදුලිබල මණ්ඩලය ඇතුළු බොහෝ ආයතන- පාඩු ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා; පසුගිය අවුරුද්දට වඩා ඒවායේ අදායම අඩු වෙලා තිබෙනවා. ඒකට බලපෑ ඇත්ත හේතු සොයනවා වෙනුවට අර තනි කථාව අරගෙන, ඇදිච්ච ස්වීප් ටිකට් එකෙන් ලැබුණු මුදලෙහි එල්ලිලා 'මේ රටේ ආර්ථිකය මාරයි. යහපත් තත්ත්වයට ආවා. ඒක හර්ෂත් කිව්වා' කියලා සම්පූර්ණයෙන් විකෘති කථාවක් රට තුළට ගෙන යෑම පමණයි අය වැය සම්බන්ධයෙන් මේ සතිය තුළ ඔබතුමන්ලාට කියන්න පුළුවන් වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කථාව පටන් ගන්න කොටම කියපු කාරණයෙන්ම අවසන් කරන්නම්. ඒ මොකක්ද? සමාජවාදී, මාක්ස්වාදී ප්‍රතිපත්ති විශ්වාස කරන දේශපාලන ව්‍යාපාරයකට සිද්ධ වෙලා තිබෙනවා ධනවාදී ආර්ථිකයක් කළමනාකරණය කරන්න. ඒක තමයි ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියන්නේ "පල්ලියේ ෆාදර් බෞද්ධ කථා කියනවා" කියලා. ඒ කියන්නේ, නොගැළපෙන වැඩක් කරන්න ගිහිල්ලා වැඩේ පැටලිලා තිබෙනවා කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා අද දවසේ ඔය කථාවට හොඳ උදාහරණයක් කිව්වා ආකිමිඩීස්ගේ කථාව කියපු නියෝජ්‍ය ඇමතිතුමාම. එතුමා කිව්වා, ආර්ථිකය අංශක 360කින් කැරකුණා කියලා. අංශක 360ක් කියලා කියන්නේ හිටපු තැනටම ආවා කියන එකයි. මේ ආර්ථිකයට වෙලා තිබෙන්නේත් ඒකයි. එක තැන කැරකෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය සීමිතයි. කථාව දැන් අවසන් කරන්න.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
අංශක 360 නොවෙයි, අංශක 180කින් හරවන රටක් බවට මේ රට පත් කරන්න. අංශක 360කින් කැරකෙනවා කියන්නේ එතැනමයි, එකම දේ වෙමින් තිබෙනවා කියන එකයි. එතුමාට ඒ බව මතක් කර දෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි, කාලය ලබා දීම පිළිබඳව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.22]

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මේ අය වැය විවාදය දිහා බලා සිටිද්දී මට හිතුණා, අද දවස මේ පාර්ලිමේන්තුවට අලුතින් පත් වෙලා ආපු නවක මන්ත්‍රීවරුන් විධියට අප යම්තාක් දුරකට අවාසනාවන්තදෝ කියා හැඟිච්ච දවසක් කියලා. මොකද, විවාදයක් කර ගන්න සහ විවාදයකදී අපට දෙයක් ඉගෙන ගන්න තරම් දෙයක්වත් නැති, ඒ තරමට අදහසක්වත් පළ කරන්න බැරි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් පිරිසක් ඉන්න විපක්ෂයක් තමයි නවක මන්ත්‍රීවරුන් විධියට අපට හම්බ වෙලා තිබෙන්නේ. අඩුම ගණනේ අය වැය විවාදයකදී ඒ පිළිබඳ යම් අධ්‍යයනයක් කරලා, ඒ පිළිබඳ යම් හැදෑරීමක් කරලා, ඒ පිටුපස තිබෙන යම් ආර්ථික විද්‍යාත්මක පදනම ගැන හැදෑරීමක් කරලාවත් නැති ස්වභාවයක් තමයි අපි මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් දැක්කේ. මොකද, සෙනසුරාදා දවසේ අය වැය විවාදය ආරම්භ කරමින් කථා කරපු ආර්ථික විද්‍යාව සම්බන්ධයෙන් දැනුමක් තිබෙන විපක්ෂයේ ඉන්න ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයා වන හර්ෂ ද සිල්වා මන්ත්‍රීවරයාගේ ඉඳන් විපක්ෂයේ සියලු දෙනා අපේ අය වැය එක තැනකට ලඝු කරන්න උත්සාහ කළා, මේක IMF අය වැයක්, අපි අරගෙන යන්නේ IMF එකේ ක්‍රියාමාර්ගය පමණයි කියමින්. මොකක්ද ඒකට හේතුව? ඔවුන්ට දැන් සත්‍යය ප්‍රතික්ෂේප කරන්න බැරි මට්ටමට, බැහැර කරන්න බැරි මට්ටමට, reject කරන්න බැරි මට්ටමට ඇවිල්ලා තිබෙනවා. අප රටේ ආර්ථිකය ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා දැන් ස්ථාවර වෙලා, රාජ්‍ය මූල්‍ය කාර්යක්ෂම වෙලා, ආයෝජකයින්ගේ විශ්වාසය ආරක්ෂා වෙලා, අප දැන් ඊළඟ step එක තියන්න ලැහැස්තියි කියන එක බැහැර කරන්න බැරි මට්ටමට ඇවිත් තිබෙනවා. ඒ නිසා දැන් ඔවුන්ට අවශ්‍ය වෙලා තිබෙනවා "ඔව්, රටේ ආර්ථිකය ස්ථාවර වෙලා තිබෙනවා. හැබැයි, එය ස්ථාවර කළේ ආණ්ඩුව නොවෙයි" කියලා එතැනින් වංගුවක් ගහන්න. කමක් නැහැ. අපට credit එක ඕනෑ නැහැ. මේ රටේ ආර්ථිකය ස්ථාවර වෙලා තිබෙනවා. මේ රටේ ආර්ථිකය දැන් ඉදිරි පියවරක් තබන්න සූදානම් වෙලා තිබෙනවා. ඒ credit එක ආණ්ඩුවට ඕනෑ නැහැ; අපට ඕනෑ නැහැ. හැබැයි, අපි ඒ credit එක දෙනවා, මේ රටේ වැඩ කරන ජනතාවට. මොකද, මේ රටේ බාහිර අංශය, විදේශ අංශය ශක්තිමත් වෙන්න විදේශ ප්‍රේෂණ රැස් කිරීම

උපකාරි වුණා. විදේශ ප්‍රේෂණ වැඩියෙන් එව්වේ විදේශ ශ්‍රමිකයන්. අන්න ඒ නිසා තමයි අපි 2026 අවුරුද්දේ අය වැයෙන් ඒ විදේශ ශ්‍රමිකයන්ට සහනදායී පොලියට නිවාස ණයක් ගන්න ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීලා තිබෙන්නේ; ඒ වාගේම දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදන්න මුදල් වෙලා කරලා තිබෙන්නේ.

අපේ රටේ අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයට මේ රටේ වතු කම්කරු ජනතාව උපකාරි වුණා. ඔවුන් වැඩ කළා ශ්‍රමය වගුරුවලා. අවුරුදු ගණනාවක් ඒ ජනතාවට එහි ප්‍රතිලාභය හම්බ වුණේ නැහැ. අන්න, ඒ වෙනුවෙන් තමයි අපි මේ අය වැයෙන් ඔවුන්ගේ වැටුප් වැඩි කරන්න මුදල් වෙන් කළේ. හැබැයි, ඒ ගැනත් අන්ත ජාතිවාදී කථාවක් කිව්වා, විපක්ෂයේ ඉන්න උගත් මන්ත්‍රීවරයෙක්. ගරු මන්ත්‍රීතුමනි, අන්ත ජාතිවාදී කථාවක් ඔබ කළේ. ඔබ කථාව පටන් ගත්තා මුලින්ම, නැඟෙනහිර ජනතාවට මුදල් වෙන් කරලා නැහැ කියලා. ඔබ අදහස් කරන්නේ ඒක නොවෙයි, මුස්ලිම් ජනතාව එතැනදී- *[බාධා කිරීමක්]* මේ අය වැයෙන් නැඟෙනහිර මුස්ලිම් ජනතාවට මුදල් වෙන් කළේ,- *[බාධා කිරීමක්]*

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මගේ වෙලාව දෙන්න. මම නවක මන්ත්‍රීවරයෙක්. මට මගේ වෙලාව දෙන්න. මම නම කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* අය වැයෙන් නැඟෙනහිර ජනතාවට මුදල් වෙන් කරලා නැහැ කියපු මන්ත්‍රීවරයා වතු කම්කරු ජනතාවට රුපියල් 200 දුන්නු එක විවේචනය කළා. අන්ත ජාතිවාදය! නැගෙනහිර මිනිසුන් ළඟ දැන් ඔය ජාතිවාදය නැහැ. නැගෙනහිර මිනිසුන් ඔය ජාතිවාදය ප්‍රතික්ෂේප කරලායි තිබෙන්නේ. ඔය ජාතිවාදය ආයෙත් ගෙනෙන්න දෙන්නේ නැහැ. ඔබ නැඟෙනහිරට මුදල් වෙන් කළේ නැහැ කියලා වතු ජනතාවට රුපියල් 200ක් දුන්නු එකට කෑ ගැහුවා නේද? ඒවා ඉවරයි. *[බාධා කිරීමක්]* නැඟෙනහිර මිනිස්සු ඔය ජාතිවාදය පිළිගන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මට මගේ වෙලාව දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, IMF එක ගැනත් වචන කීපයක් කියන්න ඕනෑ. අපට ආරෝපණය කරනවා අපි මාක්ස්වාදී ව්‍යාපාරයක්, වාමාංශික ව්‍යාපාරයක්, ඒ නිසා අපට IMF එකට යන්න සිද්ධ වෙලා තිබීම සරදමක් වාගේ අදහසක්. IMF එක ගැන මෙතුමන්ලා දන්නේ නැහැ නේ. IMF එක ගැන අපට විවේචන තිබෙනවා. ඒ ඒ කාලවල ඒ ඒ රටවල පැවැති ආණ්ඩු IMF එකත් එක්ක ගෙන ගිය වැඩ පිළිවෙළවල් තිබෙනවා. අපේ රටේ පැවැති ආණ්ඩු ඒ අය එක්ක ක්‍රියාත්මක කරපු ප්‍රතිපත්ති හරහා වැඩ කරන ජනතාවට සිදු වෙච්ච අසාධාරණකම්, කප්පාදු කිරීම් තිබෙනවා. අන්න ඒ තැන්වලදී අපි ඒවා විවේචනය කළා. හැබැයි IMF එක කියන්නේ, ලෝකයේ සෑම රටකම පාහේ දායකත්වයෙන් හැදිච්ච ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක්. එතකොට ඒ මූල්‍ය අරමුදල තිබෙන්නේම අපේ වාගේ රටවල් මූල්‍ය අර්බුදවලට ලක් වුණාම උපකාර ලබා ගන්නයි. එහි අපගේත් දායකත්ව පංගුවක් තිබෙනවා. අපට අයිති කොටසක් ඒ මූල්‍ය අරමුදලේ තිබෙනවා. අපේ රට අර්බුදයට ලක් වෙච්ච වෙලාවේ අපි එහි සේවය ලබා ගන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉතින් ඒ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඒ අරමුදල් ප්‍රමාණය ලබා ගැනීමේදී අපි මොන වාගේ කොන්දේසිවලටද යටත් වෙන්නේ, මොන වාගේ කොන්දේසිවලටද එකඟ වෙන්නේ කියන එක සම්බන්ධයෙන් තමයි අපට විවේචන තිබුණේ. හැබැයි අද ඕනෑම ආර්ථික විද්‍යාඥයෙක් පිළිගන්නවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තිබිච්ච කොන්දේසි එක්ක වුණත් අපි ඉතාම කාර්ය ශූර විධියට, ඉතාම දක්ෂ විධියට ජනතාවගේ කිසිම අයිතිවාසිකමක්, කිසිම සුබසාධනයක් කප්පාදු නොකර 2025 වර්ෂයේ අයවැය ලේඛනයත්, 2026 වර්ෂයේ අය වැය ලේඛනයත් හැදූ බව. මේ කෑ ගහන අයියලා, ආර්ථික ඔස්තාර්ලා හිටපු යහපාලන ආණ්ඩුව 2015දී IMF එකට ගියා. එදා මොකක්ද කළේ? රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කරන්න කියද්දී රාජ්‍ය ව්‍යාපාර විකුණන්න ඕනෑ කිව්වා. "විකුණමු-ගොඩ යමු" කිව්වා. VAT එක වැඩි කළා. 2015දී සියයට 11ට තමයි VAT එක තිබුණේ. ඒක සියයට 15 කළා. ඉන්ධන සහනාධාරය කප්පාදු කළා. විදුලි ගාස්තු සහනාධාරය කප්පාදු කළා. අන්න එහෙම කරලා IMF ගිය අය අපට දැන් උපදෙස් දෙනවා, ඔහොම නොවෙයි මෙන්න මෙහෙමයි IMF යන්නේ කියලා. ඒගොල්ලන් 2015 IMF එකට යනකොට අපේ රටේ ණය අනුපාතය තිබුණේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 78යි. ඒක 2019 වෙද්දී සියයට 70ට අඩු කරගන්න ඉලක්කයක් තමයි අපට තිබුණේ. හැබැයි මේ උන්දැලා -කබීර් හෂීම්ලා, හර්ෂ ද සිල්වලා, රවි කරුණානායකලා- එකතු වෙලා රට කොහේටද අරගෙන ගියේ? 2019 අවසන් වෙද්දී සියයට 83යි ණය අනුපාතය. රට අර්බුදයට දාපු ඒ උන්දැලා දැන් ඇවිල්ලා කියනවා, ඔහොම නොවෙයි IMF යන්නේ, මෙන්න මෙහෙමයි කියලා.

නවක මන්ත්‍රීවරුන් විධියට අපි ඉතා සාරගර්භ විවාදයක් බලාපොරොත්තු වුණා. හැබැයි අපට දකින්න ලැබුණේ, අන්ත අසරණ වෙච්ච, තර්ක නැති, නිකම් මඩ ගැසීම්, බැණ අඬ ගැසීම් පමණක් තිබෙන විවාදයක්. ඉතාම කනගාටුයි!

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අප මේ සියලු කොන්දේසි මැද්දේ, මේ සියලු දුෂ්කරතා මැද්දේ 2025 අය වැය හැදුවේ ආර්ථිකය ස්ථාවර කරන්නයි. 2026 අය වැය හදලා තිබෙන්නේ දිගු කාලීන ආර්ථික වර්ධනයට අවශ්‍ය කරන පදනම දමන්නයි. අපි මධ්‍ය කාලීනව සියයට 7ක ආර්ථික වර්ධන වේගයකට යන්නයි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා අපි සියලු පුරෝකථන පරාජය කරනවා. හැමෝම කිව්වා, 2025 අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි කියලා. අපි එය සියයට 5 දක්වා ගෙනැල්ලා තිබෙනවා. 2026 අවුරුද්දේත් අපි අදාළ ඉලක්කයට යනවා. ඔය බලාගෙන ඉන්න විපක්ෂයේ ආර්ථික ඔස්තාර්ලා 2025 අවුරුද්දේ මුලදී ඇවිල්ලා "නැහැ, නැහැ, ඕවා කරන්න නම් බැහැ" කියලා, ආයෙත් 2025 අවුරුද්දේ අවසානයේ ඇවිල්ලා කියනවා, "අයියෝ! අපි හිතුවාටත් වඩා හොඳ වෙලා නේ, හරි පුදුමයි!" කියලා. ඒ වාගේ 2026 අවුරුද්දේ අවසානයේත් අපි හම්බ වෙමු. එතකොට බලමු මොකක්ද වෙලා තිබෙන්නේ කියලා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක වචනයක්වත් කිව්වේ නැහැ- *[බාධා කිරීමක්]* එතුමාගේ කථාවේදී කියැවුණු "ආගමික අන්තවාදය" කියන වචනය කපා හරින ලෙස මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* "මුස්ලිම්" කියන වචනය මම කිසිසේත් කිව්වේ නැහැ. මම කිව්වේ, නැඟෙනහිර පළාත ගැන විතරයි. මා දිහා බලලා,- *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හැන්සාඩ් වාර්තාව පරීක්ෂා කර බලා අවශ්‍ය පරිදි කටයුතු කරන්නම්.

විවාදය කල් තැබීම, ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "විවාදය දැන් කල්තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ඊට අනුකූලව විවාදය කල්තබන ලදී.***
***එතැන් සිට විවාදය 2025 නොවැම්බර් 11වන අඟහරුවාදා පවත්වනු ලැබේ.***
*அதன்படி, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம், 2025 நவம்பர் 11, செவ்வாய்க்கிழமை மீளத் தொடங்கும்.*
*The Debate stood adjourned accordingly.*
*Debate to be resumed on Tuesday, 11th November, 2025.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 ඔක්තෝබර් 23වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 11වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், அதனது 2025 ஒக்ரோபர் 23ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 11, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Tuesday, 11th November, 2025, pursuant to the Resolution of Parliament of 23rd October, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.